72 වන කාණ්ඩය
2 වන කලාපය

සෙනසුරාද
1967 ජූලි 15

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

අන්තර්ගත ප්‍රධාන කරුණු

රාජපාක්ෂික භාවය පිළිබඳ දිවුරුම [තී. 81]

නිවේදනය [තී. 82] :
සභාපති නාමාවලිය

තේරීම් කාරක සභාව [තී. 84]

අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව [තී. 84] :
ස්තුති යෝජනාව පිළිබඳ විවාදය [දෙවන දින]
විවාදය කල් තබන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 72
இல. 2

சனிக்கிழமை
15 ஜூலை 1967

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

*அதிகார அறிக்கை*

*பிரதான உள்ளடக்கம்*

**சத்தியப் பிரமாணம் [ப. 81]**

**அறிவிப்பு [ப. 82] :**
*அக்கிராசனர் குழாம்*

**தெரிவுக் குழு [ப. 84] :**

**மகாதேசாதிபதியினது பேச்சு [ப. 84] :**
*உரை மீதான விவாதம் [இரண்டாம் நாள்]*
*விவாதம் ஒத்திவைக்கப்பட்டது*

---

**Volume 72**
**No. 2**

**Saturday,**
**15th July 1967**

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

**OATH OF ALLEGIANCE [Col. 81]**

**ANNOUNCEMENT [Col. 82] :**
**Chairmen's Panel**

**COMMITTEE OF SELECTION [Col. 84]**

**GOVERNOR-GENERAL'S SPEECH [Col. 84] :**
**Debate on the Address [Second Day]**
**Debate adjourned**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## House of Representatives

**1967 ජූලි 15 වන සෙනසුරාදා**

சனிக்கிழமை, 15 ஜூலை, 1967

*Saturday, 15th July 1967*

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය.

சபை, பி. ப. 2 மணிக்குக் கூடியது.

*The House met at 2 P.M.*

---

**ලේකම්**

*(செயலதிகாரி)*

(The Clerk)

I have to inform this honourable House that Mr. Speaker is unwell and therefore unable to be present. I call upon the Deputy Speaker to take the Chair.

**අනතුරුව නියෝජ්‍ය කථානායක තැන්පත් සී. එස්. ෂර්ලි කොරයා මයා. මූලාසනාරූඪ විය.**

அதன் பிறகு, உபசபாநாயகர் [திரு. சீ. எஸ். ஷேர்லி கொறயா] அக்கிராசனத்தமர்ந்தார்.

*Whereupon* MR. DEPUTY SPEAKER [MR. C. S. SHIRLEY COREA] *took the Chair.*

---

## රාජපාක්ෂික භාවය පිළිබඳ දිවුරුම් : එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.

சத்தியப் பிரமாணம் : திரு. டென்சில் பெர்ணாண்டோ

OATH OF ALLEGIANCE : MR. N. DENZIL FERNANDO

**නිකලස් ඩෙන්සිල් ප්‍රනාන්දු මයා. (මීගමුව) නීතියෙන් පනවා ඇති අන්දමට දිවුරුම් දී අත්සන් තැබුවේය ; ඊට පසු මන්ත්‍රීන්ගේ නාම පුස්තකයේ අත්සන් කළේය.**

திரு. நிக்கலஸ் டென்சில் பெர்ணாண்டோ (நீர்கொழும்பு), சட்டத்தினால் வேண்டப்பட்டவாறு சத்தியப் பிரமாணம் செய்து சபாபீடத்து புத்தகத்திற் கைச்சாத்திட்டார்.

*Mr. Nicholas Denzil Fernando (Negombo) took and subscribed the Oath required by law ; and signed the Book at the Table.*





## නිවේදනය

### அறிவிப்பு

### ANNOUNCEMENT

**සභාපති නාමාවලිය**

அக்கிராசன குழாம்

CHAIRMAN'S PANEL

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

136 වන ස්ථාවර නියෝගය අනුව දැන් පවත්නා සභාවාරය තුළදී සේවය සඳහා මතු පළවන මන්ත්‍රීන් සභාපති නාමාවලියට ඇතුළත් කිරීම පිණිස කථානායකතුමා විසින් නම් කර ඇති බව දන්වනු කැමැත්තෙමි :

රාජනීතිඥ වර්නන් ජොන්ක්ලාස් මහතා.
ජෝර්ජ් රාජපක්ෂ මහතා.
එස්. එම්. රාසමානික්කම් මහතා.
එම්. සිවසිතම්පරම් මහතා.
ටී. බී. සුබසිංහ මහතා.

In terms of Standing Order No. 136, Mr. Speaker has nominated the following Members to serve on the Chairmen's Panel for the current Sessions :

Mr. Vernon Jonklaas, Q. C.
Mr. George Rajapaksa
Mr. S. M. Rasamanickam
Mr. M. Sivasithamparam
Mr. T. B. Subasinghe.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

### PAPERS PRESENTED

(1) Two Orders issued under Sections 34 ; 36 and 98 ; of the Higher Education Act, No. 20 of 1966.

(2) A set of Regulations made by the National Council of Higher Education under Sections 33 and 93 of the Higher Education Act, No. 20 of 1966.—[අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු හුරුල්ලේ]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Supplementary Estimate No. 24 of 1966-1967.—[ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු හුරුල්ලේ]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

(1) Annual Report of the Board of Directors of the Ceylon Fertilizer Corporation together with the audited Statement of Accounts and the Balance Sheet for the period 1st April 1965 to 31st March 1966.

(2) Supplementary Estimates Nos. 22 and 23 of 1966-67.—[කෘෂිකර්ම හා ආහාර ඇමති වෙනුවට ගරු හුරුල්ලේ]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

By-law made under Sections 153 and 157 of the Urban Councils Ordinance (Cap. 255).—[පළාත් පාලන ඇමතිගේත් ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම් වෙනුවට ගරු හුරුල්ලේ]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම

*சபை அமர்வு*

## Sittings of the House

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

I move,

"That this House at its rising this day do adjourn until 2 P.M. on Sunday 16th July 1967."

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*



## තේරීම් කාරක සභාව

*தெரிவுக்குழு*

## Committee of Selection

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

I move,

"That the following seven Members do serve on the Committee of Selection in terms of Standing Order No. 122 during the current Session:

The Hon. C. P. de Silva
The Hon. M. D. Banda
Mr. P. G. B. Keuneman
Mr. S. J. V. Chelvanayakam, Q.C.
Dr. N. M. Perera
Mr. G. G. Ponnambalam, Q.C.
Mr. Maithripala Senanayeke."

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව: ස්තුති යෝජනාව පිළිබඳ විවාදය [දෙවන දිනය]

*மகா தேசாதிபதியினது பேச்சு:*

*உரை மீதான விவாதம்*

*[இரண்டாம் நாள்]*

## Governor-General's Speech: Debate on the Address [*Second Day*]

**කල් තබන ලද විවාදය තව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [ජූලි 8.]**

ஜூலை 8 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப் பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

*Order read for resuming Adjourned Debate on Question—[8th July]*

"අතිගරු අග්‍රාණ්ඩුකාරතුමන් විසින් පවත්වන ලද කථාවට පිළිතුරු වශයෙන් මෙම මන්ත්‍රී මණ්ඩලය විසින් පහත දැක්වෙන ස්තුති යෝජනාව ඉදිරිපත් කළ යුතුය:

'අතිගරු උතුමාණෙනි,

පාර්ලිමේන්තුව විවෘත කිරීමේදී ඔබතුමාණන් විසින් පවත්වන්නට යෙදුණු කථාව වෙනුවෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයෝ වන අපි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඔබතුමාණන්ට ස්තුති කරමු. අප වෙත ඉදිරිපත් කරන ලද සියලුම කරුණුවලට අපගේ අවධානය යොමු කරන බව අපි ඔබතුමාට ස්ථිර ලෙස ප්‍රකාශ කරමු.' "**

*" மேன்மை தங்கிய மகா தேசாதிபதி அவர்களால் நிகழ்த்தப்பட்ட பேச்சுக்கு மறுமொழியாக இச்சபை பின்வரும் நன்றியுரையைச் சமர்ப்பிப்பதாக :*

*'மேன்மை தங்கிய உத்தம !*

*பாராளுமன்றத் திறப்பின்போது மேன்மை தங்கிய தங்களால் நிகழ்த்தப்பட்ட பேச்சுக்கு, பிரதிநிதிகள் சபை அங்கத்தினராம் நாம் எங்களது நன்றியைத் தெரிவிக்கின்றோம். மேன்மை தங்கிய தங்களால் எம்முன் சமர்ப்பிக்கப்பட்ட எல்லா விடயங்கள் மீதும் எம் கவனத்தைச் செலுத்துவோம் என உறுதி பகர்கிறோம்.' ".*

"That this House do present the following Address to His Excellency the Governor-General in reply to his Speech :

'May it please Your Excellency,

We, the Members of the House of Representatives, thank Your Excellency for the Speech with which you have been pleased to open Parliament. We assure Your Excellency that we shall give our attention to all matters placed before us.' "

**ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.**

*வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.*

*Question again proposed.*

අ. භා. 2.6

**ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන්තොට)

*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)*

(Dr. N. M. Perera—Yatiyantota)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයෙන් ඉදිරිපත් කරන අතුරු යෝජනාව—විරුද්ධ පාර්ශ්වයේ අදහස්—මේ අවස්ථාවේ මා ඉදිරිපත් කරන්නේ ඉතා සන්තෝෂයෙන් සහ ඉතා කල්පනාකාරීවයි. මේ ආණ්ඩුව පිහිටුවනු ලැබීමෙන් පසු මෙතෙක් ගත වී ඇති කාලය ගැන සලකා බලන විට දැන් එහි ආයුෂ ප්‍රමාණයෙන් භාගයක් අවසන් වී තිබෙන බව පෙනී යනව. වෙනත් වචනවලින් කියතොත් මේ ආණ්ඩුවෙ තවත් හුස්ම තියෙන්නෙ භාගයයි. මේ ආණ්ඩුවේ ජීවිත කාලය වන පස් අවුරුද්දෙන් දැනටමත් හරි අඩක් ගිහිල්ලයි තියෙන්නෙ. ගත වූ කාලය තුළ මේ ආණ්ඩුව විසින් කුමක් කර තිබෙනවද යන්න සොයා බලන්නට මේ අවස්ථාව යෝග්‍යයි. මේ රටේ තිබෙන්නාවූ ප්‍රශ්න විසඳීම සම්බන්ධව මේ ආණ්ඩුව විසින් මේ කාලය තුළ කරන ලද්දේ මොනවාදැයි පෙන්වන්න පුළුවනි. ගත වූ අවුරුදු දෙක හමාරෙන් සැහෙන කාලයක් තුළ කළේ විරුද්ධ පාර්ශ්වයට දොස් නැඟීමයි. විරුද්ධ පාර්ශ්වය ආණ්ඩු කරද්දී නොයෙක් නොයෙක් අඩුපාඩුකම් තිබුණාය, නොයෙක් නොයෙක් වැරදි කළාය යනාදි වශයෙන් කියා සිටියා. ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට කොමිෂන් සභා පත් කළා පමණක් නොව, මේ සභා ගර්භය තුළත් ඉන් පිටතත් විරුද්ධ පාර්ශ්වයට විරුද්ධව නොයෙක් චෝදනා එල්ල කරමින් සැහෙන කාලයක් ගත කළා. ඒවාගේම නොයෙක් ආකාරයෙන් පළිගැනීමේ වැඩවල යෙදුණා. විරුද්ධ පක්ෂයෙ දේශපාලනඥයින්ගෙන් පළිගත්ත. විරුද්ධ පක්ෂයෙ පත්‍ර වලින් පළිගත්ත. නොයෙක් ආකාරයෙන් කළ මේ විධියෙ පළිගැනීම්වලට නම් සැහෙන කාලයක් යෙදුව. නොයෙක් විධියෙ නඩුවලට, විරුද්ධ පක්ෂයෙ මන්ත්‍රීවරුන්ට සහ ඔවුන්ගේ අනුගාමිකයන්ට විරුද්ධව පැවරූ නොයෙක් විධියෙ නඩුවලට සැහෙන කාලයක් යෙදුව. බොරු නඩුයි බොහොම අවස්ථාවලදි පවරා තිබුණේ. ඇත්ත වශයෙන්ම ඒ සම්බන්ධව අපේ සංශෝධනයෙන් කරුණු සඳහන් වෙනව. මෙන්න මේ වැඩ කරන්ට තමයි ආණ්ඩුව මේ කාල සීමාව ඇතුළත මහන්සි ගත්තෙ. මේ වැඩ හැර ආණ්ඩුව මේ රටේ දියුණුවට, මේ රටේ ආර්ථික තත්ත්වය නගාසිටුවීමට යමක් කර තිබෙනවාය කියා අපට කියන්ට පුළුවන්කමක් නැහැ. එම නිසා අග්‍රාණ්ඩුකාරතුමාගේ දේශනය මේ විධියට සකස් කර මේ විධියට ඉදිරිපත් කිරීම ගැන අපි පුදුම වෙන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය ඇමතිතුමා එවකට විරුද්ධ පක්ෂයේ සිටින කාලයේදී මේ රටේ පාලනය ගෙන යාම පිළිබඳව එතුමාට තිබෙන පලපුරුද්ද ගැන, දැනීම ගැන, නොයෙක් අවස්ථාවලදී කර තිබෙන ප්‍රකාශ ගැන මට මතකයි. මේ රටේ පාලනය ගෙන යෑමට පලපුරුද්ද තිබෙන්නෙ, දැනීම තිබෙන්නෙ එක්සත් ජාතික පක්ෂයේ උදවියටය කියා එවකට විරුද්ධ පක්ෂයෙ සිටියදී එතුමා නොයෙක් අවස්ථාවල ප්‍රකාශ කර තිබෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

නව. තමා ඒ පිළිබඳව විශේෂඥ තත්ත්වයක් දරණවාය කියා එතුමා ප්‍රකාශ කර තිබෙනව. හැන්සාඩ් වාර්තාවෙ තිබෙන ඒ ප්‍රකාශයන් ගැන මට මතක් වෙනව. මා ඒ හැන්සාඩ් වාර්තා කියවන්නට වුවමනා කරන්නෙ නැහැ. ඇත්ත වශයෙන්ම අග්‍රාණ්ඩුකාරතුමාගෙ මේ දේශනයෙන් අපි මොනවද බලාපොරොත්තු වෙන්නෙ? ඕනෑම ආණ්ඩුවක් බලයට පැමිණෙන අවස්ථාවේදී, "මේ රටේ ප්‍රශ්න විසඳීමට අපි ඉදිරිපත් කරන වැඩ පිළිවෙළ, ක්‍රියා මාර්ගය මෙන්න මේකය" කියා රටට හෙළි දරව් කරනවා. ඒ ක්‍රියා මාර්ගය අවුරුදුපතා ක්‍රියාත්මක කරන ආකාරය තමයි සැසි වාරයක් මුලදී අග්‍රාණ්ඩුකාරතුමාගෙ දේශනයෙන් ඉදිරිපත් කරන්නෙ. ඒ ක්‍රියා මාර්ගය තමන්ට නියමිත කාලසීමාව තුළදී අවසාන කරන්ට පළමුවැනි අවුරුද්දෙ මේ මේ වැඩ කරනවාය කියා අග්‍රාණ්ඩුකාරතුමාගෙ දේශනයෙන් කියනව. නමුත් අග්‍රාණ්ඩුකාරතුමාගේ මේ දේශනයෙන් එවැනි දෙයක් සිද්ධ වී තිබෙනවාද කියා මා මේ ගරු සභාවේ සිටින ගරු මන්ත්‍රීවරුන්ගෙන් අවංකව ප්‍රශ්න කරන්ට සතුටුයි. පාර්ලිමේන්තුව මාර්ගයෙන් නීති රීති සකස් කිරීමෙන් ඉෂ්ට කර ගන්ට බලාපොරොත්තු වන්නාවූ වැඩ පිළිවෙළවල් තමයි සැසි වාරයක් මුලදී පවත්වන අග්‍රාණ්ඩුකාරතුමාගෙ කථාවෙන් බලාපොරොත්තු වෙන්නෙ. නමුත් මොනවද මේ කථාවෙ තිබෙන්නෙ? මේක හරියට අර වෙන්දේසියක කැටලොග් එකක් වගෙයි. අතීතයේදී කර තිබෙන දේවල් දීර්ඝ වශයෙන් සඳහන් කර තිබෙනව. පරිපාලනය මාර්ගයෙන් දෙපාර්තමේන්තු මාර්ගයෙන්, පාර්ලිමේන්තුව මාර්ගයෙන් කරන්ට බලාපොරොත්තු වන දේවල් ගැන අතරින් පතර තමයි යමක් සඳහන් කර තිබෙන්නෙ.

මෙවැනි රාජාසන කථාවක් ඉදිරිපත් කර තිබෙන්නෙ ඇත්ත වශයෙන්ම අපේ රාජ්‍ය ඇමතිතුමාට මේ ගැන දැනීමක් නැති නිසා නොවෙයි. මගේ කල්පනාවේ හැටියට මෙතැන සිටින්නාවූ මැති ඇමතිවරුන් බොහොම දෙනෙක් මීට කලින් ආණ්ඩුවලත් සිටි සැහෙන පළපුරුද්දක් තිබෙන උදවියයි. නමුත් ඒ අය ඇයි මෙවැනි දේශනයක් ඉදිරිපත් කළේ? එයින් ඔප්පු වෙන්නෙ මේ රටේ අනාගතයේදී විසඳන්ට තිබෙන්නාවූ ප්‍රශ්න ගැන ඒවා විසඳන ආකාරය ගැන මේ ආණ්ඩුවේ තිබෙන බංකොලොත් බවයි. මේ ප්‍රශ්න විසඳීමට කුමන පියවරවල් ගතයුතුද කියා හැඟීමක්, අවබෝධයක් මේ ආණ්ඩුව තුළ නැහැ. නිකම් අතීතයේදී කළ දේවල් ගැන නම් සඳහන් කර තිබෙනව. මේ රාජාසන කථාව මා සම්පූර්ණයෙන්ම කියවන්නට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. නමුත් මගේ තර්කය ඔප්පු කිරීමට වාක්‍ය එකක් දෙකක් ඉදිරිපත් කරන්නම්: අග්‍රාණ්ඩුකාරතුමාගෙ කථාවෙ මෙසේ සඳහන් වෙනව:

"සාහිත්‍යයටද, පාරම්පරික කලා හා සංස්කෘතියට ද, විශේෂයෙන්ම නාට්‍ය කලාවේ පුනරුත්ථාපනය වද මාගේ ආණ්ඩුවේ අනුග්‍රහය ලැබී ඇත."

අතීතයේදී අනුග්‍රහය ලැබී තිබෙනවලු; නමුත් අනාගතයේදී කරන්න යන්නෙ මොනවද කියා නැහැ. ලබන වර්ෂය තුළ මොනවද කරන්ට බලාපොරොත්තු වන්නෙ? ඒකයි මෙම කථාවෙ විශේෂයෙන් සඳහන් කළ යුතුව තිබෙන්නෙ. නමුත් එය සඳහන් කර නැහැ. තවත් හුඟක් කරුණු සඳහන් කර තිබෙනව. අතීතය ගැනයි, වැඩියෙන් කියා තිබෙන්නෙ. ගිය අවුරුද්දෙ කෙරිල තියෙනවය කියනව. ඇත්ත වශයෙන්ම එසේ කෙරී තිබෙනවද නැද්ද යන්න ඔප්පු කරන්ට පුළුවන් වන්නෙ මෙම අවධියෙදී නොවෙයි. අපට එය විමසා බලන්ට හැකි වන්නෙ, අයවැය ලේඛනය ඉදිරිපත් කළ විටයි.

පොලිස් කොමිසමක් පත් කර තිබෙන බව කියනව. ඒ ගැන අහන්ටත් බොහොම සන්තෝෂයි. නමුත් ඒ සම්බන්ධව මීළඟ අවුරුද්දෙ මොනවද කරන්ට යන්නෙ? ඔය විදියට බලාගෙන යන විට ඇත්ත වශයෙන්ම අපි පුදුමයට පත් වී සිටිනව, මේ අග්‍රාණ්ඩුකාරතුමාගෙ කථාව ගැන. අපේ ඉඩම් ඇමතිතුමා 1966 දී කළ වැඩ ගැන කියා තිබෙනව. 4,922 කට නොයෙක් විධියෙ වැඩ, ඉඩකඩම් යනාදිය දී තිබෙන වාය කියා තිබෙනව. ඒවා දැනගන්ට ලැබීම සන්තෝෂයට කාරණයක්. නමුත් මෙහි සඳහන් කළයුත්තෙ, මීළඟ අවුරුද්දෙ කෙරෙන වැඩ ගැනයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තවත් තැනෙක මෙසේ සඳහන් වෙනව. මා එය ඉංග්‍රීසියෙන් කියවන්නම්. ඒ මෙසේ යි :

"In 1966, 4,922 families were settled in colonization schemes.

57,500 acres were given on lease under the scheme of Special Leases for the production of food crops.

2,600 youths were settled on 9,289 acres out of which 5,000 will be cultivated with subsidiary foods."

ඒව දැනගන්ට සන්තෝෂයි. නමුත් විශේෂයෙන් අපට දැනගන්ට වුවමනා කරන්නෙ, ලබන අවුරුද්ද සම්බන්ධවයි. ගිය අවුරුද්දෙ නැතිනම් ඊට ප්‍රථම කළ වැඩ කටයුතු ගැන නොවෙයි, අප බැලිය යුත්තෙ. ඇත්ත වශයෙන්ම මට මෙම කථාව කියවා බැලූ පසු මතක් වුණා, එදා මන්ත්‍රණ සභාව කාලෙදී එවකට සිටි සභානායකතුමා ඉදිරිපත් කළ අයවැය ලේඛනය පිළිබඳව. එය ඉදිරිපත් කළෙත් මේ විධියටමයි. දෙපාර්තමේන්තුවල හපන්කම් යනාදිය ගැන එහි සඳහන් කළා මිස මේ රටේ ආර්ථික වැඩ පිළිවෙල කොයි ආකාරයෙන් ගමන් කරනවද, එම වැඩ පිළිවෙළ ගමන් කළයුත්තෙ කුමන අන්දමකට ද, ඒ පිළිබඳව පැන නගින ප්‍රශ්න විසඳා ගැනීම සඳහා කළයුතු ප්‍රතිකාර මොනවද, යනාදි දේ එහි සඳහන් කළේ නැහැ. අද නමුත්නාත්සෙලත් කටයුතු කරන්නෙ ඒ අන්දමටයි. මෙම දේශනයෙන් ඒ බව ඔප්පු කර තිබෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවංකව සිතා බැලුවහොත් මේ රටේ සෑම දෙනාටම පාහේ මුහුණ පාන්ට සිදු වී තිබෙන, කාගේත් ඇස් ඉදිරිපිට පෙන් නුම් වන, වැදගත් ප්‍රශ්න දෙකක් තුනක් අද අප හමුවේ පවතිනව. මෙම ප්‍රශ්න ඇමති මණ්ඩලයට නම් ගැවිලාවත් නැති බවයි පෙනෙන්නෙ. අග්‍රාණ්ඩුකාරතුමාගෙ දේශනයෙහි ඒ පිළිබඳව සඳහන් කර නැහැ ; මතක් කරලවත් නැහැ. ප්‍රථම කොටම, අද රටේ පවතින බඩු හිඟය පිළිබඳ ප්‍රශ්නය මා සඳහන් කරන්ට කැම තියි. සාමාන්‍ය බඩු නොවෙයි, අත්‍ය වශ්‍ය කෑම් ද්‍රව්‍යවල හිඟයක් අද රටේ පවතිනව. ඇතැම් බඩු තිබුණත්, ඒවා සම්බන්ධයෙන් පවතින අධික මිල තත්ත්වය පිළිබඳ ප්‍රශ්නය ඊළඟට පෙන්වා දෙන්ට පුළුවනි. අනික් පැත්තෙන් රැකිරක්ෂා නැතිකමේ ප්‍රශ්නය උග්‍ර අතට හැරී තිබෙනව. මෙම ප්‍රශ්න දෙක තුන ගැන එතුමගේ කථාවෙ සඳහන් වෙලා නැහැ. එම ප්‍රශ්න ගැන මේ ආණ්ඩුවට මතක් වෙලාවත් නැහැ. මේ රටේ එවැනි ප්‍රශ්න නැති විධියයි. බඩු මිල ප්‍රශ්නය නිසා අද ජනතාව විඳින දුක, බඩු හිඟය නිසා ජනතාවට සිදු වී තිබෙන්නා වූ අමාරුකම් ආදිය සම්බන්ධයෙන් මේ දේශනයෙ කිසිවක් සඳහන් වන්නෙ නැහැ. ඒ ප්‍රශ්න විසඳීම කෙසේ වෙතත් ඒ ප්‍රශ්න ගැන අඩුම ගණනෙ මෙහි සඳහන් වෙන්න වත් එපාය? නැහැ. කිසිම සඳහනක් නැහැ.

ඒ අනුව බලන විට, මේ දේශනයට වඩා වැදගත් ප්‍රකාශයක් අපේ රාජ්‍ය ඇමතිතුමා විසින් කර තිබුණා. ඒ ගැනයි මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නෙ. ඒ මොකද? මේ දේශනයේ ඇතුළත් කරුණු වලට වඩා වැදගත් යමක් ඒ ප්‍රකාශයේ සඳහන් කරුණු පදනම් කරගෙන සාකච්ඡා කළ හැකි නිසයි. මේ දේශනයේ නම් කිසිම දෙයක් නැහැ ; නැති දේවල් ගැනයි කථා කරන්න තිබෙන්නෙ.

අපේ රාජ්‍ය ඇමතිතුමා ජූනි මාසෙ 29 වෙනිදා "ඔබ්සර්වර්" පත්‍රයේ වාර්තාකරු වකුට පැහැදිලි වශයෙන් කළ ප්‍රකාශයක් ගැනයි මම සඳහන් කරන්නෙ. ඒ ගැන ටිකක් අපේ හිත් යොමු කළොත් මේ ප්‍රශ්න පිළිබඳ යම් ලෙසක මැන බැලීමක් කරන්න පුළුවන්. මෙන්න මේ විධියටයි මෙය ආරම්භ වන්නෙ :

"On July 8, the Government will present its third Throne Speech.—"

අග්‍රාණ්ඩුකාරතුමාගෙ තුන්වැනි දේශනය ගැන සඳහන් කරමින් තමයි උන්නැහේ මේ ප්‍රකාශය කර තිබෙන්නෙ. මෙයින් වැදගත් කොටස් පමණයි මම කියවන්න බලාපොරොත්තු වන්නෙ. මා අතේ පත්‍රය තිබෙනවා. ඕනෑම කෙනකුට අවශ්‍ය නම් එය බැලීමට පුළුවන්.

"To begin with, could you give us a personal assessment of the past two years' performance ?"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

පත්‍රවාර්තාකරු මුලින්ම අහනවා, ගත වුණු අවුරුදු දෙකේ තමුන්නාන්සේලා ගෙන ගිය වැඩ පිළිවෙළ ගැන තක්සේරු වක්, මැනීමක් කරන්න පුළුවන්ද කියා. උන්නැහේ මෙසේ උත්තර දෙනවා :

"I would say that our achievement is quite outstanding."

කවදාවත් මෙහෙම දක්ෂ ලෙස වැඩ කළ ආණ්ඩුවක් මේ රටේ ඇති වුනේ නැති බව මම ප්‍රකාශ කරන්න කැමතියි. එතකොට තවත් ප්‍රශ්නයක් අසනවා ඒ මොන අංශ වලින්ද කියා.

"Outstanding in what fields?"

මෙන්න ඒකට උත්තරය :

"The most impressive, I think, is on the food front."

වැදගත් වශයෙන් සලකන්න තිබෙන්නේ ආහාර වගා කිරීමේ අංශයයි කියා උන්නැහේ උත්තර දී තිබෙනවා. ඊ ළඟට තවදුරටත්—

"By banning certain food imports which could be produced locally, the Government has given a tremendous fillip to production. I refer especially to chillies, onions, potatoes, and other substitutes."

දැන් මෙයින් ප්‍රකාශ කරන්නෙ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මෙරටට ගෙන්වීම ආණ්ඩුව ප්‍රතිපත්තියක් වශයෙන් තහනම් කළා. ඒ කියන්නේ අල, මිරිස්, ලූනු පරිප්පු—මම කල්පනා කරනවා, බොම්බයි ලූනුත් මෙයට අඩංගුය කියා—ආදී අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය තහනම් කිරීම හේතු කොටගෙන ඒ ද්‍රව්‍ය මෙරටම වගා කිරීමට සැහෙන ධෛර්‍යයක්, ආධාරයක්, උපකාර යක් ලබා දුන්නය කියායි එතුමා ප්‍රකාශ කර තිබෙන්නෙ.

මම හිතනවා මේ ගැන ටිකක් සිතා බැලීම සුදුසුයි කියා. අප සියලු දෙනාම පිළිගත යුතු සත්‍යයක් තමයි, අද තිබෙන්නාක් මෙන් වෙන කිසිම දිනක මේ රටේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය දුර්ලබකමක් තිබුණේ නැති බව. මම හිතන්නෙ නැහැ කොයිම කාලෙකවත් තිබුණය කියා. යුද්ධ කාලෙදිවත් තිබුණය කියා මම විශ්වාස කරන්නෙ නැහැ. ඒ කාලය පිළිබඳව මම ඒ තරම් විස්තර දන්නෙ නැහැ. ඒ මොකද ඒ කාලය ඇතුළත වැඩි කාල සීමා වක් අපි හිටියේ එළියේ නොවෙයි, හිර ගෙවල් ඇතුළෙයි. ඒ කාලයෙ සිර ගෙවල් ඇතුළේ සිටි නිසා මට හරියටම කියන්න අමාරුයි. මගේ මතකයේ හැටියට ඒ කාල යෙදීවත් මෙතරම් හිඟයක් තිබුණාය කියා මට විශ්වාස කරන්න බැහැ. කෙසේ වුනත් බොම්බයි ලූනු ආදිය මෙරටට ගෙන්වීම තහනම් කර තිබෙනවාය කියා පළ වුණා. එසේ පළ කළාට පසුව මේ අවුරුද්දෙ ජූලි මාසයෙ 11 වනදා මෙන්න මේ විධියෙ ප්‍රවෘත්තියක් පළ වෙනවා :

"The current scarcity of Bombay onions in the market will end today.

One thousand tons of Bombay onions were yesterday unloaded from two freighters, 'Indian Industry' and the 'Bappan', now in the port of Colombo."

ආණ්ඩුවේ වගකිව යුතු ඇමතිවරයකු වශයෙන් තමුන්නාන්සෙ ප්‍රකාශ කරනවා, බොම්බයි ලූනු ආදිය මෙරටට ගෙන්වීම තහනම්කර තිබෙනවාය, එයින් මේ රටේ එම ද්‍රව්‍ය වගාවට සැහෙන ආධාරයක් උපකාරයක් සැලසෙනවාය, ඒ හේතු කොට ගෙන දැනටමත් මෙම ද්‍රව්‍ය වගාව වැඩි දියුණු වී තිබෙනවාය කියා. ඒ ප්‍රකාශය පළ කළ පත්‍රයේම නැවත වරක් ජූලි 11 වනදා පළ වෙනවා බොම්බයි ලූනු ටොන් දහසක් බොම්බායේ සිට ගෙනැවිත් ගොඩබෑවාය එයින් දැනට ඇති හිඟය මගහැරී යනවාය කියා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன— இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி)*

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

Did I say onions or Bombay onions?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

Bombay onions.

ගරු ඇමතිවරයකු යම්කිසි ප්‍රකාශයක් කරන කොට වගකීමක් ඇතුව ඒ ප්‍රකාශය කරන්න ඕනෑ. මම කැමතියි. මීට කෙළින්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිළිතුරක් ලැබෙනවා නම්. එහෙම නම් පත්‍රයෙ පළ කර ඇති ප්‍රවෘත්තිය අසත්‍ය යක්ද ?

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**

*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*

(The Hon. U. B. Wanninayake—Minister of Finance)

පත්‍රවල ඕනෑම දෙයක් පළ කරන්න පුළුවනි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

ගරු ඇමතිවරුන්ට ටිකක් තදබද වෙනකොට, අමාරු වෙනකොට පත්‍රයෙ කියන ඒවා බොරු. අනික් වෙලාවට කියන ඒවා ඇත්ත. මෙතැන කියා තිබෙනවා ටොන් දහසක් ගොඩබෑවාය කියා. තමුන්නාන්සෙලා අනික් පැත්තෙන් කියනවා පිටරටින් බොම්බයි ලූනු ගෙන්වීම තහනම් කළ නිසා මෙරට නිෂ්පාදනය වැඩි වෙන්න ඉඩ තිබෙනවාය කියා. එසේ නම් මෙහි තේරුම මොකක්ද ? තමුන්නාන්සෙලාගේ ප්‍රතිපත්තිය වී තිබෙන්නෙ, මේ රටේ නිෂ්පාදන—වගා කිරීම්—කඩා බිඳ දැමීමද ? මෙයින් පැහැදිලිව පෙනී යන්නෙ, මේ අවුරුදු දෙක හමාරක කාලය තුළදී තමුන්නාන්සෙලා ගෙන ගොස් ඇති වැඩ පිළිවෙළ එය බවයි. කොයි අවස්ථාවකදිවත් මහජනතාවට ඇත්ත ප්‍රකාශ කළේ නැහැ. ඇතැම් ගරු මන්ත්‍රීවරුන් මෙම පාර්ලිමේන්තුව තුළදී අපට සරදම් කළා, ඔය කියන විධියෙ අඩුවක් නැත, අපේ කොට්ඨාශවල ඕනෑ තරම් බොම්බයි ලූනු ආදිය තිබෙනවාය කියා. මේ සියල්ලෙන් ම පැහැදිලි වෙන්නෙ තමුන්නාන්සෙලා කරන ප්‍රකාශවල, තමුන්නාන්සෙලාගේ වැඩ පිළිවෙළවල තිබෙන නිසරුකමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවෙ මැති ඇමතිවරුන් අද එක අදහසක් පළ කර හෙට වෙනත් අදහසක් පළ කරමින්, පාර්ලිමේන්තුව තුළදී එක් අදහසකුත් පිටස්තරදී වෙනත් අදහසකුත් ප්‍රකාශ කරමින් මහජනතාව මුළා කරන්න පුළුවන් වේයයි කල්පනා කරතත්, පසුගිය දිනවල පැවති අතුරු මැතිවරණවලින් සාමාන්‍ය ජනතාවගේ හැඟීම් දිහා බැලුවොත් ඔවුන් හිතන අන්දමට මහජනතාව රැවටී නැති බව පැහැදිලි වෙනවා.

එම ප්‍රකාශය එතැනින් නැවතුනේ නැහැ. තවදුරටත් මෙසේ කියා තිබෙනවා :

"This has also meant immediately an increase in the price these items fetch in the domestic market and as a result more money in the hands of the cultivator and the farm producer."

ගරු මුදල් ඇමතිතුමාටත් රාජ්‍ය ඇමතිතුමාටත් මතක් කරන්නෙ මෙයයි : වගා කිරීම යුතු තනතුරු දරන මේ ගරු ඇමතිවරුන්ට මේ විධියෙ බොළඳ කථා කියන්න පුළුවන්ද ? සමහර විට තමුන්නාන්සෙලා දන්නවා ඇති—ඇත්ත වශයෙන්ම දැනගතයුතු කරුණක්—රතුළූනු ආදී ද්‍රව්‍යවල මිල වැඩි වී තිබෙනවා නම් එයින් ප්‍රයෝජනය ලැබී තිබෙන්නෙ වගා කරන්නන්ට නොවන බව. එයින් නියම ප්‍රයෝජනය ලැබී තිබෙන්නෙ, වාසි ලැබී තිබෙන්නෙ, වැඩි මිලක් යන්නෙ වෙළඳාම කරන වෙළෙන්දාත්, නිපදවන්නාත් අතර සිටින පුද්ගලයාට බව සමහර විට තමුන්නාන්සෙලාත් දන්නවා ඇතී. තත්ත්වය එසේ නම් මෙවැනි ප්‍රකාශයක් කරන්නෙ මොන කාරණයක් නිසාද ?

තමුන්නාන්සෙලාට මේවා ගැන කියන්න වුවමනා කරන්නෙ නැහැ. බලන්න අද "ඩේලිනිව්ස්" පත්‍රය අරගෙන. එහි මුල පිටුවෙම තිබෙනව, සහල් එළවලු ආදිය පහසුවෙන් ලබාගැනීමටය කියා රේස් පිටියෙ පිහිටුවන ලද වෙළඳපොල ගැන ප්‍රවෘත්තියක්. අද වෙලා තියෙන්නෙ මොකක්ද ? තමුන්නාන්සේගේ පොලීසිය පැන රතු ලූනු වැඩි මිළට විකුණූ කීප දෙනකු අල්ලාගෙන තිබෙනවා නේද ? තමුන්නාන්සේලා ඇති කළ ස්ථානයකමයි රතු ලූනු වැඩි මිළට විකුණා තිබෙන්නේ. ජාතික පොළේ එහෙම නැත්නම් පෝය පොළේ ඊයේ පෙරේදා එහෙම දෙයක් වුණා නේද ? ඉතින් මෙයින් පෙනෙන්නේ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

තමුන්නාන්සේලා කියන පරිදි නිෂ්පාදනය කරන ගොවියාට වැඩි ප්‍රයෝජනය ලැබෙන බවද? ඇත්තෙන්ම නියම ප්‍රයෝජනය නෙළා ගන්නේ ගොවියා නොව වෙළෙන්දායි. වැලිමඩ පැත්තේ ගෝවා ගෙඩියක මිළ කීයද? ඒ වගේම කොළඹ ගෝවා රාත්තලක් විකුණන මිළ කීයද? ඇඹිලිපිටිය පැත්තේ එළවළු මිළ කීයද? අද කොළඹ එළවළු මිළ කීයද? ඉතින් කවුද ප්‍රයෝජනය ලබන්නේ? තමුන්නාන්සේලා මේ අදහස් උඩයි, වැඩ කර තිබෙන්නේ. වැරදි මාර්ගයක ගොස් අග්‍රාණ්ඩුකාරතුමා ලවා මේ විධියේ නිසරු කථාවක් ඉදිරිපත් කරවා තිබෙනවා. අග්‍රාණ්ඩුකාරතුමාගේ දේශනය ඉදිරිපත් කරන්නට පෙර මේ ආණ්ඩුව මේ රටට දී තිබෙන වැදගත් වරප්‍රසාද ගැන තමුන්නාන්සේ මහ පුරසාරම් කිව්වා. මේ ආණ්ඩුවෙන් රටට දුන් වැදගත් වරප්‍රසාද ගැන ආඩම්බරයෙන් ප්‍රකාශ කළා. නමුත් මේ කරුණුවලින් පෙනී යන්නේ ඇත්තෙන්ම තමුන්නාන්සේලා මේ රටේ දුප්පත් ජනතාවට දී තිබෙන්නේ දුකක් කරදරයක් බවයි.

තව දුරටත් මෙසේ කියා තිබෙනවා :

"Of course these prices will slide down once local production catches up with demand."

ඇත්තෙන්ම අපේ ගරු රාජ්‍ය ඇමතිතුමා මේ තරම් ළාමක ප්‍රකාශ කිරීම ගැන මා පුදුම වෙනවා. එතුමා දැන් ඔය පැත්තට වෙලා අවුරුදු දෙකහමාරක් වෙනවා. ඒ කාලය තුළ බඩු මිළ අඩු වුණේ කොයි අවස්ථාවේද? ක්‍රමානුකූලව බඩු මිළ නැංගා මිස අඩු වුණේ නම් නැහැ. ආභ්‍යන්තරික හෝ බාහිර බඩුවල මිළ බැස්සේ කොයි අවස්ථාවේද? අපට පැහැදිලි වශයෙන් දැන ගන්නට තිබෙන්නේ නම් හැමදාම ක්‍රමානුකූලව බඩු මිළ ඉහළ ගිය බවයි. එය හොඳටම පැහැදිලියි.

තමුන්නාන්සේගේ ප්‍රකාශයේ නිසරු බව පහසුවෙන් ඔප්පු කරන්නට පුළුවනි. මැද සිටින වෙළෙඳුන් වැඩි ප්‍රයෝජනය ලබා ගන්නවා නම් කවදාකවත් ඔවුන් මිළ අඩු කරන්නට සූදානම් වන්නේ නැහැ. ඔවුන් නිතරම උත්සාහ කරන්නේ නොයෙකුත් මාගීවලින් මිළ වැඩිවීම තහවුරු කර ගන්නටයි. බොම්බයි ලූනු, රතු ලූනු හා අභ්‍යන්තරික එළවළු වර්ග ආදියේ මිළ බස්සන්නට බැරි වී තිබෙන්නේ ඒ නිසයි. අසවල් තැනට පොලීසිය පැන්නායයි පත්‍රවල ඉදහිට සඳහන් වෙනවා. එහෙත් අතරින් පතර කරන වැටලීම්වලින් කවදාවත් පළල් මහජනතාවට සෙතක් නොලැබෙන බව තමුන්නාන්සේ පිළිගත යුතුයි.

ඒ ප්‍රකාශයේ හාස්‍යජනක තැනක් ඊළඟට පෙන්වන්නම් :

"In the meantime we have eased the problem of rising costs, a problem to other sections of the population by giving a measure of rice free."

ඇත්තෙන්ම මේක හිනාවට කාරණයක් නොවෙයිද? තමුන්නාන්සේලා ඒ තරම්ම නිසරු බොළඳ අදහස් ඇති උදවියද? හාල් සේරු දෙකෙන් එකක් කපා අනෙක නොමිළයෙ දුන්නට ඒ කැපූ සේරුව ගන්න මහජනයට ඕනැ වන්නෙ නැද්ද? දැන් බොහෝ පළාත්වල මහ අස්වැන්න ලබාගෙන මාස දෙක තුනක් ගත වී තිබෙනව. ඒත් හාල් සේරුවක මිළ කීයද? අපේ පළාත්වල තත්ත්වය මට කියන්න පුළුවනි. ගලුයි වැලියි එක්ක ගන්නව නම් හාල් සේරුවක් රුපියලයි. තරමක් දුරට හොඳ හාල් සේරුවක් රු. 1.20 යි.

ගරු මන්ත්‍රිවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
සුද්ධ කරල ශත 80 යි.

ආචාර්ය ඒන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
ඒ තමුන්නාන්සෙගෙ ආසනයෙ වෙන්න ඇති. අපේ පළාත්වල තත්ත්වය ඊට වෙනස්. තමුන්නාන්සෙලාට විශේෂ සැලකිල්ලක් තිබෙන බව අප දන්නව. අප හැමදම කියන්නෙත් ඒක තමයි. හැන්ද තමුන්නාන්සෙල අතේ තිබෙන නිසා ඕන හැටියට බෙදා ගන්න බව අපට පෙනෙනව. එහෙත් අපේ පළාත්වල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජනතාවට ඒ සෙත නැහැ. ඇත්ත වශයෙන්ම, ඇතැම් පළාත්වල හාල් සේරුවක මිළ ඊටත් වඩා බොහොම වැඩියි. සමහර ප්‍රදේශවල රු. 1.40 යි, 1.60 යි, 1.80 යි.

**ටී. බී. ඉලංගරත්න මයා.** (කොලොන්නාව)
*(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்ளுவ)*
(Mr. T. B. Ilangaratne—Kolonnawa)

රේඩියෝ එකේ කියන්නෙත් හාල් සේරුවක මිළ රු. 1.10 සිට 1.60 දක්වා වන බවයි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

තමුන්නාන්සෙලාගෙ ගුවන් විදුලි ප්‍රචාරයෙන් කියන්නෙත් හාල් සේරුවක මිළ රු. 1.10 සිට 1.60 දක්වා බව කොලොන්නාවෙ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. ඉලංගරත්න මයා.) කියනවා. කඩාකප්පල් කාරයින් වෙන්න ඇති ඔව කියන්නෙ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

සම්බ රු. 1.60 යි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

තමුන්නාන්සෙල මහජනයා රවටන්නට යම් යම් ප්‍රකාශ නොකරනව නම්, හාල් සේරුව කැපීමෙන් මහජනයට සැහැල්ලුවක් වෙනුවට විශාල බරක් උසුලන්නට සිදුවුණු බව රාජාසන කථාවෙන් අවංකව ප්‍රකාශ කළ යුතුව තිබුණ නේද? මේ කරුණු අනුව බලන විට අද ජීවන වියදම් ලේඛනය සකස් කිරීමත් සම්පූර්ණයෙන්ම ප්‍රයෝගයක් බවට පත්ව තිබෙන බව පෙනෙනවා. අද ජීවන වියදම් ලේඛනය සකස් කෙරෙන්නෙ ජනතාවට නොමිළයෙ දෙන හාල් සේරුව ගැන පමණක් සලකාගෙනයි. හාල් සේරු දෙකෙන් එකක් කැපීම නිසා ඒ වෙනුවට පිටින් වැඩි ගණනට මහජනයට ගන්න සිදුවන හාල් සේරුවෙ මිළ සඳහන් නොකර, එකතු නොකර, අද ජීවන වියදම් ලේඛනය සකස් කරනවා. ජීවන වියදම් අංකය අද තිබෙන්නෙ, 113.4 ක් හැටියටයි. එහෙත්, මහජනතාවට වැඩි ගණනට ගන්නට සිදුවී තිබෙන හාල් සේරුවෙ මිළත් එකතු කොට නියම විධියට ජීවන වියදම් ලේඛන සකස් කරතොත් ඇත්ත වශයෙන් ජීවන අංකය 125 ට නගින බවයි නිළධාරි මහත්වරුන් කියන්නෙ. මේකයි ඇත්ත තත්ත්වය.

1965 මැතිවරණ කාලයෙදී, ජීවන අංකය සකස් කිරීමේ එදා තිබුණු පිළිවෙළ මහා ප්‍රෝඩාවක්යයි තමුන්නාන්සෙලා ප්‍රකාශ කළා. එහෙත් අද එය ඊට වඩා සිය ගුණයකින් වැඩි ප්‍රෝඩාවක් වී තිබෙනවා. ජීවන වියදම පිළිබඳ සම්පූර්ණ ඇත්ත ප්‍රකාශ කරන්නෙ නෑ. නියම තත්ත්වය ඒකයි. එවැනි තත්ත්වයක් තියෙද්දි තමුන්නාන්සෙල මහජනයා මුලා කරන්නට, මහජනයගෙ ඇස්වලට වැලි ගසන්නට නොයෙක් ආකාරයෙ බොරු ප්‍රකාශ කරනවා.

මීටත් වඩා වැදගත් ප්‍රශ්නයක් මෙහි මතුවී තිබෙනවා. ඒ ගැනත් වචන ස්වල්පයක් කීම සඳහා මිනිත්තු 4 ක් 5 ක් ගත කරන්නට මා බලාපොරොත්තු වෙනවා. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පිටරටින් ගෙන්වීම තහනම් කළ විට එම ද්‍රව්‍යවල හිඟයක් ඇතිවී ඒවායේ මිළ වැඩි වන බවත් එසේ මිළ වැඩිවීම නිසා එම ද්‍රව්‍ය මෙහිම නිෂ්පාදනය කර ගැනීමට ගොවියා තුළ ලොකු උනන්දුවක් ඇති වී එය ඔවුන් වගා කිරීමට බහින්න හේතුවක් බවත් ඒ අනුව යම්කිසි කාලයක් තුළදී, බඩු හිඟය නිසා ඉහල ගිය මිළ බැසිය යුතු බවත් මේ ආණ්ඩුව ප්‍රතිපත්තියක් වශයෙන් කියනවා.

"Supply and demand will settle themselves and you get a fairly level equitable price."

ඉල්ලුමත් නිෂ්පාදනයත් සංසන්දනය වී ජනතාවට සාධාරණ මිළකට බඩු ගන්නට පුළුවන් වන අවස්ථාවක් ඇති වෙනවාය යන න්‍යායක් මේ ආණ්ඩුව ඉදිරිපත් කරනවා. මේ න්‍යායෙ ඇත්ත නැත්ත දැන් අපි පොඩ්ඩක් හොයා බලමු. මෙහි තිබෙන වැරදි දැන් මොහොතකට පෙර මා තමුන්නාන්සෙට පැහැදිලි කළා. එසේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

නැත්නම් මේ න්‍යාය සෑහෙන ප්‍රමාණයකට සිදුරු කරන්න පුළුවන්. ඇත්ත වශයෙන් ම අපේ රටේ බඩු මිළ ඉහළ නැගීමේ ප්‍රයෝජනය ගන්නෙ ගොවියා නොවෙයි. බඩු මිළ ඉහළ නැගීමේ ප්‍රයෝජනය ගන්නෙ වෙළඳාම් කරන මිනිහා නම් ඔය ප්‍රශ්නය විසඳෙන්නෙ නැහැ. එපමණක් නොවෙයි, සෑහෙන කාලයක් ගත වෙනව, මේ වැඩ පිළිවෙළ ඇති කරන්න. ඒ කාලය තුළ මහජනයාට ඇති වන්නාවූ අමාරුකම් එමටයි.

නමුත් මේ සිදුරු දෙකම පැත්ත කට දමා අපි බලමු බලාපොරොත්තු වන දේ ඉෂ්ට වෙනවාද කියා. බඩු නිෂ්පාදනය සැලැස්මක් උඩ සිදු නොකරන නිසාත්—බඩු නිෂ්පාදනය ඕනෑවට වඩා වැඩි වීම නිසාත්—මේ අදහස ඉටු කර ගැනීමට බැරි බව තමුන්නාන්සේලාට ඔප්පු කිරීමට මට අමාරු වෙන්නෙ නැහැ. යම් යම් අංශවල නිෂ්පාදනය වැඩි වන්න පුළුවන්. සමහර විට සෑම අතිරේක ආහාර වගාවක්ම වැඩි වන්න පුළුවන්. ඒ අන්දමට නිෂ්පාදනය වැඩි වුනාම මිළ බසින්නට ඉඩ තිබෙනව. එසේ මිළ බැස්සම—ගොවිතැන් කරන උදවියට ලැබෙන පාලන මිළ බැස්සම—නිෂ්පාදනය අඩු වෙනව. එතකොට මොකද වෙන්නෙ? දිගටම දියුණුවක් ඇති වන්නෙ නැහැ. දියුණුව එක මට්ටමක පවතින්නෙ නැහැ. දියුණුව නගිනව, බහිනව; නගිනව, බහිනව. ඔය කාලය තුළ පාරිභෝගිකයත්, ගොවිතැන් කරන්නාත් යන දෙදෙනාම අනතුරේ වැටී සිටිනව. මේ නිසා තමයි, අද ලංකාව මේ න්‍යාය පිළිගෙන වැඩ කළත් අනික් රටවල් මේ න්‍යාය පිළිගෙන වැඩ කරන්නෙ නැත්තෙ.

අද එංගලන්තය කිරි නිෂ්පාදනය කරන උදවියටත්, බිත්තර නිෂ්පාදනය කරන උදවියටත් රන් පවුම් කෝටි 35 ක පමණ මුදලක් දෙන බව තමුන්නාන්සේලා දන්නව. ඒ වගේම ඇමෙරිකාවත් ඒ සඳහා ඩොලර් කෝටි ගණනක් වියදම් කරනව. එසේ ආධාර මුදල් දෙන්නෙ වගාව වැඩි කරන්නය කියා නොවෙයි, වගාව නවත්වන්නය කියායි. ඕනෑවට වඩා වගා කළොත් මිළ බහිනව. ඒ නිසා ඒ මිළ යම් තත්ත්වයක තබා ගැනීම සඳහා අද ඇමෙරිකන් ආණ්ඩුව වගා නතර කරන්නය කියා ගොවීන්ට ආධාර මුදලක් දෙනව. ඔය තත්ත්වය නියම සැලැස්මක් උඩ නිෂ්පාදනය නො කරන—ධනපති ක්‍රමය තිබෙන— සෑම රට කම තියෙනව. ජර්මනියෙත් ඔය තත්ත්වය තියෙනව, ප්‍රංශයෙත් ඔය තත්ත්වය තියෙනව.

මේ අවුරුද්දේ මේ ආහාර ද්‍රව්‍යය වගා කරන්න ඕනෑ මේ තරමටය කියා නියම සැලැස්මක් අනුව වැඩ කරනවා නම් ඔය ප්‍රශ්නය මතු වන්නෙ නැහැ. එසේ නොකරන නිසා තමයි—එළවළු හෝ වේවා, වියළි මිරිස් හෝ වේවා, රතු ළූනු හෝ වේවා, වෙනත් ද්‍රව්‍යයක් හෝ වේවා සීමාවක් නැතිව සෑම දෙනකුටම වගා කිරීමට ඉඩ දී තිබෙන නිසා තමයි—ඒ හේතු වෙන් මිළ පිළිබඳ ස්ථිර තත්ත්වයක් නැති වන නිසා තමයි මේ විධියට ආධාර මුදල් දීමට සූදානම් කර තිබෙන්නෙ.

අපේ මේ අධාර කිරීම් සම්බන්ධව ලෝක බැංකුව මැළි වන්නෙ ඇයි? එංගලන්තයට ඒක කරන්න හොඳ නම්, ඇමෙරිකාවට ඒක කරන්න හොඳ නම් අපේ ගොවිතැන් කරන අයට ආධාර දීමක් වශයෙන් මේ මුදල් ගෙවීම නරක ඇයි කියා මේ ආණ්ඩුවට ලෝක බැංකුවෙන් අහන්න බැරි ඇයි? තමුන්නාන්සේලාට මම ඒ සම්බන්ධව දීර්ඝ වශයෙන් කියන්න වුවමනා නැහැ. තමුන්නාන්සේලා ඉදිරිපත් කළ සැසි වාර්තා දෙකක් මගේ අතේ තිබෙනව. එකක් "Foreign Exchange Problems of Ceylon" නමැති පොත. අනෙක "Recent Economic Trends in Ceylon" නමැති පොත. මේ පොත් දෙක කියෙව් වොත් තමුන්නාන්සේලා පුදුම වේවි. හාල් සේරුවක් කැපීමේ අවශ්‍යතාව, හාල් සම්බන්ධයෙන් රජයෙන් වියදම් කරන සහනාධාර මුදල අඩු කිරීමේ අවශ්‍යතාව ගැන මේ පොත් දෙකේ 16 පොළක කියා තිබෙනව. ඒ උපදෙස් තමයි, මේ ආණ්ඩුව පිළිපැද්දෙ. මේ පොත් දෙකේ කියා තිබෙන දේ තමුන්නාන්සේලා විසින් අකුරෙන් අකුරට ඉෂ්ට කර තිබෙන හැටි අයවැය විවාදයේදී මා ඔප්පු කරන්නට ලෑස්තියි. මා මේ පොත් දෙක බොහොම කල්පනාකාරීව කියවා තිබෙන නිසා මගේ තර්කය පැහැදිලි කිරීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහා තමුන්නාන්සේලා ඉදිරියේ මේ පොත් දෙකෙන් අදාළ කොටස් කීපයක් කියවන්නට කැමතියි :

"The government appears"—

I am reading from "Recent Economic Trends—Ceylon", page 6, paragraph 7 :

"The government appears to have decided not to run the political risk of making a frontal attack at the present time on any of these issues, and has not yet prepared a program of action for gradual or later implementation which will have an effect on the allocation of resources between consumption and investment."

That was in September 1966, and in December you did it. Paragraph 8 says :

"The situation in Ceylon today is thus not a happy one."

Then, what follows? Page 17, paragraph 33 says :

"One of the main contributing factors to this fiscal imbalance has been the gross subsidy payments on food, etc., whose growth has been continuous and so far unstoppable because of the highly charged political atmosphere engendered by even a discussion of the issue."

Paragraph 34 says :

"It is essential that the action taken to increase output—by increasing the proportion of total resources devoted to investment and making the best possible use of the capital stock of the country—be effective in raising economic growth significantly ahead of population growth. Unless such a trend is achieved—and it clearly cannot be permanently achieved by external assistance alone—the danger exists that Ceylon will slide from one crisis to the next, continuously requiring either emergency assistance or alternatively facing the necessity of cutting the inflated standard of living."

All these are nicely set out here and you have carried out the instructions given.

Page 27, paragraph 62 :

"As is stressed in the next chapter, and as was emphasized by the Bank and participants at the first Aid meeting on Ceylon, and as was agreed by the Ceylon government at the time."——

At the first Aid meeting the Ceylon government agreed.

——"action was and is necessary on the part of Ceylon to improve the mobilization of resources for developmental purposes so as to reverse the trends described above towards a declining investment rate, and to modify the many policies and pratices in Ceylon—income redistribution policies, welfare policies, pricing policies, etc.—so as to remove the avoidable obstacles to a more rapid rate of growth."

All these things you have faithfully carried out in your subsequent Budget.

Page 33, paragraph 79 :

". . . . it seems inevitable that a change must be made in the largest and most rapidly growing element—the food subsidies."

Right through in this report the advice given—more than advice, almost threats—is that they must carry out these policies if they are to get any assistance.

Page 34, paragraph 83 :

"In the meantime, pending the emergency of a proposed system which would meet the economic and social objectives at lower cost, a decision to hold the subsidy at its present level of around Rs. 500 million would, in itself, provide a large part of the financial resources necessary over the next few years."

That is precisely what the Hon. Minister of Finance said in his last Budget Speech—that the subsidy was to be contained at Rs. 500 million. All that is here in black and white. This is what they did.

May I now tell you what "The Foreign Exchange Problem of Ceylon" says? This is actually what the World Bank says. Your budgets have been torn up by the World Bank.

**පී. ජී. බී. කෙනමන් මයා.** (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)

*(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)*

(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

The World Bank is the real Government of Ceylon!

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)

Page 16, paragraph 47 :

"The government has also undertaken to present a budget for 1965-66 that promises to keep the inflationary deficit within the limits stipulated by the agreement with the IMF."

මෙන්න මේ විධියට අපේ අයවැය ලේඛනය සම්පාදනය කරනවාය කියා මේ ආණ්ඩුව ජාත්‍යන්තර මුදල් සංවිධානයට පොරොන්දුවක් දී තිබෙනව. ඒ පොරොන්දුව උඩයි, මේ ආණ්ඩුව අයවැය ලේඛන ඉදිරිපත් කළේ.

"As the minimum, any plan that the Government may devise should provide initially for keeping gross payments for food subsidies constant at the 1965-66 level of about Rs. 475 million and ensure that some reduction below this level is achieved in the following years."

මේ කියූ සීමාවෙන් පනින්නට ඉඩ නොදී සැම විටම ක්‍රියා කරමින් තමයි, මේ ආණ්ඩුව අයවැය ලේඛන ඉදිරිපත් කළේ. ඒ නිසා මේ පොත්වල පැහැදිලි වශයෙනුත්, දීර්ඝ වශයෙනුත් සඳහන් වී තිබෙන්නා වූ වැදගත් තර්ක අයවැය විවාදයේදී ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනව. දැනට තාවකාලික වශයෙනුයි, මේවා කියන්නෙ.

මේ ලියමන කාර්ගිල් මහත්මය 1965 ජූනි 14 වැනි දා ගාමිණී කොරයා මහත්මයාට ලියා තිබෙනව. මෙහි පිටපත් ගරු ඩඩ්ලි සේනානායක මහත්මයටත්, ගරු ජේ. ආර්. ජයවර්ධන මහත්මයටත්, ගරු වන්නිනායක මහත්මයටත් යවා තිබෙනව. එහි අවසාන ඡේදයෙ මොනවද, කියා තිබෙන්නෙ ?

I. P. M. Cargill, Director, Far East Department of the International Bank for Reconstruction and Development, wrote this letter to Dr. Gamani Corea, Economic Secretary to the Cabinet, with copies to the Hon. Dudley Senanayake, the Hon. J. R. Jayewardene and the Hon. U. B. Wanninayake.

The last paragraph reads as follows :

"Consideration should also be given to policies which would minimize the adverse impact of the tax system on private development."——

ඒ මහත්මය කියන ආකාරයට එදා තමුන්නාන්සේලා පොරොන්දුවක් දුන්න. ඒ උඩ තමයි, තමුන්නාන්සේලාට යම් යම් සුළු ආධාර දෙන්නට ඒ අය සූදානම් වුණේ. ඒ උඩ තමයි තමුන්නාන්සෙලාගේ පළමු වැනි අයවැය ලේඛනයෙන්, රුපියල් 2,000 ; 3,000 ; 4,000 ආදි වශයෙන් විශාල බදු ගෙවූ උදවියගෙ බදු බර නිදහස් කර රුපියල් කෝටි 7 ක පමණ බදු නිදහසක් ඔවුන්ට දුන්නෙ. මේ පොරොන්දු තමුන්නාන්සෙලා ඉෂ්ට කළා.

——"adjust the prices of commercial goods and services produced by the Government sector in accordance with costs, and reduce the burden of transfers of government funds for subsidizing the production and consumption of rice and other goods and services."

එක වරක් නොවෙයි, දහසය වරක් මේ පොත් දෙකේ පැහැදිලි වශයෙන් කියා තිබෙනවා තමුන්නාන්සේලා විසින් කළ යුතු දේවල්. තමුන්නාන්සෙලා ඒ අනුව කටයුතු කළ බවයි මම කියන්නෙ. අප කාටවත් භය වන්ට වුවමනා නැහැ. ලෝක බැංකුව කිව්ව නිසා ඉෂ්ට කරන්ට වුවමනා නැහැ. මා මුදල් ඇමති වශයෙන් සිටි කාලයෙදි ලෝක බැංකුවට පැහැදිලි වශයෙන් මේ අදහස් ඉදිරිපත් කළා. කාගිල් මහත්මයාගෙන් මා කෙලින්ම ඇහුව, "තමුන්නාන්සේලා ගොවිතැන් කරන උදවිය වෙනුවෙන් මෙතරම් විශාල මුදලක් වැය කරනව නම් ඇයි අපි වියදම් කළාම නරක" කියා. මේ ආණ්ඩුවට එහෙම කියන්ට බැරි ඇයි ? මේ ආණ්ඩුවට ආත්ම ශක්තියක් නැද්ද, කෙළින් ඉදල ලෝක බැංකුවට මේ ප්‍රකාශය කරන්න ? තමුන්නාන්සෙලා මේ නියාලු විධියට යට වෙලා කටයුතු කරලත් ලබාගෙන තිබෙන ආධාර මොනවද ? ඊයෙ පෙරේද පත්‍රවලින් දකින්ට ඇති, මොනවද ලබාගෙන තිබෙන ආධාර කියා. ජූලි 11 වෙනිදා "ඩේලි නිවුස්" පත්‍රයේ පළ වී තිබුණු ප්‍රවෘත්තියක් මෙන්න :

"$ 40 M Aid Overdue Now".

"Ceylon has still to receive 40 million dollars worth of Aid outstanding from the last two Aid programs, according to estimates prepared by the Ministry of Planning and Economic Affairs."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවුරුදු 2 කට ඉස්සර වෙලා පොරොන්දු වුණු ආධාර තවම ලැබී නැහැ. මෙන්න තත්ත්වය. දණ ගහල සෑම ඉල්ලීමක්ම ඉෂ්ට කරලත් ලැබිල තිබෙන ආධාර මොන වද? එපමණක් නොවෙයි, ශ්‍රී ලංකා මහ බැංකුවේ 1967 මාර්තු මාසයේ වාර්තාවේ 6 වෙනි පිටුවේ මොනවද කියා තිබෙන්නෙ? මෙන්න ඒ කොටස :

"The net external assets of the banking system declined by Rs. 44.8 million in January 1967.... "

එසින් කියවෙන්නෙ 1967 ජනවාරියේදී අපේ විදේශ වත්කම කෝටි 4½ කින් තරම් බැස්ස බවයි.

"The Central Bank's foreign borrowings amounted to Rs. 36.8 million during the month."

පිටරටින් රුපියල් තුන් කෝටි හැට අට ලක්ෂයක් ණය අරගෙනත් තත්ත්වය මේකයි.

"Despite these borrowings the Central Bank's cash balances abroad fell by Rs. 4.1 million during the month."

මා කලින් සඳහන් කළ තරම් විශාල මුදලක් ණයට අරගෙනත් තමුන්නාන්සේලාගේ විදේශ විනිමය ප්‍රමාණය 1967 ජනවාරි මාසයේදී රුපියල් ලක්ෂ 41 කින් බැහැල තිබෙනව. තමුන්නාන්සේලාගේ තත්ත්වය මේකයි.

රාජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කර තිබෙන තවත් වැදගත් කරුණු දෙකක් ගැන වචන දෙකක් කියා මගේ කථාව අවසාන කරන්ටයි, මා බලාපොරොත්තු වෙන්නෙ.

He says :

"So far as I see it Ceylon made a slow but steady economic recovery."

සුළු වශයෙන් වුවත් මේ අවුරුදු 2½ ඇතුළත ක්‍රමයෙන් ආර්ථික දියුණුවක් ඇති වී තිබෙන බව රාජ්‍ය ඇමතිතුමා කියනව. ගොනාගෙ වල්ගෙ වගෙයි දියුණු වෙලා තිබෙන්නෙ. ගොනාගෙ වල්ගේ වගේ හැම වෙලේම පහළටයි යන්නෙ. ශ්‍රී ලංකා මහ බැංකුවේ 1965 වර්ෂයේ වාර්තාව තමුන්නාන්සේලා ළඟ තිබෙනවද? [බාධා කිරීමක්] ඒක තියෙද්දීත් ඇයි මේ ප්‍රකාශය කළේ? තමුන්නාන්සේලාගේ ක්‍රමානුකූල දියුණුව කොහෙද තිබෙන්නෙ?

I read from the Central Bank Report for 1965 :

"In 1965 Ceylon's economic performance, as measured in terms of Gross National Product showed a decline. Whereas in 1964, the Gross National Product at current factor prices increased by 5.8 per cent, in 1965 the increase was only 4.0 per cent. In real terms, that is at constant (1959) prices, this means an increase in 1965 of only 2.0 per cent, in contrast to the increase of 4.4 per cent in 1964. When account is taken of the increase in population by 2.4 per cent, the Gross National Product per capita increased only by 1.7 per cent at current prices; in real terms it actually fell by 0.4 per cent."

අපට දොස් කියාපු අවුරුද්දෙ—1964—තත්ත්වයට වඩා 1965 දී පහළට බැස්සා.

ඒ අවුරුද්දෙ තමුන්නාන්සෙලා දියුණු වෙනවා වෙනුවට පහළට බැස්සා. ඒ ගැන කියා සිටි වෙලාවෙ තමුන්නාන්සෙලා අපට කිව්වෙ මොකක්ද? හා හා ඔය තරම් ඉක්මන් වෙන්න එපා, අපි මේ වැඩ කරන්න පටන් ගත්තා විතරයි, තවම අවුරුද්දක් වත් ගත වුනේ නැහැ. ලබන අවුරුද්දෙ කොයි තරම් ලොකු දියුණුවක් ලැබෙනවද කියා බලන්න. මේ රටේ ආර්ථික තත්ත්වය කොයි තරම් දුරට දියුණු වේදැයි ලබන අවුරුද්දෙ බලන්න, ආදී වශයෙන් නොවෙයිද එදා කිව්වෙ? ඒ අවස්ථාවෙ තව ටිකක් අපට ඉවසන්නෙයි කිව්වා. අපි ඉවසුවා. රාජ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමනි, 1966 තත්ත්වය කුමක්ද? කරුණාකර ඒ ගැන අපට දැන ගන්න සලස්සන්න. වැඩි දුර කියන්න වුවමනාවක් නැහැ. මේ වාර්තාවෙ පළමුවැනි පිටුව පෙරළා බලන්න. පළමුවැනි පිටේ මොනවද තියෙන්නෙ? මම කියවන්නම්.

I read at page 1 of the Central Bank Report for 1966 :

"The rate of increase in the Gross National Product recorded in 1966 was less than that of the previous year."

1965 අවුරුද්දටත් වැඩියෙන් අඩුයි 1966 අවුරුද්දෙ තත්ත්වය.

"In 1965 the Gross National Product at current factor prices increased by 2.9 per cent, but in 1966 the increase was only 1.3 per cent, the rate of increase in 1965 being itself lower than that of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

1964. In fact, the rate of increase of the G.N.P. in 1966 was the lowest recorded since 1961."

1961 අවුරුද්දට පස්සෙ ඔය තරම් පහත් තත්ත්වයක් කවදාවත් තිබුණේ නැති බවයි මධ්‍යම මහා බැංකුව කියන්නෙ. මධ්‍යම මහා බැංකුවෙ වාර්තා ගැන මම එකක් කියන්නම්. ඒවා සකස් කර තිබෙන්නෙ තමුන්නාන්සෙලාට ආධාර වන ආකාරයටයි. අයවැය ලේඛනය ඉදිරිපත් කරන විට කනගාටුවෙන් ඒ බව ප්‍රකාශ කරන්න සිද්ධ වෙනවා ඇති. තමුන්නාන්සෙලාට මේවා සකස් කර දෙන තැනැත්තාමයි තමුන්නාන්සෙලාගෙ වැඩ සැලැස්මේ නායකයා. ඒ නිසා ඔය කාරණයෙදි උන්නැහෙගෙ ඇහත් බේරා ගන්න වුවමනා කරනව.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

කව් ද?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ඇයි තමුන්නාන්සෙ දන්නෙ නැද්ද? ගාමිණී කොරෙයා ගැනයි කිව්වෙ. එයා නම් වැඩිපුර පිටරටවල තමයි ඉන්නෙ.

"In real terms, *i.e.* at constant (1959) prices the increase in the Gross National Product in 1966 was only 1.6 per cent as compared with an increase of 4.6 per cent and 1.8 per cent in 1964 and 1965 respectively."

That is, in 1964 the increase was 4.6 per cent but the increase during your last year was only 1.6 per cent. To read further :

"The increase in population in 1966 was 2.3 per cent as compared with 2.4 per cent in 1965. When account is taken of the increase in population, the Gross National Product per capita actually declined by 1.0 per cent at current prices and 0.7 per cent in real terms."

මේ ක්‍රමානුකූල දියුණුව කොහෙද තියෙන්නෙ? ප්‍රස්තාර සටහන් අනෙක් පැත්තට පෙරළී තිබෙන බවයි පෙනෙන්නෙ. තමුන්නාන්සෙලා ලෝකය වටේ අහසින් ඇවිද නොයෙක් ආකාරයට පොරොන්දු වුණා. තමුන්නාන්සෙලාගෙ අගමැතිතුමා කැමරාවක් අරගෙන විගා කරන්ට වගා කරන්ට කිය කියා රට හැම තැනම යනව. නමුත් මේ රටේ ගොවිතැන් දියුණුවක් ඇතිවී තිබෙනවාය කියා අපට පෙනෙන්නෙ නැහැ. මේ ආණ්ඩුව තව දැවුරුදු හය මාසයක් යාවි. නමුත් ඔය තමුන්නාන්සෙ ළඟ වාඩිවී සිටින ඉඩම් ඇමතිතුමා සිටින තුරු මේ රටේ වැඩ සැලැස්මක් ගෙන යාවිය කියා තමුන්නාන්සේ කවදාවත් විශ්වාස කරන්ට එපා. දේශපාලන වශයෙන් ප්‍රෝඩාකාර යකු පමණක් නොවෙයි ආර්ථික වශයෙන් සම්පූර්ණයෙන් අවුල් වූ මොළයක් තිබෙන මිනිසකු මේ ලංකාවෙ ඉන්නව නම් ඔහු තමයි සී. පී. ද සිල්වා මහත්මයා. එය අපි පැහැදිලි වශයෙන් කියන්ට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රාජ්‍ය ඇමතිතුමා ඊට පසු පුදුම ප්‍රකාශයක් කර තිබෙනව. මේකයි ඒ ප්‍රකාශය :

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

That is not the Throne Speech?

**ආචාර්ය එන්. එම් පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

But there is nothing in your Throne Speech to speak about. [*Interruption*]. These are the words of the Hon. Minister of State :

"In view of these factors I hope personally that the Finance Minister, in his next budget, will present a new approach to our basic economic problems."

රාජ්‍ය ඇමතිතුමා ආණ්ඩුවට අයිති කෙනෙකු නොවෙයිද මෙහෙම කථා කරන්නෙ? මොකටද මේව මෙහෙම ප්‍රසිද්ධියෙ කියන්නෙ? ඇයි අපේ මුදල් ඇමති තුමාට මේව කියන්ට බැරිද? ආණ්ඩු දෙකක් තිබෙනවද? තමුන්නාන්සෙගෙ එක ආණ්ඩුවකුත් මුදල් ඇමතිතුමාගෙ තවත් ආණ්ඩුවකුත් තිබෙනවද? ඇයි මෙවැනි ප්‍රකාශ කරන්නෙ?

He is hoping that the "Finance Minister will present a new approach to our basic economic problems."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉතින් ඇයි මේව මුදල් ඇමතිතුමාට කියන්ට බැරි? මේව අළුත් අදහස් බවයි කියන්නෙ. හොඳයි දැනට තිබෙන අදහස් වල වැරදි මොනවද? මේ අළුත් අදහස්ය කියන ඒව ඊටත් වඩා පුදුමයි. මෙන්න බලන්න.

Then he was asked the question, "When you speak of a new approach, what precisely do you have in mind?"

He replies:

"I have advanced this view consistently..."

නවම ආණ්ඩුවේ කෙනෙකු හැටියට නොවෙයි කථා කරන්නෙ. එහෙම නම් මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරන දේවල් හැම දාම ප්‍රතික්ෂේප කර තිබෙන බවයි පෙනෙන්නෙ.

"We should, as quickly as possible do away with exchange restrictions, import controls, etc."

රාජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සෙල 1953 දීත් මේ වැඩේ කළා මතක නේද? තමුන්නාන්සෙ එදා මේ වැඩේ කළ නිසා තමයි ඔතැනින් යන්නත් සිද්ධ වුණේ. එයින් මොකද වුණේ මේ රටට? තමුන්නාන්සේලාගේ ඒ ක්‍රියාවෙන් මේ රටට විශාල විපත්තියක් සිද්ධ වුණා. තමුන්නාන්සෙ මොනවද මේ කියන්නෙ? මේ රටේ සිටින පෞද්ගලික ව්‍යාපාරිකයින්ට, කළුකඩකාරයින්ට, හෙට්ටි වීදියෙ චෙට්ටියාර්ලට නිදහසේ ඕනෑ තරම් ඕනෑ විධියට මේ රටේ මුදල් පිටරට ගෙන යන්ට ඉඩ දෙන්න ඕනෑය කියායි තමුන්නාන්සෙ මේ කියන්නෙ. මේකයි නියම තත්ත්වය. තමුන්නාන්සෙ නැවතත් අළුත් අදහසක් වශයෙන් ඉදිරිපත් කරන්නෙ ඒකයි. අද ඇමරිකාවෙ නැත්නම් එංගලන්තයෙ තිබෙනවද මේ විධියෙ තත්ත්වයක්? එංගලන්තයේ රන් පවුම් 15 යි රටින් පිට ගෙන යන්ට පුළුවන්. මේ ළඟදී මා පිටරට ගිහින් ආපසු එන අවස්ථාවෙ නොදැනුවත්ව ට්‍රැවලර්ස් චෙක්පතක් මාරු කරගෙන මා ළඟ රන් පවුම් 30 ක් තිබුණා. මගෙන් ඇහුව කොහෙන්ද මේ මුදල් කියා. මේ තරම් ගෙන යන්ට දෙන්න බැහැ. රන් පවුම් 15 යි ගෙන යන්ට දෙන්න පුළුවන් කියා කිව්ව. නමුත් රාජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කරනව මේ රටේ සියලුම සීමා කිරීම් අස් කරන්ට වුවමනාය කියා. වෙන කොයි රටේද එවැනි තත්ත්වයක් තිබෙන්නෙ? එවැනි තත්ත්වයක් ඇමරිකාවෙ තිබෙනවද? එංගලන්තයෙ තිබෙනවද? නැහැ. එහෙම නම් මේ පුංචි ලංකාවෙ තමුන්නාන්සෙ කියන ඔය අදහස ක්‍රියාත්මක කරන්ට පුළුවන්ද? ඇමරිකන්කාරයින් සන්තෝෂ කරවන්ට මේ රට බංකොලොත් තත්ත්වයකට පමුණුවන්ටයි තමුන්නාන්සෙල ඇත්ත වශයෙන්ම බලාපොරොත්තු වෙන්නෙ.

මේ අදහස දරණව ජෝන් එක්ස්ටර් මහත්මයත්. මේ අදහස ගැන මා ඒ මහත්මය සමග තර්ක කර තිබෙනව කීප වතාවක්. ඒ මහත්මය පමණක් නොවෙයි ළඟදී තමුන්නාන්සෙට උපදෙස් දෙන්ට වෙළඳ මණ්ඩලය ගෙන්වපු මගේ පෞද්ගලික මිත්‍රයකු වන ෂෙනෝයි මහත්මයත් මේ අදහස තමයි ප්‍රකාශ කළේ. මම පැය ගණනක් මේ අදහස ගැන ඒ මහත්මය සමගත් තර්ක කළා. මේක සම්පූර්ණයෙන්ම විහිළු අදහසක්. මේ කාලසීමාව තුළ කවදාවත් කරන්ට බැරි අදහසක්. කරන්ට යන අළුත් දේවල් හැටියට තමුන්නාන්සෙල ඕව තමයි කියන්නෙ.

මා මීට වඩා දීර්ඝ වශයෙන් කතා කරන්ට අදහස් කරන්නෙ නැහැ. අග්‍රාණ්ඩුකාරතුමාගෙ දේශනයෙ කිසිම දෙයක් සඳහන් වී නැති බවයි, මා තමුන්නාන්සෙලාට ඔප්පු කරන්ට කල්පනා කළේ. එතුමගෙ කථාවෙ කිසිම වැදගත් ප්‍රශ්නයක් ගැන සඳහන් වෙලා නැහැ. එතුමන්ල කියනව, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කෙරුවාය කියා. මීගමුවෙදි විතරක් නොවෙයි, හැම තැනදීම කියනව. "ජනදින" පත්‍රය තහනම් කර තිබෙන්නෙ, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම උඩද කියා මා අහනව. එපමණක් නොවෙයි, එම අච්චු කන්තෝරුවත් තහනම් කර තියෙනව. "ජනදින" පත්‍රය ගැනත් තමුන්නාන්සෙ ප්‍රකාශ කර තිබෙනව. නමුත් තමුන්නාන්සෙ ප්‍රකාශ කරන දේ නොවෙයි, තමුන්නාන්සෙගෙ නායකතුමා ප්‍රකාශ කරන්නෙ. යම් කෙනෙකුට අපහාසයක් කළාය කියා නඩු දමා තිබෙනව. ඒ ක්‍රියා මාර්ගය පිළිගන්ට අපි ලෑස්තියි. ඒ අනුව උසාවියෙන් දෙන දඬුවමක් පිළිගන්ට අපි සූදානම්, නමුත් ඇයි "ජනදින" පත්‍රයත්, එම පත්‍රය අච්චු ගසන අච්චු කන්තෝරුවත් තහනම් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]
සිය ගණනකට රක්ෂා නැති වෙන තැනට කටයුතු සලසා තිබෙන්නෙ? එම පත්‍රය විරුද්ධ පාර්ශ්වයෙ වැදගත් පත්‍රයක්. යම් වරදක් කළා නම්, ඊට විරුද්ධව නඩු දම්මම; දඩුවම් කළා. එතැනින් සියල්ල අවසානයි. ඒ වැඩ පිළිවෙළ වැරදිය කියන ව නොවෙයි, නමුත් මේ අන්දමට ක්‍රියා කරන්නෙ ඇයි ?

"දිනමිණ", "ඩේලිනිව්ස්", 'ටයිම්ස්' "ඩේලිමිරර්" යනාදි පත්‍ර අපට හැමදාම අපහාස කරන්නෙ නැද්ද? අපි ඇමති වරුන් වශයෙන් සිටියදිත් අපට ඒ පත්‍ර අපහාස කළේ නැද්ද? මැතිනියට අපහාස කළේ නැද්ද? නමුත් තමුන්නාන්සෙල මේ ගෙන යන වැඩ පිළිවෙළ මොකක්ද ? [බාධා කිරීමක්]

මස් කෑම නරක වෙන්ට පුළුවනි; හොඳ වෙන්ටත් පුළුවනි. ඒක වෙනම ප්‍රශ්න යක්. ඩඩ්ලි සේනානායක මැතිතුමාගෙ සිතට අමාරුවක් තිබෙනව නම් නඩු දැම් මට අපේ විරුද්ධයක් නැහැ. එහි වරදක් තිබෙනව නම් අපි දඩුවම් විඳින්නම්. නමුත් පුද්ගලයකුට අපහාස කළාය කියා පත්‍රය තහනම් කරන්නෙ ඇයි? මේ මොන ප්‍රජාතන්ත්‍රවාදයක්ද ?

තමුන්නාන්සෙල මේ කාලය තුළ කම් කරුවන්ට දහසක් දුක් දී තිබෙනව. ඔවුන් අස් කර තිබෙනව. ස්ටැන්ලි ජයවීර නමැති මහත්මයා ගැන අපි දන්නව. ඒ මහත්මයගෙ වැඩ තහනම් කර දැන් අවු රුදු දෙකහමාරක් වෙනව. නමුත් ඒක චෝදනා පත්‍රයක්වත් නැහැ. පඩියක් ලැබෙනවද කියන්ට මා දන්නෙ නැහැ.

**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.**
(අත්තනගල්ල)
*(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டார நாயக்க—அத்தனகல்ல)*
(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)
පඩියෙන් බාගයක් ලැබෙනව.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
පඩි බාගයක් ලැබෙන බව කියනව. මේක හරිද? ඒ මහත්මයා යම් වරදක් කර තිබෙනව නම් ඊට චෝදනාවක් ඉදිරි පත් කර අස් කර දමන්න. ඒක වෙනම දෙයක්. නමුත් කිසිම චෝදනාවක් නො කර නිකම් රස්තියාදු කරවන්නෙ ඇයි? ඒ මහත්මයාට වෙනත් රක්ෂාවක් කරන් ටවත් හැටියක් නැහැ. මේ අන්දමට කී දෙනෙක් සිටිනවද ?

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)
What about the army officers on compulsory leave for over $1\frac{1}{2}$ years ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
Yes. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කර නව. ජාතික සමගිය ගැන කතා කරනව. මොනවද ජාතික සමගියක් ගැන කර තිබෙන්නෙ? ඇත්ත වශයෙන්ම මහ ජාතිය තමුන්නාන්සෙල කෙරෙහි කිසිම විශ්වාසයක් තබන්නෙ නැහැ. මේකද ජාතික සමගිය? මේකද ප්‍රජාතන්ත්‍රවාදය? මෙවැනි ව්‍යාපාරවලින් ඉදිරි කාලයේදී මේ රටට යහපතක් වේය කියා සිතන්ට බැහැ. එම නිසා අපගේ අතුරු යෝජනා තමුන් නාන්සේලාට මෙම අවසථාවෙදි ඉදිරිපත් කරන්ට මා බලාපොරොත්තු වෙනව.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
You might propose all four amendments together if the House agrees.

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)
Aye !

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
I do not want to take more time than is necessary.

I formally move the four amendments on the Order Paper.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

The main amendment deals with the general political situation, the second amendment deals with the whole question of the Middle East War, the third amendment deals with the question of Vietnam, and the last amendment deals with the question of language.

I submit these amendments for the consideration of all hon. Members.

**සංශෝධන මෙසේ ය :**

*திருத்தங்கள் வருமாறு :*

*The amendments are as follows :*

I

"සංශෝධනයක් වශයෙන් ස්තුති යෝජනාව අගට එකතු කිරීමට :

'එතෙකුදුවුවත්, උතුමාණන් වහන්සේගේ රජය, එහි නීත්‍යනුකූල නිල කාලයෙන් අඩක් වූ ඉකුත් සැසි වාර දෙක තුළදී,

(අ) ලංකාවේ ස්වාධීනත්වයට හා ඒකීයත්වයට අන්තරායකර ;

(ආ) ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට සහ නිදහසට හානි පැමිණවූ ;

(ඇ) ආර්ථිකයෙහි බැරෑරුම් හා ඉතා ගැඹුරු පිරිහීමක් මෙන්ම ජනතාවගේ ජීවන තත්ත්වයෙහි සීඝ්‍ර පහත වැටීමක් ඇති කළ ;

(ඈ) දේශීය අභිමතාර්ථයන්ට සහ ජනතාවගේ ජීවිතයට සම්බන්ධ අවශ්‍යතාවන්ට පාඩු වන සේ විදේශීය හා දේශීය මුල් බැස ගත් ස්වාර්ථවාදී කණ්ඩායම්වලට පුළුල් අනුග්‍රහයන් ලබාදුන් ;

(ඉ) දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව පළිගැනීමේ ව්‍යාපාර ගෙනයනු සඳහාත් පළිගැනීමේ චේතනාවෙන් රජයේ සේවකයන්ට දඬුවම් පැමිණවීම සඳහාත් පරිපාලනමය බලතල අයුතු ලෙස යෙදවීම ලක්ෂණ කොට ගත් ;

(ඊ) 1965 මහා මැතිවරණයේදීත්, පසුව පැවැත්වූ පාර්ලිමේන්තු අතුරු මැතිවරණවලදීත්, පාර්ලිමේන්තුවේ පළමුවැනි හා දෙවන සැසිවාරයන්ට කරන ලද උතුමාණන් වහන්සේගේ කථාවලදීත් දෙන ලද බොහෝ පොරොන්දු ඉටු නොකළ අතර ඒවාට පටහැනිවූ ප්‍රතිපත්ති අනුගමනය කළ හෙයින් ද ;

තවද, උතුමාණන් වහන්සේගේ කථාව—

(1) රජයේ දේශපාලන, ආර්ථික සහ සදාචාරමය බංකොලොත් බව මෙන්ම ලංකාවත්, ලාංකික ජනතාවත් දැනට වැටී සිටින දේශපාලන ප්‍රතිගාමිත්වය, පරිපාලනමය ක්‍රියා විරහිත භාවය සහ ආර්ථික පරිහානිය පිළිබඳ මඩ වගුරින් ගොඩගැනීමට හැකි අංග සම්පූර්ණ ප්‍රතිපත්තියක් තබා පැහැදිලි ප්‍රතිපත්තියක් පමණවත් සකස් කිරීමට රජයට කිසිසේත්ම නුපුළුවන් බව හෙළි කරන හෙයින් ද ;

(2) විශේෂයෙන්ම උඩරට පෙදෙස්වල, ගොවිජනතාවගේ සහ දේශීය ජනතාවගේ වෙනත් කොටස්වල නීත්‍යනුකූල අයිතිවාසිකම්වලට කොපමණ පාඩු සිදුවූවත්, බොහෝ සේ බිය සැක ඇති කළ, ඉමහත් විරෝධයට හේතුවූ ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැගීම) පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට රජය අධිෂ්ඨානයෙන් සිටින බව පෙන්වන හෙයින් ද ;

(3) රජය සෑදුම් ලබන දේශපාලන පක්ෂ විසින් පාලනය කැරෙන ප්‍රාදේශීය බල මණ්ඩල ඇතුළුව නොයෙක් ප්‍රාදේශීය බල මණ්ඩල විසින් ද සමස්ත ලංකා ද්‍රවිඩ සංගමය වැනි සුළු ජන අභිමතාර්ථ නියෝජනය කරන වෙනත් දේශපාලන පක්ෂ විසින් ද ප්‍රකාශ කර ඇති පුළුල් විරෝධය නොතකා, දැනට දිස්ත්‍රික්ක සභා පිහිටුවීම තරයේ ඉල්ලා සිටින එකම දේශපාලන පක්ෂය වූ ඉලංකායි තමිල් අරසු කච්චියේ ඇඩි ඉල්ලීම සලකා දිස්ත්‍රික්ක සභා පිහිටුවීමට රජය අධිෂ්ඨානයෙන් සිටින බව දක්වන හෙයින් ද ;

උතුමාණන් වහන්සේගේ කථාව, විශේෂ වශයෙන්—

(i) සියලු බලතල මහජනතාවගෙන්ම ලබා ගන්නා වූ සත්‍ය වශයෙන් ස්වාධීන, ස්වෛරී සහ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් ඇති කරන නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් ක්‍රියාත්මක කිරීමට පියවර කිසිත් යෝජනා කිරිමට අපොහොසත් වන හෙයින් ද ;

(ii) දින දහයක් හැර ගතවූ සැසි වාරය පුරා පැවති පක්ෂග්‍රාහී දේශපාලන පරමාර්ථයන් සඳහා යොදවනු ලබන මූළමණීන් අසාධාරණ හදිසි තත්ත්වය අස් කර ගැනීමට රජය අදහස් කරන බවක් පෙන්නුම් නොකරන හෙයින් ද ;

(iii) රැකී රක්ෂා විරහිත භාවය සහ දිනපතා ප්‍රයෝජනයට ගැනෙන අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන්ගේ අධික මිල ගණන් සහ ඒවා හිඟවීම පිළිබඳ දරුණු ප්‍රශ්න විසඳීම පිණිස යෝජනා කිසිත් ඉදිරිපත් කරනු තබා, මෙම ප්‍රශ්න ගැන සඳහනකුදු නොකරන හෙයින් ද ;

(iv) කලින් පැවැති සහල් සලාකය නැවත ඇති කරලීමට හෝ මහ කන්නයේ අස්වැන්න අතින් වාතීවක් පිහිටුවීම පිළිබඳව උදන් අනතත් ආරෝග්‍යශාලාවල රෝගීන්ටවත් ප්‍රමාණවත් බත් ආහාර සැපයීමට හෝ රජය අදහස් කරන බවක් හෙළි නො කරන හෙයින් ද ;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

(v) වාරිමාගී බද්ද අහෝසි කිරීම, ගොවි ජනපද වල කට්ටිකරුවන්ගෙන් අය කෙරෙන අධික අක්කර බද්ද අඩු කිරීම, පෞද්ගලික මුක්වර් හිමියන් ඇනට කරන, ගැමියන් සූරාකෑම නතර කිරීම, බැංකු හා වෙනත් ණය දෙන ආයතනවලින් ගන්නා ණය මුදල් සඳහා ගෙවිය යුතු පොළිය අඩු කර ලීම හා වෙනත් යම් යම් පියවර ගැනීම යන ක්‍රම යොදා, ඒ මගින් ගැමි ජනතාවට අද උසුලන්නට සිදුවී ඇති බර සැහැල්ලු කරන අදහසක් රජය කෙරෙහි ඇති බවක් සඳහන් නොවන හෙයින්ද;

(vi) ජීවන වියදම ඉහළ යෑම හේතුකොටගෙන රාජ්‍ය හා පෞද්ගලික අංශවල නියුක්ත සේවකයින්ගේ නියම වේතන හා වැටුප් පිරිහීම නිසා ඒ අයට සිදුවී ඇති පාඩුව මකාලීම සහතික කරනු සඳහා යෝජනා ඇතුලත් නොවන හෙයින්ද;

(vii) මාළු පිටරට යැවීම ගැන කියමින් පුරසාරම් දොඩන නමුත්, ලංකාවේ පාරිභෝගික යන්ට ප්‍රමාණවත් තරම් මාළු සාධාරණ මිළට සපයා දීමටවත්, මාළු ඇල්ලීමේ යෙදී සිටින ජනතාවට විඳින්නට සිදු වී ඇති නොයෙකුත් දුෂ්කරතාවන් අඩුකරලීමටවත් අදහස් කරන බවක් සඳහන් නොවන හෙයින්ද;

(viii) අත් යන්ත්‍රවලින් රෙදි වියීමේ හා හස්ත කර්මාන්තවල යෙදී සිටින විශාල ජනකායක ගේ අභාග්‍යයටත්, විනාශයටත් හේතු වූ රජයේ වර්තමාන ප්‍රතිපත්ති අත්හරින්නට රජය අදහස් කරන බවක් නොපෙන්වන හෙයින්ද;

(ix) රජයේ කාර්මික ප්‍රතිපත්තිය වනුයේ දැනට පවත්නා කාර්මික ව්‍යාපාරවලින් බොහෝම යකගේ ප්‍රගතියට හානි කරමින් ඒවායේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වයටද බාධා කරන අතර, කලින් පැවති රජය තිබුණු කාලයේ ආරම්භ කරන ලද ව්‍යාපාර එසේම කර ගෙන යැම හා ඒවා පුළුල් කිරීම විනා ඊට වැඩි යමක් නොකිරීම බව හඟවන හෙයින්ද;

(x) රජයේ ඉඩම් අක්කර දහස් ගණන් අති රේක ආහාර ද්‍රව්‍ය වගාකිරීම සඳහා දේශීය හා විදේශීය ධනේශ්වර ව්‍යාපාරවලට පවරා දීමටත්, කුඹුරුවල වල් නෙලීම පිණිස දහස් ගණන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් බලහත් කාරයෙන් යෙදවීමත්, දේශපාලන පර මාර්ථ අරමුණු කොටගත් " ගොවි හමුදා වක් " ඇති කිරීමත් වැඩි වැඩියෙන් ආහාර වගා කරන්නැයි අසන්නන්ට ඇවි පිලි කරන හරයක් නැති ගී අසන්නන්ට තිත්ත වන තෙක් තොර තෝන්වියක් නැතිව ලංකා ගුවන් විදුලි සංස්ථාව ලවා නැවත නැවත ප්‍රචාරය කරවීමත්, ආහාර අතින් ස්වයංපෝෂිතභාවය ලඟාකර ගැනීම සඳහා දරණ " මහා ප්‍රයත්නයක් " හැටියට පෙන්වීමේ මුලාව තවදුරටත් කරගෙන යෑමට රජය අදහස් කරන බව පෙනී යන හෙයින්ද;

(xi) උසස් අධ්‍යාපනය දැනටමත් සීමාකර තිබෙ නවා මදිවාට නිදහස් අධ්‍යාපන ක්‍රමයට හානි කිරීමේ ප්‍රතිපත්තියද වෙනස් කර නැති බව හැඟෙන හෙයින්ද;

(xii) බලංගොඩ අතුරු මැතිවරණ කාලයේදී රජය පුන පුනා කථා කළ නින්දගම් පනත කෙ රෙහි දැන් සැලකිල්ලක් නොමැති බව හෙළි කරන හෙයින්ද;

(xiii) රජයේ සේවකයින්ට දේශපාලන අයිතිවාසි කම් දීම පිළිබඳව කිසිම අදහසක් හෙළි දරව් නොකරන හෙයින්ද;

(xiv) දැනට තදින් පැතිර තිබෙන, විශේෂයෙන් උසස් තැන්වල පවතින දූෂණ නැවැත්වීම ගැන රජය තුළ කිසිම අදහසක් ඇති බව හෙළිදරව් නොකරන හෙයින්ද;

උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව කෙරෙහි මෙම සභාවේ විශ්වාසයක් නොමැති බව ප්‍රකාශ කර සිටිමු ".

" நன்றியுரைக்குத் திருத்தமாக அதன் இறுதியிற் கீழ்க்காணும் சொற்களைச் சேர்க்கவேண்டும் :—

' எனினும், மேன்மை தங்கிய தங்களது அரசாங்கம் அதன் பதவித் தவணையின் பாதிக்காலமாகிய இரண்டு கூட்டத் தொடர்களிலும் கைக்கொண்ட கொள்கைகள்—

(அ) இலங்கையின் சுதந்திரத்தையும் பிரிக்க முடியாத தன்மையையும் ஆபத்துக்குள்ளாக்கியும் ;

(ஆ) மக்களின் சனநாயக உரிமைகளையும் சுதந்திரத்தையும் அமவதித்தும்,

(இ) பொருளாதாரத்தில் பாரதூரமான பெரும் விழுக்காட்டை உண்டுபண்ணி மக்களின் வாழ்க்கைத் தரத்தைப் பெருமளவில்குறைத்தும்,

(ஈ) தேசிய நலன்களையும், மக்களின் அவசிய தேவைகளையும் பணயம் வைத்து, பிற நாட்டிலும் உள் நாட்டிலுமுள்ள தன்னலவாதிகட்குப் பெரும் சலுகைகளைக் கொடுத்தும்,

(உ) நிருவாக அதிகாரத்தைத் துர்பிரயோகம் செய்து, அரசியல் எதிரிகட்கெதிராக வஞ்சம் சாதிக்கவும், அரசாங்க ஊழியரைப் பழிவாங்கவும் பயன் படுத்தியும்,

(ஊ) 1965 ஆம் ஆண்டுப் பொதுத் தேர்தலிலும் பின்னர் நடந்த பாராளுமன்ற உப தேர்தல்களிலும், பாராளுமன்றத்தின் முதலாம் இரண்டாம் கூட்டத்தொடர்களில் மேன்மை தங்கிய தங்களது பிரசங்கங்களிலும் கொடுக்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கப்பட்ட வாக்குறுதிகள் பலவற்றை நிறைவேற்றாமலும், அதில் பலவற்றுக்கு முரணாக நடந்தும் இருப்பதாலும்,

மேலும், இப்பிரசங்கம்—

(1) அரசியல், பொருளாதார, நீதி நெறித் துறைகளில் அரசாங்கத்தின் வெறுமையையும், இலங்கையையும் அதன் மக்களையும் தற்போதுள்ள அரசியல் மாறுட்டம், நிர்வாகச் செயலின்மை, பொருளாதார விழுக்காடு ஆதியன கொண்ட படுகுழியிலிருந்து மீட்பதற்கு ஒரு விரிவான அல்லது ஓரளவேனும் இணங்கக் கூடியதான கொள்கையினை வகுக்க முடியாத் தன்மையை வெளிக்காட்டுவதாலும்,

(2) விவசாயிகளும், இதர பிரிவினரும் ஆகிய இந்நாட்டு மக்களின், முக்கியமாகக் கண்டிப் பகுதியினரின் முறைமையான நலன்களுக்கு என்னதான் நேர்ந்தாலும், பெரும் சந்தேகங்கட்கும், எதிர்ப்புக்கு முள்ளான இந்திய-இலங்கை உடன்படிக்கை (செயற்படுத்தல்) சட்டத்தை அனுஷ்டிப்பதென்று அரசாங்கம் திடங்கொண்டிருப்பதனைக் காட்டுவதாலும்,

(3) அரசாங்கத்திலுள்ள அரசியற் கட்சிகளின் கட்டுப்பாட்டில் உள்ளவை உட்பட்ட, உள்ளூராட்சிச் சபைகளினதும், அசில இலங்கைத் தமிழ்க் காங்கிரஸ் போன்ற சிறுபான்மையினரின் நலன் கருதும் அரசியற் கட்சிகளினதும் பரந்த எதிர்ப்பையும் பொருட்படுத்தாமல் தற்சமயம் மாவட்ட சபைகள் அமைக்கப்பட வேண்டுமெனக் கோரும் ஒரேயொரு அரசியற் கட்சியாகிய இலங்கைத் தமிழரசுக் கட்சியின் பிடிவாதமான கோரிக்கையை நிறைவேற்ற அரசாங்கம் மாவட்ட சபைகளை அமைக்கத் திடம் கொண்டிருப்பதைக் காட்டுதாலும்,

அத்துடன் முக்கியமாக, இப்பிரசங்கம்,

(i) மக்களிடமிருந்தே சகல அதிகாரத்தையும் பெறக்கூடிய உண்மையான சுதந்திர, ஆதிபத்திய, ஜனநாயகக் குடியரசை அமைப்பதற்கு வகை செய்யும் புதிய அரசியற் திட்டமொன்றை நடைமுறைக்குக் கொண்டு வருவதற்கான நடவடிக்கைகளைக் குறிப்பிடத் தவறியதாலும்,

(ii) கடந்த கூட்டத் தொடரில் பத்து நாட்களுக்கு மட்டுமில்லாதிருந்த முற்றிலும் அநீதியான பாரபட்சமான அரசியல் தேவைகட்குப் பயன்படும் அவசர கால நிலையை நீக்குவதற்கான யோசனை எதையும் அரசாங்கம் கூறத் தவறியதாலும்,

(iii) வேலையில்லாத் திண்டாட்டம், நாளாந்தத் தேவைகட்கான அத்தியாவசியப் பொருட்களுக்குத் தட்டுப்பாடு, அவற்றின் உயர் விலைகள், முதலிய பிரச்சினைகளைத் தீர்ப்பதற்குரிய ஆலோசனைகளைத் தராத பட்சத்தில் இப்பிரச்சினையையாவது குறிப்பிடத்தவறியதாலும்,

(iv) கட்டுப்பாட்டின் கீழ் முன்னர் கொடுக்கப்பட்ட அளவு அரிசியை மீண்டும் கொடுப்பதற்கு அல்லது காலபோகத்தில் முன்னெருபோதும் இல்லாத அளவு நெற்சாகுபடி செய்யப்பட்டதென்று பெருமையுடன் கூறிக்கொண்ட போதிலும் வைத்தியசாலைகளிலுள்ள நோயாளிகளுக்காவது உரிய சோற்றுத் தீனைக் கொடுப்பதற்கான ஆலோசனைகளைக் குறிப்பிடத் தவறியுள்ளதாலும்,

(v) நீர்ப்பாசன வரிகளை இரத்துச் செய்வதன் மூலமாகவும், குடியேற்றப் பகுதிகளில் குடியேற்றவாசிகள் மீது விதிக்கப்படும் நிலவரியை இரத்துச் செய்வதன் மூலமாகவும் தனிப்பட்ட டிராக்டர் சொந்தக்காரர் தற்போது விவசாயிகளைச் சுரண்டும் முறையைத் தடுக்கும் நடவடிக்கைகளை எடுப்பதாலும், வங்கிகள் மற்றும் கடன் கொடுக்கும் தாபனங்கள் அளிக்கும் கடன்களுக்குரிய வட்டி விகிதத்தைக் குறைப்பதாலும், ஏனைய நடவடிக்கைகளை எடுப்பது மூலமாக விவசாயிகள் மீதுள்ள பளுவைக் குறைக்கும் நோக்கங்களைக் கொண்டிருப்பதாக எடுத்துக் காட்டாததாலும்,

(vi) வாழ்க்கைச் செலவு ஏறிக்கொண்டு வருவதால் அரசாங்க, தனித்துறையில் உள்ள சேவையாளர்களின் ஊதியத்தின் மதிப்புக்குறைவை ஈடுசெய்வதற்கான நடவடிக்கைகளைக் கொண்டிராததாலும்,

(vii) மீன் வகைகளை வெளிநாட்டுக்கு ஏற்றுமதி செய்வதாகப் பெருமையுடன் கூறிக்கொண்ட போதிலும் மீனவரின் கஷ்டங்களைக் குறைக்கவோ அல்லது இலங்கையிலுள்ள பாவனையாளர்களுக்கு நியாயமான விலையில் போதிய அளவு மீனை விற்கும் நோக்கம் கொண்டிருப்பதாக எடுத்துக் காட்டாததாலும்,

(viii) பெருந்தொகையான குடிசைக் கைத்தொழிற் பொருட்கள், கைத்தறித் துணிகள் உற்பத்தியில் ஈடுபட்டிருக்கும் பெருந்தொகையான மக்கட்கு நட்டத்தையும் அழிவையுங் கொண்டுவந்துள்ள தற்போதைய கொள்கைகளைக் கைவிடும் நோக்கம் கொண்டிருப்பதாகக் காட்டாததாலும்,

(ix) அரசாங்கத்தின் கைத்தொழிற் கொள்கையானது திறப்படக் கூறின் முந்திய அரசாங்கத்தின் காலத்தில் ஆரம்பிக்கப்பட்ட திட்டங்களைப் பெரும்பிக்கவோ அல்லது தொடர்ந்து நடத்துவதே எனக்காட்டும் அதே வேளையில் நடைமுறையில் தற்போதுள்ள பல திட்டங்களின் முன்னேற்றத்தைத் தடுத்தலும்,திறம்படச் செயலாற்றுவதைப் பாதிக்கும் முறையிலுள்ளதெனக் காட்டுவதாலும்,

(x) முடிக்குரிய ஆயிரக்கணக்கான ஏக்கர் காணி நிலத்தை பிறநாட்டு உள்நாட்டு முதலாளித்துவ நலன்கட்குத் தானியச் செய்கைக்கென அளித்தும் நெற்காணிகளில் களை

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

பிடுங்குவதற்கென ஆயிரக் கணக்கான பாடசாலை மாணவர்களை நிர்ப்பந்தித்து வேலை வாங்கியும், காணிப்பட்டாளத்தை அரசியல் நோக்குடன் உருவாக்கியும் இலங்கை ஒலி பரப்புக் கூட்டுத்தாபனத்தால் இரசிகர்களை உணவு உற்பத்தியைக் கூட்டும்படி கருத்தற்ற பல்லவியை மீண்டும் மீண்டும் கூறுவதாலும், இவையெல்லாம் உணவு சுயதேவை பூர்த்தியைப் பெற நடாத்தப்படும் பகீரதப் பிரயத்தனமெனக் காட்டி மக்களைத் தொடர்ந்து ஏமாற்றும் நோக்கத்தைக் காட்டுவதாலும்,

(xi) மேற்படிப்பிற்கென அளிக்கப்படும் சந்தர்ப்பங்களை ஏற்கெனவே தடுக்கும் நடவடிக்கைகளைக் கைக்கொண்டதுமல்லாமல் இலவசக்கல்வித் திட்டத்தைப் பாதிக்கும் முறையை மாற்றவில்லையெனக் காட்டியுள்ளதாலும்,

(xii) பலாங்கொடை உப தேர்தலின்போது பெருமளவில் பிரசாரஞ் செய்யப்பட்ட பரவணி நிலவுரிமைக் சட்டத்தில் அக்கறையிழந்துவிட்டதைக் காட்டுவதாலும்,

(xiii) அரசாங்க ஊழியர்களுக்கு அரசியல் உரிமைகள் அளிக்கும் நோக்கத்தை எடுத்துரைக்காததாலும்,

(xiv) விசேடமாக, உயரிடங்களிலும், பொதுவாக எங்கும் பரந்திருக்கும் ஊழல்களைக் களைந்தெடுக்கும் நோக்கத்தை எடுத்துரைக்காததாலும்

மேன்மை தங்கிய தங்கள் அரசாங்கத்தின் மீது இச்சபைக்கு நம்பிக்கையில்லை'."

"As an amendment to the Address at the end add the words:

'but inasmuch as Your Excellency's Government has, in the past two Sessions which cover half its permissible term of office, pursued policies that have—

(*a*) endangered the independence and indivisibility of Ceylon;

(*b*) undermined the democratic rights and liberties of the people;

(*c*) brought about a serious and deep-going deterioration in the economy and a sharp decline in the standard of living of the people;

(*d*) made extensive concessions to foreign and local vested interests at the expense of national interests and the vital needs of the people;

(*e*) been characterized by the abuse of administrative power in order to pursue vendettas against political opponents and to inflict vengeance upon public employees; and

(*f*) failed to give effect and acted contrary to many of the promises made during the General Election of 1965, the subsequent Parliamentary by-elections, and in Your Excellency's Addresses to the *first* and *second* Session of Parliament;

and further, as the Address:

(1) reveals the political, economic and moral bankruptcy of the Government and its complete inability to formulate a comprehensive or even coherent policy that can take Ceylon and its people out of the present morass of political reaction, administrative paralysis and economic decline;

(2) show that the Government, whatever may be the cost to the legitimate interests of the peasantry and other sections of the indigenous population, especially of the Kandyan areas, as determined to enforce the provisions of the Indo-Ceylon Agreement (Implementation) Act that has aroused such misgiving and opposition; and

(3) indicates that the Government, despite the widespread opposition expressed by local authorities, including those controlled by constituent political parties of the Government, and by other political parties representing minority interests such as the All-Ceylon Tamil Congress, is determined to establish District Councils in response to the insistent demand of the Illankai Thamil Arasu Kachchi, which is the only political party that insists on the establishment of such councils at the present time;

and, in particular, as the Address:

(i) fails to propose any steps to bring into effect a new Constitution that will establish a truly independent, sovereign and democratic Republic in which all power will be derived from the people;

(ii) does not disclose any intention by the Government to withdraw the totally unjust State of Emergency that existed for all but ten days of the past Session and which is being used for partisan political purposes;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(iii) does not even mention the acute problems of unemployment and the high prices and scarcities of essential articles in everyday use, let alone advance any proposals to solve these problems ;

(iv) does not disclose any intention by the Government to restore the former rice ration or, despite the boast of a record *Maha* harvest, even to provide patients in hospitals with adequate rice meals ;

(v) makes no reference to any intention by the Government to ease the burdens on the peasantry, through the abolition of irrigation rates, the reduction of the high acreage taxes levied from allottees in peasant colonies, the stopping of the present exploitation of the peasants by the private tractor owners, the reduction of the rates of interest on loans from banks and other lending institutions, and by other measures ;

(vi) contains no proposals to ensure that employees in the public and private sectors are compensated for the decline in their real wages and salaries as a result of the increased cost of living ;

(vii) while boasting of exporting fish abroad, makes no reference to any intention to see that consumers in Ceylon are supplied with an adequate quantity of fish at reasonable prices or that the many hardships of the fishermen are ameliorated ;

(viii) shows no intention by the Government to discontinue its present policies which have brought misfortune and ruin to large numbers of persons engaged in the production of handloom textiles and handicrafts ;

(ix) indicates that the industrial policy of the Government is, at best, no more than to continue or expand projects that originated at the time of the previous Government while in practice impeding the progress and impairing the efficient working of many existing industrial ventures ;

(x) shows that the Government intends to continue the hoax that the alienation of thousands of acres of State land to private foreign and local capitalist interests to grow subsidiary foodstuffs, the compulsory dragooning of thousands of schoolchildren to weed paddy lands, the creation of a politically-motivated 'Land Army', and the boring reiteration over the Ceylon Broadcasting Corporation of senseless jingles urging listeners to grow more food, represents an 'all-out effort' to achieve self-sufficiency in food ;

(xi) indicates that the Government in addition to the restrictions it has already imposed on opportunities for higher education, has not changed its policy of making inroads into the scheme of Free Education ;

(xii) reveals that the Government has lost interest in the Nindagama Lands Bill, about which it spoke so eloquently at the time of the Balangoda by-election ;

(xiii) does not disclose any intention to grant political rights to public employees ; and

(xiv) does not reveal any intention by the Government to end the widespread corruption that prevails, particularly in high places ;

this House has no confidence in Your Excellency's Government'."

II

" සංශෝධනයක් වශයෙන් ස්තුති යෝජනාව අගට එකතු කිරීමට :

' එසේතුදුවුවත්,

1967 ජූනි මස 4 වැනි දිනට පසුව, ඊශ්‍රායල් රජය බලයෙන් අල්ලාගත්, එක්සත් අරාබි ජනරජයට, සිරියාවට හා ජෝර්දානයට අයත් ප්‍රදේශයන්ගෙන් ඊශ්‍රායල් සන්නාහ සන්නද්ධ හමුදා ඉවත්කර ගන්නා තෙක්, ලංකාව හා ඊශ්‍රායලය අතර පවත්නා තානාපති හා අනෙකුත් සබඳතාවන් අත්හිටුවන මෙන් රජයෙන් ඉල්ලා සිටිමු."

' நன்றியுரைக்குத் திருத்தமாக அதன் இறுதியிற் கீழ்க்காணும் சொற்களைச் சேர்க்க வேண்டும் :

" எனினும், 1967 ஆம் ஆண்டு ஜூன் மாதம் 4 ஆம் தேதிக்குப் பின்னர் இஸ்ரவேல் ஆயுதப் படைகளினால் பலவந்தமாகக் கைப்பற்றப்பட்ட ஐக்கிய அரபுக்குடியரசு, சிரியா, ஜோர்டான் ஆகிய நாடுகளின் ஆள்புலங்களிலிருந்து அப்படைகளை இஸ்ரவேல் அரசாங்கம் வாபஸ் பெற்றுக் கொள்ளும்வரை இலங்கைக்கும் இஸ்ரவேல் நாட்டுக்குமிடையிலுள்ள ராஜரீகத் தொடர்புகளையும் ஏனைய தொடர்புகளையும் தற்காலிகமாகத் துண்டித்துக் கொள்ளுமாறு அரசாங்கத்தைக் கேட்டுக்கொள்ளுகிறோம் '."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

"As an amendment to the Address at the end add the words :

'but calls on the Government to suspend diplomatic and other relations between Ceylon and Israel until such time as the Government of Israel withdraws its armed forces from the territories in the U. A. R., Syria and Jordan which they occupied by force after 4th June 1967'."

III

"සංශෝධනයක් වශයෙන් ස්තුති යෝජනාව අගට එකතු කිරීමට :

'එතෙකුදුවුවත්,

"වියට්නාම් ප්‍රශ්නය පිළිබඳ සාධාරණ ස්ථිරව පවතින තීරණයකට එළඹීම සඳහා කටයුතු කිරීම පිණිස සෑම අවස්ථාවක්ම ප්‍රයෝජනයකට ගැනීමට උත්සාහ ගෙන ඇති අතර, මතුවටත් එසේ කරනු ඇත", යන ඔබතුමාගේ ආණ්ඩුවේ ප්‍රකාශයට පට හැනිව, දකුණු හා උතුරු වියට්නාමයට විරුද්ධව අමෙරිකානු එක්සත් ජනපදයේ ආක්‍රමණය හෙළා දැකීමටත්, මෙම ප්‍රශ්නය පිළිබඳව සාධාරණ හා ස්ථිරව පවතින තීරණයකට එළඹීම සඳහා අත්‍ය වශ්‍ය වන, අමෙරිකානු සන්නාහ සන්නද්ධ හමුදා වන් කොන්දේසි විරහිතව වියට්නාමයෙන් ඉවත් කර ගන්නා ලෙස ඉල්ලා සිටීමටත්, ඔබ තුමාගේ ආණ්ඩුව ඇත්ත වශයෙන්ම අපොහොසත් වී ඇති නිසා අපගේ කනගාටුව ප්‍රකාශකර සිටිමු.' "

"நன்றியுரைக்குத் திருத்தமாக அதன் இறுதியில் கீழ்க்காணும் சொற்களைச் சேர்க்கவேண்டும் :

'எனினும், "வியட்நாம் பிரச்சினைக்கு நியாயமான, நிலைத்திருக்கக் கூடிய தீர்வைத் தோற்றுவிப்பதற்குரிய சகல சந்தர்ப்பத்தையும் பயன்படுத்த முனைந்துள்ள துடன் தொடர்ந்தும் அவ்வாறு செய்வதற்கு முயற் சிக்கும்" என்று தங்கள் அரசாங்கம் வெளிப்படையாகக் கூறிக் கொண்டபோதிலும், இப்பிரச்சினைக்கு நியாய மானதும், நிலைத்திருக்கக்கூடியதுமான தீர்வைத் தோற்றுவிப்பதற்கேதுவாக வட வியட்நாம், தென் வியட்நாம் ஆகியவற்றிற்கெதிராக ஐக்கிய அமெரிக்க நாடுகளினால் நடாத்தப்படும் ஆக்கிரமிப்பினைக் கண்டிப் பதற்கும், ஐக்கிய அமெரிக்கப் படைகளை வியட்நாமி லிருந்து நிபந்தனையின்றி வெளியேறுமாறு வற்புறுத்துவதற்கும் தங்கள் அரசாங்கம் தவறியுள் ளமையையிட்டு எங்கள் வருத்தத்தைத் தெரிவித்துக் கொள்கிறோம்'."

"As an amendment to the Address at the end add the words :

'but regret that, contrary to Your Government profession that it has "sought to use every opportunity to promote a just and lasting solution of the problem of Vietnam and will continue to do so." Your Government has in fact failed to condemn the aggression of the United States of America against South and North Vietnam and to demand the unconditional withdrawal of U. S. armed forces from Vietnam, which are essential for a just and lasting solution of this problem.'."

IV

"සංශෝධනයක් වශයෙන් ස්තුති යෝජනාව අගට එකතු කිරීමට :

'එතෙකුදුවුවත් ලකිසුරුතුමනි,

ඉටු නොකළ පැරණි පොරොන්දු රාශියක් ගැන යළිත් සඳහන් කරමින් තෙවෙනි වරටත් ඔබ වහන් සේ ලවා කියවූ මෙවර රාජාසන කථාව, පුනරුත් දොසින් පිරුනු බැවින් ද ;

රටේ බලවත්ම පරිහානියට, පන්ති බේදයට හා ජාතික අසමගියට මූලික හේතුව වූ ඉංග්‍රීසි භාෂා ආධිපත්‍යයෙන් රට මුදා ගැනීමට මේ රජය අකැමැති බව දැන් හොඳින්ම පැහැදිලිවී ඇති බැවින් ද ;

රජ බස් පැනය ගැන වචන මාත්‍රයකින්වත් සඳහන් නොකර, එබඳු පැනයක් රටේ නැතැයි එය ඉතා සාර්ථක ලෙස විසඳී ක්‍රියාත්මක වන්නේ යැයි රටවැසියාට ඇඟවීමට දෝ පැස්බර ව්‍රතයක් අනුගමනය කරමින් ඔබ වහන්සේගේ වර්තමාන රජය සිංහල රාජ්‍ය භාෂා පනත කුණු කූඩයට විසිකර දමා පරිපාලන කටයුතු ඉංග්‍රීසි බසින් පවත්වා ගෙන යන බැවින් ද ;

පසුගිය රජය යටතේ පරිපාලන කටයුතු අනුක්‍රම යෙන් සිංහල බසට පෙරළීම අහෝසිකර දමා රාජ්‍ය කටයුතු යළිත් ඉංග්‍රීසි බසට ඇබ්බැහි කරවීමට ක්‍රියා කරන බැවින් ද ;

ජාතික අධ්‍යාපනය මාතෘ භාෂාවෙන් ලබා දෙන බව කියතුදු, උසස් අධ්‍යාපන කටයුතු විෂයෙහි මව් බස යෙදවීම සඳහා කිසිදු පියවරක් නොගෙන, විශ්ව විද්‍යාලයීය, වෛද්‍ය, නීති, ඉංජිනේරු හා වෙනත් වෘත්තීය පුහුණුව ලබා දීමේදී ඉංග්‍රීසි මාධ්‍යය තව දුරටත් පවත්වාගෙන යමින් ගම්බද හා දුප්පත් නගර බද අසරණ දරුවන් අතරමන් කරන බැවින්ද ;

උසාවියේ භාෂා පනතකැයි 1961 අංක 3 දරණ පනතක් ඇතත්, ලංකාවේ එකද මහේස්ත්‍රාත් උසා වියක, එකද රික්වැස්ට් උසාවියක, එකද දිස්ත්‍රික් උසාවියක, එකද අපරාධ අධිකරණයක, එකද ශ්‍රේෂ්ඨා ධිකරණ මණ්ඩලයක හෝ එකද අපරාධ අභියාචන අධිකරණයක එකම දවසකවත්, එකම නඩු විභාග යක්වත් රජබසින් නොපවත්වා, එකම නඩු තීන්දු වක්වත් රජබසින් නොලියවා පොදු දනට නොවැටි හෙන පරබසකින් සියලු අධිකරණ කටයුතු පවත් වාගෙන යන බැවින් ද ;

වර්තමාන අධිකරණ ක්‍රමය, නීති වෘත්තිය හා ඊට අදාල සම්ප්‍රදායයන් රුසක් මේ රටේ ඓතිහාසික සංස්කෘතික පරිසරයට කිසිසේත් නොගැලපෙන නේ වී නමුදු, එංගලන්තයේ ඉංග්‍රීසි ජීවිතයට ඔබ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වහන්සේගේ වර්තමාන රජය දක්වන ලෙන්ගතුකම හා දීන ගැතිකම නිසා එය වෙනස් කිරීමට අකැමැත්තෙන් ලංකා මාතාව ඉංග්‍රීසි නීති සම්ප්‍රදායයේ ඌරු වල්ගා සහිත ලොම් තොප්පියෙන් වසා තැබීමට තැත් කරන බැවින් ද ;

කම්කරු ආරාවුල් පනත යටතේ සාමාන්‍ය සේවක පක්ෂයේ පහසුව පතා පිහිටුවන ලද කම්කරු උසාවිවල පවා වැඩ කටයුතු නඩු විභාග ලේඛන ගත කිරීම හා නඩු තීන්දු ලිවීම ආදිය මේ රටේ කම්කරුවනට වැටහෙන සිංහලෙන් නොව එංගලන්තයේ මහ රැජිනගේ මාතෘ භාෂාවෙන් පවත්වා ගෙන යන බැවින් ද ;

අළුතින් පිහිටුවන රජයේ නීතිගත සංස්ථාවක හෝ අභ්‍යන්තර පාලන කටයුතු පවා රාජ්‍ය භාෂාවෙන් නොඅරඹා ඔබ වහන්සේගේ රජයේ ගරු ඇමතිවරුන් ස්වකීය මාතෘ භාෂාව ලෙස සලකන ඉංග්‍රීසියෙන්ම සිදු කෙරෙන බැවින් ද ;

මේ රටේ උපන් ජනයාගේ ආර්ථික, සංස්කෘතික හා අධ්‍යාත්මික නිදහසේ පදනම වශයෙන් සැලකිය යුතු ජාතික අභිමානයේ හා ස්වාධීනත්වයේ සුපිරිසිදු සංකේතය වශයෙන් ගිණිය යුතු, අපගේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අප විසින්ම, අප බසින්ම, සකස් කිරීම තිබියදී, කලු සුද්දන්ට රට බාරදී ගිය සුදු සුද්දන් විසින් රහසිගතව ගැට ගසා තකහනියේ ගෙනැවිත් අප හිසමත පැලැන්දූ සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ ඉංග්‍රීසි කවු ඔවුන්න අතනින් මෙතනින් කොත් කඩා මුළු කපා පාස්සමින් පැලැස්තර ඇලවීමකට සූදානම් වන බැවින් ද ;

ඔබ වහන්සේගේ වර්තමාන රජය බලයට පත්වූ ද සිට රටේ හා සමාජයේ අස්සක් මුල්ලක් නෑර පැතිර ගිය විවිධ දූෂණය, සදාචාර පරිහානිය, දේශපාලන පලිගැනීම් අනියම් ඥාති මිත්‍ර අනුග්‍රහය, අයුක්තිය, අසාධාරණත්වය හා අවිචාරත්වය නිසා අපගේ අනාගත බාල පරම්පරාවේ ගුණ වගාව රුචිකත්වය ජීවන දර්ශනය හා සදාචාරවත් පිළිවෙත් පිළිබඳ හැඟීම් පවා විකෘතවීමට සහ විරූපවීමට අවසර ඇති හෙයින් ද ;

ඔබ වහන්සේගේ වර්තමාන රජයේ බියකරු, අහංකාර, විනාශකාරී, ස්වරූපය ගැන අපගේ අප්‍රසාදය හා සංවේගය මෙසේ පළ කර සිටිමු."

"நன்றியுரைக்குத் திருத்தமாக அதன் இறுதியில் கீழ்க்காணும் சொற்களைச் சேர்க்க வேண்டும் :

'எனினும் மகா தேசாதிபதியவர்களே,

நிறைவேற்றப்படாத, தொகையான பழைய வாக்குறுதிகளை மீண்டும் குறிப்பிட்டு மூன்றும் முறையும் தங்களைக் கொண்டு வாசிப்பிக்கப்பட்ட உரையானது திரும்பக்கூறும் குற்றமுடைமையாலும் ;

நாட்டின் மோசமான சீர்குலைவுக்கும், வர்க்கபேதத்துக்கும், தேசிய ஒற்றுமையின்மைக்கும் அடிப்படைக் காரணமான ஆங்கில மொழி ஆதிக்கத்திலிருந்து, நாட்டை விடுவிக்க இந்த அரசாங்கம் விரும்பவில்லையென்பது தற்பொழுது தெளிவாகியிருக்கின்றமையாலும் ;

அரசகருமமொழிப் பிரச்சினையைப் பற்றி ஒரு வார்த்தைதானும் குறிப்பிடாமல், அவ்விதப் பிரச்சினையில்லை, அது வெற்றிகரமாகத் தீர்க்கப்பட்டு அமுல் நடத்தப்பட்டு வருகிறதென நாட்டு மக்களுக்கு உணர்த்துவிப்பதற்காக, தீப்பறவை முறையைக் கையாண்டு, தங்களின் இன்றைய அரசாங்கம் சிங்கள அரசகரும மொழிச்சட்டத்தைக் குப்பைத் தொட்டியில் வீசிவிட்டு, நிர்வாக வேலைகளை ஆங்கிலத்தில் நடத்துகின்றமையாலும் ;

கடந்த அரசாங்கம் நிர்வாக வேலைகளை படிப்படியாக சிங்கள மொழிக்கு மாற்றுவதற்கு எடுத்துக்கொண்ட நடவடிக்கையைக் கைவிட்டு, அரசாங்க அலுவல்களை மீண்டும் ஆங்கிலத்துக்கடிமைப்படுத்த நடவடிக்கையெடுக்கின்றமையாலும் ;

தேசியக் கல்வியைத் தாய்மொழி மூலம் பெற்றுத் தருவதாகக் கூறிக்கொண்டு, உயர்கல்வியைத் தாய்மொழியில் போதிப்பதற்காக எவ்வித நடவடிக்கையும் எடுக்காது, பல்கலைக்கழக, வைத்திய, சட்ட, பொறியியல், மற்றும் தொழில் நுட்பக்கல்வியை ஆங்கில மொழி மூலமாக கிராமத்திலும், நகரிலுமுள்ள ஏழைக் குழந்தைகளிடையேயும் தொடர்ந்து போதிக்க முயலுகின்றமையாலும் ;

நீதிமன்ற மொழிச்சட்டமென, 1961 ஆம் ஆண்டு 3 ஆம் இலக்கச் சட்டமிருந்தபோதிலும், இலங்கையிலுள்ள ஒரு மாஜிஸ்திரேட்டு நீதிமன்றமாவது, ஒரு கேள்வி நீதிமன்றமாவது, ஒரு மாவட்ட நீதிமன்றமாவது, ஒரு குற்ற நீதிமன்றமாவது, ஒரு உயர் நீதிமன்றமாவது ஒரு நாளாவது எந்த ஒரு விசாரணையைத்தானும் அரசமொழியில் நடத்தாமல், ஒரு வழக்குத் தீர்ப்பையாவது அரசமொழியில் எழுதாமல், பொது மக்கள் விளங்கமுடியாத அந்நிய மொழியில் சகல நீதிமன்ற அலுவல்களையும் நடத்திவருகின்றமையாலும் ;

இன்றைய நீதிமன்றங்களின் அமைப்பும், நிர்வாக முறையும், சட்டத் தொழிலும், அவை சம்பந்தப்பட்ட சம்பிரதாயங்களும், இந்நாட்டின் வரலாற்றுக்கும், பண்பாட்டுக்கும் எவ்விதத்திலும் ஒத்தவையாகாத போதிலும், இங்கிலாந்தின் ஆங்கிலேய வாழ்க்கைமீது தங்களின் இன்றைய அரசாங்கம் காட்டுகின்ற மோகத்தின் காரணமாக, அதனை மாற்றியமைப்பதற்கு விருப்பமில்லாமல், இலங்கை யன்னையை ஆங்கிலேய சட்டசம்பிரதாயமென்னும் பன்றிவாலுடன் கூடிய உரோமத் தொப்பியினால் மூடி வைக்க முயலுகின்றமையாலும் ;

தொழிலாளர் பிணக்குச் சட்டத்தின் கீழ் சாதாரண தொழிலாளர்களின் நன்மைக்காக நிறுவப்பட்ட தொழிலாளர் நீதிமன்றங்களில்தானும் அலுவல்கள், வழக்குவிசாரணைகளைப் பதிதல், தீர்ப்புகளை எழுதுதல் என்பனவற்றை இந்நாட்டின் தொழிலாளர்கள் விளங்கிய சிங்களத்திலில்லாமல், இங்கிலாந்து மகாராணியின் தாய் மொழியில் நடத்துகின்றமையாலும் ;

புதிதாக நிறுவப்போகும் அரசாங்க கூட்டுத்தாபனத்திலும், கூட, உள் விவகார அலுவல்களைத்தானும் அரசமொழியில் ஆரம்பிக்காமல் தங்களின் அரசாங்க கௌரவ அமைச்சர்கள் தங்களின் தாய்மொழியாகக் கருதுகின்ற ஆங்கிலத்திலேயே நடத்துகின்றமையாலும் ;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

இந்நாட்டிற் பிறந்த மக்களின் பொருளாதார, கலாசார, ஆத்மீக சுதந்திரத்தின் அடித்தளமாகக் கருதப்படுகின்ற தேசியப்பற்றின் புனிதமான இலச்சினையாகக் கொள்ளப்படத்தக்க, எமது அரசியலமைப்புச் சட்டத்தை நாமே, நமது மொழியால் வகுக்க வேண்டியிருக்க, கறுப்புத்துரைகளுக்கு நாட்டைக் கையளித்துச் சென்ற வெள்ளைத்துரைமார்களால், இரகசியமாகச் சிக்கல்களுடன் வகுத்து அவசர அவசரமாகக் கொண்டு வந்து எமது தலையிற் சுமத்தப்பட்ட சோல்பரி அரசியலமைப்புச் சட்டமான பிரித்தானிய முட்கிரீடத்தை அங்குமிங்கும் ஒடித்து மூலைகளை வெட்டி ஒதுக்கி, ஒட்டுப்போட ஆயத்தப் படுகின்றமையாலும் ;

தங்களின் தற்போதைய அரசாங்கம் ஆட்சிக்கு வந்த நாள்முதல், நாட்டினதும், சமுதாயத்தினதும் சகல அம்சங்களிலும் பரவியுள்ள பலவிதமான ஊழல்கள், ஒழுக்கச் சீர்கேடுகள், அரசியல் பழிவாங்கல், முறையற்ற சுற்றந்தழுவல், நியாயமின்மை என்பனவற்றின் காரணமாக எமது எதிர்கால இளம் பரம்பரையினரின் ஒழுக்கவளர்ச்சி, இரசிகத்தன்மை, வாழ்க்கையின் குறிக்கோள் ஆதியனவை சம்பந்தமான உணர்வுகள் தானும் அழிந்துபோகும் நிலையிருக்கின்றமையாலும் ;

தங்களின் இன்றைய அரசாங்கத்தின் பயந்தாங் கொள்ளி, அழிவுகாண் உருவத்தைக்குறித்து எமது அதிருப்தியையும், துக்கத்தையும் இவ்விதமாக எடுத்துக் காட்டுகிறோம். ' "

" As an amendment to the Address at the end add the words :

' but inasmuch as,

this Speech, which refers again to numerous unfulfilled old pledges and which Your Excellency was required to read for the third time as well, is full of repetitions ;

it is now abundantly clear that this Government is unwilling to liberate the country from the stranglehold of the English language which has been the primary cause of the greatest national decline, class distinction and national discord ;

Your Excellency's present Government, without mentioning even a word about the official language question but purporting ostrich-like, perhaps to indicate to the people that there is no such problem and that it has been solved successfully and that the Act is being implemented, is doing administrative work in the English language, having thrown the Official Language Act into the waste paper basket ;

the gradual change-over to Sinhala in administrative work, brought about by the previous Government has been abandoned and action is taken to re-introduce English into Government affairs ;

Your Excellency's Government while claiming that national education is being imparted in the mother-tongue, it is not taking any steps to employ the mother-tongue in the sphere of higher education but is forsaking rural children and poor, helpless urban children by continuing the English medium in medical, law, engineering and other professional studies in the universities ;

in spite of there being an Act called the Language of the Courts Act, No. 3 of 1961, never was a single case heard or a single judgment written in the official language in any Magistrate's Court, in any Court of Requests, in any District Court, in any Assize Court, in any Supreme Court, in any Court of Criminal Appeal, in Ceylon, but instead all judicial work is conducted in an alien language, not understood by the masses ;

while the existing system of justice the legal profession and many of its related conventions are totally alien to the historical and cultural environment of this country, Your Excellency's present Government, because of its attachment and abject servility to the English mode of life, as prevailing in England, is attempting to shroud Mother Lanka with the pig-tailed wig and other English legal conventions, in its reluctance to effect any change in this state of affairs ;

even in the Labour Tribunals set up, under the Industrial Disputes Act, for the convenience of ordinary employees, the proceedings, maintenance of records and writing of judgments are done not in the Sinhala language, understood by the workers of this country, but in the mother-tongue of Her Majesty the Queen of England ;

in the newly established corporations too, even internal administration is not conducted in the official language, but in English, which is regarded by the Honourable Ministers of Your Excellency's Government, as their mother-tongue ;

instead of framing ourselves in our own language, our own Constitution which should be the foundation of the economic, cultural and spiritual freedoms of the people born in this country, and which should be the purest symbol of national pride and sovereignty, preparations are being made to cut the corners, snip the edges, piece together and thereby patch up the Soulbury Constitution which is an English crown of thorns hastily and secretly put together and placed on our heads by the white sahibs who handed over this country to the black sahibs ;

the various forms of corruption, moral degeneration, political vindictiveness, nepotism, injustice, inequity and irrationality which have spread throughout the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

length and breadth of the land and in every nook and corner of society since Your Excellency's Government came into power, have paved the way for the permission and distortion of moral precepts and practices, the philosophy of life, the aesthetic sensibility, and the moral virtues of our future generations ;

we express our displeasure and deep regret in regard to the alarming, arrogant and destructive aspect of Your Excellency's Government.' "

**එම වචන එතැනට එකතු කළ යුතුය, යන ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

குறித்த சொற்கள் அங்கே சேர்க்கப்படுமாக எனும் வினா விடுக்கப்பட்டது.

*Question proposed, that those words be there added.*

අ. භා. 3.15

**ලක්ෂ්මන් ජයකොඩි මයා.** (දිවුලපිටිය)

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய)*

(Mr. Lakshman Jayakody—Divulapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යටියන්තොට ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද අතුරු යෝජනා 4 මම ප්‍රථමයෙන්ම ස්ථිර කරන අතර, මෙම දේශනය පිළිබඳව මගේ අදහස් ප්‍රකාශ කිරීමටද මම බලාපොරොත්තු වෙනව. අග්‍රාණ්ඩුකාරතුමා විසින් කර ඇති මේ දේශනය දෙස බලන විට මේ රට දැනට යම් කිසි ප්‍රපාතයකට වැටී තිබෙනවද ඊටත් වඩා අන්ත ප්‍රපාතයකට තවත් අවුරුද්දක් තිස්සේ වැටීමේ වැඩපිළිවෙළකට මෙම දේශනය තුඩු දෙන බව අපට පැහැදිලිවම පෙනී යනව.

අපි දැන් රාජාසන කථා ගණනාවකටම සවන් දී තිබෙනව. ඒ කථා ගණනා වෙන්ම මෙය කිසිම හරයක් නැති, රටට කිසිත් ප්‍රයෝජනයක් නැති, අනාගතයේ ආලෝකයක් ගැන කිසිම ලකුණක්වත් නැති රාජාසන කථාවක් වශයෙන් හැඳින්වීමට සිදු වී තිබෙනවා. අපට පත්‍ර මාර්ග යෙනුත් දකින්න ලැබුණා, මෙම රාජාසන කථාව පවත්වන විට විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු පමණක් නොව, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු පවා විටින් විට නැගිට ගිය බව. අප අවට සිටි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු නැගිට ගියා.

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ** (ප්‍රවාහණ ඇමති)

*(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)*

(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

කවුරුවත් ගියේ නැහැ.

**ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

මා එක්කම ගිය කෙනෙක් ඉන්නව. මම නම කියන්නෙ නැහැ. එසේ නැගිට යාමට හේතුව මොකක්ද? මෙම කථාවෙ කිසිම හරයක් නැති නිසයි. මේ ගැන විශ්වාසයක් තියන්න පුළුවන්කමක් නැහැ. පසු ගිය රාජාසන කථා දෙසත් මේ රාජාසන කථාව දෙසත් බලන විට අපට පෙනී යනවා මේ රටේ මහජනතාවට කෙළින්ම ඇත්ත ප්‍රකාශ කර නැති බව. කෙළින් කියන්නෙ නැහැ. කරන්න තිබෙන දේ කරනවාය කියා කෙළින්ම කියන්නෙ නැහැ. සිංහල භාෂාවෙ තිබෙන නොයෙකුත් වචන පාවිච්චි කර, ඉංග්‍රීසි භාෂාවෙ තිබෙන නොයෙකුත් වචන පාවිච්චි කර දේශනය පවත්වා තිබෙනවා.

මම ආණ්ඩුවෙන් එක ප්‍රශ්නයක් අහන්න කැමතියි. රාජාසන කථාවෙ පැහැදිලි වශයෙන්ම තිබෙන එක් කාරණාවක් ගනිමු :

" මැද පෙරදිග නොබෝද ඇති වූ අවාසනාවන්ත සිද්ධීන් ගැන මාගේ ආණ්ඩුව සංවේග වන අතර මෙම ප්‍රදේශයට පැමිණ ඇති උවදුරු මගහැරවීමට සාධාරණ හා කල් පවතින මාර්ගයක් සොයා ගැනීම පිණිස අනිකුත් රටවල් සමග එක් වී කටයුතු කිරීමට උත්සාහ දරනු ඇත."

ඇයි උත්සාහ දරනවාය කියන්නෙ? ඇයි කෙළින්ම කියන්නෙ නැත්තෙ " කටයුතු කරනු ලැබේ " කියා? ඔය විධියේ කීම් තමයි සම්පූර්ණයෙන්ම තිබෙන්නෙ. මෙන්න තවත් තැනක :

" සත්ව පාලන සංවර්ධනය හා කිරි නිෂ්පාදනය ගැන විශේෂ සැළකිල්ලක් දක්වනු ඇත."

සැලකිල්ලක් දැක්වීම පමණයි කරන්නෙ. ඇයි කෙළින්ම කියන්න බැරි " නිෂ්පාදනය වැඩි කරනු ලැබේ " කියා? එහෙම කිව්වොත් අපට විශ්වාස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]
කරන්න පුළුවන් යම් වැඩ පිළිවෙලක් නොහොත් සැලැස්මක් තිබෙනවාය කියා. හැම වගන්තියක්ම එහෙමයි :

"දිවයිනේ එළවළු සහ පළතුරු වගාව තවදුරටත් ව්‍යාප්ත කිරීමට කටයුතු සලසනු ඇත."

"කරනු ලැබේ" කියා කියන්න බැරි ඇයි? ගරු උප ඇමතිතුමා හිනහ වෙනවා. මේ රාජාසන කථාවෙ යම් කිසි යෝජනා මාලාවක් තිබෙනවා නම් ඒ සෑම එකකටම යොදා තිබෙන්නෙ ඔය විධියේ වචනයි. කිසිම දෙයක් කෙළින් කියන්නෙ නැහැ. සෑම කීමක්ම කෙළවර වෙන්නෙ ඒ විධියටයි. එක තැනක තිබෙනවා, "දැඩි උත්සාහයක් දරනු ලැබේ" කියා. තවත් තැනක මෙන්න :

"ඉඩම් සංවර්ධනය හා සුළු වාරිමාර්ග තැනීම සඳහා කෘෂිකාර්මික හමුදාවක් පිහිටුවන ලදී."

ඒ කියන්නෙ අතීතයේ සිදු කළ දෙයක්.

"350 දෙනෙකුගෙන් යුත් කඳවුරු 45ක් පිහිටුවීමට බලාපොරොත්තු වේ."

"බලාපොරොත්තු වේ" කියන්නෙ මොකද? සැලැස්මක් නැහැ. "පිහිටුවනු ලැබේ" කියන්න බැරි ඇයි? ඔය විධියට "බලාපොරොත්තු වේ", "සැලකිල්ලක් දක්වනු ලැබේ" කියන වචනයි තිබෙන්නෙ. වචනයේ කිසිම සථිරත්වයක් නැහැ.

පසු ගිය රාජාසන කථාවට කලින් රාජාසන කථාවෙදි කිව්වා, ගුරුවරුන්ගේ වැටුප් විෂමතා නැති කරනවාය කියා. මේ කථාවෙදි කියනවා, එය කාරක සභාවකට පවරා තිබෙනවය කියා. ඒ වාගේම පාඨශාලා පොත් මුද්‍රණය ගැනත් කියන්නෙ "සැලකිල්ලට භාජන කරනු ලැබේ" කියායි. එමනිසා මේ රජය කිසිම සැලැස්මකට අනුව වැඩ කරන්නෙ නැති බව මෙම වචනවලින්ම පෙනී යනවා. හැම තැනකම වාගේ "කන්සිඩරේෂන්" කියන වචනය යොදා තිබෙනවා. එමනිසා, නිෂ්පාදනය වැඩි කිරීම ගැන, ගොවි කර්මාන්තයට නව උදවක් ඇති කිරීම ගැන මොන විධියෙ පොරොන්දු මේ රාජාසන කථාවෙන් දුන්නත් සථිර වැඩ පිළිවෙලක් අනුගමනය කරන බවක් නම් අපට පෙනෙන්නෙ නැහැ.

පසුගිය වර අයවැය ලේඛනය පිළිබඳ විවාදයේදී අප පැහැදිලි වශයෙන් පෙන්නා දුන්න, අයවැය වර්ෂය අවසානයේදී මේ රටේ නිපදවන ද්‍රව්‍යවලට—පිට රට යවන ද්‍රව්‍යවලට—ලැබෙන මිල අඩු වෙනවාය කියා. නමුත් ගරු මුදල් ඇමතිතුමා ඒ අවසථාවේදී ප්‍රකාශ කළේ, ඊට පෙර වර්ෂයට වඩා මේ රටේ ද්‍රව්‍යවලට මිලක් ලැබෙනවාය, එයින් අපේ විදේශ විනිමය වැඩි වෙනවාය කියායි. එසේ ප්‍රකාශ කර අයවැය වර්ෂයෙ භාගයක් ගත වන විට විදේශ විනිමය එන්ට එන්ටම ප්‍රපාතයට වැටෙන බව මුදල් ඇමතිතුමාට පෙනී ගියා පමණක් නොවෙයි, මෙරටට එන්ට තිබුණු ආදායමින් දහයෙන් පංගුවක් පමණ නැතුව ගිය බවත් පෙනී ගියා. ඒ අන්දමට විරුද්ධ පක්ෂයෙන් එදා පෙන්නා දුන් කරුණු විශ්වාසයට ගෙන, ඒ කරුණු පදනම් කොට ගෙන, එවැනි දෙයක් සිද්ධ වෙන්න පුළුවන්ය කියන හැඟීමෙන් එවැනි ද්‍රව්‍ය සඳහා ලැබෙන ආදායම් ප්‍රමාණය අඩු කර පෙන්වන්න එදා මුදල් ඇමතිතුමා උත්සාහ කළේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය වර්ෂයෙ අයවැය ලේඛන කථාවෙහි සඳහන් කර තිබුණෙ ඊට පෙර වර්ෂයෙදි ලැබුණු ආදායමට වඩා සියයට දහ තුන හමාරකින් පමණ ආදායම මෙම අමු ද්‍රව්‍ය පිටරට යැවීමෙන් වැඩි වෙනවාය කියායි. නමුත් අප පැහැදිලි වශයෙන්ම පෙන්වා දුන්න, අපේ අමු ද්‍රව්‍ය වන තේ, රබර්, පොල් ආදියෙන් ලැබෙන ආදායම වර්ෂයෙන් වර්ෂය පහත වැටෙන බව. එය ගරු ඇමතිතුමා විශ්වාස කළේ නැහැ. අපේ ගරු අගමැතිතුමා ප්‍රකාශ කළේ විදේශ විනිමය නැතිකම නිසා සහල් ප්‍රමාණය කපන්න සිදුවුණු බවයි; ඒ වාගේම අල ලූනු ආදි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ගෙන්වීම සීමා කිරීමට සිදු වුණු බවයි. මේ සියල්ලෙන්ම පැහැදිලි වන්නෙ ආණ්ඩුව කරන කටයුතු ගැන ආණ්ඩුවටම පැහැදිලි අවබෝධයක් නැති බවයි.

වී නිෂ්පාදනය ගැන හැම තැනකදීම බොහොම උදන් අනනවා. හැම තැනකදීම වාගේ ප්‍රකාශ කර තිබෙනවා, 1970 වන විට මේ රට ආහාරයෙන් සවයංපෝෂිත කරනවාය, රට කිරියෙන් පැණියෙන් උතුරවනවාය කියා. සමහර උදවිය තැන් තැන්වලදී ප්‍රකාශ කර තිබෙනවා, ඒ කාලය වන විට පිටරට පටවන්නත් පුළුවන් තරම් ප්‍රමාණයක් ආහාර ද්‍රව්‍ය නිපදවනවාය කියා. කොහොම වුණත් මේ ගැන මගේ අදහස් දක්වන්න කැමතියි. මම කිසිම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇමතිවරයකුට දෙස් කියනවා නොවෙයි. යටියන්තොට ගරු මන්ත්‍රීවරයා, (ආචාර්ය එන්. එම්. පෙරේරා) එතුමාගෙ කථාවෙදි වැදගත් අදහසක් පළ කළා. එතුමා කීව, මේ ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති තුමා සිටින තුරු ඔය ප්‍රශ්නය නම් විසඳන්නෙ නැත කියා. ඒ ඇමතිතුමාගෙ අකාර්යක්‍ෂමභාවය ගැන මම දෙස් කියන්නෙ නැහැ. කවදත් එතුමා අදක්‍ෂයකු බව අප කවුරුත් දන්නව. නමුත් මහජනතාව දැනගන්න ඕනැ මොන හේතුවක් උඩද එවැනි තත්ත්වයක් පැන නැග තිබෙන්නෙ කියා.

බලන්න, මේ දෙපාර්තමේන්තු සකස් වී තිබෙන හැටි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවයි, වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි, ගොවිකම් දෙපාර්තමේන්තුවයි කියන මේ දෙපාර්ත මේන්තු තුන තමයි මේ රටේ වී නිෂ්පාදන යට සම්බන්ධ වී තිබෙන්නෙ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවත් අයිති එක අමාත්‍යාංශයකට. වාරිමාර්ග දෙපාර්ත මේන්තුව අයිති වෙනත් අමාත්‍යාංශයකට. වාරිමාර්ග දෙපාර්තමේන්තුව දන්නෙ නැහැ, කොයි තරම් අක්කර ප්‍රමාණයක් වගා කරන්න ජලය සැපයිය යුතුද කියා. අහස් දියෙන් ලැබෙන වතුර ප්‍රමාණය හා ඉන් වගා කළ හැකි අක්කර ප්‍රමාණය ගැන දන්නෙ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, එහෙම නැතිනම් ගොවිජන සේවා දෙපාර්ත මේන්ව. සුළු වාරිමාර්ගවලින් ලැබෙන වතුර ප්‍රමාණය ගැන දන්නෙ ඒ දෙපාර්ත මේන්තුවයි. මහ වාරිමාර්ගවලින් ලැබෙන වතුර ප්‍රමාණය ගැන දන්නෙ වෙනත් දෙපාර්තමේන්තුවක්. ඔන්න ඔය විධියට එක් එක් දෙපාර්තමේන්තුව වෙන් වෙන් වශයෙන් කට්ටි තුනකට වෙන් වී තිබෙනව. මම අභියෝග කරනව, මේ ආණ්ඩුවට පුළුවන් නම් මේ දෙපාර්ත මේන්තු තුනම එක්කාසු කරන්නය කියා. එසේ එක්කාසු කළොත් එදාට මේ ආණ්ඩු වත් වැටෙනව. ආණ්ඩුව නොවැටෙතොත් එක ඇමතිවරයකු විසි වේවි. ඉතින් ඔය ප්‍රශ්නය තිබෙන තුරු මේ රටේ වී නිෂ්පාදනය වැඩි කරන්ට බැහැ.

මහ කන්නයේ වී නිෂ්පාදනය වැඩි යයි ගරු කෘෂිකර්ම ඇමතිතුමා ආඩම්බරයෙන් කියාගෙන යනවා. 1966-67 වර්ෂයේ මහ කන්නය වී නිෂ්පාදනය අතින් වාර්තාවක් පිහිටුවා තිබෙනවාලු. එය 1963-64 වර්ෂයේ නිෂ්පාදනයටත් වඩා වැඩිලු. මේ ඉලක්කම් ගත්තේ කොහෙන්ද? ඉතින් වැඩි වෙලා තිබෙන ප්‍රමාණය කෙතෙක්ද? එක දෙපාර්ත මේන්තුවක් ඉදිරිපත් කරන සංඛ්‍යාවලට වඩා වෙනස් සංඛ්‍යා තවත් දෙපාර්ත මේන්තුවක් ඉදිරිපත් කරනවා. මේ අතර සංඛ්‍යා ලේඛන හදන දෙපාර්තමේන්තුව කියන්නේ තවම මේ ගැන සංඛ්‍යා සාදා නැති බවයි. ඉතින් අප විශ්වාස කරන්නේ මොකක්ද? හොඳයි, වැඩි වී තිබෙන අස් වැන්න ප්‍රමාණය කොතෙක්දැයි පැහැදිලි ලෙස අපට කියන්න.

මේ අතර කෘෂිකර්මය සඳහා වියදම් කරන මුදල් ප්‍රමාණය ගැන වචනයක් දෙකක් කියන්නට කැමතියි. ගොවීන්ට වැඩිම ණය පහසුකම් සැලසුවේ 1963-64 වර්ෂයේදීයි. ගරු කෘෂිකර්ම ඇමතිතුමා විසින් 1966 ජනවාරි මාසයේ ඉදිරිපත් කරන ලද පොතක කෘෂිකර්ම සංවර්ධන යෝජනා යටතේ දැක්වෙන කරුණුවලින් උපුටාගෙනයි, මා මේ කියන්නේ. එදා 1963-64 වර්ෂයේ දොම්පේ ගරු මන්ත්‍රීතුමා කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් සිටියදී රුපියල් ලක්ෂ 345 ක් තරම් වූ මුදල් කෘෂි කර්මය වෙනුවෙන් දී තිබෙනවා. එහෙත් කෘෂිකර්මය දියුණු කළ යුතු බව කියන වර්තමාන ඇමතිතුමා සිය සැලැස්ම මගින් 1965-66 වර්ෂය සඳහා දී තිබෙන්නේ රුපි යල් ලක්ෂ 250 යි. එය කලින් වෙන් කළ මුදලට වඩා හුඟක් අඩුයි. 1966-67 දී වෙන් කළ මුදල රුපියල් ලක්ෂ 270 යි. 1967-68 දී වෙන් කරන මුදල රුපියල් ලක්ෂ 300 යි. 1964 දී දුන් ප්‍රමාණයටත් වඩා අඩුවෙනුයි, මේ අවුරුද්දේ ගොවීන්ට ණය දෙන්නට බලාපොරොත්තු වන්නේ. ඉතින් ගොවීන්ට මේ විධියට සලකන ගමන් අස් වැන්න වැඩි කර ගන්නට පුළුවන් යයි කියන්නේ කොහොමද?

ඊළඟට බිත්තර වී ගැන කල්පනා කර බලමු. දැන් රට පුරාම බිත්තර වී හිඟයක් තිබෙනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තීරණයක් පත්තර මාර්ගයෙන් මා කියෙව්වා. "මැයි මාසයේ සිට එච් 4 සහ අනික් හාර මාස් වීත් තහනම්" යනු ඒ තීරණයයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මේ තීරණය වී වගාව ගැන නියෝගයක් බව සැලකිය යුතුයි. බිත්තර වී නැතිව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

ගියේ කෙසේද කියා දැන ගත්තොත් ගරු ඇමතිතුමා පුදුම වේවි. වගාව සඳහා අක්කර දහස් ගණනක් ලබා ගත් සමහර උදවිය ගරු ඇමතිතුමාගේ බිත්තර වී ගබඩාවලින් වී විශාල ප්‍රමාණයක් ලබාගෙන තිබෙනවා. ගොවිතැන් කටයුතුවල යෙදෙන ගොවීන්ට දිය යුතු ඒ බිත්තර වී ඇත්තෙන්ම ඒ ගොවීන්ට නොලැබී අක්කර දහස් ගණන් ඉඩම් ලබාගෙන ඇති උදවියට ලැබුණා. "මම අක්කර 1,000 ක් ගත්තා. ඒ නිසා මට එහි ඉහින්නට වී බුසල් 2,000 ක් ඕනෑ" යයි කියමින් එච් 7 සහ අනික් වී වර්ග ගත් සමහරුන් ඊට පසුව කෙළේ මොකක්ද? රුපියල් 16 බැගින් වී ලබා ගත් ඔවුන් අපේ ප්‍රදේශවලට ඇවිත් රුපියල් 24 බැගින් වික්කා. විශාල වශයෙන් ඉඩම් ලබා ගත් අයගේ එක් කුට වැඩ පිළිවෙළක් ඕකයි. "බිත්තර වී ඕනෑ තරම් දෙන්නට පුළුවන්" යනුවෙන් එදා අපට කියමින් අපේ ප්‍රදේශය සඳහා වී බුසල් 4,000 ක් දෙන්නට පොරොන්දු වුණත් එසේ පොරොන්දු වී සති දෙකකට පසුව බිත්තර වී දිය නොහැකි බවට පණිවුඩයක් එව්වා. කොහෙද ඒව ගියෙ? අන්තිමේ බලන විට බිත්තර වී ටික සේරම ලොකු පුද්ගලයකුගෙ සාක්කුවට ගිහින්. බුසල රු. 16 ට 18 ට ගත් ඒ බිත්තර වී අපේ ගම්වලට ගෙනැත් බුසල රු. 24 ගණනෙ වික්කා. ඔය එච්. 7 වී වගීය. යම් විධියකින් වී මිළ වැඩි වුණා නම් ඒව යන්නෙ බිත්තරට නොව කෑමටයි. ඔන්න ඔය විධියෙ තත්ත්වයක් අද පවතින්නෙ.

ට්‍රැක්ටර්වලට සිදුවන්නෙ මොකක්ද? ඒක බිත්තර වී වලට සිදුවන දේට වඩා භයානකයි. මා කොළඹ දිස්ත්‍රික්කයට අයිති නිසා කොළඹ දිස්ත්‍රික්කයෙ තත්ත්වය ගැන පමණයි මට කියන්නට පුළුවන් වන්නෙ. "ට්‍රැක්ටර් මෙපමණ ගණනක් රටට ගේනවා, දැන් ඉතින් රට ස්වයංපෝෂිත කරන්න පුළුවන්ය" යි කවුරුත් කිව්ව. "ට්‍රැක්ටර් මෙපමණ ගණනක් ලබා ගන්නට ආධාර ලැබුණා; කුරුණෑගල සත්‍යවාදී සමාගම මෙපමණ ගණනක් ගෙන්වනවා; අඹුවල් කොම්පැනිය මෙපමණ ට්‍රැක්ටර් ගණනක් ගෙන්වනවා" ආදි වශයෙන් ආරංචි අසන්න ලැබුණා. එහෙත් මගේ කල්පනාවෙ හැටියට නම්, කොළඹ දිස්ත්‍රික්කයට ගෙනා ට්‍රැක්ටර් එකක්වත් කුඹුරුවල වැඩට යෙදිලා නෑ. කොළඹ දිස්ත්‍රික්කයට ගෙනා ට්‍රැක්ටර්වලින් සියයට 80 ක්ම බඩු එහා මෙහා ගෙනයාමට පාවිච්චි කරනව.

දිවුලපිටියෙ විවිධ සේවා සමුපකාර සමිති සංගමයට ට්‍රැක්ටරයක් දී තිබෙනව. හාන්න ලබා ගත් ඒ ට්‍රැක්ටරයෙන් කෙරෙන්නෙ කුළුබඩු එහාමෙහා ගෙනයාමයි. දිවුලපිටියෙ පොල් නිපදවන්නන්ගෙ සමුපකාර සමිතියට ට්‍රැක්ටරයක් දී තිබෙනව. ඒ සමිතිවලට ට්‍රැක්ටර් දුන්නට මගේ විරුද්ධත්වයක් නැහැ. ඒව කුළුබඩු අදින්නත් පොල් හෝ කොහු හෝ එහා මෙහා අදින්නත් යෙදවීම වැරදියි. පොල් වතු හිමි පුද්ගලයින් කීපදෙනකුට ට්‍රැක්ටර් දී තිබෙනව. මෙහි චාරිත්‍රගතවන නිසා ඒ අයගෙ නම්ගම් කියන්න මම කැමැති නැහැ. මීරිගම ප්‍රදේශයෙ සහෝදරයින් දෙදෙනකුට ට්‍රැක්ටර් දී තිබෙනව. එහෙත් කිසිම ගොවියකුට ඒවායින් ප්‍රයෝජනය ලබා ගන්න බැහැ. හාන්නට වුව මනා වී ගොවියෙක් ට්‍රැක්ටරයක් ලබා ගන්නට ගියොත් මෙපමණ මුදලකට කර දෙන්නම් කියා පොරොන්දු වන නමුත් අන්තිම මොහොතේ ට්‍රැක්ටරය ලබා ගන්න ගියහම ඒ පොරොන්දුව කඩ කරනව. මේ තත්ත්වය ගැන ගරු ඇමතිතුමා ටිකක් සොයා බලනව නම් හොඳයි. ගරු ඇමතිතුමාට මෙය පාලනය කරන්න බැහැ. එහෙත්, ගොවි කාරක සභා මගින් ට්‍රැක්ටර් ඉල්ලන විට ගොවීනට ඒවා ලබා දීම සඳහා කිසියම් වැඩ පිළිවෙළක් සකස් කිරීමට අඩු වශයෙන් යෝජනාවක්වත් ඉදිරිපත් කරන්න ඕනෑ. මා මෙහිදී කිසිවකුට පෞද්ගලිකව චෝදනා කරන්නෙ නෑ. රට සංවර්ධනය වෙනොත් ඒ ගැන අප කවුරුනුත් කැමතියි. එහෙත් නියම විධියට වැඩ කෙරෙන්නෙ නැතිබව පෙන්වා දෙන්න ඕනෑ. වැඩ කරන ගොවියකුට ට්‍රැක්ටරයක් වුවමනා වූ විට එය ඔහුට කරදරයක් නැතිව කෙළින්ම ලැබෙනවද යන වග ගරු ඇමතිතුමා සොයා බලන්න ඕනෑ. "අප ට්‍රැක්ටර් මෙච්චර ගණනක් ගෙන්නුව; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ රජය කිසිම දෙයක් කෙළේ නැහැ" ආදී වශයෙන් ගරු ඇමතිතුමා මෙහිදී කියයි. එහෙත් ඇත්ත වශයෙන් තිබෙන තත්ත්වය ඉතාම කනගාටුදායකයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජීප් රථ සම්බන්ධයෙනුත් පවතින්නෙ මෙවැනිම තත්ත්වයක්. "ලේඩීස් කොලෙජ්" එකට ළමයින් අදින්න පවා අද ඒවා පාවිච්චි කෙරෙනව. කුරුඳුවත්තෙ මඟුල් ගෙවලට සමහර අය යන්නෙ මේ ජීප් රථවලින්.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

කාර්එක නැති නිසා වෙන්න ඇති.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

රට සංවර්ධනය කිරීමේ කටයුතුවලට ගෙනා වාහනවලට අද සිදුවී තිබෙන්නෙ ඔකයි. මේ තත්ත්වය උඩ, මේ රජයෙ සංවර්ධන කටයුතු හරියාකාර කෙරෙනව යයි අපට විශ්වාස කරන්න බැහැ.

වී නිෂ්පාදනය ගැන නියම සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන ලෙස මා මේ අවසථාවෙදි ගරු ආහාර ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව. මේ පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් මා ගරු ඇමතිතුමාගෙන් බලා පොරොත්තු වෙනව. වී නිෂ්පාදනය ගිය මහ කන්නයේදිට වඩා මෙවර වැඩි වුණා යයි මේ රාජාසන කථාවෙහි සඳහන් කර තිබෙනව. ඒ වැඩිවීමේ ප්‍රමාණය කොපමණද යන බව මා දැනගන්න කැමතියි. කාගෙත් දැන ගැනීම සඳහා එය ඉදිරිපත් කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනව. මට ලැබී තිබෙන ආරංචිය නම් මෙහෙමයි: කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කියා තිබෙන්නෙ වී බුසල් ලක්ෂ 53 ක් ලැබුණු බවයි. ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව කියන්නෙ ලක්ෂ 34 ක් ලැබුණු බවයි. මේ දෙකෙන් කොයික හරිද යන වග අප දන්නෙ නෑ. එම නිසා නියම ප්‍රමාණය දැනගන්න අප කැමතියි. ලැබී තිබෙන වී ප්‍රමාණයෙ නියම ගණන සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට ගියායින් පසු එම දෙපාර්තමේන්තුවෙන් කිසියම් සංඛ්‍යා ලේඛනයක් ප්‍රසිද්ධියට පත් කළා නම් එය අපට විශ්වාස කරන්න පුළුවනි. එහෙත් සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට තවම ඒ සංඛ්‍යා ලැබී නැහැ. එහෙම නම්, මේ ප්‍රසිද්ධ කර තිබෙන සංඛ්‍යා ලේඛන මොනවාද? එසේ ලැබිල නැත්නම් මේ ගණන් කොහොමද රාජාසන කථාවට ඇතුළත් වුණේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වී නිෂ්පාදනය ගැන 1950 දී ලියා තිබුණ ලිපියක් මම ඊයෙ පෙරේදා කියෙව්වා. 1950 දී දැනට සිටින ගරු රාජ්‍ය ඇමතිතුමා ආහාර ඇමති වශයෙන් සිටින කාලයේදී බොහොම ආඩම්බරයෙන් "ඩේලි නිව්ස්" පත්‍රයට ලියවිල්ලක් ලිව්වා. ඒ ලියවිල්ලේ මෙහෙම තියෙනව :

"It is clearly shown that Ceylon is in a position to produce all the rice she needs by 1953—"

මේ ආණ්ඩුවම කියපු දෙයක්. 1953 දී ස්වයම්පෝෂිත වෙනවය කියා 1950 දී කිව්වා.

"—if only the yield can be increased from 10.2 to 42 bushels of paddy per acre."

1950 දි අක්කරයකින් ලැබුණේ බුසල් 10.2 ය, 1953 දී ඒ ගණන අක්කරයට බුසල් 42 කර ගත්තම වැඩය සම්පූර්ණ වෙනවය කියා ආඩම්බරයෙන් කිව්වා.

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)**
*(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)*
(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

එදාට වඩා අද ජනගහනය වැඩි වෙලා තියෙනව.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

තමුන්නාන්සේලා හරියාකාර සංඛ්‍යා ලේඛන ලබාගෙන නැති බවයි, එයිනුත් පෙනෙන්නෙ. මහජනයාට ප්‍රකාශයක් කරන විට ඒ විධියට එහෙන් මෙහෙන් ප්‍රකාශ නොකර පැහැදිලි විධියට ප්‍රකාශයක් කරන්න ඕනෑ. කරන්න බැරි දෙයක් කියන්න හොඳ නැහැ. මම මේ ලිපිය ගරු ඇමතිතුමාට පෙන්වන්න කැමතියි. ඒ ලිපිය ඒ තරම් රසවත් එකක්. එදා දෙන්න අදහස් කළ බෙහෙතමයි, අදත් දෙන්න යන්නෙ. එදා ඒක වැරදුනා නම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අදත් ඒක වරදිනව. මුළු ශක්තියම යොදවා ආහාර නිෂ්පාදනය දියුණු කරන්නට සෑම තැනැත්තාම උත්සාහ කරන්න ඕනෑය කියා එදත් කිව්වා. නමුත් අදහස ඉෂ්ට වුනේ නැහැ.

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ඇචායෘී එන්. එම්. පෙරේරා) වැදගත් කරුණක් ඉදිරිපත් කළා. මේ ආණ්ඩුව පටන්ගත් දා පටන්ම, එක්තරා විධියක දේශපාලන හැඟීම් තියෙන—එක්තරා විධියක දේශපාලන ප්‍රතිපත්ති තිබෙන—යම් යම් බටහිර රටවල් අනුගමනය කරන ලෝක බැංකුව කියන විධියට කටයුතු කරනවය කියා එතුමා ප්‍රකාශ කළා. මේ ආණ්ඩුව පටන් ගත් දා පටන්ම අපට කීවේ බත් කන්න එපාය, බත් කෑවොත් දියවැඩියාව හැදෙනවය, ජනගහනය වැඩි වෙනවාය, කියායි. ඒ නිසා බත් කන්නෙ නැතිව පිටි කාපල්ලය, වෙන වෙන ජාති කාපල්ලය කිව්වා. සෑම තැනකදීම මේ ආණ්ඩුව ඔය විධියට ප්‍රකාශ කළා. හාල් කෑමේ ආදීනව හැම තැනදීම විස්තර කළා. මේ ප්‍රකාශ ගැන අප කල්පනා කරන විට එක්තරා විධියක යටිකූට්ටු කුමන්ත්‍රණයක් තිබෙන බව පෙනෙනවා.

තායිලන්තයේ හාල් වලට මොකද වුණේ ? තායිලන්තය හාල් පිට රට පටවන බව නමුන්නාන්සේලා අහල තියෙනවා. තායිලන්තය තමයි, සෑහෙන විධියට හාල් පිටරට පැටෙව්වෙ. මේ රට ඇමෙරිකානු බලපෑම්වලට තදින්ම යටත්ව තිබූ රටක්. ඇමෙරිකාව මොකද කළේ ? ඇමෙරිකාව මැදහත් වෙලා අවුරුදු දෙක කටම සෑහෙන හාල් එක අවුරුද්දකින් නිපදවා ගන්න උදව් කළා. ඒ අවුරුද්ද ගියාට පස්සෙ ඊ ළඟ අවුරුද්දේ පිටරට පටවන්න හාල් නැතිව ගියා. ඇමෙරිකාවේ බලපෑම නිසයි, ඒක වුනේ.

අද බුරුමයේ මොකද වෙලා තියෙන්නෙ ? අද බුරුමය ඇතුළේ විදේශීය බලපෑම් කොයි තරම් තියෙනවද කිව්වොත්, සී. අයි. ඒ. කියන සංවිධානය ඒ රටේ සමහර ගොවීන් සමග එකතු වෙලා නේවින්තුමාට විරුද්ධව සංවිධාන ශණනාවක්ම ඇති කර නිෂ්පාදනය අඩු කිරීමට වැඩ පිළිවෙළක් ගෙන ගොස් තිබෙනවා.

ලෝකයේ වැඩිම සහල් ප්‍රමාණයක් නිෂ්පාදනය කළේ වියට්නාමයෙ මීකොං මිටියාවතේ බව නමුන්නාන්සේලා දන්නවා. වියට්නාමයටත් ඔය කරදරේ ඇති වුණා. ඇමෙරිකාව වියට්නාමයේ යම් යම් බලපෑම් කර ඒ රට සම්පූර්ණයෙන්ම ගිල ගැනීමේ වැඩ පිළිවෙළක් ගෙන යනවා.

ඉන්දුනීසියාවෙ මොකක් ද වුණේ ? ඉන්දුනීසියාව පසුගිය වර්ෂය වන තුරු පිටරටින් හාල් ඇටයක්වත් ගෙන්වා ගත්තෙ නැහැ. එය හාල්වලින් ස්වයම් පෝෂිත වූ රටක් වශයෙනුයි තිබුණේ. නමුත් ඉන්දුනීසියාවේ දේශපාලන තත්වය කෙරෙහි අමෙරිකාව කළ යම් යම් බලපෑම් නිසා ඒ රටේ දේශපාලන තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් අතකට හැරුණු අතර, අද ඒ රටත් හාල් පෝලිමේ ඉන්නවා. මෙය අප විසින් කල්පනාවට ගත යුතු දෙයක්. ඒ රටවල තත්ත්වය එහෙමයි.

නමුත් පිලිපයින් දූපතේ තත්ත්වය මොකක්ද ? ඒ රටේ තිබෙනවා, හාල් නිෂ්පාදනය පිළිබඳ නොයෙකුත් විශාල පර්යේෂණාගාර. අයි. ආර්. ආර්. 8 නමැති ඉතා අගනා වී වර්ගයක් එහි තිබෙනවා. එය හැම රටකම බෝ කරන්නට බැහැ. එය බෝ කරනොත් බෝ කරන්නෙ නිකම් නොවෙයි. ඒවා නිකම් දෙන්නෙ නැහැ. ඔවුන්ටත් යම් යම් උදව්පදව් දුන්නොත් තමයි, ඒ විශේෂ වී වර්ගය දෙන්නෙ.

එක් අතකින් අපට කියනව, "හාල් කන්නට එපා, පිටි කාපල්ලා" කියා. පිටි වැඩිපුර තිබෙන්නෙ කොහෙද ? පිටි වැඩිපුර තිබෙන්නෙ, අමෙරිකාවෙ හා ඕස්ට්‍රේලියාවෙයි. ඒ නිසා අප—විශේෂයෙන් මේ රජය—එක් දෙයක් කල්පනා කළ යුතුයි. අමෙරිකානුන් මේ ගෙන යන්නෙ. තීක්ෂණ වැඩ පිළිවෙළක්. අමෙරිකානුන් ගෙන යන්නෙ ආසියාතික රටවල දේශපාලන තත්වයට, වෙළහෙළඳාමට පමණක් නොව බඩටත් තට්ටු කරන වැඩ පිළිවෙළක් බව අප හිතේ තබා ගත යුතුයි. එවැනි තත්ත්වයක් අද පැන නැඟී තිබෙනවා. ඒ අතර මේ රජය ඒ තත්ත්වයට කැමැත්ත පළ කර, ඊට අනුකූලතාව දක්වා "හාල් කෑම හොඳ නැත" කියා පියවරකුත් ගෙන තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ රජය හැම අවස්ථාවකදීම, හැම කට යුත්තකදීම ක්‍රියා කරන්නෙ ලෝක බැංකුව කියන විධියටයි. ලෝක බැංකුව කිව්වොත් අධ්‍යාපන පහසුකම් නැති කරන්න කියා රජය ඒ අනුව කටයුතු කරනව. ලෝක බැංකුව ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් යම් උපදේශයක් දුන්නොත් රජය ඒ අනුව ක්‍රියා කරනව. ලෝක බැංකුව සෞඛ්‍ය ප්‍රශ්නය සම්බන්ධයෙන් යමක් කීවොත් එයත් ඒ විධියට කරනව. විදේශ විනිමය ගැන කීවොත් ඒ විධියට විදේශ විනිමය පාවිච්චි කරනව. ලෝක බැංකුව මොනව කීවත් ඒ විධියට කටයුතු කරනව. මා හිතන්නෙ. මේ යුගයෙ තරම් ලෝක බැංකු වාර්තා පිට වුණු යුගයක් වෙන කවදාවත්ම ඇති වී නැහැ. මේ ලෝක බැංකු වාර්තා යුගයක්. ලංකාව තරම් ලෝක බැංකු වාර්තා වලට කැමති වී ඒ අනුව කටයුතු කරන අන් කිසිම රටක් නැති බව කණගාටුවෙන් වුවත් ප්‍රකාශ කරන්නට ඕනැ.

ගරු ධීවර හා කර්මාන්ත ඇමතිතුමාට එක් දෙයක් කිව යුතුයි. එතුමා ලෝක බැංකු වාර්තා අනුව ප්‍රතිපත්ති ගණනාවක් සකස් කර තිබෙනව. අපි ඊයේ පෙරේදා මීගමුවේ හිටිය. ඊට කලින් දෙවුන්දර ගන්දර පැත්තෙ හිටිය. ඇත්ත වශයෙන් ම ඒ පළාත්වල ධීවර කාර්මිකයන් අඩු තරමින් බෝට්ටුවක්වත් නැති තත්ත්ව යකට, ප්‍රපාතයකට, වැටී සිටිනව.

මම එක් කරුණක් පෙන්නුම් කර දෙන් නම්. ධීවර කර්මාන්තය පිළිබඳ 1958 පැවැති තත්ත්වය අපි බලමු. ඒ කාලෙ ලංකාවෙ ජනගහනය ලක්ෂ 90 යි. ඒ ජනගහනයට අවශ්‍ය වූ මාලු ප්‍රමාණය ටොන් 25,000 යි. 1967 වන විට ජනගහ නය ලක්ෂ 20 කින් පමණ වැඩි වී තිබෙ නව; නමුත් අද මාලු ටොන් 80,000 ක් පමණ නිෂ්පාදනය කරනව. එදා 90,00,000 කට මාලු ටොන් 25,000 යි; අද 1,10,00,000 කට මාලු ටොන් 80,000 යි. නමුත් මාලු මිල එදාට වඩා තුන් හතර ගුණයකින් පමණ වැඩියි. නිෂ්පාදනය වැඩි වන විට මිල බහින්නට ඕනැ. ඕනෑම කර්මාන්ත යක නිෂ්පාදනය වැඩි වන විට මිල අඩු වෙනව. නමුත් මාලු නිෂ්පාදනය සම්බන්ධ යෙන් ඇති වී තිබෙන තත්ත්වය මොකක් ද? ධීවර කර්මාන්තයේ තිබෙන සමහර දූෂිත වැඩ පිළිවෙළවල් නිසා අල්ලන මාලු ප්‍රමාණයෙන් සමහරක් මහජනයාගෙ ආහාරයට නුසුදුසු තත්ත්වයකට පත් වෙනව; මාලු කුණු වෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඊයෙ-පෙරේද මීගමුවේ සිටි නිසා එහි ධීවර කාර්මිකයින්ට බලපාන වැදගත් කරුණක් මතක් කරන්ට ඕනැ. අපේ මීගමුවේ ගරු මන්ත්‍රීතුමා (ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.) මේ ස්ථානයේ සිටීම ගැන මා සන්තෝෂ වෙනව. එතුමාත් මේ කාරණයට එකඟ වෙනවා අනැයි මා විශ්වාස කරනව. සමහර විට එකඟ නොවෙනවාත් ඇති. කෙසේ වෙතත් මීගමුවේ ධීවර කාර්මිකයින්ගෙන් සියයට 95 ක් විතර කියනව, විශාල නයි ලොන් දැල් පාවිච්චිය මේ රටට අහිතකරයි කියා. එහි සත්‍යතාවක් තිබෙනව. දැල් වලින් මාළු ඇල්ලීම ලෝකයේ හැමතැනම වගේ තිබෙන වැඩ පිළිවෙළක්. නිව් පවුන්ඩ්ලන්ඩ්, ජපානය, වැනි රටවලත් දියවැල් තිබෙන ප්‍රදේශවලත් නයිලොන් දැල් පාවිච්චි කර මාළු ඇල්ලුවට කිසිම වරදක් නැහැ. එහෙත් මීගමුව වගේ ගොඩබිම අවට මුහුදේ නයිලොන් දැල් පාවිච්චි කර මසුන් ඇල්ලීම නිසා අද අස රණ ධීවර කාර්මිකයන් අන්ත ප්‍රපාතය කට වැටී සිටිනව. මේ විශාල නයිලොන් දැල් පාවිච්චි කර ගොඩබිම වටේ මසුන් ඇල්ලීම නිසා හම්බන්තොට සිට පුත්තලම දක්වා සිටින පරම්පරාගත ධීවර කාර්මික යින්ට අද ඔවුන්ගේ ජීවිකාව කරගෙන යාමට අපහසු තත්ත්වයක් උද්ගත වී තිබෙනව.

විශාල නයිලොන් දැල් පාවිච්චි කරන්ට එක්තරා ප්‍රදේශයක් වෙන් කළාට වරදක් නැහැ. සාමාන්‍යයෙන් උතුරුකරයේත්, කැලෑ ප්‍රදේශ අසල මුහුදේත් ඒ දැල් පාවිච්චි කිරීම ගැන කවුරුවත් විරුද්ධ නැහැ. හැම නයිලොන් දැලක් ගැනම නො වෙයි මා කියන්නෙ. අඟල් 4 ට වඩා ලොකු "බිග්fපිෂ් නයිලොන් fපිෂිං නෙට්" කියන ඒව ගැනයි මා කියන්නෙ. ඒ දැලක් අඩු ගණනේ හැතැප්මක් විතර දිගයි; බඹ 25 ක් විතර පළලයි. ඒ දැලක් දැම්මට පසු ඒ අවට සිටින ලොකු මාළුවයි, කුඩා මාළුවයි, ඔවුන්ගෙ බිත්තරයි ඔක්කොම සම්පූර්ණයෙන්ම කොටුවී ප්‍රදේශයම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

වද වී යනව. ඊට පසුව පිත්තෙන් බිලි බාන කුඩා කාර්මිකයන් ගොස් ඔවුන්ගේ මසුන් ඇල්ලීමේ වැඩ පිළිවෙළ යෙදුවාම එක මාළුවෙකුවත් අහු වෙන්නෙ නැහැ. ඉතින් ඔවුන්ට නිරාහාරව සිටින්ටයි සිදු වෙන්නෙ. ලෝක බැංකු වාර්තාවෙන් ඉල්ලා සිටින්නෙ නයිලොන් දැල් පාවිච්චි කරන්න කියායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1966 අගෝස්තු මාසයේ 26 වැනිදා පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) මේ ප්‍රශ්නය මේ ගරු සභාවට ඉදිරිපත් කළ අවස්ථාවෙදි ගරු කර්මාන්ත හා ධීවර ඇමතිතුමා ඒ ගැන සොයා බලන බව කිව්ව. නමුත් ඒ සම්බන්ධයෙන් මේ දක්වා කිසිම සැලකිල්ලක් දක්වා නැති බව පෙනෙනව. ධීවර කාර්මිකයන්ට සහනයක් ලැබෙන වැඩ පිළිවෙළක් මේ රාජාසන කථාවේ වුණත් ඇතුළත් වෙලා නැහැ. ධීවර සංස්ථාව ගැන නම් කියා තිබෙනව. ධීවර සංස්ථාව ධීවර කාර්මිකයන්ට වුවමනා උපකරණ ලාභයට සපයනවද? සුළු ධීවර කාර්මිකයන්ට තමන්ගේ බෝට්ටු යන්ත්‍ර අළුත්වැඩියා කර ගන්ට කම්හලක්— "සර්විස් ස්ටේෂන්"—පිහිටුවනවද? අපේ මාළු පිටරට යවනවාය කියල නම් කිව්ව. මම දන්නෙ නැහැ, කවුරු පිටරට පටවන වද කියා. නමුත් අපට කන්ට නම් මාළු නැහැ, මේ රටේ. [බාධාකිරීමක්] මම මාළු අල්ලන්න දන්න මිනිහෙක් නොවෙයි. ඇමතිතුමායි, මායි, මා හිතන්නෙ, ලූලෙක් වත් අල්ලල නැහැ කියලයි.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)*
(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)
මඩකරි.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
කාවයියො අල්ලල තියෙනව. ඒ කෙසේ වෙතත් මේ කාරණය ගැන ගරු ඇමතිතුමා යම් සැලැස්මක් ඇති කළොත් හොඳයි. අඟල් 4 ට වඩා ලොකු නයිලොන් දැල් යම් ප්‍රදේශවල පාවිච්චිය තහනම් කිරීමේ වැඩ පිළිවෙළක් යෙදුවොත් අදට වඩා අපේ නිෂ්පාදන ප්‍රමාණය වැඩි වෙයි කියා මා විශ්වාස කරනව. සමහර විට තමුන්නාන්සෙලාගෙ නිලධාරීන් කියනවා ඇති, නිෂ්පාදනය බැහැගෙන යන නිසා කුඩා නයිලෝන් දැල් පාවිච්චි කළාට කමක් නැති බවක්. ඒවායින් පොඩි මාලු අහු වෙනව. මහ ඒවා පාවිච්චි කළාම දුක්ඛිත තත්ත්වයක ඉන්න පරම්පරාගත කාර්මිකයා-බෝට්ටු ගන්න බැරි කාර්මිකයා-ආරක්ෂා වන විධියේ වැඩ පිළිවෙළක් යෙදිය යුතු බව කියන්න කැමතියි.

රාජාසන කථාවේ රැකීරක්ෂා ප්‍රශ්නය ගැන කථා කරනව. ජීවන වියදම සම්බන්ද ප්‍රශ්නය යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඉදිරිපත් කළා. මේවා දැවෙන ප්‍රශ්න. මේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නය ගැන විශාල වශයෙන් පුරසාරම් දෙඩුවෙ පසුගිය කාලයෙදී මේ ආණ්ඩුවයි. අසුවල් කර්මාන්තය—අසුවල් වැඩේ—පටන් ගත්තම මේ තරම් ලක්ෂ ගණනකට රක්ෂා ලබා දෙන්න පුළුවන් වෙනව කිව්වා. පේසකර්ම මධ්‍යස්ථාන දහක් විවෘත කරන බවත් එයින් විසිපන් දහකට රැකීරක්ෂා ලැබෙන බවත් කියා සිටියා. හය මාසයක් ඇතුළත ඒ තරම් විශාල පිරිසකට රක්ෂා ලැබෙනවය කිව්වා. විශාල පිරිසකගෙ රැකීරක්ෂා ප්‍රශ්නය අවසන් වෙනවය කිව්වා. එතකොට ජාතික ආණ්ඩුවට කරදර වෙන්නෙ නැතෙයි කිව්වා. එහෙත්, දැන් පෙනෙන හැටියට නම් එවැන්නක් ගැන කියන්න පුළුවන් කමක් නැහැ. දැනටමත් පෞද්ගලික පේසකර්මාන්ත ශාලාවල සේවයේ නියුක්ත උදවියගෙන් සියේට දහයක සුළු සංඛ්‍යාවක් හැරෙන්නට ඉතිරි සියේට අනූවටම ගෙදර යන්නයි සිද්ධවෙලා තියෙන්නෙ. මා නියෝජනය කරන කොට්ඨාශයේ එවැනි තත්ත්වයක් ඇති වේගෙන යනව. පසුගිය අවුරුද්දේ නූල් ගෙන්වීම සඳහා රුපියල් හතළිස් දහක් වැය කරන්න ඉඩ දුන් පේසකර්මාන්ත ආයතනයකට මේ අවුරුද්දෙ දෙන්නෙ රුපියල් හාර දහක් පමණයි. රුපියල් තිස් දහක් ලැබුණු ආයතනයකට රුපියල් තුන් දහක් පමණයි දී තිබෙන්නෙ මෙදා. අද පවතින නූල් හිඟය උඩ රැකීරක්ෂා සැපයීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොවෙයි කෙරෙන්නෙ. දැනට කර කියා ගෙන ඉන්න රක්ෂාවලින් පවා ඉවත් වෙන්නයි වෙලා තියෙන්නෙ.

මා කල්පනා කරන හැටියට නම් කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා කල්පනා කර බැලුවොත්, උලු කර්මාන්තයේ යෙදී සිටින උදවිය සම්බන්ධයෙන් යමක් කරන්න පුළුවන් වේවි. සතියකට දින හයක් වැඩ කරන උලු කර්මාන්තශාලාවල දැන් වැඩ කෙරෙන්නෙ දින දෙක තුනක් පමණයි. මෙතන විදේශ විනිමය පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. මට මතක තිබෙන හැටියට නම්, 1962 අවුරුද්දෙ අපේ ආණ්ඩුව ඉදිරිපත් කළ රාජාසන කථාවෙ ඇතුළත් වුණු වැඩ පිළිවෙළක් ගැන විරුද්ධ පාර්ශ්වයේ එවකට හිටපු බොහොම දෙනෙක් අපට පොඩි විහිළුවක් කළා. පිදුරු සහ අතු සෙවිලි කරන ලද පැල්පත්වලට උලු සෙවිලි කරන ලද වහලවල් ඇති කර ගැනීමට හැකි වන විධියේ වැඩ පිළිවෙළක් සකස් කිරීමට අප බලාපොරොත්තු වන බව එදා රාජාසන කථාවේ අඩංගු වුණා. මේ ආණ්ඩුවට දැන් පුළුවන් කම තිබෙනවා ඒ උදවියට උලු සපයා දෙන්න. තමුන්නාන්සෙලාට උලු කර්මාන්තශාලා ගණනාවක් තිබෙනව. බංගදෙනිය යනාදි ප්‍රදේශවල උලු කර්මාන්ත ශාලා තිබෙනව. පෞද්ගලික උලු කර්මාන්තශාලා සෑහෙන ප්‍රමාණයක් තිබෙනව. අනන්ත අප්‍රමාණ උලු නිෂ්පාදනය වී තිබෙනව. වැඩිපුර තිබෙන උලු අරන් බෙදා දෙන්න පුළුවනි. ඒවා නිකම් ගොඩ ගහලා තියෙනවට වඩා හොඳයි අතු සෙවිලි කර තිබෙන ගෙවලට ඒවා ලැබෙන්න සලස්සනවා නම්. මෙවැනි රාජාසන කථාවකින් මේ ආණ්ඩුව මේ රට දියුණු කරනැයි අපට නම් විශ්වාස කරන්න බැහැ.

හැමදාම උදේට ගොවි ගීයක් ඇහෙනව. බෙරිහන් දෙනව ඇහෙනව. මුළු දවසෙම කිසිම වැඩක් කරන්න බැහැ. මේ ගීය අයින් කරන්න. මේ බෙරිහන් දීම අයින් කර දමා ජයමංගල ගාථාවක් කියන්න සලස්සන්න. වගා ගීය කියලා එකක් උදේ පාන්දර ගැයුවට වැඩේ හරි යන්නෙ නැහැ. මේ රටේ පරම්පරාගත නිෂ්පාදකසින්ට අත නොදී වෙන වෙන ක්‍රියා මාර්ග යෙදීමට තැත් කිරීමේ ප්‍රතිඵල භයානක විය හැකි බව අපට පෙනී යනවා. මෙතෙක් කල් මේ රටේ ඇත්ත වශයෙන්ම ගොවිතැන් කළෝ ගොවියෝයි. මේ රටේ යම් නිෂ්පාදනයක් කරන්නට මහන්සි වුණු පිරිසක් සිටියා නම් සිටියේ කාර්මිකයෝ. මේ රටේ ආධාර ලැබීමට සුදුස්සෝ ගොවියෝ, කාර්මිකයෝ. පරම්පරාගත ගොවීන්ටත් කාර්මිකයන්ටත් ආධාර ලැබෙන්න ඕනෑ. එහෙත් එවැන්නන්ට දැන් නිසි පරිදි ආධාර ලැබෙන්නෙ නැහැ. ගොවියා සඳහා වෙන් කරනු ලබන ආධාරය ගොවියා වෙත යන්නෙ නැහැ. ධීවර කාර්මිකයා වෙත යා යුතු ආධාරය ධීවර කාර්මිකයා වෙත යන්නෙ නැහැ. අනෙකුත් දේශීය නිෂ්පාදකයන් වෙත යා යුතු ආධාර ඒ ඒ අංශවලට යන්නෙ නැහැ. හැම අවස්ථාවේම ලොකු පුද්ගලයෙක් ඒකට හරස් කපා ඇති. ඒකට හේතුව මේ රජය ගෙන යන වැඩ පිළිවේළය කියා අපට කියන්ට පුළුවන්. මේ රජය පසුගිය අවුරුදු දෙක හමාර තුළදී උදව් කළේ මේ රටේ ධනේශ්වර පන්තියටයි. මමත් ආදායම් බදු ගෙවන කෙනෙක්. මා ගෙවන ආදායම් බද්දත් අඩුවී තිබෙනව. නමුත් ආර්ථික වශයෙන් මේ රටේ දුක් විදින නැනැත්තා තව තවත් ප්‍රපාතයට ඇද වැටුණා පමණක් නොවෙයි ඔහු අඳුරෙනුත් අඳුරට තල්ලු වුණා. අද ඔහු ඇත්ත වශයෙන්ම ඉතාමත් භයානක තත්ත්වයකයි ඉන්නෙ.

මේ රාජාසන කථාවෙන් ආලෝකයක් ඇතිවේවිය කියා අපට පෙනෙන්නෙ නැහැ. ආලෝකයක් ඇතිවෙන්ට විධියකුත් නැහැ. ආලෝකයක් එන්න විධියක් නැත්තෙ ඇයි? තමුන්නාන්සේලා මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් අනුගමනය කරනවාය, සමාජවාදී රටක් ඇති කිරීමට තැත් කරනවාය කියා වේදිකාවලදී කියනව. සමාජවාදයේ නාමයෙන් ආණ්ඩු කරනවාය කියා නිකම් කටින් පමණක් කියනව. ඒ අතර සමාජවාදයට පහර ගසා ධනවාදය රකින්ට යනව. එහි ප්‍රතිඵලය තමයි අද අපට මේ භුක්ති විදින්ට සිද්ධ වී තිබෙන්නෙ. මේ ආණ්ඩුව තියෙන්න තියෙන්න රට තව තවත් ප්‍රපාතයට වැටෙනව. එම නිසා මේ ආණ්ඩුව ගෙන යන මේ වැඩ පිළිවෙළට අපට සම්බන්ධ විය නොහැකි බවත් මේ වැඩ පිළිවෙළට අපේ සහයෝගය නොදෙන බවත් ප්‍රකාශ කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනව.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.56

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව කරන්ට පළමුවෙන් මේ ආණ්ඩු පක්ෂය දෙස ඔබතුමාගේ අවධානය යොමු කරවනව. බලන්න, කැබිනට් මණ්ඩලයම අස් වෙලා ගිහින් වගෙයි පෙනෙන්නෙ. මෙවැනි වැදගත් අවස්ථාවකදී වත් රාජාසන කථාව විවාද කරන මෙවැනි වැදගත් අවස්ථාවකදීවත් මේ ඇමතිවරුන්ට විරුඬ පක්ෂයේ අදහස්වලට හා යෝජනාවලට ඇහුම්කන් දෙන්ට ශක්තියක් නැතිවීම ගැන අපි පළමුවෙන්ම අපේ කණගාටුව ප්‍රකාශ කරන්ට ඕනැ. අද මේ විවාද කරන්නෙ මේ ආණ්ඩුවෙ තුන්වැනි රාජාසන කථාවයි. පළමුවැනි රාජාසන කථාවෙන් පොරොන්දු කීපයක් දුන්නා. ආණ්ඩුව ඒව ඉෂ්ට කළේ නැහැ. ඊළඟට දෙවන වරට රාජාසන කථාවක් පවත්වා එයිනුත් පොරොන්දු කීපයක් දුන්නා. ඒ දුන් පොරොන්දුත් ඉෂ්ටකළේ නැහැ. දැන් තුන් වන වරට රාජසන කථාවක් ඉදිරිපත් කර තිබෙනව. මහ හැල්ලක් ඉදිරිපත් කර තිබෙනව. මහජනයාට කියන්ට දෙයක් නැති නිසා, මහජන අධිකරණය ඉදිරියේ පෙනී සිටින විත්තිකරුවන් කන්නලව්වක්, අඳෝනාවක් ඉදිරිපත් කරනව වගේ හැල්ලක් තමයි මේ වර රාජසන කථාවෙන් ඉරිදිපත් කර තිබෙන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රාජාසන කථාව් විදේශිකයකු එහෙම කියෙව්වොත් පුදුම වේවි. මේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නය ගැන කිසිම සඳහනක් මේ රාජසන කථාවෙ නැහැ. මේ රටේ දිනපතා ඉහළ යන බඩු මිළ ගැන, ජීවන වියදම ගැන කිසිම දෙයක් මේ රාජාසන කථාවෙ නැහැ. රැකීරක්ෂා ප්‍රශ්නය ගැන, ජීවන වියදම් ප්‍රශ්නය ගැන කිසිම සඳහනක් කර නැති මේ රාජාසන කථාව කියවන විදේශිකයකු ඇත්ත වශයෙන්ම ලංකාව කොයි තරම් සමෘද්ධිමත් රටක් ද කියා මවිතයට පත් වෙනවාට කිසිම සැකයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රාජාසන කථාවෙ රැකීරක්ෂා ප්‍රශ්නය ගැන සඳහන් කර නැත්තෙ මක්නිසා ද? මේ ආණ්ඩුවේම ක්‍රම සම්පාදක මණ්ඩලයත් මධ්‍යම බැංකුවත් එකතුවී සකස් කළ වාර්තාවකින් කියනව 1971 අවුරුද්ද වන විට ලංකාවේ රැකීරක්ෂා නැති තරුණ තරුණියන්ගේ සංඛ්‍යාව දස ලක්ෂයක් වෙන වාය කියා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, Please! The sitting is suspended till 4.30 P.M.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින් අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி. ப. 4.30 வரை இடை நிறுத்தப்பட்டு மீண்டும் ஆரம்பமாயிற்று.

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed.*

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ආණ්ඩු පක්ෂයේ එක් පාර්ලිමේන්තු ලේකම්වරයකු පමණයි, පෙනෙන්ට ඉන්නෙ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

තමුන්නාන්සෙට පැය බාගයක් නියම කර තිබෙනව, කථා කරන්ට.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

බොහොම හොඳයි. මා කථා කරමින් සිටියෙ මධ්‍යම බැංකුවෙ වාර්තාව අනුව 1971 අවුරුද්ද වන විට මේ රටේ රැකීරක්ෂා නැති උදවියගෙ සංඛ්‍යාව දස ලක්ෂයක් වේවිය කියන කාරණය ගැනයි. රාජාසන කථාව දෙස බැලූ විට මේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නයක් නැති බවයි පෙනෝනෙ. මා අහනව තමුන්නාන්සෙලා රැකීරක්ෂා ප්‍රශ්නය විසඳා අවසානද කියා. මධ්‍යම බැංකුව කියන්නෙ බොරුද? එහෙම නැති නම් මේ ආණ්ඩුව කියන්නෙ බොරුද? මෙම රාජාසන කථාවෙ කොයිම තැනකවත් රැකීරක්ෂා ප්‍රශ්නය ගැන සඳහන් කර නැහැ. ආණ්ඩුවෙ ඇස් පෙනීම නරකද? මේ ආණ්ඩුවෙ සිටින්නෙ අන්ධයොද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ රටේ දිනෙන් දින උග්‍රවන රැකිරක්ෂා ප්‍රශ්නය පිළිබඳව ඒ උදවියට පෙනෙන්නෙ නැද්ද? ඇස් වහගෙනද බලන්නෙ? ඇස් වහගෙන බැලුවාම පෙනෙන්නෙ නැහැ නොවැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

මා කැමති නැහැ, සභාවේ කටයුතුවලට බාධා කරන්ට. නමුත් ආණ්ඩුව පැත්තෙ ඉස්සරහ පෙළ සම්පූර්ණයෙන් ම හිස්. සම්පූර්ණයෙන්ම හිස් ආසන තිබීම ගැන මා කනගාටු වෙනව. එම නිසා මා කියනව, ගණපූරණයක් නැති බව.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සිනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

**පසුව ගණපූරණයක් තුබූයෙන්—**

*சபை கணக்கிடப்பட்டு நிறைவெண் இல்லையென்று கண்டதனால் பிரிவு மணி அடிக்கப்படவேண்டுமென ஆணையிடப்பட்டது.*

*பிறகு, நிறைவெண் இருந்ததனால்—*

*House counted and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මා කියමින් සිටියෙ මෙම ආණ්ඩුවෙ ඇමතිවරුන්ට එක්කෝ ඇස් පෙනෙන්නෙ නැහැ, නැතිනම් ඒ අය ඕනෑ කමින්ම ඇස් වහගෙන සිටිනවාය කියන එකයි. එම නිසයි, මේ වර රාජාසන කථාවෙ රැකිරක්ෂා ප්‍රශ්නය ගැන කිසිම සඳහනක් නැත්තෙ.

මේ ඇමති මණ්ඩලයට ජීවන වියදම නගින බව පෙනෙන්නෙ නැහැ. මෙවැනි ප්‍රශ්නවලදි එතුමන්ල ඇස් පියාගෙන සිටින බවයි පෙනෙන්නෙ. මේ රටේ අද කොතරම් විශාල ආහාර ද්‍රව්‍ය හිඟයක් පවතිනවද යන්න නමුත් නාන් සෙලාට කියන්ට වුවමනා නැහැ. පරිප්පු, මිරිස්, රටලූනු යනාදී මහජනයාට එදිනෙදා වුවමනා කරන ආහාර ද්‍රව්‍ය කිසිවක් අද ලබා ගන්ට පුළුවන්කමක් නැහැ. මාතර නගරය වටා රවුමක් ගියත් පරිප්පු ඇටයක් සොයා ගන්ට බැහැ. අගමැතිතුමා ලෝකෙ වටේ ගිහින් හාල් ඇටයක් සොයාගන්ට බැරි වුණා වගේ මාතර නගරය වටා රවුමක් ගියත් පරිප්පු ඇටයක් සොයා ගන්ට බැහැ. කිරි ආහාර වර්ග ඇත්තෙම නැහැ.

මාතර එක් ගම්කාර්ය සභාවක් මගින් පාලනය වන මාතෘ නිවාසයක් බලන්ට මා ගියා. එහි සිටින මව්වරුන්ට බෙදා දෙන්ට කිරි ඇත්තෙ නැහැ. ඒ ගම්කාර්ය සභාවට සල්ලි තිබුණත් ඒ සල්ලි වියදම් කොට ලබා ගන්ට කිරි ආහාර ඇත්තෙ නැහැ. එතකොට මොනවද මේ මාතෘ නිවාසයෙ සිටින මව්වරුන්ට දෙන්නෙ? "ඇන්ටිපා" විතරයි. ඒක පණුවන් හැළෙන්නට දෙන බේතක් ඒ අනුව මීළඟ මැතිවරණයෙදි ඒ මව්වරු මේ ආණ්ඩුවටත් "ඇන්ටිපා" දේවිය කියායි, මා සිතන්නෙ. ඒ අය මේ ආණ්ඩුවට දෙනව ඇත්තෙ ඡන්දය නොවෙයි; ඇනටිපායි. ඒකයි මේ අයට දෙන්ට තිබෙන එකම බේත. ආහාර ද්‍රව්‍ය සොයා ගන්ට බැරිකම නිසා, අද මහජනතාවට උසුලන්ට බැරි තත්ත්වයක් පැනනැගී තිබෙනව.

ආහාර ද්‍රව්‍ය හැරෙන්නට, මහජනතාවට වුවමනා කරන වෙනත් උපකරණ වුණත් සොයා ගන්ට බැරි තත්ත්වයක් පවතිනව. මෝටර් රථයකට වුවමනා කරන අමතර කොටසක් සොයා ගන්ට බැහැ. එපමණක් නොවෙයි, දුප්පතාගෙ බයිසිකලයට වුවමනා කරන අමතර කොටසක්වත් ලබා ගන්ට බැරි තත්ත්වයක් පවතිනව. අපි දන්නවා බයිසිකල්වලින් තමන්ගේ ගමනාගමනය කරගන්නා විශාල සංඛ්‍යාවක් අද ඉන්න බව. දුප්පත් මිනිහගෙ වාහනය බයිසිකලයයි. ඒ වාහනයේ කොටස්වල මිල අද දහ ගුණයකින් වැඩි වී තිබෙනවා. ඒ නිසා දුප්පත් මිනිහට බයිසිකලයෙන් යන්න විධියක් නැහැ. බයිසිකලය ගෙදර තබාලයි රැකීරක්ෂා ආදියට යන්න සිදු වී තිබෙන්නෙ. ඒ අනුව බලන විට නියෝජ්‍ය කථානායකතුමනි, දුප්පත් මිනිහට අවශ්‍ය ආහාර ටික නැතිවා පමණක් නොව, දුප්පත් මිනිහගෙ වාහනය පවා පදවන්න ක්‍රියා කරවන්න පුළුවන්කමක් නැහැ. ඒ මොකද, ඊට අවශ්‍ය උපකරණ ලබා ගැනීමට පුළුවන්කමක් නැති නිසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

මේ ආණ්ඩුවේ මුල් රාජාසන කථාවලින් වැදගත් යෝජනා ඉදිරිපත් කළා. රජයේ සේවකයන්ට දේශපාලන නිදහස දෙනවාය කිව්වා. මුල්ම යෝජනාව ඒකයි. බොහොම වැදගත් යෝජනාවක්. නමුත් යෝජනාවට පමණයි එය සීමා වුණේ. දේශපාලන නිදහස දෙනවා වෙනුවට දේශපාලන කටයුතුවල යෙදුණාය කියන චෝදනාව උඩ මේ රටේ විශාල සංඛ්‍යාවකගේ බඩට ගසා දොට්ට දමා ඔවුන් අනාථ කර තිබෙනව. අපට මේව මතක් කරන්න සිද්ධ වෙනව. ගුරුවරුන් දහස් ගණනක් මේ ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන් අනාථ කර තිබෙනවා. රජයේ සේවකයන්ට දේශපාලන නිදහස දෙනවාය කියා රාජාසන කථාවෙන් ප්‍රකාශ කළ මේ ආණ්ඩුව දුප්පත් ගුරුවරුන් දහස් ගණනක් රක්ෂාවෙන් නෙරපා තිබෙනව. සමහරුන් පිළිබඳව චෝදනා පත්‍ර ඉදිරිපත් කරන්නවත් මේ ආණ්ඩුවට තවමත් බැරි වී තිබෙනව. සමහරුන් පිළිබඳව තවමත් තීන්දු දී නැහැ. බොහෝ ගුරුවරුන් සංඛ්‍යාවක් අද තව වන තුරුම අඩි වැටුප් පිටයි ඉන්නෙ. ඒ උදවියගේ අනාගතය මොකක් ද කියන එක මේ ආණ්ඩුව තවමත් තීරණය කර නැහැ. දේශපලාන නිදහස දෙනවාය කියා දේශපාලන නිදහස විඳින්නට සිටි අය ගෙන් මේ ආණ්ඩුව පළිගත්තා.

ඊ ළඟට තමුන්නාන්සේලා නින්දගම් පනතක් ඉදිරිපත් කළා. බොහොම ලක්ෂණ පනතක්. ඒ ගැන ලොකු පත්‍රිකාවක් එහෙම නිකුත් කර තිබෙනවා. "සමාජවාදය දෙසට තවත් පියවරක්—නින්දගම් අහෝසි වන වගයි" කියා එම පත්‍රිකාවෙ හැඳින්වීමක් කර තිබෙනවා. ලංකාවේ නින්දගම් ක්‍රමය අහෝසි කිරීමට කටයුතු කරන බවට රාජාසන කථාවෙන් දුන් පොරොන්දුව ගැන ගුවන් විදුලියෙන් කරුණු පැහැදිලි කළ ගරු ඉඩම් ඇමතිතුමා කිව්වෙ මොකක් ද?

"අපේ රජය ප්‍රජාතන්ත්‍ර සමාජවාදී පිළිවෙතක් අනුගමනය කිරීමට ප්‍රතිඥා දී ඇත. නින්දගම් ක්‍රමය අහෝසි කිරීමෙන් දුප්පත් හා පීඩිත ගොවියාට ඔවුන්ගෙ නැති වී ගිය ආත්ම ගරුත්වය නැවත ලබා ගැනීමටත්, ඔවුන් වැඩ කරන ඉඩම්වල තනි අයිතිය ඔවුන්ට පවරා දීමටත් අපි මග සලසා ඇත්තෙමු."

ඔන්න ඔය විධියටයි ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිතුමා ප්‍රකාශ කර තිබෙන්නෙ. එපමණක් නොවෙයි, එතුමා තවදුරටත් මෙසේ කියා තිබෙනවා. :

"එපමණක් නොව, අපගේ ආර්ථික දුර්වලතා මග හරවා ගත හැක්කේ ජාතික නිෂ්පාදනය වැඩි කිරීමෙනි. එම නිසා නින්දගම් ඉඩම්වල පදිංචිව සිටින්නාවූද බදුකරුවන් වශයෙන් ඒවායේ සේවය කරන්නාවූද සැම දෙනාගෙන්ම මේ අවස්ථාවේදී මා ඉල්ලා සිටින්නේ මේ නින්දගම් ක්‍රමය නැමැති බැම්මෙන් ඔවුන් මුදවා ගත් පසු ඔවුන්ට ආණ්ඩුව සලසන අවස්ථාවලින් නිසි ප්‍රයෝජනය ගෙන කෘෂිකාර්මික නිෂ්පදාන වැඩි දියුණු කරගෙන ජාතියට සේවයක් සලසන ලෙසයි."

කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි දියුණු කිරීමට නින්දගම් පනත ගැන මේ ආණ්ඩුව දැන් කිසිම කථාවක් නැහැ. මෙම රාජාසන කථාවෙ ඒ ගැන අකුරක්වත් සඳහන් වී නැහැ. මොකක්ද මේ ආණ්ඩුවට සිදු වී තිබෙන්නෙ? සමාජවාදය දෙසට තවත් පියවරක් ඉස්සරහට නොවෙයි, මේ ආණ්ඩුව තවත් පියවරක් පස්සට තබා තිබෙන බවයි මගේ පිළිගැනීම. නින්දගම් පනත ඉදිරිපත් කිරීමෙන් බලන්ගොඩ ආසනය ජයග්‍රහණය කිරීමට මේ ආණ්ඩුව බලාපොරොත්තු වුණා. එහෙත් බලන්ගොඩ නින්දගම්වල ජනතාව මේ ආණ්ඩුවට විරුද්ධව ඡන්දය පාවිච්චි කළ නිසා දැන් ඒ උදවියගෙන් පළිගැනීම පිණිස ඒ පනත ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තුවක් නැහැ. එසේ ක්‍රියාත්මක කරන්නෙ නැතිවා පමණක් නොවෙයි, මේ රාජාසන කථාවෙන් නින්දගම් පනත පිළිබඳව කිසිවක් ඇතුළත් කර නැහැ.

සි. ආර්. බෙලිගම්මන මයා. (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. சி. ஆர். பெலிகம்மன—உள்நாட்டு விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. C. R. Beligammana—Parliamentary Secretary to the Minister of Home Affairs)

තමුන්නාන්සෙ කිව්වෙ ජනතාව ඊට විරුද්ධව ඡන්දය දුන්නයි කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඒ නිසාද තමුන්නාන්සේලා මේක ක්‍රියාත්මක නොකරන්නෙ? ජනතාවගෙ අදහස් බලා ජනතාවගෙ මතය අනුවමයි තමුන්නාන්සෙල වැඩ කරන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදය ගැන මහ ලොකුවට කථා කරනව. ප්‍රජාතන්ත්‍ර වාදය ගැන කථා කරමින් මේ රටේ තවමත් හදිසි නීතිය තබා ගෙන සිටිනවා. මොකක්ද මේ ආණ්ඩුවට තිබෙන හදිස්සිය? අපි කැමතියි දැන ගන්න තිබෙන හදිස්සිය මොකක්ද කියා. අතුරු මැතිවරණ පවත්වන්නෙත් හදිසි නීතිය යටතෙ. මහජන රැස්වීම් පවත්වන්නෙ හදිසි නීතිය යටතෙ. මහජනතාව ජීවත්වන්නෙත් හදිසි නීතිය යටතෙ. ප්‍රජාතන්ත්‍රවාදය පවතිනවාය කියන මේ රටේ ජනතාවට අද ජීවත්වන්න සිද්ධ වී තිබෙන්නෙ තුවක්කු—බයිනේත්තුවලට යටවෙලයි. හදිසි නීතිය යටතේ ජනතාවට ජීවත්වන්න සලස්වා මේ ආණ්ඩුව ලජ්ජා නැතුව කියනව ප්‍රජාතන්ත්‍රවාදය රකිනවාය කියා. ආණ්ඩුවට ලජ්ජාව කියා දෙයක් තිබෙනවා නම් වහාම මේ හදිසි නීතිය අස් කරන්න ඕනැ. දැන් අතුරු මැතිවරණ හතක් පැවැත්තුව, හදිසි නීතිය යටතෙ. මේ අන්දමට ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් හදිසි නීති පනවමින් මේ රටේ ජනතාව යටපත් කර ගන්නටද මේ ආණ්ඩුව අදහස් කරන්නෙ?

ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරමින්, ගරු පළාත් පාලන ඇමතිතුමා යාපනයෙ නගර සභාව විසුරුවා හැරිය. එසේ නගර සභා විසුරුවා හරිමින් එහි පාලනය මහජන නියෝජිතයින්ගෙන් ඉවත් කර ඒකාධිපති ක්‍රමයට කොමසාරිස්වරුන්ගෙ යටතට පැවරීමෙන් මේ ආණ්ඩුව රකින්න හදන ප්‍රජාතන්ත්‍රවාදය කුමක්ද? නගර සභාවක පාලනය හොඳ නැති නම්, නගර සභාව විසුරුවා හැරියායින් පසුව මහජනතාවට අවස්ථාව දෙන්න ඕනැ තමන්ට කැමති මහජන නියෝජිතයින් ඒවාට පත් කර මහජන කැමැත්ත අනුව පාලනය ගෙන යන්නට. යාපනයෙ නගර සභාව විසුරුවා හැරිය. අධිකරණය ප්‍රකාශ කර තිබෙනව, ඇමතිවරයාගෙ ක්‍රියාව සාධාරණ නැතැයි කියා. එසේ වුණත් තවමත් නැහැ, යාපනයෙ නගර සභාවට මහජන නියෝජිතයින් තෝරා පත් කර ගන්නට අවකාශ සලසා දුන්නෙ. මන්ද ෆේඩරල් පක්ෂයට පුළුවන් වෙන්නෙ නැහැ, මේ නගර සභාවෙ බලය අල්ලා ගන්න. ඒ උදවියට බලය ලබා ගන්න බැරි නිසා නගර සභාවෙ පාලනය ජනතාවගෙ නියෝජිතයින්ට භාර දෙන්නෙ නැතුව, මැතිවරණයක් පවත්වන්නෙ නැතුව පළාත් පාලන ඇමතිවරයාගෙ හිතුවක්කාර වැඩ පිළිවෙළ අනුව කොමසාරිස්වරයාගෙ පාලනය යටතේම පවත්වාගෙන යන බව අද කාටත් පිළිගන්න සිදු වී තිබෙනව.

එපමණක් නොවෙයි, තමුන්නාන්සෙලා රත්වත්තෙ මහතාට විරුද්ධව චෝදනා රාශියක්ම ඉදිරිපත් කළා. එතුමාට විරුද්ධව තිබුණු චෝදනා නිෂ්ප්‍රභ කරමින් අධිකරණයෙන් වරක් තීන්දුව දුන්නා. ඊට විරුද්ධව නැවත වරක් තීන්දුවක් ලබා ගැනීමට උත්සාහ කළත් එවරත් පරාජය වී තිබෙනවා. මේ අන්දමට තමන්ගෙ බලතල අයුතු අන්දමට පාවිච්චි කරමින්, පුද්ගලයන්ගෙන් අයුතු අන්දමට පළි ගැනීමට, පුද්ගලයන්ට මඩ ගැසීමට ක්‍රියා කිරීම ප්‍රජාතන්ත්‍රවාදයද කියා මම අහනව. ප්‍රජාතන්ත්‍රවාදය කඩතුරාව කොට ගෙන, ප්‍රජාතන්ත්‍රවාදයේ මුවාවෙන් මෙවැනි ක්‍රියා මාර්ගයකුයි මේ ආණ්ඩුව අද ගෙන යන්නෙ.

එපමණක් නොවෙයි, විරුද්ධ පක්ෂයෙ නායිකාව වන බණ්ඩාරනායක මැතිණියට විරුද්ධව චෝදනාවක් ඉදිරිපත් කළා, අල්ලසක් වශයෙන් මෝටර් රථයක් ලබා ගත්තාය කියා. ඒ ගැන විභාග කිරීමට පත් කළ කාරක සභාවෙ සභාපති වශයෙන් ක්‍රියා කළ ගරු රාජ්‍ය ඇමතිතුමාටම වාර්තාව අත්සන් කර දෙන්න සිද්ධ වුණා, බණ්ඩාරනායක මැතිණිය එම චෝදනාවෙන් සම්පූර්ණයෙන්ම නිර්දෝෂය කියා. මේ අන්දමට තමන්ගෙ බලතල අයුතු අන්දමින් පාවිච්චි කරමින්, මොනවා හරි කරන්න——

**බෙලිගම්මන මයා.**
*(திரு. பெலிகம்மன)*
(Mr. Beligammana)

ප්‍රජාතන්ත්‍රවාදය තවමත් තිබෙන බව එයින් පෙනෙනව නේ ද?



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)

ප්‍රජාතන්ත්‍රවාදය? හරිම ප්‍රජාතන්ත්‍රවාදයක් එය.

මේ විදියට තමන්ගෙ බලතල අයුතු අන්දමින් ප්‍රයෝජනයට ගෙන, තමන්ගෙ දේශපාලන විරුද්ධ කාරයින්ගෙන් පළිගන්න, ඔවුන්ගේ නම් වලට මඩ ගහන්න මේ ආණ්ඩුව ක්‍රියා කරන ගමන්ම ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සෙ දන්නව කුමන්ත්‍රණ නඩුවට අසුවුණු ඇතැම් පුද්ගලයන්ට අනිවාර්ය වශයෙන් නිවාඩු දී තිබෙන බව. ඇයි අනිවාර්ය වශයෙන් නිවාඩු දී තිබෙන්නෙ? ඔවුන් වරදක් කර තිබෙනවා නම්, ඇයි ඔවුන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් කර නඩු පවරන්නෙ නැත්තෙ? එම නිසා ප්‍රජාතන්ත්‍රවාදය ගැන ලොකුවට කථා කරන මේ ඇමතිවරුන් මේ විධියෙන් ක්‍රියා කරන්නෙ මන්ද කියා මම අහනව. වරදක් කර ඇත්නම් ඔවුන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් කිරීම ආණ්ඩුවේ යුතුකමයි. නමුත් තවම ඒක කරලා නැහැ. "ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණයක් වූ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තිබෙන්නට ඕනෑ; ප්‍රවෘත්ති පත්‍ර නිදහස තිබෙන්නට ඕනෑ; ප්‍රවෘත්ති පත්‍ර නිදහස නැති කිරීමට නීති පනවන්නට එපා; එසේ කිරීම වැරදියි. වුවමනා නම් කළ යුතුව ඇත්තේ අලුත් ප්‍රවෘත්ති පත්‍ර ආරම්භ කරන එකයි;" යනාදී විධියට දැනට මේ ආණ්ඩුවේ සිටින උදවිය එදා කීවා. නමුත් එදා තමන් කී දේ අනුව අද මේ උදවිය ක්‍රියා කරනවාද?

අප ප්‍රවෘත්ති පත්‍රයක් ආරම්භ කළා. විරුද්ධ පාර්ශ්වයේ ආධාරය ඇතිව ආරම්භ කරන ලද "ජනදින" පත්‍රයට මේ උදවිය කෙළේ මොකක්ද? දැන් ඒ පත්‍රය නතර කරලා. මුද්‍රණාලය සීල් තබා තිබෙනවා. දැනට කාලයක් තිස්සේ මුද්‍රණාලය සීල් තබාගෙන ඉන්නවා. ඒ වගේම "ඇත්ත" පත්‍රය මාස ගණනක්ම තහනම් කර තිබුණා. තවමත් ලංගම බස්වලින් "ඇත්ත" පත්‍රය ගෙන යන්නට ඉඩ දෙන්නේ නැහැ. ඔන්න මේ ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවාදයේ හැටි.

විරුද්ධ පාර්ශ්වය පාගා දමා, විරුද්ධ මත පාගා දමා, විරුද්ධ පාර්ශ්වයේ මහජනයාට හිරිහැරකර බලය රැක ගන්නට ක්‍රියා කිරීම මේ ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවාදයයි. යාපනය නගර සභා සිද්ධිය ගැන මා මුලින් කිව්වා. නාවිමන-මාකාවිට ගම්කාර්ය සභාපතිගෙන් තඹ සතයක වංචාවක් නොසිදු වුණත්, කිසිම දූෂණයක් නොසිදු වුණත් දේශපාලන වශයෙන් පළිගන්නට වුවමනා නිසා ඔහුට විරුද්ධව චෝදනා මාලාවක් ඉදිරිපත් කර දැන් ඔහු අස් කරනු ලැබ සිටිනව. ඒ ගම්කාර්ය සභාපතිගේ යම්කිසි වරදක් තිබෙනවා නම් එය ඔප්පු කරන ලෙස මා මේ ආණ්ඩුවට අභියෝග කරනවා. මේ අතර දෙවිනුවර සුළු නගර සභාපති අස් කරන්නටත් දැන් චෝදනා ඉදිරිපත් කර තිබෙනවා. දෙවිනුවර සුළු නගර සභාපති ඇතුළු එහි ප්‍රගතිශීලී කණ්ඩායම පසුගිය දවස්වල පැවැති දෙවිනුවර අතුරු මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂක රොනී ද මැල් මහතාට ආධාර දුන් නිසා තමයි, මේ විධියට මේ ආණ්ඩුව ක්‍රියා කරන්නේ. ඒ සුළු නගර සභාපතිගෙන් පළිගැනීම සඳහා මේ විධියට චෝදනා පත්‍ර ඉදිරිපත් කර ඔහු අස් කිරීමට පළාත් පාලන ඇමතිවරයා කටයුතු කරනව. මේකද ප්‍රජාතන්ත්‍රවාදය? මේක නම් අමුතු ප්‍රජාතන්ත්‍රවාදයක්.

මේ ආණ්ඩුව සමගි මණ්ඩල පත් කරනවා. නමුත් ඒවායේ සමහර සාමාජිකයන් සහ සභාපතිවරුන් තමන්ගේ දේශපාලන ගැත්තනුයි; සමහර විට ක්‍රිමිනල් අපරාධකාරයනුයි; දේශපාලන වශයෙන් තමන්ගේ බලතල රැකගැනීමට යොදා සිටින කසිප්පුකාරයිනුයි. මඩිහ, ගොඩගම සමගි මණ්ඩලයට පත් කරනු ලැබ සිටින්නේ එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයකු වශයෙන් පසුගිය මහා මැතිවරණයේදී තරඟ කොට පරාජයට පත්වූ ජස්ටින් විජේවර්ධන මහතායි. ඔහු පැය ගණනක් දේශපාලන වේදිකාවේ කථා කොට සමගි මණ්ඩල රැස්වීමට පැමිණ එහිදී යුක්තිය ඉෂ්ට වන අන්දමට කටයුතු කරන්නේ කොහොමද? මේ ආණ්ඩුව දෙන්නේ මේ වාගේ පත්වීම් තමයි. මේ විධියට පත්වීම් දෙන ගමන් මේ අය ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ ආණ්ඩුව ආහාර නිෂ්පාදනය ගැන කථා කරනවා. පසුගියදා නින්දගම් පනතක් ඉදිරිපත් කෙළේත් ආහාර නිෂ්පාදනය වැඩි කිරීමේ අදහස ඇතිව බව ප්‍රකාශ කළා. නමුත් ගොවියන්ට සිදු වී තිබෙන යහපත මොකක්ද? ගොවියන්ට මේ ආණ්ඩුවෙන් ලැබී තිබෙන ආධාර මොකක්ද? මේ ආණ්ඩුව ආධාර දී තිබෙන්නේ ගොවියන්ට නොව කොම්පැනිකාරයන්ටයි. කොම්පැනිකාරයන්ට අක්කර දහස් ගණන් දී ගොවිතැන් දියුණු කිරීමටයි, මේ ආණ්ඩුව බලාපොරොත්තු වන්නේ. ඒ උදවියට ඉඩම් අක්කර සිය ගණන් දුන්නා පමණක් නොව මෝටර් රථ, ජීප් රථ, ඩීසල් ලොරි ආදියත් දී නොයෙක් විධියෙ උපකාර කර තිබෙනවා. එහෙත් එක ගොවියකුට එවැනි කිසිම ආධාරයක් දී තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ගොවීන් ඒව ඉල්ලන්නෙ නෑ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඉල්ලන්නෙ නෑ? ඉල්ලුවොත් තමුන්නාන්සෙල ගොවීන්ට ඒව දෙනවද? දෙයි කියල තමයි බය. මහජන මන්ත්‍රීවරයකුට මෝටර් රථයක් ගන්න ඉඩ දෙන්නෙ නෑ. තමුන්නාන්සේලාගෙ හෙන්චයියලට නම් ශ්‍රී 5 කාර් ඕනෑ තරම් ගන්න පුළුවනි. මෝටර් රථ නැතිකම නිසා තමතමන්ගෙ කොට්ඨාශවල වැඩ කර ගන්න බැරි මන්ත්‍රීවරුන් මෙහි සිටිනව. මෝටර් රථ ගන්න පුළුවන් වන්නෙ එක්සත් ජාතික පක්ෂයට බැඳී සිටිනව නම් පමණයි. ගොවීන් ඉල්ලන හැම දෙයක්ම දෙනව වගෙයි කථා කරන්නෙ. ගොවිතැන දියුණු කරන්නයයි කියමින් ගොවි හමුදා, තරුණ හමුදා හදනව. "වචන්නෝ දිනන්නෝය, දිනන්නෝ වචන්නෝය" යනුවෙන් හැම දාම ගගන අඳෝනාව ගුවන් විදුලියෙන් මේ වනාවෙන් ගහනව. ඒක දැන් ගුවන් විදුලියක් නොව "ගුවන් විහිළුවක්" වෙලා. මේ ආණ්ඩුව රටේ ගොවිතැන දියුණු කරන්න ලෑස්ති වන්නෙ මෙවැනි වැඩ වලිනුයි.

අපේ රටේ ගොවිතැන ගැන කථා කරන විට රුහුණෙ පැඟිරි කර්මාන්තය ගැන සඳහන් නොකරම බෑ. අද ඒ ප්‍රදේශයෙ පැඟිරි ගේන් බොහෝ ගණනක් වසා දමා දහස් ගණනක් රක්ෂා නැතිව අනාථ වී සිටිනව. රුහුණේ පැඟිරි කර්මාන්තයෙ යෙදෙන අයට මේ රාජාසන කථාවෙන් කිසියම් සහනයක් සලසා තිබෙනවද? ඔවුන්ට රක්ෂාව නැති වීම නිසා අද ඔවුන්ගෙ දරුපැටවුන් පවා බඩගින්නෙ සිටින තත්ත්වයක් ඇති වී තිබෙනව. පැඟිරි ගේන්වල වැඩ කරන කම්කරුවන් සඳහා මේ ආණ්ඩුව මේ විධියටද ගොවිතැන් දියුණු කරන්නෙ? මේ විධියටයි ගොවිතැන් දියුණු කරන්නෙ. ගොවි හමුද ඇති කොට ඔවුන්ට නිල ඇඳුම් අන්දවාගෙන ගොවිතැන් දියුණු කරන්න බෑ.

සංවර්ධනය ගැනයි මේ ආණ්ඩුව බොහොම හයියෙන් කථා කරන්නෙ. පළමුවන අවුරුද්දෙ කථා කළා. දෙවැනි අවුරුද්දෙත් කථා කළා. එහෙත් මේ රටේ මොනවද සංවර්ධනය වී තිබෙන්නෙ? මට කලින් කථා කළ යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඒ ගැන පැහැදිලි ලෙස කරුණු කිව්ව. අද මේ ආණ්ඩුව ක්‍රියාත්මක කර තිබෙන්නෙ රට හදනවට වඩා විනාශ කිරීමේ වැඩ පිළිවෙළක්.

සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීමට කොමිෂන් සභාවක් මේ ආණ්ඩුව විසින් පත් කරන්ට යනවලු. "සමුපකාරය" යනු සමාජවාදි ව්‍යාපාරයක් බව තමුන්නාන්සෙ දන්නව. ධනපති ක්‍රමය රකින, ධනපති ක්‍රමය ස්ථාවර කරන, ධනපති ක්‍රමය අනුව වැඩ කරන මේ ආණ්ඩුව යටතේ සමුපකාර ව්‍යාපාරයට වගාවක් ඇත්තෙ නෑ. සමුපකාර ක්‍රමය දියුණු වන්නෙ සමාජවාදී ආණ්ඩුවක් යටතෙ පමණයි. මේ ධනපති ආණ්ඩුවට එය කරන්න බෑ. එක්සත් ජාතික පක්ෂයෙ ආණ්ඩුව බලයට පත්ව සිටි පසුගිය අවුරුදු දෙකහමාර තිස්සෙම මේ රටේ සමුපකාර ව්‍යාපාරයට කළ තරමක් කෙළේ හතුරුකම් මේ ආණ්ඩුවෙන් සමුපකාරයට සිදුවුණු එක සෙතක් පෙන්වා දෙන්න, පුළුවන් නම්. සමුපකාර සමිති සංගම් ගණනාවක් විසුරුවා හැර තිබෙනව. මාතර දිස්ත්‍රික්කයෙ තිබුණු සමුපකාර සමිති සංගම් 6 න් 4 ක්ම මේ ආණ්ඩුව විසින් විසුරුවා හැරිය. එක්සත් ජාතික පක්ෂයෙ උදවිය කෙරෙහි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

මහජනාය තුළ විශ්වාසයක් නැති නිසා සමුපකාර සමිතිවල බලය අල්ලන්න ඔවුන්ට බැහැ. ධනපති ක්‍රමයට කල්පනා කරන වැඩ කරන උදවිය ගැන දන් මහජනයා විශ්වාසයක් තබන්නෙ නෑ. එම නිසා මහජනයා සමූපකාර සමිති සංගම් වැනි සමාජවාදී ආයතනවලට එක්සත් ජාතික පක්‍ෂයෙ උදවිය පත් කරන්නෙ නෑ. එම නිසා ඔවුන් කරන්නෙ, පස්ස දොරෙන් ගිහින් ඇමතිතුමා හමු වී එවැනි සමුපකාර සංගම් විසුරුවා හැරීමයි. දන් හදිසි නීතිය යටතෙ සමුපකාර සංගම්වල පාලනය තමන් අතට ගැනීමේ අලුත් වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුව ඇති කර තිබෙනව. ඒ අනුව පාලනය අල්ලා ගන්නා සමුපකාර සංගම් එක්සත් ජාතික පක්ෂයට හිතවත් අයට පවරා දෙනව. ඉනා මැතදි තල්පෙ විවිධ සේවා සමුපකාර සමිති සංගමය සම්බන්ධයෙන් ඒ විධියට ක්‍රියා කළා. එක්සත් ජාතික පක්ෂයෙ උදවියට බලය අල්ලා ගන්න බැරි වන සමුපකාර සංගම්, හදිසි නීතිය යටතේ දිසාපතිතුමා යටතට ගෙන කටයුතු කරනව. එහෙත්, එක්සත් ජාතික පක්ෂයෙ උදවියට බලය තිබෙන සමුපකාර සංගම් සම්බන්ධයෙන් ඒ විධියට හදිසි නීතිය යටතෙ ක්‍රියා කරන්නෙ නෑ. බලංගොඩ විවිධ සේවා සමුපකාර සමිති සංගමය ගැන ලොකු ප්‍රශ්නයක් මතු වී තිබුණ. මේ ගරු සභාවෙදිත් ඒ ගැන කීපවරක්ම ප්‍රශ්න මතු වුණා. ඒවට කිසිම දෙයක් නැහැ. ඒවයෙ හොරුන්ට මේ ආණ්ඩුව තවත් ඉඩ දෙනව. කොළ පාට කබායක් ඇඳ ගත්තම හොරා හොරෙක් නොවෙයි. ඒ හොරුන්ට සම්පූර්ණ ආරක්ෂාව දෙන්න මේ ආණ්ඩුව ලෑස්තියි. ඒ විධියටයි, මේ ආණ්ඩුව කටයුතු කරන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තවත් කරුණක් කියන්න ඕනැ. මධ්‍යම ක්ෂය රෝග චිකිත්සාගාරයක් ඇති කිරීමට මේ ආණ්ඩුවෙ අළුත් යෝජනාවක් තියෙනව. ඒක තමයි, අද මේ රටට අවශ්‍ය වෙලා තියෙන්නෙ. මේ රජය බලයට පත් වුන දා පටන් ක්ෂය රෝගය වැඩි වෙලා තියෙනව. කන්න නැහැ. හාල් සේරු දෙක සේරුව කළා. ජනතාව ඉතාමත් නරක විධියට මන්දපෝෂණයෙන් පෙළෙන බව තමුන්නාන්සෙ දන්නව. වැඩි කල් යන්න පෙර හැම ගමකටම [illegible]

මධ්‍යස්ථානයක් දෙන්න මේ ආණ්ඩුවට සිදු වෙයි, මහජනයාට කෑම බීම නැතිව මේ දුඃඛිත තත්ත්වයේ දිගටම තබාගෙන සිටියොත්.

මේ රාජාසන කථාවේ මැද පෙරදිග අවුල ගැන කියන අතර මේ විධියට කියා තිබෙනව :

"මැද පෙරදිග නොබෝදා ඇති වූ අවාසනාවන්ත සිද්ධීන් ගැන මාගේ ආණ්ඩුව සංවේග වන අතර මෙම ප්‍රදේශයට පැමිණ ඇති උවදුරු මගහැරවීමට සාධාරණ හා කල් පවතින මාර්ගයක් සොයා ගැනීම පිණිස අනිකුත් රටවල් සමග එක් වී කටයුතු කිරීමට උත්සාහ දරනු ඇත."

නමුත් නියෝජ්‍ය කථානායකතුමනි, මේ තරමින් අපට සෑනසෙන්න බැහැ. මේ සම්බන්ධයෙන් මීට වඩා දැඩි පියවරක් ආණ්ඩුව විසින් ගත යුතුව තිබෙනව. අරාබි එක්සත් සමූහාණ්ඩුව මැද පෙරදිග වියවුලට සම්බන්ධ වූ ප්‍රධාන රටක් බව තමුන්නාන්සේ දන්නව. අධිරාජ්‍යවාදයෙන් මිදී සමාජවාදය කරා ගමන් කිරීමට—සමාජ ප්‍රගතිය සඳහා ගමන් කිරීමට—උත්සාහ කරන දේශප්‍රේමී මුස්ලිම් ජනතාවගේ ලේ හෙළුනේ මේ වතාවෙදි පමණක් නොවෙයි. මීට කලිනුත් ඔය වගේ සිද්ධීන් වෙලා තියෙනව. ඊශ්‍රයෙලය ආක්‍රමණකාරී අන්දමට මැද පෙරදිග රටවලට කඩා වැදීම නිසා මේ ඉතාමත්ම භයානක තත්ත්වය ඇති වූ බව තමුන්නාන්සේ දන්නව්. මේකට හේතුව කුමක්ද? සිරියාව සමාජවාදය කරා ගමන් කරන රටක්. ඉරාක් තෙල් කොම්පැනි ඔවුන්ගේ තෙල් පයිප්ප දමා තිබෙන්නේ සිරියාව මැදින්. තමන්ගේ රට මැදින් තෙල් පයිප්ප දමා තිබෙන නිසා ඒ තෙල් කොම්පැනි බද්දක් ගෙවිය යුතුය කියා සිරියාව තීරණය කළා. මේ තීරණයට විරුද්ධව ඊශ්‍රායෙලය කඩා පැන්නා. සිරියාවත් එක්සත් අරාබි සමූහාණ්ඩුවත් අතර ගිවිසුමක් අත්සන් කර තිබුනා, අරාබි සමූහාණ්ඩුවට ගැසූ පහරක් සිරියාවට ගැසූ පහරක් වශයෙන් සැලකීමටත්, ඒ වගේම සිරියාවට ගැසූ පහරක් එක්සත් අරාබි සමූහාණ්ඩුවට ගැසූ පහරක් වශයෙන් සැලකීමටත්. එවැනි ගිවිසුමක් තිබුණු නිසා ඊශ්‍රායෙලය සිරියාවට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කර කඩා පැන්නා පෙර කෙළින්ම මිසරයට කඩා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැදුණු බව තමුන්නාන්සේ දන්නව. ඒ පැත්තෙන් පහර ගසා, අධිරාජ්‍යවාදයෙන් මිදී සමාජවාදය කරා ගමන් කරන මේ ආණ්ඩුවට පහර ගැසීමට ඔවුන් කල්පනා කළා. ඇත්ත වශයෙන්ම කියනව නම් ජාත්‍යන්තර නීති රීතිවලට පටහැණිව හමුදා පාවිච්චි කර, උපක්‍රම පාවිච්චි කර ඊශ්‍රායෙලය යුද්ධ කටයුතු ගෙන ගියා. ඊශ්‍රායෙලය කුඩා රටක් වුනත් ඔවුන්ගේ ව්‍යාපාරය ගෙන යාමට ඇමෙරිකන් අධිරාජ්‍යවාදීන්ගෙනුත් බටහිර ජර්මනියෙනුත් සම්පූර්ණ ආධාර උපකාර ලැබුනා. ඒ නිසා තමයි, "නාපාම්" බෝම්බ වැනි බෝම්බ පාවිච්චි කරන්නට ඊශ්‍රායලයට පුළුවන් කම ලැබුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සෙ ප්‍රවෘත්ති පත්‍රවලින් දකින්නට ඇති, ඔවුන්ගේ මේ "නාපාම්" බෝම්බ පාවිච්චිය නිසා අරාබි රටවැසියන් දහස් ගණනින් මරු මුවට පත් වීමේ ඛෙදවාචකය.

ඊශ්‍රායලයේ වර්තමාන වැඩ පිළිවෙළ, ඔවුන් අතීතයේදී කරන ලද යම් යම් ප්‍රකාශ හා සසඳා බලන විට ඊශ්‍රායල් අධිරාජ්‍යයක් ගොඩ නැඟීමේ කෑදරකම පෙන්නුම් කරන බව කියන්නට ඕනෑ. 1949 දී ඊශ්‍රායලයේ හිටපු ඇමතිවරයෙක් ප්‍රකාශ කර තිබෙනව "අපි ජෝර්දන් ගඟ තරණය කර දමස්කස් හා අම්මාන් නගර කරා ගමන් කොට යුදෙව් රාජ්‍යය පුළුල් කළ යුතුය" කියා. මේ ප්‍රකාශය අනුව තමයි 1950 දී බෙන්ගුරියන් කීවෙ, "නයිල් හා යුප්‍රටීස් ගංගා දෙක අතර සියලුම බිම් එක්සත් කොට ඊශ්‍රායල් අධිරාජ්‍යයක් ගොඩ නැඟිය යුතුය" කියා. ඒ ඊශ්‍රායල් අධිරාජ්‍යය ගොඩ නැඟීමේ අදහසින් තමයි, මේ ආක්‍රමණ පටන් ගෙන තිබෙන්නෙ. ඊශ්‍රායලයේ වර්තමාන විදේශ ඇමති මෝෂෙ ඩයාන් සෙනෙවියා කියා තිබෙනව, ඔහුගෙත් ඔහුගේ ආණ්ඩුවෙත් අවසාන පරමාර්ථය ඊශ්‍රායල් අධිරාජ්‍යයක් පිහිටුවීම බව. ඊශ්‍රායල් අධිරාජ්‍යයක් පිහිටුවීමේ අදහස ඇතිවයි, මොවුන් මේ කටයුතු කරගන ගොස් තිබෙන්නෙ. මැද පෙරදිග ආක්‍රමණය මේ අධිරාජ්‍යවාදී ආක්‍රමණකාරී වැඩ පිළිවෙළේ එක් අංශයක් පමණක් බව අප කියා සිටිනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සෙ දන්නව, වියට්නාමයේ සුද ඔස

උත්සන්න වෙමින් පවතින බව. ග්‍රීසියෙ පාලන බලය ෆැසිස්ට්වාදී මණ්ඩලයකට ලැබී තිබෙනව. සමාජවාදය කරා යන ගමන නවත්වා, ඒ රටවල නිදහස නැති කර ඒවා යටත් විජිතයන් හැටියට තබා ගැනීමට අධිරාජ්‍යවාදී රටවල් දරන වෑයමේ එක් කොටසක් තමයි, මැද පෙරදිග අවුල. මේ මැද පෙරදිග අවුලේදී ලංකාවෙ මහජනතාව මිසර ජනතාවට පක්ෂපාතිව නොයෙක් තැන්වල රැස්වීම් පවත්වා, විශාල උද්ඝෝෂණයක් කරමින් "රජය මේ මැද පෙරදිග අවුලට මැදිහත් වී මිසරයෙ පැත්ත ගෙන අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව සිටින්නට ඕනෑය" කීම ගැන අපි ආඩම්බර වෙන්නට ඕනෑ. ඒ අදහසට විරුද්ධව කිසිම කෙනෙක් රැස්වීම් පැවැත්වූයේ නැහැ. ඇත්ත වශයෙන්ම, මිසරයේ සමාජවාදී වැඩ පිළිවෙළට විරුද්ධ මිනිසුන් මේ රටේ හිටිය. ඔවුන්ටවත් කට හොල්ලන්නට බැරි වුණා. ඒ තරම් අධිරාජ්‍ය විරෝධී හැඟීමක් මේ රටේ තිබෙනව. අමෙරිකන් අධිරාජ්‍යවාදීන්ගේත් බටහිර ජර්මන් අධිරාජ්‍යවාදීන්ගේත් උසිගැන්වීම් උඩයි, ඊශ්‍රායලය සාමකාමී අරාබි ජනතාවගේ සමාජවාදී ගමනට විරුද්ධව නොයෙකුත් වැඩ පිළිවෙළවල් ගෙන යන්නෙ. ඒ අධිරාජ්‍යවාදී වැඩ පිළිවෙළවලට විරුද්ධ විය යුතුයයි සිතූ ලංකා ජනතාව අරාබි රටවල පැත්ත ගෙන විශාල රැස්වීම් පවත්වමින් හා වෙනත් නොයෙකුත් මාර්ගවලින් ඊශ්‍රායලයේ ආක්‍රමණික වැඩ පිළිවෙළට විරෝධය පළ කළා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

කරුණාකර කථාව ඉක්මණින් ඉවර කරන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඉක්මණින් ඉවර කරන්නම්. වඩා දීර්ඝ කථාවක් කරන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් මැදවච්චියෙ ගරු මන්ත්‍රීතුමාත් (මෛත්‍රීපාල සේනානායක මයා.) ලංකා සමසමාජ පක්ෂය වෙනුවෙන් අගලවත්තෙ ගරු මන්ත්‍රී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

තුමාත් (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මයා.), ලංකා කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් මැද කොළඹ 3 වැනි ගරු මන්ත්‍රීතුමාත් (පීටර් කෙනමන් මයා.) ආදී වශයෙන් මුළු විරුද්ධ පාර්ශ්වයම ඊශ්‍රායලය ගෙන යන ආක්‍රමණකාරී වැඩ පිළිවෙළට විරුද්ධව එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි කටයුතු කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටි බව තමුන්නාන්සෙට මතක ඇති. අගමැතිතුමාට එක්සත් ජාතීන්ගේ විශේෂ සම්මේලන වාරයට සහභාගි වන්ට බැරි වුණා. එක්සත් ජාතීන්ගේ සංගමයේ කණිෂ්ඨ නිලධාරියෙක් තමයි, මේකට යොදවා තිබෙන්නෙ. එහෙත් කැනඩාවේ මොන්ට්‍රියල්හි ඉතා විශාල සල්පිලක් නරඹන්න නම් එතුමාට යන්ට පුළුවන් වුණා. එතැන සිට පැය කීපයකින් නිව් යෝර්ක් නගරයට ගිහින් මේ සම්මේලනයට සහභාගිවී ලංකා ජනතාවගේ අදහස්, අධිරාජ්‍ය විරෝධී මත ඉදිරිපත් කිරීමෙන් ලංකාව වෙනුවෙන් එතුමාට වැදගත් වැඩ කොටසක් ඉටු කරන්ට පුළුවන්කම තිබුණු නමුත් එය ඉටු කළේ නැහැ. ඒ ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊශ්‍රායලය අද ඔවුන්ගේ රට මෙන් සිව් ගුණයක බිම් ප්‍රමාණයක් අල්ලාගෙන සිටිනව. ඊශ්‍රායලය ඉතා කුඩා රටක්. එහෙත් කොයි තරම් දඩබ්බර විධියට ඊශ්‍රායලය ක්‍රියා කරනවාද කියතොත්, ඔවුන් ප්‍රකාශ කර තිබුණ, "යුද්ධයට පෙර සිටි ස්ථානවලට ඊශ්‍රායලය යායුතුය කියා එක්සත් ජාතීන්ගේ සංගමයේ සිටින සාමාජිකයන් 122න් ඔවුන් හැර අනික් ජාතීන් 121 ම තීරණය කළත්, ඒ තීරණය ක්‍රියාත්මක කිරීමට තමන් සූදානම් නැහැ" කියා. වේන විධියකින් කියනව නම් අනික් රටවල—ලංකාවත් ඇතුළු—තීරණය භාර ගන්ට ඔවුන් ලැහැස්ති නැතිලු. එහෙම නම්, අනික් රටවල් 121 ම තීරණය වැරදියි; ඔවුන් විතරයි හරි, කියන තරමට ඊශ්‍රායල් අධිරාජ්‍යවාදීන් ඔවුන්ගේ ඔළුව උදුම්මාගෙන සිටිනව. මේ අවස්ථාවේදී ආණ්ඩුවෙන් අපි ඉල්ලා සිටිනව, ඊශ්‍රායල් අධිරාජ්‍යවාදීන් ගෙන යන මේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියට ලංකා ජනතාවගේ ඇති විරෝධය පෙන්නුම් කිරීමක් වශයෙන් ඊශ්‍රායල් ආණ්ඩුවත් සමග මේ ආණ්ඩුව ඇති කරගෙන තිබෙන තානාපති හා රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධකම් සම්පූර්ණයෙන්ම අස් කර දමන්න කියා. ලෝකයේ අධිරාජ්‍යවාදී ග්‍රහණයෙන් මිදෙන්ට කැමති ජනතාවට අත දෙන්ට මේ ආණ්ඩුව කැමති නම්, මේ ආණ්ඩුව අධිරාජ්‍යවාදයට විරුද්ධ නම්, ලේ පිපාසයෙන් සිටින අධිරාජ්‍යවාදීන්ට ආසියාතික රටවල ජනතාවගේ ලේ උරා බීමට ඉඩ තැබීමට මේ ආණ්ඩුව ලැහැස්ති නැත්නම්, ඊශ්‍රායල් අධිරාජ්‍යවාදී ආණ්ඩුව සමග මේ ආණ්ඩුව පවත්වාගෙන යන සම්බන්ධකම් වහාම නතර කළ යුතු බව අපි බලවත් ඕනෑකමින් කියා සිටිනව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මීට වඩා කාලය ගන්ට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. අවසාන වශයෙන් මේ රාජාසන කථාව මහජනයා රැවටීමට දරන ලද ප්‍රයත්නයක් බව ප්‍රකාශ කරමින් ඊට අපේ සම්පූර්ණ විරුද්ධත්වය පළ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

අ. භා. 5.9

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහොම කාලයක් තිස්සෙ රාජාසන කථාවලට සහභාගි වුණාට මොකද මෙතරම් නිදිමත ආණ්ඩුවකට විරුද්ධව කිසි කලෙක කථා කිරීමට අපට අවස්ථාවක් ලැබී නැහැ. මා හිතන අන්දමට කිසි විටෙක ආණ්ඩු පක්ෂයක් විසින් විරුද්ධ පාර්ශ්වයට හෝ මහජනතාවට හෝ මේ අන්දමට සලකා නැහැ. එයින් වැටහෙන්නෙ ජනතාව මොන විධියේ අදහස් දැරුවත් ඒ අයගේ වැඩ ඒ අය කරගෙන යන බවයි. මේ ආණ්ඩුව යටතේ මා සහභාගි වෙන පළමුවෙනි රාජාසන කථාවයි, මේ. මීට ඉස්සර දෙකක් තිබුණා. අවාසනාවකට දෝ වාසනාවකට දෝ ඒ අවස්ථාවලදී ඒවාට සහභාගිවීමට මට පුළුවන්කමක් ලැබුණෙ නැහැ. එක අතකින් බලන විට පළමුවෙනි, දෙවෙනි රාජාසන කථාවලින් අපට ආණ්ඩුවේ ප්‍රතිපත්තිත්, විරුද්ධ පාර්ශ්වයේ අදහස්-උදහස් ආදියත් මනින්ට පුළුවන්කමක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආණ්ඩුවක් බලයට පත් වුණාට පස්සෙ එක්තරා විධියක උද්ධච්ච ස්වභාවකින් සිටිනවා. ඒ වගේම විරුද්ධ පාර්ශ්වයත් ඒ උදවියගෙ බොරු ප්‍රචාරවලින් පීඩාවට පත් වෙනවා. ඒ නිසා එක්තරා අන්දමකින් බලන විට ඒ පරිසරය නිසා තමන්ගෙ නියම තත්ත්වය හරියාකාර තේරුම් ගන්න බැරි විධියෙ වටපිටාවක් පළමුවන සහ දෙවන රාජාසන කථාවල තිබුණා. ඒ කෙසේ වෙතත් දේශපාලන දර්ශනයක් ඇතිව ක්‍රියා කරන විරුද්ධ පාර්ශ්වයට ආණ්ඩුව සම්බන්ධව හරියාකාර අවබෝධ යක් ඇති කර ගැනීමට හුඟක් ඉස්සර වෙලා පුළුවන්කමක් ලැබුණා.

මට සහභාගී වීමට ඉඩ ලැබුණු රාජාසන කථාවල් දෙකක් ගැන මට විශේෂයෙන් මතක් වෙනවා. මා හිතන හැටියට ඒ අවස්ථා දෙකම දේශපාලන ඉතිහාසයේ ඉතා වැදගත් අවස්ථාවල් බව කියන්න පුළුවනි. එයින් පළමුවැනි කථාව පවත්වන ලද්දේ 1960 අප්‍රේල් මාසයේ 19 වැනිදායි. එක්සත් ජාතික පක්ෂයේ දවස් තිස්තුනේ ආණ්ඩුව බිඳ වැටීම නිමිත්තෙන් විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් කළ කථාවයි ඒ. මා එදා මගේ කථාව අවසන් කළේ මෙන්න මෙහෙමයි :

"මගේ කථාව මීට වඩා දික් කිරීමට මම අදහස් කරන්නෙ නැහැ. මේ ආණ්ඩුවේ යටගියාව ගැනත්, මේ ආණ්ඩු කණ්ඩායමේ සිටින පුද්ගලයන්ගේ ආර්ථික පරිසරය හා අභ්‍යන්තර සිතුම් පැතුම් ආදිය ගැනත් බැලූ විට අපට නිගමනයකට බහින්න පුළුවන් වන්නේ, මේ ආණ්ඩුව ධනපති ක්‍රමයත්, වැඩ වසම් ක්‍රමයත්, අධිරාජ්‍යවාදි ක්‍රමයත්, තහවුරු කර ගෙන, ඉදිරියට යාමට වෑයම් කරනවා මිස, පොදු ජනතාවගේ ප්‍රශ්න ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී පද නම්ක් උඩ විසඳමින් සමාජයට සේවයක් කිරීමට බලාපොරොත්තු නොවන බවයි. මේ වචනවලින් මගේ කථාව අවසාන කරමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙන අතුරු යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා. [නිල වාර්තාව, 1960 අප්‍රේල් 19 ; 38 වන කාණ්ඩය, තී : 250-51.]

මා මේ ප්‍රකාශය කළේ 1960 අප්‍රේල් මාසයේ 19 වැනිදා. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නිල වාර්තාවේ ඒ කොටස ගැබ් වී තිබෙනවා. මෙයින් ඔබතුමාට පෙනී යනවා එක් වැදගත් කාරණයක්. ඒ කාර ණය මෙයයි : මේ විධියෙ ආණ්ඩුවක් ඇති වුණාම, මේ විධියෙ පුද්ගලයන් මොන විධියේ සමාජ තත්ත්වයක් බිහි කරන් නට ලැස්ති වෙනවද යන්න 1960 අප්‍රේල් මාසයේදීත් අප හොඳ හැටි දැනගෙන සිටියා. 1960 අවුරුද්දේ අප්‍රේල් මාස යේදී කරන ලද රාජාසන කථාවට විරුද්ධ පාර්ශ්වයෙන් ඉදිරිපත් කළ සංශෝධනය මේ ගරු සභාවට ඉදිරිපත් කරමින් මා කළ කථාව ගැනයි මා ඔය සඳ හන් කළේ. ඒ වගේම 1964 දෙසැම්බර් මාසයේ 3 වැනිදා අපට පිටුපසින් ඇවිල්ලා පිහියා ඇනුමක් කර, අපේ ආණ්ඩුව කඩා බිඳ හෙලූ අවසථාවේදී ආණ්ඩුව වෙනුවෙන් අවසන් කථාව කිරීමට අවස්ථාව ලැබු ණෙත් මටයි. ආණ්ඩුව වෙනුවෙන් 1964 දෙසැම්බර් මස 3 වැනිදා කළ කථාවෙ මෙන්න මෙහෙමයි මා කියා සිටියෙ :

" ගරු කථානායකතුමනි, අද දෙපිළ හොඳට බෙදී ගෙන යන අවස්ථාවක්. ප්‍රතිගාමීන් යටතේ අධිරාජ්‍ය වාදීනුත් ධනවාදීනුත් වැඩවසම්වාදීනුත් ඔළුව උස්සන දවසට මං කපන අවස්ථාවකයි දැන් අපි ඉන්නෙ. ඒ නිසා යම් විධියකින් අධිරාජ්‍යවාදීන් වත් අධිරාජ්‍යවාදීන්ගේ හිතවතුන්වත් පෙට්‍රල් කාරයන්වත් වතුකාරයන්වත් රක්ෂණ කාරයන් වත් බැංකුකාරයන්වත් වැඩවසම්කාරයන්වත් කරවලකාරයන්වත් නැවත වරක් ඔළුව උස්සන් නට ඉඩ ලැබුණොත්, වැඩ කරන ජනතාවට හානි යක් ඇති කරන්නට ඉඩ ලැබුණොත් ප්‍රගතිශීලි මුහුණුවරින් පෙනී සිටින මේ ගරු මන්ත්‍රීන් වැඩ කරන ජනතාවට ඒ කරන හදිය ගැන වග කියන් නට ඕනෑ."

අපේ ආණ්ඩුව කඩා වැටෙන්න ඔන්න මෙන්න කියා තිබුණු අවස්ථාවෙයි මා මේ ආකාරයට කථා කළේ. තමුන්නාන්සෙ දන්නව එදා ප්‍රගතිශීලි මුහුණුවරින් හිටපු අය මේ කර්මාන්ත ඇමතිතුමත්, ගාල්ලේ ගරු මන්ත්‍රීතුමත් බව.

"ඒ වගේම දැන් තවත් කොටසකටත්, එනම් ජාතිවාදීන්වත් ඉඩ දෙන්නයි යන්නෙ. 1956 දී ලබා ගත් ජයග්‍රහණයන් හා 1960 දී අප ඇති කර ගත් ප්‍රතිසංස්කරණත් අඩපණ කිරීමට අද දින මේ ගන්නා පියවරින් පණක් ලැබුණොත් නැවතත් ප්‍රතිගාමී කොටස්වලට ඉඩ දුන්නාය කියා ඒ උදවිය මහජනයාට වගකියන්නට ඕනෑ."

අද කොලොන්නාව ඒ පාඩම හොඳට උගන්වා තිබෙනවා. ඒ වගේම අද ප්‍රති ගාමීන් ගිහිල්ලා සම්පූර්ණයෙන්ම පෑගෙන ජනතාවට—කම්කරු ජනතාවට—පහර ගහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

මින් එදා අමුතු මුහුණුවරකින් පෙනී සිටි ඊනියා කම්කරු නායකයින් රදළවාදීන්ට කම්කරුවන් පාවා දුන්නාය කියනව.

"ඒ නිසා ජාති ප්‍රේමයක් ඇති සමාජවාදය ගැන කැක්කුමක් ඇති ප්‍රගතිශීලී ජනතාවක් ඇති කිරීමට වේගවත්ව ක්‍රියා කළ හැම දෙනාගෙන්ම, ඒ පැත්තේ සිටියත් මේ පැත්තේ සිටියත් ඒ හැම දෙනාගෙන්ම මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා පක්ෂ භේදයක් නැතිව මේ රාජාසන කථාවට තමන්ගේ සම්පූර්ණ සහයෝගය දීමෙන් බුද්ධාගමට මේ රටේ නියම තැන දීමටත්, ඉන්දියානු ප්‍රශ්නය විසඳීමටත්, ආර්ථික, සංස්කෘතික, සමාජයීය නිදහස ලබා ගැනීමටත් ලංකා මාතාවට තැනක් දීමටත් ක්‍රියා කරන්නය කියා. අපේ රජය ගෙන යන මේ ප්‍රතිපත්තිවලට සහාය දීමෙන් ප්‍රතිගාමීන් සියළු දෙනාම අභිභවා, ප්‍රතිගාමීන් පරාජය කර සමාජවාදය ඔස්සේ ගමන් කරමින් ඇති නැති අය අතර තිබෙන පරතරය සම්පූර්ණයෙන් නැති කිරීමට අපට අවස්ථාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසාන කරනව."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ කියෙව්වෙ 1964 දෙසැම්බර් 3 වන දින හැන්සාඩ් වාර්තාවෙන්. අද තත්ත්වය කුමක්ද? මා එදා ප්‍රකාශ කළ අනාවැකිය අද සම්පූර්ණයෙන්ම හරි ගිහින් තිබෙන බව අපට පෙනෙනව. මෙවැනි දේශපාලන පක්ෂ මේ විධියෙ වැඩ පිළිවෙළක් අනුගමනය කිරීම අපට පුදුමයක් නොවෙයි. මේ ආණ්ඩුව වැඩ කරන්නෙ ලෝක බැංකුවෙ වාර්තා උඩ බවට යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) කරුණු ගෙන හැර දැක්වූවා. ඒක පුදුමයක් නොවෙයි. මෙවැනි ධනවාදී අධිරාජ්‍යවාදී පක්ෂයක සිටින මන්ත්‍රීවරු අධිරාජ්‍යවාදයේත් ධනවාදයේත් මුරකරුවන් පමණයි. ඒ අයගෙ ස්වාමිවරුන් නැත්නම් ප්‍රතිපත්ති පිළියෙළ කරන අය, සංවිධාන පිළියෙළ කරන අය ඉන්නෙ පිටිපස්සෙ. අධිරාජ්‍යවාදී රටවල සිටින උදවිය නැත්නම් ඔවුන්ගෙ අතකොළු හැටියට මෙහි සිටින උදවිය කියන කියන විධියට මේ මන්ත්‍රීවරු නටනව මිස මොලයකින් කල්පනා කර හිතක් පපුවක් ඇතිව ජාතිය වෙනුවෙන් වැඩ නොකරන බව අපට හැම අවස්ථාවකදීම පෙනී ගොස් තිබෙනව. අපේ පක්ෂවල, සමාජවාදී පක්ෂවල ප්‍රතිපත්ති හදන්නෙ මහජනතාවයි. සෑම කාරණයකදීම මහජනතාව සමග අත්වැල් බැඳගෙන, මහජනතාවගේ අදහස් උදහස් හොඳහැටි දැනගෙන තමයි අපේ පක්ෂවල ප්‍රතිපත්ති හදන්නෙ. අපේ සංවිධාන හදන්නෙත් මහජනතාවට වුවමනා විධියටයි. නමුත් මෙවැනි ධනපති, අධිරාජ්‍යවාදී කොටස්වල ප්‍රතිපත්ති හදන්නෙත් සංවිධාන හදන්නෙත් සී. අයි. ඒ. එකට, ලෝක බැංකුවට නැත්නම් ඇමරිකන්කාරයින්ට වුවමනා විධියටයි. මේ අය ඔවුන්ගෙ ගැත්තන් හැටියට, සම්පූර්ණයෙන්ම ජාතිය පාවා දෙමින් බලයේ සිටිමට පමණක් ක්‍රියා කරන බව දැන් අපට හොඳහැටි පැහැදිලිවී ගොස් තිබෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ එක්සත් ජාතික පක්ෂයෙ අය බලයට එන්න එක ප්‍රකාශයක් කරනව. ඒ ප්‍රකාශයෙන් ප්‍රයෝජන අරගෙන බලයට පත්වූවාට පසුව තවත් ප්‍රකාශයක් කරනව. ඊට පසු දිගටම බලයෙ ඉන්න තවත් ප්‍රකාශ කරනව. මේ අය 1965 දී කළ ප්‍රකාශ මොනවාද? මේ අය 1965 දී ඉදිරිපත් කළ රාජාසන කථාවත් 1966 දී ඉදිරිපත් කළ රාජාසන කථාවත් දැන් මේ ඉදිරිපත් කර තිබෙන රාජාසන කථාවත් අරගෙන පරීක්ෂාවෙන් සංසන්දනය කර බැලුවොත් මේ රාජාසන කථා තුනම කොයි තරම් පරස්පර විරෝධිද කියා අපට සිතාගන්ට පුළුවන්. එක්සත් ජාතික පක්ෂය 1965 දී කිව්වෙ මොකක්ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ ආණ්ඩුව නැත්නම් සභාග ආණ්ඩුව බුද්ධාගමට ප්‍රධාන තැනත් අනෙක් ආගම්වලට සාධාරණ තැනත් දීමට 29 වන වගන්තිය සංශෝධනය කරන්ට ඉදිරිපත් වූ අවස්ථාවේදී, සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ක්‍රියාත්මක කරන්ට ඉදිරිපත් වූ අවස්ථාවේදී, ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් ජාතික සේවාවක් කිරීමට වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළ අවස්ථාවේදී අපේ ආණ්ඩුව බිඳ හෙළුව. අපේ ආණ්ඩුව බිඳ හෙළූ මේ අය ඉන්පසු මොකක්ද කළේ? මේ අයට තමන් ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ආණ්ඩුවක් හැටියට කටයුතු කරනවාය කියා කියන්ට වුවමනා කළා. එම නිසා මේ අය මොනවද කළ ප්‍රකාශ? ඇත්ත වශයෙන්ම මේ අය ඒ කාලයේදී කළ ප්‍රකාශ දෙස බැලුවොත් පුදුම හිතෙනව. ඩඩ්ලි සේනානායක මහත්මයා කියනවා—

"From tomorrow, it will be my task to defend it more than ever."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මොනවද ?

"I am quite confident that the patriotic people of this country will defend with their lives, their priceless freedom from being destroyed.

From tomorrow, it will be my task to defend it more than ever. Free as I am without my parents or any other dependants, I consider it a great act of merit to be in this battle in the defence of the fundamental rights of man, and his freedom to believe in religion."

ඔකයි එදා කීවෙ. නමුත් අද කෙරුවාව කොහොමද ? අද ඊට සම්පූර්ණයෙන්ම වෙනස්.

1965 එක්සත් ජාතික පක්ෂයෙ මැතිවරණ ප්‍රකාශනයෙන් බුද්ධාගමට ලොකු තැනක් දීම ගැන කියනව. එදා ඒ උදවියගෙ ලොකුම වැඩේ ඒකයි. එදා ඒ අය කීවෙ මෙහෙමයි :

"We believe that Buddhism is the very life of the Sinhalese people, inspiring their literature, art, architecture and civilization."

"While restoring Buddhism to the place it occupied when Lanka was free and Kings ruled according to the Dassa Raja Dharma (Ten Buddhist Principles), we shall respect the rights of those who profess other faiths and ensure to them freedom of worship."

1965 රාජාසන කථාවෙ ඒ උදවිය මෙහෙම කියා තිබෙනව :

"ලංකාව නිදහස්ව සිටි අවධියේදී තිබූ තත්ත්වයට බෞද්ධාගම නැවත නගා සිටුවන අතර මාගේ ආණ්ඩුව අනිකුත් ලබ්ධිකයින්ගේ අයිතිවාසිකම් වලට ගරු කරමින් ඔවුන්ට තමතමන්ගේ ආගම් ඇදහීමේ නිදහස සලසා දෙනු ඇත."

1966 රාජාසන කථාවෙ කියන්නෙ මෙහෙමයි :

"බුද්ධාගමට හිමි ස්ථානය යළිත් ලබාදීමේ පියවරක් වශයෙන් මාගේ ආණ්ඩුව රජයේ අංශයටද පෞද්ගලික අංශයටද අදාළ වන සේ හතර පෝය දින නිවාඩු දින කර තිබේ. මාගේ ආණ්ඩුව කිසිම විරොධයක් පැන නොනගින සේ මීට අවශ්‍ය සංශොධන ඇති කළේය. මේ සම්බන්ධයෙන් විශෙෂයෙන් අනිකුත් ආගම් අදහන්නවුන් දැක්වූ සුහදතාවයද සියල්ලන්ගෙන්ම ඒ ගැන ලැබුණ සහයෝගයද මාගේ ආණ්ඩුව ප්‍රශංසනීය ලෙස සලකයි."

නමුත් 1967 රාජාසන කථාවෙන් බුද්ධාගමට දෙන තැන ගැන මොනවද කියන්නෙ ? බුද්ධාගමට ලොකු තැනක් දීම ගැන එහි වචනයක්වත් නැහැ. 1965 දී කීව, සිංහල රජකාලෙ තිබුණු තැන බුද්ධාගමට දෙනවය කියා. 1966 දිත් කීව. ක්‍රමක්‍රමයෙන් ටික ටික අඩු වුණා. එහෙත්, මේවර මීගමුව ඉලෙක්ෂන් එක තිබෙන නිසා එක වචනයක්වත් කීවෙ නැහැ, බුද්ධාගමට යථා ස්ථානයක් දීම ගැන. මේකයි, ප්‍රෝඩාව. ඉලෙක්ෂන් කාලෙ එක පිළිවෙළක්. ආණ්ඩුව අල්ලාගත්තට පසුව තව පිළිවෙළක්. ආණ්ඩුව තියාගන්න වෙනත් පිළිවෙළක්.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදය ගැනත් කියා තිබෙනව. 1965දී ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදය ගැන තමයි, උසස් විධියට සඳහන් කළේ. එදා හැම එකෙන්ම කීවෙ ඒ ගැනයි. 1966 දිත් එහෙමයි. නමුත් 1967දී වචනයක්වත් නැහැ. 1967 දී ප්‍රජාතන්ත්‍රවාදයත් සමාජවාදයත් නැහැ. මොකක්ද මේකෙ තේරුම ? 1965 වන විට ඒ උදවිය කිවෙ "අපි පරණ යූ. එන්. පී. කාරයො නොවෙයි ; අපි දැන් අළුත් ; අපි සමාජවාදී අයයි ; අපි ප්‍රජාතන්ත්‍රවාදී අයයි ; අපි ඇති නැති අය අතර ඇති පරතරය නැති කරන අයයි ; පේන්නෙ නැද්ද මාක්ස් වාදයෙ පියත් අපි සමග ඇවිත් සිටිනව ; ඇසිලින් නෝනගෙ බුලත් වට්ටිය ගැන වර්ණනා කළ ගාල්ලේ දහනායක උන්නැහෙත් ඇවිත් සිටිනව" යනාදී වශයෙනුයි. ඔහොම කියා ආණ්ඩුව අල්ලගෙන දැන් ඒ අයට ප්‍රජාතන්ත්‍රවාදයත් නැහැ, සමාජවාදයත් නැහැ.

ඊළඟට ඉන්දියානු ප්‍රශ්නය ගැන බලමු. 1965 රාජාසන කථාවෙ ඒ ගැන වචනයක්වත් සඳහන් කළේ නැහැ. ඇයි එසේ වන්ට කාරණය ? රහස් ගිවිසුම් වලින් සම්පූර්ණයෙන් ප්‍රතිඥා දී තිබෙනව, අපි මෙන්න මේ විධියට කටයුතු කරනවය කියා. ඒ නිසයි, එක්සත් ජාතික පක්ෂය මුහුණු දෙකක් තියාගෙන කටයුතු කළේ. එක් කොටසක් වතුකරයට ගොස් ඉන්දියානුන් හමුවෙ කීව, "උඹල ඉන්දියාවට යන්ට කැමති නැතිනම් අලියට කතිරෙ ගහපල්ල" කියා. ඊළඟට ගමට ගිහින් කීව, "පන්ලක්ෂ විසිපන් දහස නොවෙයි නවලක්ෂ හැත්තෑපන් දහසම යවන්න උඹල කැමතිනම් අලියට කතිරෙ ගහපල්ල" කියා. අන්න ඒ නිසා තමයි ඒ ගැන පිරිසිදු වශයෙන් එකම වචනයක්වත් 1967 ප්‍රකාශනයෙ කර නැත්තෙ.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

අනික් කාරණය නියෝජ්‍ය කථානායකතුමනි, උඩ රට ගැමි පුනරුත්ථාපනය ගැන කිසිම දෙයක් මේ ප්‍රකාශනයෙ නැහැ. කොහොමද එවැන්නක් ඇතුළත් කරන්නෙ? ඉන්දියානු ප්‍රශ්නය විසඳන්නට තොන්ඩමනුත් එක්ක ගිවිසුම් ගහගෙන ඒ අතරට මේකත් ගහන්න බැහැ. ඇයි? ගමට ගිහින් එකක් කියනවා, වතුකරයට ගිහින් තවත් එකක් කියනවා. ඒ නිසා උඩ රට පුනරුත්ථාපනය ගැන රාජාසන ප්‍රකාශනයෙ එක වචනයක්වත් සඳහන් වී නැහැ. ආණ්ඩු බලය ලබාගන්නට පස්සෙ පැවැත්වූ 1965 ප්‍රකාශනයෙ තිබෙනව. 1966 ප්‍රකාශනයෙ තිබෙනව. එහෙත් මේ 1967 ප්‍රකාශනයෙ වචනයක්වත් නැහැ. ඒ මොකද? උඩරට පුනරුත්ථාපනය පිළිබඳව උඩරටට කරල ඉවරයි. ඒ කොහොමද? 5,25,000 ක් ඉන්දියානුවන් වශයෙන් ලියා පදිංචි කිරීම පමණක් කර, ඒ උදවිය මේ රටේ පදිංචි කරවා 3,00,000 ට මේ රටේ පුරවැසිකම් දී, ඒ ඉන්දියානුවන්ට ඡන්ද බලයත් හොඳ හැටියට අයිති කර දී දැන් උඩ රට අයට වෙන කරන්න දෙයක් නැහැ. ඒ නිසා උඩ රට ගැන එක වචනයක්වත් නැහැ.

අනික් කාරණය දේශපාලන අයිතිවාසිකම් රජයේ සේවකයන්ට දේශපාලන අයිතිවාසිකම් දෙනවාය කියා 1965 දී පක්ෂ ප්‍රකාශනයෙ සඳහන් කර තිබෙනව. මෙන්න ඒ පිළිබඳව ප්‍රකාශ කර තිබෙන දේ :

"The Public Service is as important as the Government. Without a contended informed and co-operative Public Service no democratic Government can carry out its programme. That co-operation cannot be won by threats or punishments or spying or by appointing stooges to high places—as the Coalition Government did. It has to be won by persuasion, by clear direction, by non-interference by politicians and by fairplay. It will be the policy of the U.N.P. to meet the needs of public servants including those in the Local Government Service.

We are in favour of granting political rights to certain categories of public servants, the categories to be agreed to by an All-Party Parliamentary Select Committee."

එතකොට 1965 ට එය ඇතුළත් වුණා. 1966 වචනයක්වත් නැහැ. 1967ත් කොහෙත්ම නැහැ. මේ ආණ්ඩුව දෙස බලන විට, නියෝජ්‍ය කථානායකතුමනි, බර්නාඩ් ෂෝ මහතා විසින් ලියා ඇති නාට්‍යයක් මට සිහි වෙනවා. ඒ මොකක්ද? මැතිවරණයක් පැවැත්තුවා. වැඩි ඡන්ද සංඛ්‍යාවකින් යුත් වැඩි ආසන ගණනක් ලබා ගත්තා. ඊට පස්සෙ විරුද්ධ පක්ෂයට සම්පූර්ණයෙන්ම දොරටුව වසා ආණ්ඩු කර ගෙන ගියා. අන්න ඒ විධියටයි මේ ගොල්ලත් ආණ්ඩු කරන්න සූදානම් වන්නෙ.

තවත් උඩරට මගේ යාළුවෙක් නාට්‍යයක් කෙටුම්පත් කරගෙන යනව. නමුත් නාන්සේලා දන්නවා ඇති, අප ආණ්ඩු බලයේ සිටියදී අපට නොයෙකුත් විධියේ චෝදනා කළා, අපි දූෂණ වැඩ කරනවාය, ඤාති සංග්‍රහ කරනවාය, නෑදෑයින්ට හිතවතුන්ට නොයෙක් විධියේ සංග්‍රහ කරනවාය කියා. නමුත් මේ ආණ්ඩුව මොකක්ද කර තිබෙන්නෙ?

අන්න ඒ කාරණයේදී මට මතක් වෙනවා, අර මුලින් මතක් කළ පරිදි, මගේ මිත්‍රයෙක් වන නාට්‍යකරුවෙක් ලියාගෙන යන නාට්‍යය ගැන. මොකක්ද නාට්‍යය? එක්කෙනෙක් අගමැති වෙනව. මොකටද? රටට, ජාතියට, ආගමට, භාෂාවට සේවය කරන්න. එයාගෙ අනික් සහෝදරයෙක් ජාවාරමක් පටන්ගන්නව. තවත් සහෝදරයෙක් විරුද්ධ පක්ෂයේ නායකයා වෙනව. ඊ ළඟට පත්‍ර ටික ඔක්කොම අල්ල ගන්නව ඕනෑ විධියට මේ ආණ්ඩුවෙ වර්ණනාව කරන්න. අගමැති වූ එක්කෙනා කියනවා, හෝ ඉස්සර කරගෙන ගිය හැටි වැරදියි, ජනසතු කිරීම වැරදියි, අපි ඔක්කොම එකතුවී මේව ආපසු පුද්ගලයන්ට දෙන්න ඕනෑ කියා. කොයි වේලාවෙද සාකච්ඡා කරන්නෙ? රාත්‍රි කෑම මේසෙදි. රාත්‍රි කෑම මේසෙදි විරුද්ධ පක්ෂයේ නායකත්, අර ජාවාරම් කරන අගමැතිගෙ සහෝදරයත් අගමැතිත් සාකච්ඡා කරනව රට ගෙන යන හැටි. එකක් මොකක්ද? ජාවාරම් පුද්ගලයන්ට පවරන්න ප්‍රතිපත්ති හදනව. එක මල්ලි කෙනෙක් ස්ටෝරිය හදනව පසුවදා උදේට පත්‍රයට දමන්න. විරුද්ධ පක්ෂයේ නායකයා ගිරිය පුප්පාගෙන කෑ ගහනව. නමුත් මාසෙ අන්තිමට තුන් දෙනාම එක්කාසු වී ජාවාරමින් ලැබෙන ලාභය බෙදා ගන්නව. මෙන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ විධියෙ තත්ත්වයක් මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ දෙස බැලීමෙන් පෙනී යන්නෙ.

විදේශ ආධාර ගැන බැලුවත් අප කවුරුත් දන්නව මෙම විදේශ ආධාර ලැබෙන්නෙ මුදලින් නොවෙයි භාණ්ඩවලින් බව. බටහිර ජර්මනියෙන්, ප්‍රංශයෙන්, එංගලන්තයෙන් ඔය ආදී රටවලින් තමයි අපට විදේශ ආධාර වශයෙන් භාණ්ඩ ලැබෙන්නෙ. මෙම භාණ්ඩවල වටිනාකම අවුරුදු විස්සක කාලයක් තුළදී සියයට තුනේ පොළියත් සමග ආපසු ගෙවන්න වෙනව. නමුත් මේවා පරිහරණය කරන්නෙ කව්ද ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය පිළිබඳව මම ගිය මාසයේ ප්‍රශ්නයක් මෙම ගරු සභාවේදී මතු කළ අවස්ථාවේදී මට ලැබුණු පිළිතුර මොකක්ද ? බටහිර ජර්මනියෙන් ගෙන්වන “ කොන්ටිනෙන්ටල් ටයර්ස් ” බෙදා හරින්නෙ අගමැතිතුමාගේ මල්ලිගෙ “ පෑඩන්බර්ග ” කොම්පැනියෙන්. ජාතිය අවුරුදු විස්සකට ණය වෙනව, පොලියත් එක්ක ආපසු ගෙවනවා. එහෙම නම් ආණ්ඩුව මගින් ගෙන්වා අවශ්‍ය උදවියට බෙදා දෙන්නෙ නැත්තෙ ඇයි ? ඇයි මල්ලිගෙ කොම්පැනියටම භාර දුන්නෙ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ දන්නව ඇති, පත්‍ර මගින් ප්‍රසිද්ධ කර තිබුණ, විදේශ ආධාර යටතේ මෙරටට ට්‍රැක්ටර් ගෙන්වනවාය කියා. මෙසේ ආධාර වශයෙන් ලැබෙන ට්‍රැක්ටර් සඳහා සියයට තුනේ පොලියකුත් සමග ණය අවුරුදු විස්සක කාලයක් තුළදී ගෙවා නිම කරන්න ඕනෑ. මේ ජාවාරම ගෙන යන්නෙ කව්ද ? එක්සත් ජාතික පක්ෂයට අයත් එක්තරා සෙනෙට් මන්ත්‍රීවරයෙක්. මේවාද දූෂණ ? මේවාද වංචා ? මේවාට තමයි ක්‍රමානුකූල දූෂණ කියන්නෙ. මේකද මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ?

ජීවන වියදම ගැන මට පෙර කථා කළ මාතර මන්ත්‍රීතුමා (බී. වයි. තුඩාවෙ මයා.) ප්‍රකාශ කළා වාගේ මෙම රාජාසන කථාවෙහි වචනයක්වත් සඳහන් වෙන්නෙ නැහැ. කෙසේ වුණත් 1965 රාජාසන කථාවෙන් කෙළවරක් නැතුව අපට දෙස් කීවා, පෝලිම් දිගය, බඩු නැත, කරවල නැත, ගිනි පෙට්ටි නැත, පරිප්පු නැත, වෙනත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය නැත කියා. එසේ වුණත් 1965 රාජාසන කථාවෙදි කීව, බොහෝ කාලයක් තිස්සෙ විසඳන්න නොහැකිව තිබුණු මේ ප්‍රශ්න විසඳීම අමාරු වුණත් යථා පරිදි විසඳන්න කටයුතු කරනවාය කියා. 1966 රාජාසන කථාවෙනුත් විරුද්ධ පක්ෂයට දොස් නැගුවා. නමුත් 1967 මෙම රාජාසන කථාවෙදි වැඩි වන ජීවන වියදම ගැන කිසිම වචනයක් සඳහන් කර නැහැ. නමුත් අද තත්ත්වය මොකක්ද ? ආණ්ඩුවෙන් ප්‍රසිද්ධ කර තිබෙන ගණන් හිලව් දෙස බලන විට පෙනී යන්නෙ, 1964 අප බලයේ සිටි කාලයේදී ජීවන අංකය 112.2 ක්ව තිබුණත් මෙතරම් ක්‍රියා ශීලී, සමත් ඇමතිවරුන් සිටින මේ ආණ්ඩුව බලයට පැමිණියාට පස්සෙ 1967 පෙබරවාරි මාසයෙ ජීවන අංකය 113.4 ක් බවයි.

එපමණක් නොවෙයි, අපට දොස් කියා තිබුණ, අපේ ආණ්ඩුව ශක්තිමත් මදි, හැමදාමත් ස්ට්‍රයික් තිබෙනවාය එම නිසා ශක්තිමත් ආණ්ඩුවක් පිහිටුවා වැඩ කරගෙන යා යුතු කාලය එළඹ තිබෙනවාය කියා. එහෙනම් බලයට පැමිණි මේ ආණ්ඩු කාලය තුළදී පැවති වැඩ වර්ජන වලින් නැතිවූ වැඩ කරන දින සංඛ්‍යාව කොපමණද කියා බැලීම වැදගත්. මේ ආණ්ඩුව බලයේ සිටි කාලය තුළදී වැඩ වර්ජන නිසා නැති වූ දින සංඛ්‍යාව තරම් දින සංඛ්‍යාවක් පාර්ලිමේන්තු ඉතිහාසය තුළදී කවරදාවත් වැඩ වර්ජන නිසා නාස්ති වී නැති බව පෙනී යනව. වැවිලිවලින් 41, 17,264 ක් හා අනිකුත් ආයතනවලින් 34,351 ක් වෙනව. මේ අනුව එකතුව 41, 51,615 යි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව අවුරුදු දෙක තුනක කාලයක් තිස්සෙ විදේශ ධනය සම්බන්ධයෙන් කියන කථාවක් තමයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සභාග රජය රට පාලනය කරගෙන යන අවදියේ භාණ්ඩාගාරය හිස් කළාය කියා. මෙය හැමදාමත් කෑ ගහන කියමනක් තමයි.

මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසු ඇති වී තිබෙන තත්ත්වය මොකක්ද ? මහ බැංකුවේ වාර්තා අනුව විදේශ විනිමය තත්ත්වය මෙසේ යි : 1964 දී රුපියල් දශලක්ෂ 440 ක විදේශ විනිමයක් තිබුණා. නමුත් මේ ආණ්ඩුව බලයට ආවායින් පසුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
පිටරටින් දශ ලක්ෂ 108.3 ක් ණයටත් ලබා ගැනීමෙන් පසුව අද තිබෙන්නේ රුපියල් දශ ලක්ෂ 318 ක විදේශ විනිමයක් පමණයි. මෙය මෙසේ වුණත් රාජ්‍ය ඇමතිතුමා කියන්නේ ක්‍රමානුකූලව අපේ ආර්ථික තත්ත්වය නැගී යන බවයි. 1965-66 වර්ෂයේදී විදේශ විනිමයෙන් වැය කර ඇති මුළු මුදල රුපියල් දශ ලක්ෂ 330.3යි.

වෙළෙඳාම හරියාකාර කරගෙන යන්නේ නැතැයි එදා අපට නොයෙකුත් විධියට චෝදනා කළා. වෙළෙඳ ඇමතිවරයා වශයෙන් මට මොන මොන චෝදනාවලට මුහුණ පාන්නට සිදු වුණාදැයි ගරු නියෝජ්‍ය කථානායකතුමා දන්නවා ඇති. වෙළෙඳාම සම්බන්ධවත් මම සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන්නම්:

1965 වෙළෙඳ වාසිය රුපියල් දස ලක්ෂ 474
1966 ජනවාරි වෙළෙඳ වාසිය ලක්ෂ 36
1966 පෙබරවාරි වෙළෙඳ අවාසිය ලක්ෂ 35
1966 මාර්තු වෙළෙඳ අවාසිය ලක්ෂ 65
1966 අප්‍රේල් වෙළෙඳ අවාසිය ලක්ෂ 11
1966 මැයි වෙළෙඳ අවාසිය ලක්ෂ 19
1966 ජූනි වෙළෙඳ අවාසිය ලක්ෂ 37
1966 ජූලි වෙළෙඳ අවාසිය ලක්ෂ 20
1966 අගෝස්තු වෙළෙඳ අවාසිය ලක්ෂ 85
1966 සැප්තැම්බර් වෙළෙඳ අවාසිය ලක්ෂ 7
1966 ඔක්තෝබර් වෙළෙඳ අවාසිය ලක්ෂ 41
1966 නොවැම්බර් වෙළෙඳ අවාසිය ලක්ෂ 90
1966 දෙසැම්බර් වෙළෙඳ අවාසිය ලක්ෂ 25

ඇත්තෙන්ම මේ ආණ්ඩුව කරගෙන යන්නේ මොනවාද ? විදේශ විනිමය කාබාසිනියා කරගෙන යන අතර අපේ වෙළෙඳ අවාසිය මේ විධියයි. 1966 පෙබරවාරි මාසයේ සිටම හැමදාම අපට වෙළෙඳ අවාසියක් තිබෙනවා. මේවා ගැන පිළිතුරු දෙන්නට එකම ඇමතිවරයකුවත් නැහැ. මේ ඇමතිවරුන් මහජනයා ඉදිරියට යන්නේ මේ වාර්තා කියවා බලාද ? ඒ අය මේවා කියවා බලන්නේවත් නැතිව ඇති. මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ සකස් කරන්නේ පිටස්තර අයයි. "මේ මේ විධියට වැඩ කරගෙන යන්න" යනුවෙන් ලෝක බැංකුව අවවාද කරනවා. එතකොට ඒ අනුව ක්‍රියා කරනවා. එසේ වුවත් මේ ආණ්ඩුව ගෙන යන ප්‍රචාරය නම් බොහොම ලොකුයි. ජාතික සංවර්ධනය ඇති වීගන යන්නේ කොයි විධියටදැයි යටියන්තොට ගරු මන්ත්‍රීතුමා, (ආචාර්ය එන්. එම්. පෙරේරා) පෙන්වා දුන්නා. දිනෙන් දින ජාතිය පිරිහෙණ හැටි එතුමා හොඳින් පෙන්වා දුන්නා.

මේ ආණ්ඩුවේ අර්ථ ක්‍රමයෙන් ඇති වී තිබෙන බලාපොරොත්තු සුන් කරන තත්ත්වය 1965 වර්ෂය වෙනුවෙන් නිකුත් වී ඇති ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවෙන් පෙනී යනවා :

"දළ ජාතික නිෂ්පාදිතයට අනුව මණින විට, 1965 දී ලංකාවේ ආර්ථික කටයුතු සාදනයෙහි අඩු වීමෙක් දක්නට ලැබේ. 1964 දී දළ ජාතික නිෂ්පාදිතය, පවත්නා සාධක මිල අනුව සියයට 5.8 කින් වැඩි විය. එහෙත්, 1965 දී වැඩි වී ඇත්තේ සියයට 4.0 කින් පමණෙකි. මූර්ත වශයෙන්, එනම් 1959 ස්ථාවර මිල අනුව, බලන විට, 1965 වැඩි වී ඇත්තේ සියයට 2.0 කින් පමණකි. එහෙත් 1964 දී ඇති වූ මූර්ත වැඩි වීම සියයට 4.4 කි. සියයට 2.4 කින් වැඩිවන ජනගහණයද ගණන් ගත් විට, පවත්නා මිළ අනුව, ඒකජන වශයෙන් දළ ජාතික නිෂ්පාදිතය වැඩි වී ඇත්තේ සියයට 1.7 කින් පමණෙකි. මෙයම මූර්ත වශයෙන් ගෙන බලන විට නියතයෙන්ම සියයට 0.4 කින් අඩු වී ඇත."

ඒ 1965 තිබුණු තත්ත්වයයි. 1966 තත්ත්වය මීට වඩා අන්තයි. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඒ ගැන පැහැදිළිව කරුණු කිව්ව. මේ තත්ත්වය යටතෙ මේ ආණ්ඩුව රටට මුහුණ දෙන්නෙ කොහොමද? මේ ගැන මේ ඇමතිවරුන්ට නිදහසට කියන්න තිබෙන්නෙ මොනවද? ආණ්ඩුව කරගෙන යන්නෙ කොහොමද? විදේශ ආධාර ගැන නොයෙක් විධියේ කථා ආණ්ඩු පක්ෂයෙ උදවිය විසින් කර තිබෙනව. විදේශ ආධාර ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් තෙල් කොම්පැනිකාරයින්ට කෝටි පහමාරක වන්දියක් ගෙව්ව. එහෙත් විදේශ ආධාර කොච්චර ලැබුණද ?

අප විසින් ඇති කර තිබුණු සංස්ථාවලින්, ගිය අවුරුද්දෙ අග වන විට මෙන්න මේ ලාභ ලැබී තිබෙනව. සේවක අර්ථසාධක අරමුදලෙන් රුපියල් කෝටි 40 ; පැට්‍රෝල් සංසථාවෙන් කෝටි 15 යි ;— ඉතිරි කළ විදේශ විනිමය රුපියල් 6,20,00,000 යි ; සතොසෙන් අවුරුද්දකට 1 කෝටි 80 ලක්ෂයයි ; මහජන බැංකුවෙ වාර්ෂික ලාභය ලක්ෂ 20 යි ; ජාතික ලොතරැයියෙන් අවුරුදු පතා 1 කෝටි 80 ලක්ෂයයි ; 1966 පමණක් ලාභය 1,01,03,590 යි ;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිමෙන්ති සංස්ථාවෙන් ලක්ෂ 25 යි; ජාතික රෙදි ආයතනයෙන් ලක්ෂ 14 යි; කඩදාසි සංස්ථාවෙන් 34,11,085 යි; අප විසින් ඇති කරන ලද ටයර් සංස්ථාවත් වානෙ සංස්ථාවත් ලෝහ භාණ්ඩ සංස්ථාවත් මැතදී විවෘත කළා. ඒවායින් මෙතෙක් ලැබුණු ප්‍රයෝජනය කොපමණද යන වග තවම අපට දැනගන්න ලැබී නැහැ. එහෙත් මේ ආණ්ඩුව කියන්නෙ, "පසුගිය ආණ්ඩුව රට කාලා ගියා, අපි තමයි කෙරුම් කාරයො" යනුවෙනුයි.

ඊළඟට, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආනයන වාර්තාව දෙස බලන විට අපට එහි පුදුම දර්ශනයක් පෙනෙනවා. මේ වාර්තාවෙ හැටියට 1966 වර්ෂයෙදි ධාන්‍ය හා ධාන්‍ය නිර්මාණ රු. 48,55,59,320 ක මේ රටට ගෙන්වා තිබෙනව. හාල් ගෙනත් තිබෙන්නෙ රු. 36,68,31,425 ක පමණයි. ඒ අනුව, රු. 11,87,28,900 ක හාල් නොවන ධාන්‍ය වර්ග ගෙන්වා තිබෙනව, ඒ මොනවද? "කෝන්ෆ්ලේක්" ද? පරිප්පු ගෙනාවෙත් නැත්නම්, මුංඇට ගෙනාවෙත් නැත්නම් රුපියල් 11,87,28,900 ක ගෙන්නුවෙ මොනවද? ධාන්‍ය හා ධාන්‍ය නිර්මාණවලට කළුකුන් හේමත් ඇතුළත් වෙනවද?

ඊළඟට, මේ රටට ගෙන්වා තිබෙන පළතුරු හා එළවළු ප්‍රමාණය ගැන බලමු. පළතුරු වගාව, එළවළු වගාව දියුණු වේගන යනවයයි මේ රජය ලොකුවට කෑගහනව. එහෙත්, පසුගිය වර්ෂයෙ රුපියල් 12,28,59,817 ක පළතුරුත් එළවළුත් ගෙන්වා තිබෙනව. ඒවයින් ස්වයංපෝෂිත වී තිබෙනව නම් මේ විදේශ විනිමය ඉතිරි නොකරන්නේ ඇයි? ඇපල්, මුද්ද රප්පලම් ගේනවද? කිරි හා බිත්තර රුපියල් 7,68,51,709ක ගෙන්වා තිබෙනව. මොන කිරිද මේ ගෙන්වා තිබෙන්නෙ? අපට ලැබී තිබෙන ආරංචියෙ හැටියට නම් අපේ කිරි මණ්ඩලයෙ කිරි හැමදාම කාණුදිගේ ගලා යනව. අප දන්න හැටියට බිත්තර ලංකාවට ගෙන්වන්නට වුවමනාවක් නැහැ. අපේ රජය තිබුණු කාලයෙදි බිත්තරවලින් රට ස්වයංපෝෂිත වී තිබුණ. දැන් බිත්තරත් ගෙන්වනව.

රට බීම හා දුම්කොළ රුපියල් 58,50,514 ක ගෙන්වා තිබෙනව. මෙහි දුම්කොළ වගා කරන ප්‍රමාණය මදි බවත්, එය සීමා කර තිබෙන බවත් කියමින් වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) කෑගහනව. ඇයි එසේ සීමා කර තිබෙන්නෙ? එක්සත් ජාතික පක්ෂයෙ හිතවතුන්ට කොමිස් ලබා ගැනීම සඳහා ඒජන්තවරුන් මගින් මේ විධියට පිටරටින් දුම්කොළ ගෙන්වන්න ඕනෑ නිසයි. ඒ හැර වෙනත් නිගමනයකට බහින්න පුළුවන්ද? මේ ගොල්ල රට හදන්නෙ මේ විධියටයි.

1966 වර්ෂයෙදි කෝපි, කොකෝ, කුළුබඩු රුපියල් 5,59,40,422 ක ගෙන්වා තිබෙනව. දැන් හාල් සේරුවක් කපා තිබෙනව. 1967 මුල් දෙමාසයෙදි ආහාර ගෙන්වීමට වැයවී තිබෙනව කෝටි 12 ක්. 1966 මුල් දෙමාසයෙදි වැය වී තිබෙන්නෙ කෝටි 8ක් පමණයි. මේ වෙනස ඇති වුනේ කොයි විධියට කියාද අපට කියා තිබෙන්නෙ? විදේශ විනිමය ඉතා වටිනා එකක් නිසා යටියන්තොට මන්ත්‍රීතුමා මුදල් ඇමති වශයෙන් සිටින කාලයේදී මේ රටින් පිටරට යවන ප්‍රාග් ධනය සීමා කළා. මේ ආණ්ඩුව ආවට පස්සෙ කොයි තරම් ජය පානය බිව්වද කියනව නම් ජාතික ආර්ථික ක්‍රමය ගැන කිසිම සැලකිල්ලක් නැතිව ඒ සීමාව සම්පූර්ණයෙන්ම අහෝසි කළා. කලින් තිබුණු ආණ්ඩුව කළ සෑම දෙයක්ම කඩා කප්පල් කිරීමයි, මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වුනේ. 1965 දී ලක්ෂ 40 ක් ප්‍රාග් ධනය වශයෙන් පිටරට ගෙන ගොස් තිබෙන අතර 1966 දී ලක්ෂ තුන්සිය ගණනක් ප්‍රාග් ධනය වශයෙන් පිටරට ගෙන ගොස් තිබෙනව. 1964 මුදල් රෙගුලාසි අහෝසි කළ පසු කෝටි පහමාරක් තෙල් කොම්පැනිවලට දුන්නා. කෝටි 7 ක් අය බදු සහන වශයෙන් දුන්නා. මේ විධියටයි, මේ සමර්ථ ඇමතිවරු මේ ආණ්ඩුව ගෙන යන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රාජාසන කථාවේ සඳහන් කරල තියෙනව, ජාතික වේතන සභාවක් පිහිටුවන්න යන වග කියා. ඒ මොකක්ද කියා මට තේරෙන්නෙ නැහැ. මීට කලින් පිහිටුවා තිබුනෙ මොකක්ද? මීට කලින් 1961 දී එකක් පිහිටෙව්වා, දැන් සිටින මහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

බැංකුවේ අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්. ඒ ජාතික වේතන ප්‍රතිපත්ති කොමිෂන් සභාවේ වාර්තාවට—1961 VIII වැනි සැසි වාර්තාවට—මොකද වෙලා තියෙන්නෙ? මේක පරණ වැඩි ඇති. ඒ සමගම විල්මට් පෙරේරා කොමිෂන් සභාව කියා එකක් පත් කළා. වැඩක් කරන්නට වුවමනා නම් මේ දෙකම සන්සන්දනය කරල වැඩක් කරන්න පුළුවන්. නමුත් මේ කරන්න යන්නෙ ප්‍රෝඩාවක්.

අපේ කම්කරු ඇමතිතුමා කම්කරු ඇමති අංශය භාරගත්තට පස්සෙ කම්කරුවන් ස්වර්ගයට යනවාය කියා තමයි සියළු දෙනාම සිතුවෙ. එදා සිටම විශාල ප්‍රකාශන කළ ඇමතිවරුන්ගෙන් පළමු වැනියා තමයි, කම්කරු ඇමතිතුමා. මොකක්ද කළේ ? ලාභ මුදල් සේවකයන්ට බෙදා දෙනවය කිව්වා. දැන් අවුරුදු දෙකහමාරක් ගිහින් තියෙනව. ලාභ බෙදා දෙනවා වෙනුවට නොයෙකුත් ආයතනවලින් ඉන්න සේවකයනුත් පහ කරනව. ඒ හැරෙන්නට වෙන දෙයක් සිදු වෙලා නැහැ. මූල ධන කොටස් බෙදා දෙනවය කිව්වා. සාමාන්‍ය ජනතාවට කොටස් ගන්න කොම්පැනි හරිගස්සනවාය කිව්වා. නමුත් දැන් හරිගස්සාගෙන යන්නෙ ජොයින්ට් ස්ටොක් කොම්පැනියි. සතොසේ සම්පූර්ණයෙන්ම ආපසු දෙන්න යනවා. පෙට්‍රල් ආදිය ආපසු දෙන්න යනව. ඇමතිතුමාට ප්‍රශ්නයක් ඉදිරිපත් කර ලබා ගත් පිළිතුරුවලින්ම මම ඔප්පු කළා, ලුබ්‍රිකේටිං ඔයිල්, ග්‍රීස් කියන ජාති දැන් ෂෙල් කොම්පැනිකාරයන් ගෙන්වන බව.

1964 මාර්තුවලින් පසු ඉන්කො තෙල් හැර වෙන කිසිම ඛනිජ තෙල්වර්ගයක් ගෙන්වන්න එපාය, බෙදා දෙන්න එපාය කියා අපි අණ කළා. නමුත් මේ ආණ්ඩුව ආවාට පස්සේ චක්‍ර ලේඛවලින්ම ප්‍රකාශ කළා, ඒවා බෙදා දෙන්න පුළුවන්ය කියා.

ලුබ්‍රිකන්ට් කම්හලක් හදන්න තෙල් කොම්පැනි කාරයන්ද උදව් දෙන්න යන බව රාජාසන කථාවේ සඳහන් කරල තියෙනව. ඇයි තෙල් පෙරන කම්හල හදන විට මේක හදන්න දෙන්න අපට බැරිද ?

අපි ඉරාකයෙන් ගල් තාර ගෙන්නුවේ තේ විකුණලයි. අද මොකද සිදු වෙලා තියෙන්නෙ? අද ගල්තාර ගෙන්වන්නත් තෙල් කොම්පැනි කාරයන්ට දී තිබෙනව. ඒවා කොහෙන් ගෙන්වනවාද කියන එක වෙනම ප්‍රශ්නයක්. ඉරාකයත් සමග තරහ වූ නිසා එක්සත් අරාබි ජනරජයත් සමග තරහ වූ නිසා අපේ මැදපෙරදිග තේවලට විශාල පහරක් වැදිල තියෙනව. මෙය ගරු ඇමතිතුමා දන්නෙ නැතිව ඇති. "බැග්ඩාඩ් නිව්ස්" පත්‍රයෙන් උපුටා ගත් වචන කීපයක් මා කියවන්නම්. උඩින්ම තිබෙන්නේ "එච් වූ, සිලෝන් ! එච් වූ, සිලෝන් !" කියායි. හරියට බෘටස්ට, "එච් වූ, බෘටේ" කීව වගෙ "ලංකාව උබත් මෙහෙමද අපට කරන්නේ ?" මෙය ලියා තිබෙන්නේ වලබ් ජමිල් නමැත්තෙක්, මා හිතන හැටියට. ඔහු අර්ථ ශාස්ත්‍රඥයෙක් ; කයිරෝ නගරයේ පැවැත්වුණු අර්ථ ශාස්ත්‍රය පිළිබඳ උසස් සාකච්ඡාවලට සහභාගි වුණු කෙනෙක්. නුවරඑළියෙ ගරු මන්ත්‍රීතුමා (ඩොනල්ඩ් ජේ. රණවීර මයා.) මෙය අහගන්නට විශේෂ උනන්දුවක් දක්වනවා ඇතැයි මා හිතනව.

"Ceylonese tea imports by member states of the Arab League exceed £ 14 million yearly. Iraq's import of Ceylonese tea during the past year alone was in the neighbourhood of £6,750,000. The main bulk of the tea exported to the Arab countries belongs to the brand grown on low mountain slopes—a bad quality brand which Ceylon exports only to our countries. An Arab embargo on tea imports from Ceylon or even any cut in the volume of these imports will produce telling effects on the Ceylonese economy and will throw Ceylon and its government in an acute crisis. I should report here that Mrs. Bandaranaike, the former Ceylonese Prime Minister, had pleaded with, almost entreated, Dr. Khaled al-Shawi, ex-president of the State Organisation of Trade, in one of his visits to Ceylon, to do everything he could to keep up the level of Iraq's imports of Ceylonese tea, 'as otherwise a strong crisis would be precipitated to the Ceylonese government'.

Yet Ceylon is glaringly ranging sides with 'Israel' against us—by her government, by some of her deputies and by her press. Ceylon's collaboration with 'Israel' just cannot be passed in silence any longer. The Ceylonese newspaper 'The Observer', in its issue of May 7, 1967, reported that Ceylon's intelligence bureau, the so-called 'Ceylon MI 5', is training its secret agents in 'Israel'. The newspaper also reported that an Israeli expert had recently arrived in Ceylon to help reorganise the bureau.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Another Ceylonese newspaper, 'The Daily News' in its issue of May 15—the anniversary of the creation of 'Israel'—printed an article full of praise for 'Israel' and scathing attacks on the Arabs. The newspaper said: 'America having created 'Israel' abandoned her to her fate in the face of onslaughts by the armies of seven Arab countries which invaded 'Israel' the day she was created. But 'Israel' compelled the invaders to come to a standstill.' The Ceylonese newspaper can now rest assured that 'Israel' was not left alone, as witness the aggression started on June 5. America put her full weight behind that aggression.

The same newspaper in that same impudent article had also said: 'Humanity everywhere echoes to the message of peace carried by Jerusalem.'

I have also on hand many other statements made by Ceylonese officers and other public men chiming in with the abovementioned pro-Israeli tone.

However, some deputies, fearful of Ceylon's economic interests, were impelled to warn of the consequence of collaboration with 'Israel'. One of these, Deputy Sama Sama, recently said in parliament: 'The deterioration in the markets of this brand of tea should be attributed to Ceylon's open defiance of the Arab states through fostering friendly relations with 'Israel'.'

In my view, some straight talking should be done with Ceylon. Ceylon should be told that India and Pakistan, two trustworthy friendly countries, are also tea growers and that henceforth the Arab nation will never forget or forgive anyone offending her feelings. The Arab nation, which has been importing millions of dinars worth of Ceylonese tea can easily switch to some other sources.

I am also astounded to find out that the State Organisation of Trade goes on transacting dealings with our enemies. Why does not the Ministry of Economics stop issuing import permits for the importation of goods from such countries as are siding with our enemies or at least work for cutting down such imports? Why are not tea orders placed with friendly countries? Must we submit to insults even from pygmy countries?"

මෙන්න මේ විධියටයි, අරාබි රටවල් අපේ තේ ජාවාරම ගැන කියන්නෙ. එපමණක් නොවෙයි. අපට උදව් දෙන්නට ලෑස්තිව සිටි තවත් රටවල් තිබෙනව. 1967 ජූනි 16 වැනි දා "ටයිම්ස් ඔෆ් සිලෝන්" පත්‍රයෙ මෙසේ සඳහන් වෙනව: එහි ශීර්ෂ පාඨය "රසියා ඔෆර්ස් ට්‍රැක්ටර්ස් ෆෝර් අවර් ටී" කියා සඳහන් වී තිබෙනව.

"Russia Offers Tractors for our Tea.

The Soviet Union has offered to sell several types of land-clearing and earth-moving equipment, urgently needed by us, in exchange for our tea.

The Commercial Counsellor of the Soviet Union in Ceylon has informed the Minister of Land, Irrigation and Power, that the Soviet Union is prepared immediately to purchase this year, medium-grown Ceylon tea to the value of 20 per cent. of the machinery offered to Ceylon.

The balance cost of the equipment can be covered by purchases of tea made in instalments during the next five years, he has said.

Medium-grown tea is at present fetching very low prices and the tea trade is hopeful that the Government will explore this Soviet offer, which will give a boost to tea prices."

පත්‍රයේ එසේ කියා තිබුණත් මට ආරංචි වී තිබෙන හැටියට නම්, මේවා විදේශ ආධාර වශයෙන් ලබා ගන්නට දැන් ඉඩම් අමාත්‍යාංශය ලියුම් හුවමාරු කර ගන්නවාලු. විකුණා ගන්නට බැරි අපේ තේ අරගන අපට වුවමනා කරන බඩු දෙන්නට රුසියාව ලෑස්තියි. නමුත් ඒවා විදේශ ආධාර වශයෙන් ලබා ගන්නට පුළුවන්ද කියා, දැන් ඉඩම් අමාත්‍යාංශය ලියුම් හුවමාරු කර ගන්නව. විදේශ ආධාර කියන්නෙ මොනවාටද? අවුරුදු 20 ක් තුළ දී ඒ බඩුවල වටිනාකම, ඊට සියයට 3 ක පොලියකුත් සමඟ දීමයි. අපේ තේ ගෙන ඒ වෙනුවට අපට වුවමනා කරන බඩු දෙන්නට යම් ආණ්ඩුවක් ලෑස්ති නම්, අපේ ආණ්ඩුව මෙහෙම කරන්නෙ ඇයි? එසේ කිරීමේ එකම හේතුව ජාවාරම් කාරයන්ට කොමිස් ගැනීමට ඉඩ දීම සඳහා ජාතිය පාවා දීමට මැලි නොවීමයි. ඒ හැරෙන්නට වෙන කිසිම තීරණයකට බහින්නට බැහැ. රට ජාතිය කියන්නෙ තමන්ගෙ නෑදැයන්ට පමණයයි සිතාගන කටයුතු කරනව නම්, ආණ්ඩුව ඒ බව කෙළින්ම කියන්නට ඕනැ, රට මුළා නොකර. මෙවැනි තත්ත්වයකටයි, අද මුහුණ පාන්නට සිදු වී තිබෙන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

අවසාන වශයෙන් කියන්නට කැමතියි, වියට්නාමය සම්බන්ධයෙන් රාජාසන කථාවේ සඳහන් ප්‍රකාශයෙන් පමණක් අපට කිසි සේත් සැනසෙන්නට බැරි බව. වියට්නාම් ප්‍රශ්නය ඉතාම දරුණු තත්ත්වයකට හැරී තිබෙනවා. නමුත් මෙන්න මෙවැනි පුවතක් අද දකින්නට ලැබීම එක් අතකින් සතුටට කරුණක්. 1967 ජූලි 15 වැනි දා—අද—" ඔබ්සර්වර් " පත්‍රයේ මෙසේ සඳහන් වෙනවා :

"North Vietnam rockets hit Danang base. One hundred U.S. planes are destroyed."

අමෙරිකා එක්සත් ජනපදයෙන් ගෙන ආ යුද්ධ ගගන යාත්‍රා 100 ක් වියට්නාම් විමුක්තිකාමීන් විසින් විනාශ කර තිබෙනවා. අනෙක් අතින් අපට මේවා ගැන සන්තෝෂ වන්නට බැහැ. කොයි රටේ හෝ මිනිසුන් විනාශ වෙනවා නම් අප ඒ ගැන කණගාටු වන්නට ඕනෑ.

මට නොයෙකුත් සාම සාකච්ඡාවලට සහභාගි වන්නට අවස්ථාව ලැබුණා. මට ඒ එක් අවස්ථාවක දැනගන්නට ලැබුණා, අමෙරිකාවේම උදවිය පවා මේ යුද්ධවලට සම්පූර්ණයෙන් විරුද්ධ බව. තත්ත්වය එසේ තිබෙද්දීත්, අපේ ආණ්ඩුව තවම වියට්නාම් යුද්ධය ගැන හරි ප්‍රකාශයක් කර නැහැ. මට මතක හැටියට, ගිය වර රාජාසන කථා විවාදයේදී හෙළි වුණා, ගරු අගමැතිතුමා ජිනීවා සම්මුතිය ගැන නොදන්නා බව. යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය පෙරේරා), මැද කොළඹ 3 වන ගරු මන්ත්‍රීතුමාත් (කෙනමන් මයා.) කියන්නට යෙදුණා, ඒ සම්මුතිවල හැටියට අමෙරිකාවෙන් වියට්නාමයට ගෙන්වාගත තිබෙන ආක්‍රමණික යුද්ධ හමුදාව සම්පූර්ණයෙන්ම ඉවත් කළ යුතු බව. 1954 ජූලි 20 වැනි දින ඇති කර ගත් සම්මුතිය අනුව මේ අය සියලු දෙනාම වියට්නාමයෙන් ආපසු ගෙන්වා ගත යුතුයි. නමුත් අගමැතිතුමා එය දන්නෙ නැහැ. අගමැතිතුමා තවම ප්‍රකාශ කර නැහැ, " අමෙරිකාවෙන් ගෙන්වා ගත් ආක්‍රමණික යුද්ධ භටයන් වියට්නාම්යෙන් ආපසු ගෙන්වා ගත යුතුය " කියා. නමුත් එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ මහා ලේකම් ඌතාන් මහත්මය ලංකාවට ආ පසුව නම් අගමැතිතුමා එක්තරා ප්‍රකාශයක් කළා. " වියට්නාමයට බෝම්බ දැමීම නතර කළ යුතුය " කියා. නමුත් කැනඩාවට, කයිරෝවට ගිය අවස්ථාවෙදි එහෙමවත් ප්‍රකාශ කළේ නැහැ. ආපසු එන ගමන්—වියට්නාමයට ළඟ තිසාදෝ—සිංගප්පූරුවෙදිත් එවැනි ප්‍රකාශයක් කළා. නමුත් මේ රාජාසන කථාවේ ඒකවත් නැහැ. වියට්නාමය ආසියාතික රටක්. අද වියට්නාමයට වදින පහර සමහර විට හෙට අපට වදින්නට පුළුවන්.

මට මතක් වෙනවා, ජර්මනියෙ එක්තරා මහාචාර්යවරයෙක් කර තිබෙන ප්‍රකාශයක්. මොකක්ද එතුමා කිව්වේ? " මම ජර්මන්කාරයෙක්. නට්සිවරයෙක්. කම්කරුවන්ට විරුද්ධව නොයෙක් විධියේ වධ හිංසා කරන විට මම කට පියාගෙන හිටිය ; කථා කළේ නැහැ. යුදෙව්වන්ට විරුද්ධව යුද්ධ ආරම්භ කරන විට මම කට පියාගෙන හිටිය ; කථා කළේ නැහැ. ඇයි? මම කම්කරුවෙකුත් නොවෙයි ; යුදෙව්වෙකුත් නොවෙයි. ඇතැම් දේශපාලන පක්ෂවලට විරුද්ධව සටන් අරඹන විට ඒත් මම කට පියාගෙන හිටිය. ඇයි? මම ඒ දේශපාලන පක්ෂවලට අයිති නැහැ. අද මහාචාර්යවරුන්ට විරුද්ධව නට්සිවරුන් ක්‍රියා කරනවා. අද මම තනිව හිර ගෙයි සිටිනවා. මා වෙනුවෙන් කථා කරන්ට කවුරුවත් නැහැ."

අන්න ඒක අපට හොඳ පාඩමක්. අපේ මිත්‍රයකුට, අප වැනි කෙනෙකුට පහර වදිනව නම් අපටත් කවදා හෝ ඒ පහර වදින බව අපි දැනගන්නට ඕනෑ. එම නිසා වියට්නාමයට අද ගහන පහරට අපි විරුද්ධව කථා නොකළොත්, ඉරාකයට, එක්සත් අරාබි ජන රජයට විරුද්ධව ගහන පහරට අපි විරුද්ධ නොවුණොත්, තමුන්නාන්සේලාට අද මිත්‍රයන් හැටියට නොයෙක් විධියේ මවාපෑම් කර සනසන්ට උත්සාහ කරන අධිරාජ්‍යවාදීන් අපට ගහන දවස ළඟින්ම එනවට කිසි සැකයක් නැහැ. එම නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රාජාසන කථාවෙන් සාමාන්‍ය ජනතාවට, ජාති මමත්ත්වයක් ඇති ජනතාවට, පීඩිත ජනතාවට සැනසෙන්නට කිසිම මඟක් නැහැ. එම නිසා මේ ආණ්ඩුව කෙරෙහි සම්පූර්ණයෙන් අපේ අප්‍රසාදය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පළ කරන අතර මේ ආණ්ඩුව ඉක්මණින් අහෝසි වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසාන කරනව.

අ. භා. 6

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The hon. Member for Akmeemana. will speak next.

The Hon. Deputy Chairman of Committees will now take the Chair.

**අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන් කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා [ශ්‍රීමත් රසික් fපරිඩ්, ඕ.බී.ඊ] මූලාසනාරූඪ විය.**

*அதன் பிறகு, உப சபாநாயகர் அவர்கள் அக்கிரா சனத்தினின்று நீங்கவே, குழுக்களின் உப அக்கிராசனர் [ஸ்ரீமான் ருசிக் பரீத், ஒ.பி.ஈ.] அக்கிராசனத்தமர்ந்தார்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [SIR RAZIK FAREED, O.B.E.] *took the Chair.*

**සුගතදාස අරඹවල මයා.** (අක්මීමන)
*(திரு. சுகததாச அரம்பவல—அக்மீமன)*
(Mr. Sugathadasa Arambewala—Akmeemana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජාතික ආණ්ඩුවේ තුන් වෙනි රාජාසන කථාව පිළිබඳව මගේ අදහස්ද ඉතාම කොටින් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේට මගේ කෘතඥතාව පළමු කොට පුද කරනව. මගේ කථාවට පළමු අද දින මේ විවාදයට සම්බන්ධ වුණු විරුඬ පාර්ශ්වයේ උගත් ගරු මන්ත්‍රීන් හතර දෙනකුගේ කථාවලට අපට සවන් දෙන්ට සිද්ධ වුණා. ඒ කථාවලට ඇහුම්කන් දීමේ දී මට සිත් වුණා, ඒ ගරු මන්ත්‍රීවරුන්ට තමන්ගේ ඈත අතීතය නොව මෑත අතීතය පවා අමතක වී තිබුණු බව. මීට අවුරුදු කිපයකට උඩ දී, එනම්, 1956 සිට 1965 දක්වා, අවුරුදු 9 ක කාලය තුළ මේ රටට මුහුණ පාන්නට සිදුවූ විපත් ගැන අපි දන්නව. ජාතීන් අතර භේද ඇති වුණා. ජාතීන් අතර කෝලාහල ඇති වුණා. භාෂාවන් කථා කරන අය අතර භේද ඇති වුණා. ආගම් අදහන්නවුන් අතර භේද ඇති වුණා. ඒ දුර්භාග්‍ය සමයේ මේ රටේ සිංහල තරුණයන් දහස් ගණනක් ජාතිවාද කෝලාහල නිසා මරුමුවට පත් වුණු බව මේ ගරු මන්ත්‍රීවරුන්ට අමතක වී තිබෙනව. ඒ වගේම මේ රටේ ජාතිහිතෛෂීන් හැටියට ක්‍රියා කළ කීප දෙනකු අකාල මරණවලට ගොදුරු වුණා. ගන්දර ආර්ලිස් සිල්වා, බෙන්තර ඩේවිඩ් සිල්වා ආදී මහත්වරුන් ඒ අයගෙන් දෙදෙනෙක්. මට ආරංචියක් ලැබී තිබෙනව, ගන්දර ආර්ලිස් සිල්වා මහතාගේ මරණයට සහභාගි වුණු පොලිස් පරීක්ෂක මහත්මයෙකුට දැනටත් රෑට නිදා ගන්ට බැරිය කියා. නින්ද යාගෙන එන කොට හීනෙන් ආර්ලිස් මහතා ඇවිත් ඒ පොලිස් පරීක්ෂකගේ බෙල්ල මිරිකනවලු. එවිට ඇහැරුණාම නැවත නින්ද යන්නෙ නැතිලු. මේ විධියේ ආපදාවන්ට මුහුණ පෑ කාලයක් තිබුණු බව අපට සිහිපත් වන්ට ඕනෑ.

එවැනි විනාශදායක පරිච්ඡේදයක් ගත කළාට පස්සෙ අපේ පක්ෂයේ නායකතුමා රටේ ජාතීන් අතර සමගිය ඇතිවන විධියට, නොයෙක් භාෂාවන් කථා කරන අය අතර සමගිය ඇතිවන විධියට, නොයෙක් ආගම් අදහන අය අතර සමගිය ඇතිවන විධියට ප්‍රතිපත්ති මාලාවක් සකස් කර මහජනයා ඉදිරියේ තැබුව. මහජනයා එතුමාගේ ප්‍රතිපත්ති පිළිගැනීම නිසා එතුමාට පුළුවන් වුණා ආණ්ඩුවක් පිහිටුවන්න. එදා ජනතාව එතුමා කෙරෙහි තැබූ විශ්වාසය, අදත් අඩු නැතිව පවතින බව පෙනී යනව.

පසුගිය අතුරු මැතිවරණවලදී ආණ්ඩු පක්ෂයේ අපේක්ෂකයින්ට ලැබුණු ඡන්ද සංඛ්‍යාව අනුව කල්පනා කර බලන විට—මීගමුවේ අතුරු මැතිවරණ ප්‍රතිඵල ගැන කල්පනා කර බලන විට—මේ ආණ්ඩුව කෙරෙහි මේ රටේ ජනතාව තුළ කළකිරීමක් නැති බව පෙනී යනවා ඇති.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்காரத்ன)*
(Mr. Ilangaratne)

පහළොස් දාස් ගණනක වැඩි ඡන්ද සංඛ්‍යාව හත්දාස් ගණනකට බැස්සෙ මොන කාරණයක් නිසාද ?

**සුගතදාස අරඹවල මයා.**
*(திரு. சுகததாச அரம்பவல)*
(Mr. Sugathadasa Arambewala)

අගලවත්ත අතුරු මැතිවරණයේදීත් පැහැදිලි ලෙස පෙනී ගියා, මේ රටේ ජනතාව තුළ මේ ආණ්ඩුව කෙරෙහි කළකිරී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුගතදාස අරඹවල මයා.]

මක් නැති බව. මේ ආණ්ඩුව ගෙන යන ව්‍යාපාරවලට මේ රටේ ජනතාව දෙන සහයෝගය තවමත් අඩුවක් නැතිව ලැබෙන බව පැහැදිලි ලෙස පෙනී යනව.

ජීවන වියදම දවසින් දවස වැඩි වන බවක් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලා කළ කථාවලින්—විවේචනවලින්—පෙනී ගියා. ආහාර ද්‍රව්‍යවල හිඟයක් පවතින බවත් එතුමන්ලාගේ විවේචනවලින් කියැවුණා. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීන් එතුමන්ලාගේ අතීතය ගැනත් ටිකක් මෙනෙහි කර බලනවා නම් නියම තත්ත්වය එතුමන්ලට මතක් වනු ඇතැයි මා කල්පනා කරනව. පාරිභෝගික ද්‍රව්‍ය සම්බන්ධයෙන් එදා තිබුණු තත්ත්වය කුමක්දැයි එතකොට එතුමන්ලට තේරුම් යාවි. එදා බයිසිකල් ටයර් තිබුණේ නැහැ. එහෙත් අද බයිසිකල් ටයර් තිබෙනව. එදා ටෝච් බැටරි තිබුණේ නැහැ. එහෙත් අද ටෝච් බැටරි තිබෙනව. එදා ගොවි ජනතාවට උදලු තල තිබුණේ නැහැ. අද ඒවා තිබෙනව. එදා පාරිභෝගික ද්‍රව්‍ය ලබා ගැනීමට සිදු වුණේ විශාල මුදලක් ගෙවලයි. අද එහෙම නොවෙයි.

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) කළ කථාවේදී එතුමගෙ ප්‍රදේශයේ හාල් හිඟයක් පවතින බව කිව්වා. හාල් සේරුවක් රුපියල් 1.45 බැගින් ඒ ප්‍රදේශයේ විකිණෙන බව එතුමා ප්‍රකාශ කළා. ගාලු නගරයේ කැකුළු හාල් ඕනෑ ප්‍රමාණයක් ලබා ගැනීමට තිබෙන බව මම එතුමට මතක් කර දෙන්න කැමතියි. හාල් මිටියක් රුපියල් 70 ක් බැගින් ගන්න පුළුවන් බව මතක් කරන්න කැමතියි. තමන් නියෝජනය කරන ප්‍රදේශයේ ජනතාවට හාල් සපයන්න කැමති නම් ලොරි ගණනක් වුණත් අරගෙන ආවොත් ලොරි පිරෙන්න කැකුළු හාල් සපයා දෙන්න පුළුවනි. ගාල්ලේ හාල් ලැබෙට තිබෙනව.

**ටී. බී. එම්. හේරත් මයා.** (වලපනේ)

*(திரு. ரீ. பி. எம். ஹேரத்—வலப்பனே)*

(Mr. T. B. M. Herath—Walapane)

දූන් ඒවා ගැන මොකද කියන්නෙ ?

**සුගතදාස අරඹවල මයා.**

*(திரு. சுகததாச அரம்பவல)*

(Mr. Sugathadasa Arambewala)

දූන් ඒවා ගැන කියන්න ගියොත් කාලය හුඟක් ගත වේවි. ඒ නිසා ඒවා ගැන කියන්න දැන් වුවමනා කරන්නෙ නැහැ.

අපේ ආණ්ඩුව බලයට පත් වුණේ නිකම්ම නොවෙයි. ඉතාමත් පැහැදිලි ප්‍රතිපත්ති මාලාවක් රටට ඉදිරිපත් කිරීමෙන් පසු ඒ ප්‍රතිපත්ති මාලාව ජනතාව පිළිගත් නිසයි අපේ ආණ්ඩුවට බලයට පත් වෙන්න පුළුවන් වුණේ. අප දෙගොල්ලම කියන කතාවල් අහන්න ජනතාව සූදානමින් ඉන්නව. අප කියන දේට ඇහුම්කන් දෙන්න ජනතාව බලාගෙන ඉන්නව. ඒ නිසා අප දෙගොල්ල එකිනෙකා කෙරෙහි ද්වේෂ වන්නට වුවමනා නැහැ. අපේ ක්‍රියාවන් ගැන විනිශ්චයක් දීමට ඉන්නෙ ඡන්ද දායකයින් බව අප පිළිගන්න ඕනෑ. බොරු කියන්නෝ කවුරුද, ඇත්ත කියන්නෝ කවුරුදැයි ජනතාවට තේරුම් ගන්න පුළුවනි. නියම කාලය එන විට ඒ සම්බන්ධයෙන් මහජනයා පැහැදිලි තීරණයක් දීමට ඉදිරිපත් වෙනවා ඇති. අපේ ආණ්ඩුව පුළුවන් තරම් උත්සාහ කර අපේ වැඩ කොටස කරනවා ඇති. අපේ ආණ්ඩුව පිහිටුවනු ලැබූ අවස්ථාවේ මේ රටේ තිබුණු තත්ත්වය කුමක්දැයි නියම අන්දමට විස්තර කිරීමට ගියොත් ඒ සඳහා පැය කිහිපයක් වුවමනා කරනවා. අප කවුරුත් මහජනයා ඉදිරියේ පෙනී සිටිය යුත්තන් නිසා ඒ ගැන කථා කරමින් කාලය මිඩංගු කරන්න වුවමනා කරන්නෙ නැහැ. රට අන්තයට පිරිහී ගොස් තිබුණු වෙලාවක, රට භාෂා භේදය උඩ බෙදී තිබුණු වෙලාවක, ආගම් අදහන්නන් අතර සමගියක් නැතිව තිබුණු වෙලාවක පිහිටුවනු ලැබූ අපේ ආණ්ඩුව එතැන් පටන් හැම කොටසක් අතරම සමගිය වර්ධනය කිරීමට කටයුතු කර තිබෙනව. රට වැටී තිබුණු තත්ත්වයෙන් නංවා සිටුවීමට ආණ්ඩු පක්ෂයේ සිටින සියලුම ගරු මන්ත්‍රීවරුන් එකා මෙන් ඉදිරියට ගමන් කොට කටයුතු කරන බවට සැකයක් නැහැ. ඒවා විරුඩ පාර්ශ්වයේ තමුන්නාන්සෙලාගේ ඇස්වලට ගහන කටු වගේ දැනෙනවා වෙන්න ඇති. එය අපට පැහැදිලියි. බලය ඉල්ලා මහජනයා වෙත ගිය අවස්ථාවේදී යම්කිසි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රතිපත්ති මාලාවක් මහජනයා ඉදිරියේ තැබුවාද ඒ ප්‍රතිපත්ති අනුව ඉදිරියට මේ රටේ වැඩ කටයුතු කරගෙන යාමටයි ආණ්ඩුවේ බලාපොරොත්තුව. අපේ මේ ප්‍රතිපත්ති, විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සෙලා කිසිම හරයක් නැති පුස්සක් හැටියට ඔප්පු කිරීමට කොයි තරම් තර්ක විතර්ක ගෙන ආවත් එය නිෂ්ඵල කාර්යයක් වනු ඇතැයි මා තරයේ විශ්වාස කරනව.

මේ රාජාසන කථාවේ සඳහන් කර තිබෙන කරුණු අපේ ප්‍රතිපත්ති මාලාවට අනුවයි සකස් කර තිබෙන්නෙ. කෘෂිකාර්මික කටයුතු සංවර්ධන කිරීමත්, ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමත්, කර්මාන්ත සංවර්ධනය කිරීමත්, වෙනත් නොයෙක් කරුණුත් අනුව රටේ ආර්ථික තත්ත්වය නගා සිටුවීමට උත්සාහ කරන අතර රටේ ජනතාවගේ අභ්‍යන්තර ශීලාචාරකම, ආගම් ඇදහීමේ නිදහස ආදිය පුළුල් ලෙස දියුණු කිරීම ආදි වැදගත් කරුණු රාශියක් කිරීමේ චේතනාවෙන් මේ රාජාසන කථාව පිළියෙල කර තිබෙන බව ඕනෑම කෙනකුට මෙය කියවන විට පැහැදිලි වෙනවා ඇතැයි මා කල්පනා කරනව.

මෙහිදී තවත් එක් කරුණක් සඳහන් කරන්නට කැමතියි. තමන් පාවිච්චි කරන කණ්නාඩිය අනුවයි යම් යම් දේවල් පෙනෙන්නෙ. යම් කෙනෙක් නිල් කණ්නාඩියක් දමා ගෙන බැලුවොත් නිල් පාටටයි පෙනෙන්නෙ. ඒ වගේම රතු කණ්නාඩියක් දමාගෙන බැලුවොත් රතු පාටටයි පෙනෙන්නෙ. හැම දෙයක්ම පෙනෙන්නෙ තමන් පාවිච්චි කරන කණ්නාඩියෙ පාටටයි. ඒ කෙසේ වෙතත් ඥානවන්ත ලෙස බැලුවොත් මොන කරුණක් නිසා එසේ වෙනස් පාටකින් පෙනෙනවාදැයි තේරුම් යනවා ඇති. රාජාසන කථාව හොඳින් කියවන විට එහි අඩංගු හැම කාරණයක්ම හරියාකාර නොපෙනෙන්නට හේතුවක් නැහැ. මගේ අදහස එයයි.

බෞද්ධාගමට තැනක් දී නැතැයි ඇතැම් ගරු මන්ත්‍රීතුමන්ලා කියනවා. බුද්ධාගමට මේ ආණ්ඩුව තරම් තැනක් දුන් තවත් ආණ්ඩුවක් ඇතැයි මා නම් කල්පනා කරන්නෙ නැහැ. එවැනි ආණ්ඩුවක් මෙතෙක් ඇති වී නැහැ. මේ රටේ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලාටත් මහා සංඝ රත්නයටත් නිල නිවාසයක් පරිත්‍යාග කෙළේ මේ ආණ්ඩුවයි. ලංකාවේ තිබෙන ප්‍රධාන සංඝ පාර්ශ්ව දෙකේ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලාට මොටර් රථය බැගින් මේ ආණ්ඩුව පරිත්‍යාග කර තිබෙනව. ඉස්සර තිබුණු ආණ්ඩු වලින් බුද්ධාගම ගැන කළ දේ කියන්න පුළුවන්ද ?

**ටී. බී. එම්. හේරත් මයා.**
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)
වෙඩි තිබ්බෙ නැහැ.

**සුගතදාස අරඹවල මයා.**
(திரு. சுகததாச அரம்பவல)
(Mr. Sugathadasa Arambewala)
වෙඩි තැබීම් ගැන සඳහන් කිරීම විලි ලැජ්ජා සහගතයි. කහපාට රෙදි කෑලිවල කුකුළු සායම් ගාලා පාට කරලා බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයේ ජනතාවට පෙන්වා ඒ ජනතාව රැවටීමට කටයුතු කළ බව අපි දන්නව. ඒ විධියේ වැඩ කරන්න අපි සූදානම් නැහැ, කවදාවත්.

**ටී. බී. එම්. හේරත් මයා.**
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)
හාමුදුරුවරුන් මැරුවෙ නැද්ද ?

**සුගතදාස අරඹවල මයා.**
(திரு. சுகததாச அரம்பவல)
(Mr. Sugathadasa Arambewala)
ඒ කාලේ හාමුරුදුවරුන්ගේ ඔළු පැලූ හැටි, ගෝල්පේස් පිටියේ සෙරෙප්පු පවා දමා යන්නට සිදු වූ හැටි අපට අතමක නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)
වෙඩි තිබ්බද ?

**සුගතදාස අරඹවල මයා.**
(திரு. சுகததாச அரம்பவல)
(Mr. Sugathadasa Arambewala)
වෙඩි වදින්න ඇති, සමහර විට.

මේ රාජාසන කථාවේ අඩංගු දේවල් අතර සාහිත්‍ය කලා ශිල්ප දියුණු කිරීමට කටයුතු කරන බව සඳහන් වෙනව. ගොවි තැන දියුණු කිරීමට කටයුතු කරන බව සඳහන් වෙනව. වාරිමාර්ග දියුණු කිරීමට කටයුතු කරන බව සඳහන් වෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුගතදාස අරඹවල මයා.]
කර්මාන්ත දියුණු කරන බව සඳහන් වෙනව. ජීවන වියදම බැහැලා නැතැයි සඳහන් කරන විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සෙලා මේ රටේ අස්වැන්න සුලභ වන විට පාරිභෝගිකයන්ට අවශ්‍ය ද්‍රව්‍ය සුලභ වන විට ජීවන වියදම පහළ බහින බව තේරුම් ගන්න ඕනෑ. ද්‍රව්‍ය හිඟ වන විට මිල වැඩි වෙනව. ඒ වගේම ද්‍රව්‍ය සුලභ වන විට මිල අඩු නෙව.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගණ පූරණයක් නැහැ.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති බව පෙනී ගියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

**පසුව ගණපූරණයක් තුබූයෙන්—**

*சபை கணக்கிடப்பட்டு நிறைவெண் இல்லையென்று கண்டதனால் பிரிவு மணி அடிக்கப்படவேண்டுமெனு ஆணையிடப்பட்டது.*

*பிறகு, நிறைவெண் இருந்ததனால்—*

*House counted and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**සුගතදාස අරඹවල මයා.**
*(திரு. சுகததாச அரம்பவல)*
(Mr. Sugathadasa Arambewala)
රාජාසන කථාවලින් දෙන පොරොන්දු මා සිතන්නෙ අපේ ආණ්ඩුව පමණක් නොවෙයි කොයිම ආණ්ඩුවක්වත් සියයට සියයක්ම කවදාවත් ඉෂ්ට කර නැහැ. සුළු සුළු දේවල් නොකර හරින්ට පුළුවන්. නමුත් ඉදිරි වර්‍ෂවලදී ඒවා කරනවා ඇති. තමුන්නාන්සේලාගේ කාලයේදී ඉදිරිපත් කළ රාජාසන කථාවලින් දී තිබෙන පොරොන්දු සියල්ලම ඉෂ්ට කර තිබෙනවාද කියා මා ප්‍රශ්න කරන්ට සතුටුයි. කියන කොට එහෙමයි, කරන කොට මෙහෙමයි කියා අප අතර කථාවක් තිබෙනව. හැම දෙනාගෙම සිරිත ටිකක් වැඩියෙන් කියා ටිකක් අඩුවෙන් කිරීමයි. අපේ ආණ්ඩුව කියන දේවලින් ඉතාම සුළු ප්‍රමාණයයි නොකර හරින්නෙ. නමුත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පැවති කාලයේදී තමුන්නාන්සේලා හුඟක් කියා ඉතාම ටිකක් කර තිබෙනව.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඒ ටිකෙන් තමයි තමුන්නාන්සෙල ජීවත් වෙන්නෙ.

**සුගතදාස අරඹවල මයා.**
*(திரு. சுகததாச அரம்பவல)*
(Mr. Sugathadasa Arambewala)
අපි ඒව සාර්ථක කළ නිසයි තමුන්නාන්සෙලාට අද ඔහොම කථා කරන්ට පුළුවන්කම තිබෙන්නෙ.

තමුන්නාන්සෙල සංයුක්ත මණ්ඩල ඇති කර තිබෙනව. නොයෙක් නොයෙක් කම්ාන්ත ඇති කර තිබෙනව. අපි ඒව නැත කියන්නෙ නැහැ. නමුත් ඒ සංයුක්ත මණ්ඩල හා කම්ාන්තවලින් සියයට 90 කට වඩා ගෙන ගියෙ අලාභයටයි. අපේ ගරු ඇමතිවරුන් දැන් ඒව ප්‍රතිසංවිධානය කර තිබෙනව. එම නිසා දැන් ඒ සංයුක්ත මණ්ඩලවලින් හා කම්ාන්තවලින් ලාභ ලැබෙන බව තමුන්නාන්සේලා පිළිගන්නවා ඇති. අද ඉතාම සාර්ථක අන්දමින් ඒ කටයුතු කෙරී ගෙන යනවා.

**හේමචන්ද්‍ර සිරිසේන මයා. (අකුරණ පළමුවන මන්ත්‍රී)**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)*
(Mr. Hemachandra Sirisena—First Akurana)
ලාභ ලැයිස්තු කියෙව්ව නොවැ දැන් කොලොන්නාවෙ ගරු මන්ත්‍රීතුමා.

**සුගතදාස අරඹවල මයා.**
*(திரு. சுகததாச அரம்பவல)*
(Mr. Sugathadasa Arambewala)
මේ රටෙන් විදේශවලට යවන ද්‍රව්‍යවල මිළ පහත බැස තිබුණු කාලෙදී ලැබුණු ලැයිස්තුවක් කොලොන්නාවෙ ගරු මන්ත්‍රීතුමාට ලැබී තිබෙන්නෙ.

මේ රටේ ප්‍රශ්නවලට වඩා ජාත්‍යන්තර ප්‍රශ්න ගැන කථා කරමින් කාලය ගෙවන්නට තමුන්නාන්සේලා නිතරම වෑයම් කරනව. නොයෙකුත් දුෂ්කරතාවයන්ට මුහුණ පාන දහස් සංඛ්‍යාත ජනකායක් මේ රටේ ඉන්නව. එම නිසා තමුන්නාන්සේලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගේත් අපේත් පරම යුතුකම මුලින් අපේ රටේ ජනතාවගේ ප්‍රශ්න ගැන සිතීමයි. තමුන්නාන්සේලාත් අපිත් ජනතාවගේ ඡන්දයෙන් මේ ගරු සභාවට ආවෙ ජනතාව නගා සිටුවීමේ පොරොන්දුව උඩයි. එම නිසා ආණ්ඩුව හොඳ වැඩක් කරන විට ඒ හොඳ වැඩේට ධෛර්යදීමට විරුද්ධ පක්ෂයට යුතුකමක් තිබෙනව. විරුද්ධ පක්ෂයට විවේචනය කිරීමේ අයිතිය තිබෙන බව අපි ඉතාම හොඳින් දන්නව. නමුත් මේ ආණ්ඩුව කරන හැම දෙයක්ම නරක දේවල් හැටියට ජනතාවට පෙන්වීමට තමුන්නාන්සේලා කොපමණ වැයම් කළත් එය සාර්ථක නොවන බව මා කිය නවා. මේ රටේ ජනතාව අද එදාට වඩා ඥානාන්විතයි.

අවසාන වශයෙන් ජාත්‍යන්තර ප්‍රශ්න වලට වඩා මේ රටේ ප්‍රශ්නවලට මුල් තැන දෙමින් ජාතියේ ඉදිරි ගමනට මුල් තැන දෙමින් අපේ දුක් විඳින ජනතාව සුවපත් කිරීමේ චේතනාව ඇති කරගෙන අප දෙ දෙපක්ෂයේම සහයෝගයෙන් මේ රටේ ජනතාව නගා සිටුවීමට වැඩ කරන්ට එකඟ වන මෙන් ඉල්ලීමක් කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

අ. භා. 6.20

**ප්‍රින්ස් ගුණසේකර මයා.** (හබරාදුව)
*(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபறாதுவ)*
(Mr. Prins Gunasekera—Habaraduwa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විරුද්ධ පක්ෂය ඉදිරිපත් කර ඇති සංශෝධන හතර ගැනයි අද මේ විවාදය කෙරෙන්නෙ. නමුත් මේකට විවාදයක්ය කියන්ට පුළුවන්ද කියා මා තුළ සැකයක් තිබෙනව. ඇඟ බේර ගන්න ඕනෑ කමට ආණ්ඩු පක්ෂයෙ පසුපස මන්ත්‍රීවරයකු ලවා මිනිත්තු දහයක දොළහක කථාවක් කෙරෙව්ව. ඇත්ත වශයෙන්ම මේක රාජාසන කථා විවාදයක් වශයෙන් හඳුන්වන්නට පුළුවන්ද? මේ ඉදිරිපත් කර තිබෙන රාජාසන කථාව නොයෙක් අංශවලින් සියුම් ලෙස විග්‍රහ කර විරුද්ධ පක්ෂය සංශෝධන මාලා හතරක් ඉදිරිපත් කර තිබෙනව. ඒ සංශෝධන හතර දීර්ඝ ලෙස විග්‍රහ කරමින් මේ දක්වා කථා තුනක් පවත්වන්නට යෙදුණා. මෙම ආණ්ඩුවේ ආර්ථික දුර්වලතාවයන් සංස්කෘතික හා වෙනත් නොපනත්කම්, දේශපාලන බංකොලොත් භාවයන්, එමෙන්ම මෙම ආණ්ඩුව මේ රටේ මහජනයාට කර තිබෙන වෙනස්කම්, මේ රටේ මහජනයාට කරතිබෙන නොයෙකුත් හිරිහැර කර දර යනාදී නොයෙකුත් දේ අලලා විරුද්ධ පාර්ශ්වයේ ප්‍රබල වාදක මන්ත්‍රීවරුන් හතරපොලක් විසින් දන් කතා පවත්වා හමාරයි. ඒ කතාවලට ආණ්ඩු පක්ෂයෙන් ලැබුණු පිළිතුර වූයේ මිනිත්තු 10 ක් නැති නම් 12 ක් කථා කිරීම පමණයි. මේක හරි යට ආණ්ඩුවට වැළඳී තිබෙන දේශපාලන අතිසාරයට අක්මිමනින් අමුඩයක් ගැසුවා වැනි දෙයක්.

ආණ්ඩු පක්ෂයෙ ඉදිරි පෙළේ සිටින්නෙ එකම එක ඇමතිතුමායි. ඒ ඇමතිතුමත් තමන්ගෙ ආණ්ඩුව ගැන මෙතෙක් වේලා අපි කීවේ මොනවාදැයි කියාවත් දන්නෙ නැතුව ඇති. එතුම ආවෙ දැනුයි. [බාධා කිරීමක්] මොකක්ද කීවෙ?

**ඩී. පී. අතපත්තු මයා.** (රාජ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
*(திரு. டீ. பீ. அத்தபத்து—இராஜாங்க அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. D. P. Atapattu—Parliamentary Secretary to the Minister of State)

කියන්න, කියන්න. තමුන්නාන්සෙ එක්ක කතා කරන්ට ගියොත් කරදරයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මොනව හරි හරයක් ඇති දෙයක් කිය නව නම් කමක් නැහැ. එක පැත්තකින් අනික් පැත්තට වක් කරනව, වක් කර නව, කිසිම තේරුමක් නැහැ, හරියට බීරි අලින්ට වීනා ගායනා කරන්නා වාගෙයි.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

එහෙනම් නවත්වන්න.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

රාජ්‍ය කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙ පාර්ලිමේන්තු ලේකම්තුමා කියනව, නවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

වන්නය කියා. මේකද පාර්ලිමේන්තු සම්ප්‍රදාය ? රාජාසන කථාවෙදි කියා තිබෙන ජන සම්මතවාදය මේකද ? විරුද්ධ පාර්ශ්වයෙ විවේචනවලට ඇහුම්කන් දෙන්ට ගරු ඇමතිවරුන්වත් මන්ත්‍රීවරුන් වත් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

මේ කතාව කියවන්න එදා කොච්චර වියදම් කළාද ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ජන සම්මතවාදයක් ගැන කතා කරමින් මේ පාර්ලිමේන්තුව ඇතුළතදීත් ක්‍රියා කරන්නෙ මෙසේ නම්, තමුන්නාන් සෙලාගෙ දේශපාලන අවංකභාවය ගැන රටේ මහජනයා තුළ සාධාරණ සැකයක් ඇති වෙන එක පුදුමයක්ද ?

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

ඉස්සත් කියල තියෙනව ඕක.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඉස්ස විතරක් නොවෙයි, කකුළුවත්. තමුන්නාන්සෙ දන් දේශපාලන කකුළු අණ්ඩකට අසු වී සිටින පොඩි මැඩියෙක් වගෙයි. ඒ වගේම මහජනයා නමැති කකුළුවන්ගේ අඬුවලට අසු වී සිටින තමුන්නාන්සේලාගේ බෙලි දේශපාලන වශයෙන් කැපි යන්නෙ කොයි වෙලේද දන්නෙ නැහැ.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

අනිච්ඡාවත සංඛාරා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අපි බලාගෙන සිටිනව තමුන්නාන්සෙලට දේශපාලන වශයෙන් අනිච්ඡාවත සංඛාරා කියන්න.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

ඕක කාටත් වෙන දෙයක් ළමයා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අපි දන්නව, කාටත් වෙන දේ තමුන් නාන්සෙලටත් ළඟදිම වෙන්න තියෙන නිසා මේ විධියට හැසිරෙන බව.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

එහෙම හිතා ගන්න.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

සහල් නොමිලයේ දෙන්ටය කියා හදිසියෙම නීති පනවාගෙන මාස කීයක් ගත වුණාද ? මෙම නීතිය ප්‍රයෝජනයට ගන්නෙ ඇත්ත වශයෙන්ම මහජනයාට නොමිලයෙ හාල් සේරුවක් දෙන්නද ? නැති නම් වෙනත් දේශපාලන පල ප්‍රයෝජනයක් ලබා ගන්නද ?

නිකමටවත් වචනයක් කියා හරස් කපන්ට සිටි රාජ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමත් යනව. "ලිප ගිනි මොළවන තෙක් දිය සැළියේ" යනුවෙන් කකුළුවට කියපු කවිය මට සිහි වුණා. අපේ විවාදය ටිකක්වත් පණගන්වන්ට සිටි එතුම නැගිට ගියා. [බාධා කිරීමක්] එතුමා ආපසු පැමිණුනා. බොහොම හොඳයි. වාඩි වෙලා අසාගෙන ඉන්න.

තමුන්නාන්සෙලාගෙ හත් හවුල් ආණ්ඩුවෙ දෙවන වර්ෂය අවසාන වී තෙවන වර්ෂයටයි දැන් පා තබා තිබෙන්නෙ. මේ රටේ අග්‍රාණ්ඩුකාරතුමා ලවා "මාගේ ආණ්ඩුව" යනුවෙන් සඳහන් කරවමින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියවන ලද එම රාජාසන කතාව අසා සිටි මට ඇති වුණා එක් හැඟීමක්. එනිසා මා ළඟ වාඩි වී සිටි ගරු මන්ත්‍රීතුමෙකු ගෙන් එදා මා ප්‍රශ්න කළා, අපේ ගරු අගමැතිතුමාට වැරදීමක් නිසාද, මුදල් ඇමතිතුමා විසින් කියවියයුතු කතාවක් අග්‍රාණ්ඩුකාරතුමාට දීල තියෙන්නෙ කියා. "මාගේ ආණ්ඩුව" යනුවෙන් මෙම කතාවෙ හැම කොටසකම වාගෙ සඳහන් වෙතත් මාගේ ආණ්ඩුවෙ අළුත් ප්‍රතිපත්ති ගැන එම කතාවෙ කොතැනක වත් සඳහන් වෙලා නැහැ.

රාජාසන කථාවක් හැටියට වැඩිපුරම මේ කථාවෙ ඇතුළත් වී තිබෙන්නෙ "මගේ ආණ්ඩුවෙ" දේවල් නොවෙයි. "මගේ ආණ්ඩුවෙ" දෙපාර්තමේන්තු විසින් කළ දේවලුයි, කරන්න අදහස් කරන දේවලුයි. එහෙත් රාජාසන කථාව කට අඩංගු විය යුත්තෙ ආණ්ඩුවෙ දෙපාර්තමේන්තු කළ දේවල්වත්, ආණ්ඩුවෙ දෙපාර්තමේන්තු කරන්න අදහස් කරන දේවල්වත් නොවෙයි. දැන් ඩිංගකට කලින් රාජ්‍ය උප ඇමතිතුමා ඔළුව වනන විට මම කිව්ව පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව රාජාසන කථාවක ඇතුළත් විය යුත්තෙ ආණ්ඩුවෙ දෙපාර්තමේන්තු කළ දේවල්වත්, කරන්න යන දේවල් වත් නොවේය කියා. අලුත් ප්‍රතිපත්ති වශයෙන් මේ රජය ඉදිරි දොළොස් මාසය ඇතුළත යම් යම් දේවල් කරනවාය, යම් යම් පියවරවල් ගන්නවාය කියන එකයි රාජාසන කථාවකින් මූලික වශයෙන් මහජනතාවටත් රටටත් පැහැදිලි කළ යුත්තෙ. ඒ වෙනුවට මේ ආණ්ඩුව විසින් ඉදිරිපත් කර ඇති මේ රාජාසන කථාව එහෙමපිටින්ම හිස් හට්ටියක්. කිසිම දෙයක් නැහැ.

මගේ කථාවෙදි මම වැඩිපුරම සඳහන් කරන්න බලාපොරොත්තු වන්නෙ, මගේ විවේචනය සීමා කරන්න බලාපොරොත්තු වන්නෙ, විරුද්ධ පක්ෂය විසින් ඉදිරිපත් කර තිබෙන 4 වෙනි අතුරු යෝජනාව ගැනයි. ඒ අතුරු යෝජනාව මෙසේයි :

"එතෙකුදු වුවත් ලකිසුරුතුමනි,

ඉටු නොකළ පැරණි පොරොන්දු රාශියක් ගැන යළිත් සඳහන් කරමින් තෙවෙනි වරටත් ඔබ වහන්සේ ලවා කියවූ මෙවර රාජාසන කථාව, පුනරුත් දොසින් පිරුණු බැවින් ද;—"

මේ එක හේතුවක්. විරුද්ධ පක්ෂයේත් රටවැසියාගේත් අප්‍රසාදය මේ රජය කෙරෙහි පළකිරීමට හේතුවූ එක් කාරණයක් ඒකයි. පුනරුත් දෝසය කියන්නෙ යළි යළිත්, නැවත නැවතත් එකම දේ කීමයි. පසු ගිය අවුරුද්දෙ කී දේම මේ අවුරුද්දෙත් කියනව. පසු ගිය අවුරුද්දට කලින් අවුරුද්දෙ කී දේ පසු ගිය අවුරුද්දෙ කියා තිබෙනව. මේ වර රාජාසන කථාව 1965හේ කථාවත් සමග සසඳා බැලුවොත් මේ කථාවෙන් තුනෙන් දෙකක් පමණ 1965 කථාවෙ තිබෙනව. මේ 1967 කථාවෙ හතරෙන් තුනක් පමණ 1966 කථාවෙ තිබෙනව.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

හරියට ගණන් බලන්න.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මම කියන්නෙ ගණන් බලලයි. මාතර මන්ත්‍රීතුමා කථා කර වාඩි වුණාට පස්සෙ මම එතුමාට කිව්වා, මේ අලුත් රාජාසන කථාව දෙස බලාගෙන ඉන්නය, පරණ රාජාසන කථාවෙන් මම කියවන විට ඒ කාරණා ඔය රාජාසන කථාවෙත් තිබෙන වාද කියා ලකුණු කරන්නය කියා. මිනිත්තු 10ක් අපි ඒ විධියට බැලුවා. මෙය හරියට වාඩි වී විග්‍රහ කර බැලුවොත් අකුරෙන් අකුරටම කියන්න පුළුවන්කම ලැබෙනව, මේ රාජාසන කථාවෙ තිබෙන අසුවල් අසුවල් දේ පසු ගිය රාජාසන කථාවෙත් තිබෙනවාය කියා. මේ මිනිත්තු 10 ඇතුළත පසු ගිය අවුරුද්දෙ ප්‍රකාශ කළ කරුණු 22ක්ම මේ අවුරුද්දෙ කියා තිබෙන ස්ථාන අසු වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

එතකොට 1966 රාජාසන කථාවටත් ඇතුළත් වී, ඒ පොරොන්දු වූ දේම 1967 රාජාසන කථාවටත් යළිත් වරක් ඇතුළත් වී තිබෙනවා නම් එය පුනරුක්ත දෝෂයක්. එක් වරක් සඳහන් වූ දේ යළිත් වරක් සඳහන් වීම පුනරුක්ත දෝෂයක් හැටියට අපේ සිංහල සාහිත්‍යයේ තිබෙනවා. තමුන්නාන්සේ මුස්ලිම් සාහිත්‍යය පිළිබඳ විශාරදයෙක් නිසා තමුන්නාන්සේගෙ සාහිත්‍යයෙත් ඒ ගැන සඳහන් වන බව තමුන්නාන්සෙ දන්නවා ඇති. සිංහල සාහිත්‍යයට අනුව පුනරුක්ත දෝෂයක් තිබෙනවා නම් එය කුණු කූඩයට දමනවා මිසක් එවැනි සාහිත්‍යකරණයකට කිසිම සැලකිල්ලක් දක්වන්නෙ නැහැ. සාහිත්‍යයක පුනරුක්ත දෝෂයක් එන්නෙ වෙන කියන්න දෙයක් ලියන්න දෙයක් නැති වුණාමයි. ඒ කියන්නෙ අදහස් අතින් බංකොලොත් වුණාමයි. කියන්න අලුත් දෙයක් නැහැ. ඒ නිසා කලින් කී දේ නැවත නැවත කියනවා. ඒකට තමයි සිංහල සාහිත්‍යයෙ පුනරුක්ත දෝෂය කියන්නෙ. මෙහි පුනරුක්ත දෝෂ තිබීමෙන් පෙනෙන්නෙ රාජාසන කථාවෙ බංකොලොත් භාවයයි. ගිය අවුරුද්දෙ කී දේ මේ අවුරුද්දෙත් ඒ වචනයෙන්ම කියනවා.

එතකොට මේ සුළු වෙලාව ඇතුළත සොයාගත් කරුණු 22 ගැනම මම කියන්න ගියොත් මට කථා කරන්න කාලය නැති වෙනවා. අනික් කාරණය : පසු ගිය රාජාසන කථාවෙ තිබුණ ගුඩුකම මෙයින් පැහැදිලි වෙනවා. නමුත් ඊට වඩා වැදගත් දෙයක් කරන්නට මම බලාපොරොත්තු වන නිසා මම එයින් එකක් දෙකක් පමණක් කියන්නම්. 1967 රාජාසන කථාවෙහි "සාහිත්‍යයටද, පාරම්පරික කලා හා සංස්කෘතියටද, විශේෂයෙන්ම නාට්‍ය කලාවේ පුනරුත්ථාපනයටද මාගේ ආණ්ඩුවේ අනුග්‍රහය ලැබී ඇත" කියා සඳහන් කර තිබෙනව. ඔය විධියටම ඊට පෙර අවුරුද්දෙ රාජාසන කථාවෙහිද සඳහන් වී තිබෙනව. කිසිම වෙනසක් නැහැ. ඊළඟට "ජාත්‍යන්තර සම්බන්ධතා විෂයයෙහි මාගේ ආණ්ඩුව කිසිම පක්ෂයකට නොබැඳීම ස්ථිරව අනුගමනය කරන අතර..." යනුවෙන් තිබෙනව. මීට පෙර අවුරුදුවලදිත් මේ විධියටම කියා තිබෙනව. හැමදාමත් එකම දේ කියනවා, කිසිම වෙනසක් නැතුව. පක්ෂයකට නොබැඳී ක්‍රියා කරනවාය කීවත්, ඇමෙරිකාව වියට්නාමයට ගොස් දිනකට ඩොලර් දහස් ගණන් වියදම් කරමින් බෝම්බ දමන නමුත් අමෙරිකාවට විරුද්ධව වචනයක්වත් කියන්නෙ නැහැ. නමුත් වෙනත් රටක් යම්කිසි සිවිල් යුද්ධයකට හෝ වෙනත් කාරණාවකට මැදිහත් වුණොත් ඒ ගොල්ලන්ට දොස් කියනව.

**අතපත්තු මයා.**
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)

වරදක් කළොත් වැරදිය කියනව.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ඊබැටයෙ පාලනයට ඇහිලි ගැසුවාය කියා ඒ කාලයෙ දොස් කීව. තමුන්නාන්සෙ ඒ කාලයෙ බෙලිඅත්තෙ උසාවියෙ වැඩ කරනව ඇති.

**අතපත්තු මයා.**
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)

බෙලිඅත්තෙ උසාවියක් නැහැ, තංගල්ලෙ මිසක්.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ඔව්, තංගල්ලෙ උසාවියෙ වැඩ. ඒ කාලයෙ තමුන්නාන්සෙලගෙ නායකතුමා කියා තිබෙන දේවල්වත් කියවා නැති පාටයි.

**අතපත්තු මයා.**
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)

කියවන්න තරම් වේලාවක් ඒ කාලයෙ තිබුණෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

"පොලිස් දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කිරීමේ අදහසින් පොලිස් කොමිසමක් පත් කර ඇත." යනුවෙන් මෙම රාජාසන කථාවෙහි සඳහන් වෙනව. ඔය වචනවලින්ම ඔය විධියටම ගියවර රාජාසන කථාවෙත් කියා තිබෙනව. එහෙනම්, කියන්න දෙයක් නැති නම් දෙවියනෙ, ගිය අවුරුද්දේදී කියවූ රාජාසන කථාවෙන් හෙළි කළ කරුණු නැවත වරක් මාගේ ආණ්ඩුව ක්‍රියාවෙ යොදවනවා ඇතැයි කියා වාඩි වීම නොවෙද කරන්න තිබුණෙ? එසේ නැතුව මිනිත්තු 40 ක පමණ කාලයක් මේ සඳහා ගත කළේ මොනවටද? 1966 රාජාසන කථාව ගැන සඳහන් කර "ගිය අවුරුද්දේ ජූලි මාසයෙ 8 වනදා මේ වගේ වෙලාවට මගේ ආණ්ඩුව විසින් මා ලවා කියවන ලද රාජාසන කථාව නැවත වරක් කියවූ හැටියට තමුන්නාන් සෙලා සලකන්න. එය ක්‍රියාවෙ යොද වනවා ඇත" කියා වාඩි වීම නොවෙද අග්‍රාණ්ඩුකාරතුමාට කරන්න තිබුණෙ?

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

එහෙම කළා නම් තමුන්නාන්සෙල අපට බැනල බැනල ගන්න දෙයක් නැති වෙයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඊට වඩා වෙනසක් මේ රාජාසන කථාවෙහි පෙනෙන්නෙ නැහැ. එම වචනම ඒ ආකාරයෙන්ම නැවත වරක් මුද්‍රණය කිරීම පමණයි කර තිබෙන්නෙ. හැබැයි ගියවරට වඩා මෙවර අකුරු කුඩායි. ගියවර රාජාසන කථාවෙ පිටපතෙහි අකුරු තරමක් විශාලයි. ඒ දවස්වල ආණ්ඩුව ටිකක් ලොකුවට හිතුව. දැන් ටිකක් පරණ වේගෙන යන විට තත්ත්වය අඩුවේගෙන යනව.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

පරණ වෙනකොට කොයිකත් එහෙමයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මම දන්නෙ නැහැ, තමුන්නාන්සෙට පරණ දේවල් ගැන තිබෙන අත්දැකීම ගැන.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

දැකගන්න හම්බු වෙයි නුදුරු අනාගතයෙදි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඔය විධියට මෙම රාජාසන කථාවෙහි පිටුවක් පිටුවක් පාසා පුනරුත් දෝෂයන්ගෙන් පිරී ඉතිරී තිබෙනව. වරක් කියූ දේවල් යළි යළිත් කීම පමණක් නොවෙයි, ඒ වරද පමණක් නොවෙයි මේ ආණ්ඩුව කර තිබෙන්නෙ. ගිය අවුරුද්දේදි කරනවාය කියා පොරොන්දු වී ගිය අවුරුද්දේදි තබා ලබන අවුරුද්දේදීවත් කරන්නෙ නැති, කරන්න අදහස් කරන්නෙ නැති කාරණා දහහතරක් පමණ මෙම රාජාසන කථාවට ඇතුළත් කර තිබෙනව. මීට නිදර්ශන වශයෙන් කෙටියෙන් කරුණු තුන හතරක් දක්වන්නම්. ගතවුණු දොළොස් මාසය තුළදී ඉටු නොකරන ලද පොරොන්දු මොනවාද කියා පෙන්වා දෙන්නම්. සාමාන්‍ය පිළිගැනීමක් තිබෙනව, කෙනෙකුගෙ අනාගතය මනින්න ඕනෑ ඒ පුද්ගලයාගේ අතීතය දිහා බැලීමෙන්ය කියල. එහෙම නැතුව කෙනෙකු කී පළියටම පිළිගන්න සිරිතක් ඇත්තෙ නැහැ. ලබන අවුරුද්දේදී මේවා කරනවාය කියා ආණ්ඩුව කීවත් ඒ කීම එකඑල්ලේම පිළිගන්න බුද්ධිමත් මිනිසුන් සූදානම් නැහැ. පසුගිය අවුරුද්දේදී මොනවාද කීවෙ, ඒ කී දේවලින් කොපමණ ප්‍රමාණයක් ඉටු කර තිබෙනවාද කියා වටපිටාව බැලීමේ සිරිතක් බුද්ධිමත් මිනිසුන් අතර තිබෙනව. අපි බලමු, මේ අවුරුද්දේදී, පිටු තුන හමාරක පමණ රාජාසන කථාවෙන් පොරොන්දු වී ඇති දේවලින් කොයි තරම් ප්‍රමාණයක් කෙරෙනවාද කියා විශ්වාස කිරීමට, බලාපොරොත්තු තැබීමට පෙර, මෙයට දොළොස් මසකට උඩදී මේ ආණ්ඩුව මහජනතාවට දුන් පොරොන්දුවලින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

කීයක් ඉෂ්ට කර තිබෙනවාද කියා. කළ දේවල් ගැන උන්නැහෙල කථා කරන කොට කියාවි : මම කියන්නම් ඉෂ්ට නොකළ දේවල් ගැන. මේ රාජාසන කථාවට පෙර රාජාසන කථාවෙහි අඩංගු කරන ලද ඉටු කරන බවට පොරොන්දු වූ එහෙත් අද දක්වාම ඉටු නොකරන ලද පොරොන්දු 14ක් තිබෙනවා. ඒ කරුණු මොනවා ඇයි ඉතාමත් ම කෙටියෙන් කියන්නම් :

" පාරිභෝගිකයන්ගේ වුවමනාකම් පිරිමැසීම සඳහා වර්තමාන කාර්මික නිෂ්පාදනයන්ගේ නිපද වීම, බෙදා හැරීම, අලෙවි කිරීම, මිල හා අනර්ඝත්වය මනාව පාලනය කිරීම පිණිස කර්මාන්තයන් සංවර්ධනය කිරීමට සහ හැඩ ගැස්වීමට විශේෂ නීති ඉදිරිපත් කරනු ඇත."

මේ කියන්නේ ජීවන වියදම අඩු කිරීම සඳහා නීති සම්පාදනය කරන බවට එදා දුන් පොරොන්දුව පිළිබඳවයි. නමුත් අද දක්වා කිසිවක් සිදු වී නැහැ.

" අධ්‍යාපනික සහ ප්‍රවෘත්ති සේවාවන් සැපයීම සඳහා රූපවාහිනී මධ්‍යස්ථානයක් පිහිටුවීමට පියවර ගනු ඇත."

දැන් මෙහි රාජ්‍ය ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා ඉන්නවා. එතුමා බෙලිඅත්තට ගොස් රූපවාහිනී යන්ත්‍ර යෙහි ඇණය කරකවා තම නායක රාජ්‍ය ඇමතිතුමා කරන කථා ඇසීමට බලාගෙන ඉන්නට ඇති. කෑම් බීම් ඉඳුම් හිටුම් වෙනත් නොයෙකුත් පහසුකම් ලංකාවේ තිබෙන නිසා අඩුපාඩුවක් හැටියට තිබෙන රූපවාහිනිය ඇති කරන්නටයි, ගිය අවුරුද්දේ බලාපොරොත්තු වුණේ. ඉතින් ඒක හරි. දැන් මොනවා වැහෙනවා දැයි අප දන්නේ නැහැ.

" සමුපකාර ආරෝග්‍යශාලා පිහිටුවීමට සහ ඒවා විශාල කිරීමට මගේ ආණ්ඩුව ආධාර සහ අනුබල දෙනු ඇත."

ඉතින් පසුගිය දොළොස් මාසය ඇතුළත එක ආරෝග්‍යශාලාවක්වත් ඇති කළාද ?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (සෞඛ්‍ය ඇමති)**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—சுகாதார அமைச்சர்)*
(The Hon. M. D. H. Jayawardena)

ඇයි නැත්තෙ ? නිකවැරටියෙ එකක් ඇති කළා. [බාධා කිරීමක්] මුදල් දෙනවා කියා පොරොන්දු වී තිබෙනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

දෙන්නං කාසියට පොරොන්දු වී තිබෙනවා. [බාධා කිරීමක්]

" මගේ ආණ්ඩුව ආරෝග්‍යශාලාවල සහ වෙනත් වෛද්‍ය ආයතනවල වැඩිපුර පහසුකම් සපයන අතර, ඒවා ඉක්මණින්ම සැපයීම සඳහා ස්ථිර පියවර ගනු ඇත."

බෙහෙත් ඩිංගක් ගන්නට නැතැයි කිය මින් ගිය අවුරුද්දෙදි මට ටෙලිග්‍රෑම් හතරක් එවන්නට සිදු වුණා.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

දැන් පහසුකම් වැඩි කර තිබෙනවා. [බාධා කිරීමක්] මාතර ගරු මන්ත්‍රීතුමාගෙන් (බී. වයි. තුඩාවේ) අහන්න.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ලෙඩුන් ආරෝග්‍යශාලාවලට යන්නේ නැහැ. ගියාට බෙහෙත් නැති නිසා යන්නේ නැහැ. [බාධා කිරීමක්]

මා නියෝජනය කරන ප්‍රදේශයේ තිබෙන පාරකට " ශ්‍රී ලංකා හැතැප්ම " යනුවෙන් නමක් වැටී තිබෙනවා. මේ ආණ්ඩුව බලයට ආ දිනයේ සිට ඒ පාරට ගල් කැල්ලක්වත් දමන්නට දෙන්නේ නැහැ. පාරේ ගල් තළන මෝල මාතරට ගෙන ගියා. බෝක්කුවට ගැසූ යකඩ කම්බි තවම ඒ විධියටම තිබෙනවා. දැන් මිනිසුන් එයින් එහා මෙහා යන්නේ පොල් ලී හරස් කරගෙනයි.

ඒ ගමේ වැඩි දෙනා ඡන්දය දුන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටයි. ඒ වගේම එය කවදාවත් එක්සත් ජාතික පක්ෂයට ඡන්දය නොදෙන ගමක්. එහෙයින් ඒ ගමට යන පාර සාදන්නට එපා යයි මේ ආණ්ඩුවේ උදවිය රජයේ වැඩ දෙපාර්තමේන්තුවට නියෝග කරන්න ඇති. දැන් මේ පාරට කියන්නේ " ශ්‍රී ලංකා හැතැප්ම " කියලයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව ගේන්නට අදහස් කළ "රෝල්" තවම ලැබී නැහැ. "රෝල්" පණහක් ගේන්නට "ඕඩර්" කළා. තවම ආවෙ නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

රෝල් වෙලා ඒවි.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

අවුරුදු නවයක්ම "රෝල්" වුණා. ඒ අවුරුදු නවය තුළ "රෝල්" වුණු තරම අපි දන්නවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මේ පාර රෝල් වුණාම තමුන්නාන්සෙලාගෙ ඔළුවවත් උස්සන්න හම්බ වෙන්නෙ නෑ.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

එහෙම බලාපොරොත්තු වෙනව ඇති. කොරල බලන්නකො.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

බලන්න වරායට කළ වැඩේ. "ඒ නිසා ආරක්ෂක සේවා ක්‍රියාත්මක වීම සඳහා සංස්ථාවක් පිහිටුවීමට නීති නොපමාව ඉදිරිපත් කරනු ඇත" යනුවෙන් එදා කිව්වා. මේ කියෙව්වෙ පසුගිය 8 වැනිදා කියවන ලද රාජාසන කථාවෙන් නොව ඊට කලින් කියවන්නට යෙදුණු රාජාසන කථාවෙනුයි. ඉටු කරන බවට පොරොන්දු වී ඉටු නොකළ මෙවැනි කරුණු 14 ක් තිබෙනවා. [බාධා කිරීම්] බණ්ඩාරනායක යුගයට යන්න වුවමනාවක් නැහැ. අපි දැන් විවාද කරන්නෙ සේනානායක යුගයෙ දේවල්. [බාධා කිරීම්]

ගරු සභාපතිතුමනි, විරුද්ධ පක්ෂයෙ සංශෝධන 4 පළමුවැනි වරට ඉදිරිපත් කරමින් විරුද්ධ පක්ෂයෙන් යටියන්තොට ගරු මන්ත්‍රීතුමත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) දිවුලපිටියෙ ගරු මන්ත්‍රීතුමත් (ලක්ෂමන් ජයකොඩි මයා.) මාතර ගරු මන්ත්‍රීතුමත් (තුඩාවෙ මයා.) කොලොන්නාවෙ ගරු මන්ත්‍රීතුමත් (ටී. බී. ඉලංගරත්න මයා.) කළ කථා 4 ට පිළිතුරු වශයෙන් ආණ්ඩු පක්ෂයෙන් කථා කෙළේ අක්මීමන ගරු මන්ත්‍රීතුමා (සුගතදාස අරඹවල මයා.) පමණයි. එක්සත් ජාතික පක්ෂයට වැළඳී තිබෙන දේශපාලන අතීසාරයට ගැසූ ඒ මිනිත්තු 12 අක්මීමන අමුඩයෙන් විරුද්ධ පක්ෂයෙ කථා 4 කට පිළිතුරු දෙන්න උත්සාහ කිරීම තරම් විහිළුවක් තවත් ඇතැයි මා හිතන්නෙ නෑ. එය ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තු සම්ප්‍රදායට කරන සමච්චලයක්.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

I rise to a point of Order. There are certain amendments which the Opposition has moved. They must speak on the amendments. There is nothing in the amendments which refers to the previous Throne Speech. The hon. Member should be good enough to confine himself to the amendments. All that he is saying now is unnecessary.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

If the hon. Parliamentary Secretary does not disturb the hon. Member for Habaraduwa he will get on to the amendments.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

රාජ්‍ය උප ඇමතිතුමා අලුත් නීතිරීති වගයක් ඉදිරිපත් කරන්න උත්සාහ කරනවා. අසුවල් සංශෝධනය ගැන පමණක් කථා කළ යුතුයයි මේ විවාදයට සහභාගි වන ගරු මන්ත්‍රීවරුන්ට කවුරුවත් නියම කර නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

I rise to a point of Order, Sir. The hon. Member cannot talk outside the amendments.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

නැහැ, එහෙම දෙයක් නැහැ. මා පුළුවන් තරම් දුරට එක් කරුණක් ගැන සීමා වී කථා කරන්නට උත්සාහ ගන්න බව කිව්වා. එය මා විසින්ම පවරා ගන්නා ලද සීමාවක් මිස විවාදයෙදී ඇති කරගත් සීමාවක් නොවෙයි. එම නිසා මා 4 වැනි සංශෝධනය ගැන සවිස්තරව කරුණු ඉදිරිපත් කරනවා. මෙතෙක් පිළිතුරු දුන්නෙ අර ආණ්ඩුවෙ දේශපාලන අතීසාර යට ගැසූ අක්මිමන අමුඩයටයි.

ගරු සභාපතිතුමනි, මුළු රාජාසන කථාවෙම ඇති සදොස් තැන්—පුනරුත් දොස් ඇති තැන්—ගැන මා සඳහන් කළා. ඊළඟට, වැදගත් ප්‍රශ්න සම්බන්ධයෙන් කිසිම සඳහනක් නොකළ තැන් කීපයක් පෙන්වා දෙන්නට අදහස් කරනවා. අමතක වීමෙන් හෝ ඕනෑකමින්ම අමතක කිරීමෙන් හෝ මෙම රාජාසන කථාවෙහි වචනයක්වත් සඳහන් කරන්නට බැරි වී තිබෙන ඉතා වැදගත් ප්‍රධාන කරුණු දෙකක් තිබෙනවා. එකක්, මේ රටේ මිනිසුන්ගේ නිදහස පිළිබඳවත් මේ රටේ දේශපාලන අභිවෘද්ධිය පිළිබඳවත් වැදගත් කාරණයක් වන ආණ්ඩු ක්‍රම පනතක් සකස් කිරීමයි. මෙම රාජාසන කථාවට විරුද්ධව නැගිය හැකි බරපතළම චෝදනාව නම්, මෙවැනි විශාල ජාතික අවශ්‍යතාවක් ගැන වචනයක්වත් එහි සඳහන් නොකිරීමයි. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලනයෙන් අපට නිදහස ලැබී දැන් අවුරුදු 20 ක් පමණ ගත වී තිබෙනවා. නමුත් අපට තවම බැරි වුනා, අපේය කියන්න ආණ්ඩු ක්‍රම පනතක් හදා ගන්න. ගිය අවුරුද්දේ රාජාසන කථාවේ ඒ ගැන සඳහනක් තිබුනා. මේවර රාජාසන කථාවේ ඒ ගැන හඳහනක්වත් නැහැ.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

ඇයි එකඟ නොවුනේ ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

එකඟ නොවුනේ අපි පැලැස්තර අලවන්න අකැමති නිසයි. අළුතෙන් එකක් හදන්න තමුන්නාන්සෙත් එකතු වෙන්න.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

තමුන්නාන්සෙට පැලැස්තර අලවන්න අපිත් සූදානම් නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

පැලැස්තර කිව්වෙ තමුන්නාන්සෙගෙ ස්පිරිතාලවල පැලැස්තර නොවෙයි. පරණ සොල්බරි ආණ්ඩු ක්‍රමයට අතනින් මෙතැනින් කොනිත්තා පැලැස්තර අලවන්න අපට වුවමනාවක් නැහැ. මේ වගේ වැදගත් කාරණයක් ගැන වචන මාත්‍රයක්වත් සඳහන් කරන්න බැරි රාජාසන කථාවක් මේ පාර්ලිමේන්තුව කෙසේ අනුමත කරන්නද ? ඔය එක වැදගත් ජාතික ප්‍රශ්නයක්. ඒ හා සමානම තවත් වැදගත් ජාතික ප්‍රශ්නයක් තියෙනවා. ඒ ප්‍රශ්නය තමයි, අවුරුදු ගණනාවක් තිස්සේ කැකෑරෙමින් මේ සමාජයේ පවත්නා භාෂා ප්‍රශ්නය. මේ වර රාජාසන කථාවේ භාෂා ප්‍රශ්නය ගැන වචන මාත්‍රයක්වත් සඳහන් කරල නැහැ. භාෂා ප්‍රශ්නය කියා එකක් අද නැත කියා—එය විසඳී හමාරය කියා—සමහර විට රටට ඒත්තු ගන්වන්නට මේ රජය උත්සාහ කරනවා වෙන්නට පුළුවනි.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

එතකොට 23 ය කියයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඔව්, තමුනන්නාන්සෙලට දැන් වෙලා තියෙන්නෙ සඳහන් කළත් වැරදියි, නො කළත් වැරදියි. ඒකෙන් තේරෙන්නෙ මොකක්ද? පසුගිය අවුරුදු 3 ඇතුළතදී කිසිම ප්‍රශ්නයකට හරි පිළිතුරක් දී නැති බවයි. ප්‍රශ්නයට පිළිතුරක් දුන්න නම් ඒ ගැන සඳහන් කරන්න වුවමනාවක් නැහැ. ප්‍රශ්නයට පිළිතුරු දෙන්නට බැරි වූ නිසා සඳහන් කරන්නට ඕනෑ. සඳහන් කළොත් කියන්නෙ උත්තරයක් දෙන්න බැරිව අවුරුදුපතා නැවත වරක් කියනවා පමණක්ය කියායි. දැන් වෙලා තියෙන්නෙ ඉස්සරහට යන්නත් බැහැ, පස්සට යන්නත් බැහැ.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

කිව්වත් වැරදියි නොකිව්වත් වැරදියි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

බොහොම හරි, ඒකෙන් තේරෙන්නෙ මොකක්ද? භාර ගත්ත එක වැඩක්වත් හරියට කරල නැති බවයි.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

ඒ තමුන්නාන්සෙ කල්පනා කරන හැටි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

4 වැනි සංශෝධනයේ ඒ ප්‍රශ්නය ගැන මෙසේ සඳහන් කරල තියෙනව:

> "රටේ බලවත්ම පරිහානියට, පන්ති භේදයට හා ජාතික අසමගියට මූලික හේතුව වූ ඉංග්‍රීසි භාෂා ආධිපත්‍යයෙන් රට මුදා ගැනීමට මේ රජය අකැමැති බව දන් හොඳින්ම පැහැදිලි වී ඇති බැවින්ද..."

බැරිකමක් නොවෙයි. බැරිකම මතු වන්නෙ උත්සාහ කරල බැරි වෙලා ගියොත්. මේ සංශෝධනයෙන් පැහැදිලි වම කියන්නෙ ආණ්ඩුවට බැරි වෙලා තියෙන දෙයක් නොවෙයි. මේ කාරණය ගැන ආණ්ඩුව උත්සාහ කරල නැහැ. ආණ්ඩුව මේකට අකැමැති බවයි, කියන්නෙ. ඉදිරි පෙළේ අසුන්වල වැජඹෙන ගරු ඇමතිවරුන් ඉංග්‍රීසි ආධිපත්‍යයට සම්පූර්ණයෙන් යටත් වෙලා ඉන්නව. ඔවුන් සිතන්නෙ, පතන්නෙ, කථා කරන්නෙ, ජීවත් වන්නෙ, කන්නෙ, බොන්නෙ, අඳින්නෙ, කාලා ඉවර වුනායින් පසු කරන අනික් හැම දෙයක්ම කරන්නෙත් ඉංග්‍රීසි තාලයෙන් නිසා ඉංග්‍රීසි භාෂාවෙන් අයින් වෙලා මොහොතක්වත් ජීවත් වන්න ඔවුන්ට පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ රටේ හැම දේකටම ඉංග්‍රීසිය යළිත් ඇබ්බැහි කිරීමටයි, වර්තමාන රජය පසුගිය මාස 12 තුළදී ක්‍රියා කර තිබෙන්නෙ.

මේ කාරණය නිසා විශේෂයෙන්ම රජයේ දෙපාර්තමේන්තුවල ස්වභාෂා ප්‍රේමීන් අතර බලවත් කැළඹීමක්, බලවත් ආන්දෝලනයක්, බලවත් නොසන්සුන්කමක් ඇති වෙලා තියෙනව, වර්තමාන රජය රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙන් සම්පූර්ණයෙන්ම පිට පැනලා එයට එකහෙළාම විරුද්ධව ඉංග්‍රීසිය යළිත් වරක් මේ රටේ රාජ්‍ය භාෂාව කිරීමට උත්සාහයක් ගෙන යනවාය කියා. විශේෂයෙන් සිංහලට ලැදි රජයේ සේවකයන් අතර පැන නැගී තිබෙන මේ සාධාරණ බිය නිසා වෘත්තීය සමිති රාශියක් මුදල් ඇමතිතුමාටත්, අගමැතිතුමාටත් මේ පිළිබඳව සංදේශ මාර්ගයෙන් කරුණු ඉදිරිපත් කර තිබෙනව. ඊයේ පෙරේදා මට දැන ගන්නට ලැබුණ, විශේෂයෙන් සමස්ත ලංකා රජයේ ලිපිකරු සංගමය ගරු අගමැතිතුමා හමු වී මේ ගැන කරුණු ඉදිරිපත් කර තිබෙනවාය කියා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට මතක ඇති රාජ්‍ය භාෂා ප්‍රශ්නය පිළිබඳව එක්තරා උග්‍ර අවස්ථාවක් පසුගිය අවුරුද්දෙ ජනවාරි 8 වැනි දා එළඹුණු බව. මහ පාරේ එළවාගෙන ගොස් සිල්වත් භික්ෂුන් වහන්සේ නමකට වෙඩි තබා මරාගන පැනවූ භාෂා රෙගුලාසි වගයක් නිසා රටේ බලවත් කැළඹිල්ලක් ඇති වුණා. මේ ප්‍රශ්නයේදී රාජ්‍ය භාෂා ලැදි වෘත්තීය සමිති කීපයක් රජයේ වගකිව යුතු ඇමතිවරුන් හමු වී ඔවුන්ගෙන් පොරොන්දුවක් ඉල්ලා සිටිය, දෙමළ භාෂා විශේෂ විධිවිධාන පනත යටතේ යම්කිසි රෙගුලාසි වගයක් පැනෙව්වා නම් ඒ වගේම සිංහල රාජ්‍ය භාෂා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

පනත යටතේත් රෙගුලාසි මාලාවක් පනවා, රාජ්‍ය භාෂා පනත රජයේ හැම දෙපාර්තමේන්තුවකම විධිමත් පරිදි ක්‍රියාත්මක කරන හැටියට. අපට දැන ගන්ට ලැබී තිබෙන හැටියට, ඒ පිළිබඳව ගරු මුදල් ඇමතිතුමාත්, ගරු අගමැතිතුමාත් හමු වුණු වෙලාවෙ මේ වෘත්තීය සමිතිවලට ගරු අගමැතිතුමා පොරොන්දුවක් දුන්නා, "1956 අංක 33 දරන සිංහල රාජ්‍ය භාෂා පනත යටතේත් වහාම රෙගුලාසි පාර්ලිමේන්තුවට ගෙනෙනවාය" කියා. පසුගිය අවුරුද්දේත්, මේ අවුරුද්දේත් මා නොකඩවා පාර්ලිමේන්තුවට ආවා. නමුත් අගමැතිතුමාවත්, වෙනත් ගරු අගමැතිවරයෙක්වත් මේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉදිරියට සිංහල රාජ්‍ය භාෂා පනත පිළිබඳව කිසිම රෙගුලාසියක් ඉදිරිපත් කළේ නැහැ. මෙන්න මේ කාරණය නිසා විශේෂයෙන් සමස්ත ලංකා රජයේ ලිපිකරු සංගමය මෙවැනි සංදේශයක් ගරු අගමැතිතුමාට යවා තිබෙන බව මට දැන ගන්නට ලැබී තිබෙනව. මම ඒ සන්දේශයෙන්, මෙයට අදාළ කොටස් පමණක් කියවන්නම් :

"1965 ජූලි 22 වෙනිදා එළිදැක්වූ කැබිනට් නියෝගාවලියෙන් රජ බසේ මළගම කියැවිණ. එයට පසු 1966 ජනවාරි 8 වෙනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත වී ඇති ද්‍රවිඩ භාෂා විශේෂ විධිවිධාන පනත යටතේ වූ රෙගුලාසිවලින් පසු ඒ අනුසාරයෙන් මහා භාණ්ඩාගාරය මඟින් නිකුත් කර ඇති අංක 700 සහ 701 දරන චක්‍ර ලේඛවලින් 1956 සිටම රජ බසට ද්‍රෝහිකම් කරන ලද පිරිසකගේ මනදෙළ පුරවා ඇත."

සිංහල භාෂාවට ලැදි රජයේ සේවකයන් අතර පමණක් නොව මේ රටේ භාෂා ප්‍රේමී අනෙකුත් හැම දෙනා තුළමත් ලොකු බියක්, සංවේගයක් ඇති වී තිබෙන්නෙ, මෙන්න මේ නිසයි. නමුත්නාන්සේලා දෙමළ භාෂා විශේෂ විධිවිධාන පනත යටතේ රෙගුලාසි පැනෙව්වාට මිනිසුන් විරුඬ වන්නෙ නැහැ, සිංහල භාෂා පනත හරියාකාර ක්‍රියාත්මක කරනවා නම්, එය ක්‍රියාත්මක නොකර දෙමළ භාෂා විශේෂ විධිවිධාන පනත යටතේ පනවන ලද රෙගුලාසි නිසා භාණ්ඩාගාරය අලුත් චක්‍ර ලේඛ නිකුත් කර, සිංහල භාෂා ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම මරා, මකා, යට කර දැමීම ගැනයි, මිනිසුන්ගෙ බලවත් සංවේගය ඇති වී තිබෙන්නෙ. භාණ්ඩාගාරය අංක 700 සහ 701 යනුවෙන් චක්‍ර ලේඛ දෙකක් නිකුත් කළා. 1956 සිට ක්‍රමානුකූලව අවුරුදුපතා ක්‍රියාත්මක කරගෙන ආ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඒ චක්‍ර ලේඛ දෙක නිසා සම්පූර්ණයෙන්ම ආපස්සට ඇදී ගොස් තිබෙනව. ඒ කාරණය ගරු අගමැතිතුමාටත්, මුදල් ඇමතිතුමාටත් ඉදිරිපත් කළ අවස්ථාවේදී ගරු අගමැතිතුමා ඔවුන්ට පොරොන්දුවක් දුන්න, රාජ්‍ය භාෂා පනත යටතේත් රෙගුලාසි ඉදිරිපත් කරනවාය කියා. මම ඒ සංදේශය යළිත් කියවන්නම් :

"නමුත් රජ බස වෙනුවෙන් පෙරමුණ ගෙන ඇති අප සංගමය, රජයේ දේශපාලන නායකයා වූ ඔබතුමා සමඟ 1967 අප්‍රියෙල් මස 9 වන දින කරන ලද න්ල සාකච්ඡාවේදී, ලිඛිතව දී ඇති පොරොන්දුවක් නම්,............"

ඒ කියන්නෙ ගරු අගමැතිතුමා ලිපියක් මාර්ගයෙන් සංගමයට දන්වා තිබෙනව, "මම යම්කිසි දෙයක් කරනවා" කියා. මොකක්ද, ඒ පොරොන්දුව?

".........නියෝගයක් සකස් කිරීම බොහෝදුරට සම්පූර්ණ වී ඇති බවත්—"

ඒ කියන්නෙ, දෙමළ භාෂා විශේෂ විධිවිධාන පනත යටතේ නියෝගයන් සකස් කළා වගේම, සිංහල භාෂා පනත යටතේත් නියෝගයන් සකස් කිරීමට වහාම ක්‍රියා කරගෙන යනවාය කියායි.

"......නියෝගයන් සකස් කිරීම බොහෝදුරට සම්පූර්ණ වී ඇති බවත්, ලඟදීම ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරණ බවත්, ගරු අගමැතිතුමා සඳහන් කළේය."

ලඟදීම කියා කිව්වෙ, 1967 අප්‍රේල් මාසයේ 9 වැනිදායි. දන් 1967 ජූලි 15 වැනිදා. තවමත් මේ රෙගුලාසි එළිදැක්කෙ නැහැ.

"ඒ අනුව එදා සිට අද දක්වා අපි මෙතෙක් නිහඬව සිටියෙමු. කරුණු කෙසේ නමුත් ප්‍රශ්නය කෙමෙන් යටපත් වන අතර ද්‍රවිඩ භාෂා රෙගුලාසි පැනවීමට රජය දැක්වූ කඩිසර භාවය, සිංහල පනතට රෙගුලාසි පැනවීමට පැහැදිලිව දක්වන උදාසීනත්වයක් බවට පෙරලී තිබීම ඉතාමත් ඛෙදජනකය."

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ භාෂා ප්‍රශ්නය යටතේ රාජ්‍යභාෂාව යටපත් කරල දෙමළ පිළිබඳ ප්‍රශ්නයත් මතු වන්නට ඉඩ නොදී නැවත වරක් ඉංග්‍රීසි රජ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කර වීමට වර්තමාන රජය බොහොම උනන්දු වෙන් ක්‍රියා කරන බව අංක 700 සහ අංක 701 දරණ චක්‍ර ලේඛවලින් හොඳටම පැහැදිලි වෙනව. මේ සංගමය සඳහන් කරන විධියට අංක 700 සහ අංක 701 දරන චක්‍ර ලේඛවලින් කරල තිබෙන්නෙ මොකක්ද?

1966 සැප්තැම්බර් 4 වැනිදා අංක 2/9/156/26/එච් දරණ සටහන් ඇතුව භාණ්ඩාගාරය මගින් නිකුත් කරන ලද චක්‍ර ලේඛවලින් සිදු වී තිබෙන්නෙ මෙයයි : මේ දක්වා විශේෂයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව යටතේ අනුක්‍රමයෙන් අවුරුදු පතා රාජ්‍යභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නගමින් ආව. පැරණි රජයේ සේවකයන් හැටියට පිළිගන්නා අයත්, අළුතින් රාජ්‍ය සේවයට බැඳෙන අයත් යන දෙ කොටසම එක්තරා සීමා කරන ලද කාලයක් තුළදී රාජ්‍ය භාෂා ප්‍රවීනත්වයක් ලබා ගත යුතු යයි ඒ ආණ්ඩුවෙන් නීති පනවා තිබුණා. ඒ නීති අනුව, ඒ චක්‍ර ලේඛ අනුව ආණ්ඩුවේ සේවකයන් අතර එක්තරා ප්‍රමාණයක උනන්දුවක් තිබුණා, එක්තරා ප්‍රමාණයක ඕනෑකමක් තිබුණා, රාජ්‍ය භාෂාව ඉගෙන ගැනීමට. විශේෂයෙන් පැරණි සේවකයින් හැටියට හඳුන්වන නිලධාරීන් නොයෙක් විධියේ උත්සාහ ගත්ත, නියම කර තිබෙන කාලසීමාව තුළදී තමන්ට ඒ පවරන ලද රාජ්‍යභාෂා ප්‍රවීණත්වය ලබා ගන්න. එහෙත් දෙමළ භාෂා පනත යටතේ අළුත් නියෝග පැනෙව්වායින් පසු, 1966 සැප්තැම්බර් මාසයේ මේ චක්‍ර ලේඛ නිකුත් කළාට පසු, රාජ්‍යභාෂාව හැදෑරීම සඳහා රජයේ සේවකයන් තුළ පැවති උනන්දුව සම්පූර්ණයෙන් නැතිවී ගියා.

මේ චක්‍ර ලේඛයේ කියා තිබෙනව, ප්‍රධාන කාරණා තුනක්. ඒ චක්‍ර ලේඛයේ 3 වෙනි පිටුවේ 'ඇ', 'ඉ', 'ඊ' ඡේදවලින් මාගේ තර්කයට ප්‍රමාණවත් අදාළ කරුණු විතරක් ගෙනහැර පානවා. "ඇ" ඡේදයෙන් කියන්නෙ මේකයි. "අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීම." නියමිත කාල සීමාව තුළදී රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණත්වයක් ලබා ගන්නට බැරි රජයේ සේවකයකු සිටී නම් ඔහු අනිවාර්යයෙන්ම—බලෙන්—විශ්‍රාම ගැන්වීමට මීට පෙර තිබුණු ආණ්ඩුව නීතියක් පණවා තිබුණා. ඒවාගේම නියමිත කාල සීමාව තුළදී නියමිත මට්ටමෙන් ප්‍රවීණතා විභාගය සමර්ථ වෙන්නට යම් රජයේ නිලධාරියකුට බැරි වුණා නම් අවුරුදුපතා දෙන වැටුප් වැඩිවීම නතර කිරීමටත් නීතියක් පනවා තිබුණා. උසස්වීම් හා ශිෂ්‍යත්ව දීමේදී රාජ්‍ය භාෂාව පිළිබඳ දැනීම අවශ්‍යමය කියා තවත් කොන්දේසියක් පණවා තිබුණා. මේ කරුණු තුන රාජ්‍ය සේවකයන් කෙරෙහි බලපවත්වන්නෙ නැත්නම් රාජ්‍ය භාෂාව ඉගෙන ගැනීමට ඔවුන් තුළ කිසිම උනන්දුවක් ඇති නොවන බව ඔබතුමා වුවත් පිළිගන්නවා ඇති. මේ කරුණු තුන බල පවත්වන්නෙ නැත්නම් රාජ්‍ය සේවකයන්ට පරණ විධියට ඉංග්‍රීසියෙන්ම වැඩ කර අවසානයේදී විශ්‍රාම අරගෙන යන්ට පුළුවනි. රාජ්‍ය භාෂාව දැනගත්තත් එකයි, දැනනොගත්තත් එකයි. නමුත් පසුගිය ආණ්ඩුව පණවා තිබුණු ඒ රෙගුලාසි නිසා මුළු රාජ්‍ය තන්ත්‍රයෙහිම රාජ්‍ය භාෂාව ඉගෙන ගැනීම සම්බන්ධයෙන් එක්තරා උනන්දුවක් තිබුණා. නමුත් පසුගිය සැප්තැම්බර් මාසයේදී නිකුත් කරන ලද, වර්තමාන ආණ්ඩුව යටතේ, වර්තමාන මුදල් ඇමතිතුමා යටතේ පවත්නා භාණ්ඩාගාරය මගින් නිකුත් කරන ලද චක්‍ර ලේඛනයකින් ඒ කොන්දේසි තුනම ඉවත් කර තිබෙනව. මේ වැට කඩුලු ඒ චක්‍ර ලේඛනය මගින් එහෙම පිටින්ම ඉවත් කර දමා පරණ විධියට වැඩ කටයුතු ඉංග්‍රීසියෙන්ම කරගෙන යන්ට ඉඩ සලස්වා තිබෙනව. මෙන්න බලන්න චක්‍ර ලේඛනය :

> "ඇ් වයෙන් අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීම :
>
> සිංහල ප්‍රවීණතාවය නොමැතිවීම නිසා නිකුත් කර ඇති විශ්‍රාම ගැන්වීමේ නියෝග ලබා සිටින වයස අවුරුදු 55ක් නොවූ ආදි ප්‍රවේශක නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ නියෝග ඉවත් කර ඔවුන්ට සේවයෙහි රැඳී සිටීමට ඉඩ දිය යුතුය."

ඒ කියන්නෙ රාජ්‍ය භාෂාව දන්නෙ නැත කියා මින්පසු කවුරුවත් විශ්‍රාම ගන්වන්න බැහැ. ඉතින් මීට පසු වයස පනස් ගණනක් වුණු රාජ්‍ය සේවකයකු මොන වුවමනාවකටද සිංහල ඉගෙන ගන්නෙ? මොන හේතුවක් නිසා ඔහු සිංහල හෝඩි පොතක් අතට ගනියි ද? රාජ්‍ය භාෂාව ඉගෙන ගන්නෙ නැතිව අවුරුදු 60 වනතෙක් රාජ්‍ය සේවයෙ ඉන්ට පුළු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

එත් නම් මොන කෙහෙල් මලකටද සිංහල ඉගෙන ගන්නෙ? මේ අනික් නියෝගය ඊටත් වඩා නරකයි :

"වැටුප් වැඩිවීම :

රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය ලබා නොගැනීමේ හේතුව උඩ ආදී ප්‍රවේශක නිලධාරීන්ගේ නවත්වා ඇති වැටුප් වැඩිවීම් ආපසු ගෙවා ඔවුන්ගේ වැටුප් ඒ අනුව සකස් කළ යුතුය."

ඒ කියන්නේ මේ රාජ්‍ය භාෂා ප්‍රශ්නය උඩ 1956 සිට 1966 වන තුරු යම් රාජ්‍ය සේවකයකුගේ පඩි වැඩිවීම් නවතා තිබුණා නම් එම තීරණය ඉවත් කර මෙතෙක් නොගෙවා තිබුණු වැටුප් වැඩිවීම් සියල්ලම මුල සිටම ගෙවා ඒ අනුව ඔහුගේ වැටුප සකස් කළ යුතුය යන්නයි. හාමුදුරුවරුන් මරා ගෙන රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්ට යනවාය කියන ආණ්ඩුව මොකක් ද කෙළේ? රාජ්‍ය භාෂාව පිළිබඳ දැනීමක් නොමැතිකම නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව මගින් නවතා තිබුණු වැටුප් වැඩිවීම් සියල්ලම ආපසු ගෙවන්නය කියා නියෝග කරනව. මේකද රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවෙ යෙදීමය කියන්නෙ? තමුන්නාන්සේලා අර අහිංසක හාමුදුරු නමකට වෙඩි තබා දෙමළ භාෂා පනත යටතෙ නියෝග පැනෙව්වෙ මේක කරන්ට ද? අඩු වශයෙන් දෙමළ මිනිසුන්ටවත් මේකෙන් යහපතක් සැලසෙන්නෙ නැහැ. මේකෙන් යහපතක් වෙන්නෙ ඉංග්‍රීසියටයි.

**එකල් හි වේලාව අ. භා. 7 වූයෙන්, පක්ෂ නායකයින්ගේ රැස්වීමේදී ගත් තීරණයට අනුකූලව, කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා විසින් අ. භා. 7.30 වන තෙක් විවාදය පවත්වාගෙන යෑමට ඉඩ දෙන ලදී.**

*நேரம் பி. ப. 7 மணியாகிவிடவே குழு உப அக்கிராசனர், கட்சித் தலைவர்கள் கூட்டத்தில் செய்து கொண்ட தீர்மானத்தின் பிரகாரம், விவாதம் பி. ப. 7.30 வரை தொடர்ந்து நடைபெற அனுமதித்தார்.*

*It being 7* P.M., MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *permitted the Debate to be continued till 7.30* P.M. *in accordance with a decision taken at a meeting of Party Leaders.*

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අංක 700 දරණ චක්‍ර ලේඛනයෙන් කළ ලොකුම පව තමයි දැන් සඳහන් කළේ.

ඊළඟට මේ අංක 700 දරණ චක්‍ර ලේඛනය නිසා රාජ්‍ය භාෂා ප්‍රශ්නයට වැදී තිබෙන මරු පහර කුමක් ද කියා බලමු. උසස්වීම් හා ශිෂ්‍යත්ව ගැන මෙසේ කියනව: "දැනට පවතින හෝ මතුවට ඇති වන ඉහළ ශ්‍රේණිවල ඇබෑර්තුවලට උසස් කිරීමේදීද, ශිෂ්‍යත්ව සහ පුහුණුවීමේ පාඨමාලාවන් ආදිය සඳහා තෝරා ගැනීමේදී ද නිලධාරීන්ගේ රාජ්‍ය භාෂා ප්‍රවීනත්වය ඒ සඳහා කලින් අවශ්‍ය වන සුදුසුකමක් නොවිය යුතුය." මේ පුදුම විධියෙ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියක් නේ ද? නීතිය කඩදාසි කොළවල තියෙනව. නමුත් එය ක්‍රියාත්මක කරන්ට ගිය විට රාජ්‍ය භාෂාව පිළිබඳ දැනුමක් වුවමනා කරන්නෙ නැතෙයි කියනව. එය අවශ්‍ය කොන්දේසියක් නොවිය යුතු බව කියනව. රාජ්‍ය භාෂාව නොදත්කම නිසා උසස් වීම් ලබාගන්ට බැරි වූ රජයේ සේවකයන් රාශියක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ ආණ්ඩුව යටතෙ සේවය කරන්ට බැරිය කියා අස් වී ගියා.

මෙම රාජ්‍ය භාෂා ප්‍රශ්නය නිසා මේ රටේ සිටි සමහරු මේ රට පවා අත්හැර ගිය බව තමුන්නාන්සෙල දන්නව ඇති. "අපිට නොතේරෙන භාෂාවක් රාජ්‍ය භාෂාව කරල තියෙනව; අපි ආකාසයෙන් වැටිල ඉංග්‍රීසි කතා කරමින් ඉංග්‍රීසියෙන්ම ජීවත් වෙච්ච මිනිස්සු; ඒක වෙනස් කරන්ට මේ සිංහල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියක් ගෙනත් තියෙනව; ඒවට ඔළුව පාත් කරන්ට අපි කැමති නැහැ; එම නිසා අපි මේ රටේ ඉන්නත් ඕනෙ නැහැ; මේක මහ ම්ලේච්ඡ රටක්; ස්වභාෂාව රජයේ භාෂාව හැටියට පිළිගන්ට තරම් පහත් ම්ලේච්ඡ රටක්; එම නිසා අපි මේ රටින් යනව" යනාදි වශයෙන් කියමින් මේ රට අතහැර ගිය කලු සුද්දන් වගයක් එදා සිටි බව අපි දන්නව. ඒ ප්‍රතිපත්තිය අනුගමනය කළත් සල්ලි නැති නිසා රට අතහැර දමා නොගිය, එහෙත් සිංහල බැරි නිසා රක්ෂාව අතහැර දමා විශ්‍රාම ගිය මිනිසුන් කොටසකුත් මේ රටේ සිටින

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බව අපි දන්නව. ඒවගෙම එසේ විශ්‍රාම යාමට සූදානම් වෙච්ච මිනිසුන් කොටසක් ද සිටිය. නමුත් යූ. එන්. පී. ආණ්ඩුව බල යට පැමිණියා විතරයි, ඒ අය අතපය දිග හැර ඉදිරියට ආව. ඒ උදවිය අතපය දිග හැර ඉදිරියට අවුත්, "මේ කොන්දේසි පනවන්ට එපා ; අපි ඉංග්‍රීයෙන් වැඩ කළ මිනිස්සු ; අපි ඉංග්‍රීසියෙන් ආණ්ඩුවේ සේව යට බැඳිච්ච මිනිස්සු ; අපි මේ දක්වා ආණ්ඩුවෙ හැම වැඩක්ම කළේ ඉංග්‍රීසි යෙන් ; අපි මතුවටත් එසේ වැඩ කිරීමට අදහස් කරනව ; එම නිසා මේ සිංහල කොන්දේසිය අයින් කරන්න" යනුවෙන් කීව. එනිසා මේ ආණ්ඩුව එම කළු සුද්දන් ගෙ ඉල්ලීමට ඉඩ දී තිබෙනව. [බාධා කිරී මක්.] මේ චක්‍රලේඛනය තමුන්නාන්සෙලා ගෙ ආණ්ඩුවෙන් නිකුත් කළ චක්‍ර ලේඛන යක්. [බාධා කිරීමක්.] මේක පටන් ගත් තෙ 1956 දියි. ක්‍රමක්‍රමයෙන් ඉදිරියට ආව. නමුත් 1965 දී ලොකුම ලොකු වෙනස්විම ඇති වුණා.

මේ වෙනස්වීම රටේ අනිකුත් හැම ආයතනයකටම බලපා තිබෙනව. තමුන් නාන්සේලාගේ ආණ්ඩුවට ආධාර කරන "ලේක්හවුස්" පත්‍ර කාර්යාලයෙන් නිකුත් වන පත්‍ර කියවා බලන්න. අර පැරණි ඉංග්‍රීසි යුගය නැවත උදා වෙලා නැද්ද කියා ඒ අනුව දකින්ට පුළුවන් වේවි. සංස්කෘතික වශයෙන් සහ ආධ්‍යාත්මික වශයෙන් 1956ට පෙර පැවති යුගය නැවත වරක් ඇවිත් තියෙනව. මේ තත්ත්වය ආණ්ඩුවෙ දෙපාර්තමේන්තුවලට විතරක් නොවෙයි, බලපා තිබෙන්නෙ. මේ ආණ්ඩුව ආවට පස්සෙ 1956 ත් පෙර පැවති අධි රාජ්‍යවාදී ප්‍රතිගාමී සංස්කෘතික යුගය නවැත වරක් ඔළුව ඔසවාගෙන ඉදිරියට ඇවිත් තිබෙනව. දිනපතා පත්‍රවල පළවන දැන්වීම් ගෙන කියවා බලන්න. ඒ යුගය නැවත ඇවිත් තිබෙන බව ඒවායින් පෙනෙනවා ඇති. මට මතකයි, තමුන් නාන්සෙලාගෙ යුගයෙ හිටපු අගමැති වරයකුගෙ කාලයක් පිළිබඳව. ඒ කියන් නෙ සර් ජෝන් කොතලාවල අගමැතිතුමා ගෙ කාලෙ. ඒ කාලෙ රටේ මොන විධියෙ දෙයක් වුණත් ගෝල්ෆේස් හෝටලේ නැතිනම් මවුන්ට් ලැවිනියා හෝටලේ ඉංග්‍රීසි ආලිංගන නැටුමක් පැවැත්වෙනවා ඇති. උතුරෙ ජල ගැල්මක් වුණත් ගෝල් ෆේස් හෝටලේ තෝන මහත්තයා ගැනා කියනවා. එහෙම එකතු වෙලා නටනව, එහාට ආධාර යවන්ට. දකුණෙ සුළි සුළඟක් ආවත් ඒ අන්දමට මහ හෝටලේ "බෝල්රූම් ඩාන්ස්" එකක් පැවැත්වෙනවා ඇති. [බාධා කිරීමක්] පරණ ඒව නොවෙයි, දැනුත් තත්ත්වය ඒකයි. 1956 සිට 1965 වන තුරු ඔය තත්ත්වය ටිකක් අඩුවෙලා තිබුණ. ඒ කාලෙ බල්ලන්ගෙ ප්‍රදර්ශන හා එවැනි තැන්වල බාල් නැටුම් ආදිය ටිකක් අඩු වේගෙන ගියා. ඒ මොක ද? එක්තරා අලුත් දර්ශනයක් රටට හඳුන්වා දී අලුත් විධියේ සංස්කෘතික ප්‍රබෝධයක් රටේ ඇති වී තිබුණ නිසයි. නමුත් තමුන් නාන්සේලාගේ ආණ්ඩුව බලයට ආවා විතරයි, මොන සිද්ධියක් වුණත්, සුළි සුළඟක් හැමුවත්, ගෝල් ෆේස් හොට ලේ බෝල් රූම් ඩාන්ස් එකක්. ගංවතු රක් ගැලුවත්, මහා හෝටලෙ බෝල් රූම් ඩාන්ස් එකක්.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)
තමුන්නාන්සේ දන්නද ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
ඔය පත්‍ර බලන්න ; හැමදාම තිබෙනව. මම නම් දන්නෙ නැහැ, මම ඔය ඩාන්සිං පාටිවලට යන්නෙ නැහැ.

**පී. බී. ඒ. වීරකෝන් මයා.** (වත්තේගම)
*(திரு. பீ. பி. ஏ. வீரக்கோன்—வத்தேகம)*
(Mr. P. B. A. Weerakoon—Wattegama)
අපි යන්නෙත් නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
නමුත් මේ තමුන්නාන්සේලාගේ යුග යේ විශෙෂ ලක්ෂණ. තමුන්නාන්සේලා ගේ සංස්කෘතික පරිහාණියේ ලක්ෂණ.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)
තමුන්නාන්සේලා බල්ලො ප්‍රදර්ශනය කියනවා. තමුන්නාන්සේලාගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]
මීරිගම මන්ත්‍රීවරිය නමයි අද විශේෂ ස්ථානයක් අරගෙන ඒ වැඩේ කරගෙන යන්නෙ. මම දන්නව. හොඳ බල්ලො.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

තමුන්නාන්සේලා ?

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

මොනව ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

එහෙම නම් තමුන්නාන්සේලා හොඳ හරක් ප්‍රදර්ශනයක් වෙන්න ඇති.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

ඔය හරක් කථාව තමුන්නාන්සේට කවදාවත්—

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

තමුන්නාන්සේ දැක්කම මට මතක් වෙනවා

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

දැක්කම මතක් වෙන නවත් ඒව තමුන්නාන්සෙ මගෙන් අහගන්න එපා. කිව්වය කියල හිතා ගන්නවා. අපටයි කියන්නෙ— කෙරුම්කාරයෝ ඉන්නෙ ඒ පැත්තෙ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

තමුන්නාන්සෙ තරහ ගන්න එපා.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

නැහැ, ඇත්ත කියන්න එපාය. තමුන්නාන්සෙ අපට බල්ලො ප්‍රදර්ශන ගැන කියනවා. තමුන්නාන්සේලාගෙම පක්ෂයේ විශාල—

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මම මේ චක්‍රලේඛනය ගැනයි කියමින් සිටියේ :

"......දනට ඇති ඇබෑර්තු ඇති වූයේ මෙම චක්‍ර ලේඛනය නිකුත් කිරීමේ දිනට කලින් දිනයක සිට වුවද ඒ ඇබෑර්තු ඇති වූ දින සිට ක්‍රියාත්මක වන පරිදි මුදල් රෙගුලාසි විධිවිධාන වලට යටත්ව ඒවා පිරවිය හැකිසි."

අංක 700 දරණ මේ චක්‍ර ලේඛනය හේතු කොටගෙන රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අවුරුදු දහයක් ආපසු රැගෙන ගියා. අපි මේ බලු ප්‍රදර්ශන ගැන හෝ හරක් ප්‍රදර්ශන ගැන හෝ රණ්ඩු වෙන්න ඕනැ නැහැ. තමුන්නාන්සේ පිළිගන්නවා ඇති මේ විධියට රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න බැරි බව. කිසියම් බල කිරීමක් තිබුණා නම් බලයෙන් හෝ අකැමැත්තෙන් හෝ රාජ්‍ය භාෂාව ඉගෙන ගැනීමට රජයේ සේවකයන් යම් කිසි සැලකිල්ලක් දක්වන්න ඉඩ තිබෙනවා. නමුත් ඒ බල කිරීම සම්පූර්ණයෙන් අරන් දැම්මම මොන රජයේ සේවකයද තමන් අකැමැති භාෂාවක් ඉගෙන ගැනීමට ඉදිරිපත් වන්නෙ ? ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුනුත්, ඒ වගේම ඇමතිවරුනුත් අවංකවම පිළිගන්නවා ඇති. ෆේඩරල් පක්ෂයටත් ඉන්දියාවට නමස්කාර කරන අනිකුත් බලවේගයන්ටත් හිස නමා මේ චක්‍ර ලේඛනය මේ විධියට නිකුත් කිරීම නිසා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම අඩපණ වී මැරී ගිහින් තිබෙන බව. අද ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට ගිහින් බලන්න කොතැනද සියයට සියයක් රාජ්‍ය භාෂාව ක්‍රියාත්මක වන්නෙ කියා. පරණ ආණ්ඩුවේ දෙපාර්තමේන්තු අමතක කර දමමු. මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සෙ ආරම්භ කරන ලද අලුත් සංස්ථාවක් අරගෙන බලන්න. අඩුම ගණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තේ අලුතෙන් පටන් ගන්නා දෙපාර්තමේන්තුවකවත් සියයට සියයක් රාජ්‍ය භාෂාවෙන් වැඩ කරන්න ඕනෑ නොවේද? පැරණි ස්ථානවල පැරණි විධියටම ඉංග්‍රීසියෙන්ම වැඩ කරනවාය කියා ඩිංගක් නිශ්ශබ්දව සිටියත් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අපි අවංකවම පිළිගන්නවා නම් අලුතෙන් පටන්ගන්නා ආයතනවලවත් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්නෙ නැත්තෙ ඇයි?

මම තව මොහොතකින් උසාවියේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ගැන සඳහන් කරනවා. ගරු රාජ්‍ය උප ඇමතිතුමා කරුණාකර ටිකක් ඉන්න. තමුන්නාන්සෙ විතරයි ආණ්ඩු පක්ෂයෙන් මේ ගැන මා සමග හැප්පෙන්න ඉන්නෙ. [බාධාකිරීම්] නැහැ නැහැ, මන්ත්‍රීතුමනි, මම අගෞරව කිරීමක් කරනවා නොවෙයි. මට වුවමනා කරන්නෙ ඇහුම්කන් දෙන්න පුළුවන්, සත්‍ය පිළිගන්න කැමති කෙනෙක්. 99 දෙනෙක් ඉන්න තමුන්නාන්සේලාගෙන් දැන් ඉන්නෙ තුන් පළයි.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

ඇයි තමුන්නාන්සේලාගෙ පක්ෂයෙන් 5 දෙනෙක්වත් හිටියම නරකද ඔය කථාව අහන්න?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඇයි නැද්ද? කෙසේ වෙතත් මගේ කථාව අහන්න විරුද්ධ පක්ෂය ඉන්න ඕනෑ නැහැ. විරුද්ධ පක්ෂයේ ප්‍රතිපත්ති නොවෙයි මම විවේචනය කරන්නෙ. මම විවේචනය කරන්නෙ තමුන්නාන්සෙලාගෙ ප්‍රතිපත්තියි.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

අපි ඒවට උත්තර දෙන්නම්.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

උත්තර දුන්නෙ පැය දෙකහමාරක විවාදෙකට මිනිත්තු දොළහකදී. තමුන්නාන්සෙවත් කථාව අහගෙන ඉඳල උත්තර දෙන්න.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

උත්තර දෙන්න තරම් කථාවක් කරන්නෙ නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

හොඳයි එහෙම නම් තමුන්නාන්සෙත් ගරු සභාවෙන් යන්න. එවිට අපට පුළුවන් වෙයි හිස් ආසනවලට කථා කරන්න. අනාගතයේදී මෙහි ඇති අසාධාරණත්වය විසඳනවා ඇති. අපට කරන්න දෙයක් නැහැ. තමුන්නාන්සෙලාගෙන් පාර්ලිමේන්තුවේදී විරුද්ධ පක්ෂයට ලැබෙන සැලකිල්ලමයි, මේ රටේ අනිකුත් වැඩ කටයුතුවලදී, හදිසි නීතියටතෙ සෙසු මහජන ආයතනවලටද ලැබෙන්නෙ. මාතර ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, සමුපකාර සමිති විසුරුවා හැර දේශපාලන බලතල කොයි විධියෙන් එක්සත් ජාතික පක්ෂයෙ පරාජිත අපේක්ෂකයන්ට භාරදී තිබෙනවාද කියා. මහජනතාව ඉදිරියට ගොස් නීත්‍යානුකූලව ජනසම්මත ක්‍රමය අනුව යමක් ලබාගන්න බැරි වුණාම හදිසි නීතියේ මුවාවෙන් ආරක්ෂාව ලබාගෙන ඒ ජන සම්මත වාදී ආයතන විසුරුවා හරිනවා. මහජන ඡන්දයෙන් නිලතල ලබාගන්න බැරි පුද්ගලයන් ඊළඟට ඒ තැන්වලට පත් කරනවා. මේ ආණ්ඩුව කරන්නෙ ඒකයි. මෙවැනි අයුක්ති සහගත වැඩ කීයක් මේ කාලය තුළදී කර තිබෙනවද? එකක් දෙකක් නොවෙයි. පළාත් පාලන ආයතන රාශියකටම එකම හැන්දෙන්, හදිසි නීතියෙ හැන්දෙන් බෙදා විසුරුවා හැර තිබෙනව. පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් පමණක් නොවෙයි, මේ අන්දමට කටයුතු කර තිබෙන්නෙ. මහජන මතය උරගා බැලීමේදී තමුන්නාන්සෙලාට ඒ බව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

පැහැදිලි වෙයි. ඊයෙ පෙරේදා පැවති මීගමු අතුරු මැතිවරණයෙදි ජයග්‍රහණයෙ කළේ කොහොමද කියා තමුන්නාන්සෙලා දන්න වා ඇති නොවැ. දිනුවත් එය පරාජයක් හැටියට නොවෙද තමුන්නාන්සේලාට පිළිගන්න සිදු වී තිබෙන්නෙ ?

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

අපි එහෙම තමයි ; තමුන්නාන්සෙල දිනුවොත් දිනලාමයි තිබෙන්නෙ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඔව්. අපි දිනුවොත් හරියටම දිනලා ඇති.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

බලන්න දිනා ඇති ඒවාගෙ හැටි !

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගියවර, මීගමු තරගයෙදි ප්‍රනාන්දු මහත්මය ලබාගත් ඡන්ද සංඛ්‍යාවත් මෙවර එක්සත් ජාතික පක්ෂයට ලබාගන්න බැරි වුණා. එදා එක්සත් ජාතික පක්ෂය ඡන්ද 21 දහසක් ලබාගත්තා, මෙවර ලබාගන්න පුළුවන් වුණේ 18 දහසයි.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

කිතුල්ගහට ගිය මිනිහටත් කියන්න දෙයක් තිබුණා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මම කිතුල් ගස්වලට යන්නෙත් නැහැ වෙනත් ගස් බඩගාන්නෙත් නැහැ.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

තමුන්නාන්සෙ ගස් බඩගානවාය කියල මම කිව්වෙ නැහැ. කිතුල් ගහට ගිය මිනිහටත් කියන්න දෙයක් තිබුණු බව පමණයි මම කිව්වෙ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මීගමුව වාගේ ප්‍රදේශයකින් එදා ඡන්ද 15 දහසක් වැඩිපුර ලබාගන්න පුළුවන් වුණා නම් ඒ සංඛ්‍යාව 7 දහස දක්වා අඩු වුණා නම් තමුන්නාන්සෙලා වැටී තිබෙන තත්ත්වය මොකක්ද කියා තේරුම් ගන්න ඕන. එවැනි තත්ත්වයක් රටේ පවතින බව සමහර විට තමුන්නාන්සෙලා තේරුම්ගෙන තිබෙන නිසයි හාල් සේරුව බැගින් දීම පිණිස පැනවූ මෙම හදිසි නීතිය තවමත් වෙනස් නොකර පවත්වාගෙන එන්නෙ. මහජන ඡන්දයයෙන් සමුපකාර ආයතනවල නිල තල ලබාගන්න බැරි එක්සත් ජාතික පක්ෂයෙ ප්‍රබල ආධාර කාරයින් මහජන ආරක්ෂක නීති යටතෙ ගොස් ඒ ආයතන වල තැන්පත් කරවනව. මේක සාධාරණ වැඩක්ද ? ගරු ආහාර ඇමතිතුමා මේ අවස්ථාවෙදි මේ ගරු සභාවෙ නැහැ. මම එතුමාට මතක් කරන්න කැමතියි, මගේ ප්‍රදේශයෙ තිබුණු, තල්පෙ පත්තුවේ සමුපකාර සමිති සංගමය විශෙෂ බලතල යටතෙ ගිය සතියෙ විසුරුවා හැර තිබෙන බව.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

වැදගත් හේතුවක් නිසා, සමහර විට හොරකම් සිදු වන නිසා විසුරුවා හරින්න ඇති.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඔව්, ලොකුම වැදගත් හේතුවක් තිබෙනව. අවුරුදු ගණනාවක් තිස්සෙ යූ. එන්. පී. කාරයින්ට එන්නට බැරිව තිබුණු සංගමයක්. එමනිසයි විසුරුවා හැරියෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)
ඒකත් වැදගත් කාරණයක් !

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
එපමණයි එතැන ඇති වැදගත් කාරණය—[බාධාකිරීමක්]

මා කිව්වේ එක්සත් ජාතික පක්ෂය ක්‍රියා කරගෙන යන ආකාරයයි. හදිසි නීති යටතේ මහජන ආයතනයක් විසුරුවා හැර මහජන ඡන්දයෙන් නිලතල ලබා ගන්නට බැරි පුද්ගලයන් ඒ තැන්වලට පත් කිරීම වැදගත් කාරණයක් ලු. එක්සත් ජාතික පක්ෂයේ අය ඒ ආයතනවලට පත් කිරීම වැදගත් කාරණයක් ලු. මේ වගේ අසාධාරණ දේවල් සිදු වන යුගයක ප්‍රජාතන්ත්‍රවාදය අනුගමනය කරන බව රාජාසන කථාවෙහි සඳහන් කර තිබෙනවා. මෙය වචනයත් අර්ථයත් සම්පූර්ණයෙන්ම විරූපී කොට මිනිසා තුළ එක්තරා ව්‍යාකූලත්වයක් ඇති කිරීමට ගන්නා උත්සාහයක්. මේ වගේ දේවල් ජනසම්මතවාදී ප්‍රජාතන්ත්‍රවාදී වශයෙන් හැඳින්වීම වැරදියි. මේවා ජනසම්මත විරෝධයි ; ප්‍රජාතන්ත්‍ර විරෝධයි.

රාජ්‍ය භාෂා පනත ගැන පසුගිය රාජාසන කථාවේ වචනයක්වත් සඳහන් කරන්නට බැරි වුණේ මේ විධියට මේ රජය පසුගිය දොළොස් මාසය තුළදී ක්‍රියා කළ නිසයි. එපමණක් ද ? මේ චක්‍රලේඛය බල පවත්වන්නේ රජයේ නිලධාරීන් හා ආණ්ඩුවේ දෙපාර්තමේන්තු කෙරෙහියි. නමුත් රජයේ ආයතන හැටියට රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය යුතු තවත් සංස්ථා කීපයක් තිබෙනවා.

මා මීළඟට සඳහන් කරන්නේ අපේ රටේ තිබෙන අධිකරණය ගැනයි. මේ රටේ අධිකරණ සංස්ථා කෙරෙහි බලපාන උසාවි භාෂා පනත නම් වූ නීතියක් තිබෙන බව මෙහි සිටින අධිකරණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා දන්නවා ඇති. මේ රජයේ අධිකරණ අමාත්‍යාංශය ගැන වගකීම පිණිස මෙහි සිටින පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මා ප්‍රශ්නයක් අසන්නට කැමතියි. රාජ්‍ය භාෂාව භාවිත වන්නේ මේ රටේ තිබෙන මොන උසාවියේද ? කරුණාකර එක අධිකරණයක් සඳහන් කරන්න. උසාවි පනත යටතේ පිහිටුවන ලද—"කෝට්ස් ඕඩිනන්ස්" නම් නීතිය යටතේ පිහිටුවන ලද—රාජ්‍ය භාෂාව භාවිත වන එකම උසාවියක් සඳහන් කරන්න. මේ රටේ මහේස්ත්‍රාත් උසාවි සිය ගණනක් තිබෙනවා. දිස්ත්‍රික් උසාවි සිය ගණන් තිබෙනවා. රික්වෙස්ට් උසාවි සිය ගණනක් තිබෙනවා. අවුරුදු පතා වරින් වර පිහිටුවන අපරාධ අධිකරණ හයක් හතක් තිබෙනවා. දිනපතා රැස්වන ශ්‍රේෂ්ඨාධිකරණය තිබෙනවා. සතී දෙකකට වරක් රැස්වන අපරාධ අධිකරණය තිබෙනවා. ඉතින් මෙහි සඳහන් කළ මොන උසාවියේද, එසේ නැත්නම් මොන අධිකරණයේද, රාජ්‍ය භාෂාව ක්‍රියාත්මක වන්නේ ? මේ එකකවත් රාජ්‍ය භාෂාව ක්‍රියාත්මක වන්නේ නැහැ. මේ එකම අධිකරණයකවත් අධිකරණ කටයුතු රාජ්‍ය භාෂාවෙන් ලේඛනගත වන්නේ නැහැ. මේ එකම අධිකරණයකවත් නඩුවක් විනිශ්චය කිරීමෙන් පසුව නඩු තීන්දුව රාජ්‍ය භාෂාවෙන් ලේඛනගත වන්නේ නැහැ. මේ එකම අධිකරණයකවත් ඇපැල් නඩුවක් රාජ්‍ය භාෂාවෙන් විභාග වන්නේ නැහැ. ක්‍රිමිනල් ඇපැල් අධිකරණ උසාවි එකක්වත් කවදාවත් නඩු තීන්දුවක් රාජ්‍ය භාෂාවෙන් ලියැවෙන්නේ නැහැ. එහෙමනම් උසාවි භාෂා පනත යනුවෙන් පනතක් තියාගෙන රට රවටන්නෙ ඇයි ? 1960දි ඇති කළ මේ පනත අද දක්වා එකම උසාවියකවත් ක්‍රියාත්මක නොවී තිබියදී මේ ආණ්ඩුවෙ අධිකරණ අමාත්‍යාංශය අවුරුදු දෙකහමාරක් තිස්සෙ මොනව කළයි කියා රටට පිළිතුරු දෙන්නද ? සුප්‍රිම් උසාවියෙ සිංහල රජ වුණ බවක් කියැවෙන පුවතක් පසුගිය දවසක පත්තරයක පළ වී තිබෙනු මම දැක්කා. මෙපමණ කලක් උදා නොවී තිබුණු නව යුගයක් මේ රටේ අධිකරණයෙහි උදාවී තිබෙනවයයි මේ පුවත දැක්ක හැටියටම මම අදහස් කළා.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Order, please! Will the hon. Member take much time?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
ඔව්, තව විනාඩි කීපයක්.

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You know that at 7.30 P.M. the House will adjourn.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
මට හතහමාරට අවසාන කරන්න පුළුවන් වන්නෙ නෑ. තව විනාඩි කීපයක් ඉන් බැහැර යන්න සිදු වෙයි. ආණ්ඩු පක්ෂයෙන් වෙන කථිකයින් නැහැනෙ.

වීරකෝන් මයා.
(திரு. வீரக்கோன்)
(Mr. Weerakoon
ඉන්නව, ඉන්නව.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
හෙට පිළිතුරු දෙන්න ලෑස්ති වෙන්න.

වීරකෝන් මයා.
(திரு. வீரக்கோன்)
(Mr. Weerakoon)
ලෑස්ති වෙනන් ඕන නෑ.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
"ශ්‍රේෂ්ඨාධිකරණයේ සිංහල රජවෙයි" යනුවෙන් ලේක් හවුස් පත්තරයක තිබුණු පුවත දැක මා බොහොම සන්තෝෂ වුණා.

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The hon. Member for Wattegama is waiting till you finish.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
මේ ප්‍රශ්නය ගැන සවිස්තරව කථා කිරීමට තව විනාඩි කීපයක් ගත වෙයි.

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
But you have spoken for over an hour.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
සාමාන්‍යයෙන් මට පැයක් ලැබෙන බවයි දැනගන්න ලැබුණේ.

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
දැන් පැයකට වැඩිය ගිහින් තියෙනව.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
එහෙම වුණේ, මගේ කථාව 6.30 ට හෝ 6.45 ට පමණ පටන් ගන්නට අදහස් කළ නමුත් පක්ෂයෙ කථිකයින් නැති නිසා මං කලින් පටන් ගත් නිසයි.

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
තමුන්නාන්සෙ පටන්ගත්තෙ 6.16 ට.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
මා පටන් ගත් වෙලාව මම දන්නව. මට නියමව තිබුණේ 6.30 ට නැත්නම් 6.45 ට.

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committee)
එහෙම එකක් තිබුණේ නෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
තමුන්නාන්සෙ නොදන්නව වෙන්න ඇති.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)
මම දන්නව. එහෙම නියමයක් තිබුණෙ නෑ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
කොලොන්නාවේ මන්ත්‍රීතුමා කථාකළාට පසුව ආණ්ඩු පක්ෂයෙන් කපිකයිත් දෙන්නෙක් කථා කරන බව කියා තිබුණා.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)
එහෙම මොකක්වත් නෑ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
හොඳයි ඒ කොයිහැටි වෙතත්, උසාවියෙ සිංහල රජ වුණු කතන්දරේ මා දැන් කියන්නම්. එදා ලේක් හවුස් පත්තරේ මේ පුවත දැකල මා බොහොම සන්තෝෂ වී උසාවිය පැත්තෙ ගිහින් බැලුව. එහෙත් සිංහල රජ වී තිබුණෙ උසාවියෙ නොව මේ පත්තරේ තීරුවල විතරයි. මහෙස්ත්‍රාත් උසාවියෙත් ශ්‍රෙෂ්ඨාධිකරණයෙත් වැඩ කෙරුණෙ පරණ විධියටමයි. "දිනමිණ" පත්තරේ ඒ වාර්තාවෙන් කියවුණේ මෙසේයි :

"ශ්‍රෙෂ්ඨාධිකරණයේ සිංහල රජවෙයි. රාජකීය සන්නස සිංහලෙන් කියවයි. ශ්‍රෙෂ්ඨාධිකරණයේ ඊයේ සිංහල රජ විය. සොලිසිටර් ජනරාල් පදවිය දැරූ රාජ නීතිඥ වික්ටර් තෙන්නකෝන් මහතා ශ්‍රෙෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමකු වශයෙන් පත් කිරීමේදී රාජකීය සන්නස ඊයේ උදේ ශ්‍රෙෂ්ඨාධිකරණයේ උත්සව රැස්වීම් වාරයේදී මුලින්ම කියවන ලද්දේ සිංහලෙනි".

ඕකයි සිදුවී තිබෙන්නෙ. නඩුකාරතුමා පත් කිරීමේ සන්නස් පත්‍රය සිංහලයෙන් කියවා තිබෙනව. මදෑ උසාවියෙ සිංහල රජ වුණු හැටි. [බාධා කිරීමක්] ඕක අලුත් දෙයක් නොවෙයි, හැමදාම වෙන දෙයක්. අලුත් නඩුකාරතුමකු පත්කිරීමේ සන්නස සිංහලයෙන් කියවීම 1956 සිට හැමදාම වගේ කෙරෙනව. අලුත් දෙයක් නොවෙයි. ඔයිට වඩා සිංහල භාවිතයක් අළුත්කඩේ නම් සිදු වන්නෙ නැහැ. අළුත්කඩේ පමණක් නොවෙයි, ලංකාවේ දිස්ත්‍රික් උසාවියකවත් සිදු වන්නේ නැහැ. ලංකාවේ ඉහළම ශ්‍රෙෂ්ඨාධිකරණ මණ්ඩලයේ පමණක් නොවෙයි, දිස්ත්‍රික් උසාවියකවත් රාජ්‍ය භාෂාව සුළු ලේඛනගත කටයුත්තක් සඳහාවත් භාවිත කරන්නට සමහර අධිකරණ නිලධාරීන් කැමැති නැහැ. මම ඒකට නිදර්ශනයක් ඉදිරිපත් කරන්නම්. "සිංහල රජයේ භාෂාව මුළු රටම පිළිගනී" කියා ආණ්ඩුව මගින් නිකුත් කළ පොතක් තිබෙන බව තමුන්නාන්සෙ දන්නව. සිංහල රජයේ බස මුළු රටම පිළිගනීවිය කියා කිව්වොත් ඔය මුළු රටටම උතුරත් දකුණත් නැගෙනහිරත් බස්නාහිරත් යන හතර මායිම් තුළ ඇති සෑම ප්‍රදේශයක්මත් ඇතුළත් වෙනව. නමුත් කොළඹ සිට සැතැප්ම 22 ක් ඈත ගම්පහ දිස්ත්‍රික් උසාවියේ සිදුවූ දෙයකට සම්බන්ධ ලියවිල්ලක් මම කියවන්නම්.

"සිංහල රජයේ බස මුළු රටම පිළිගනී" කියා ආණ්ඩුව පොතක් ගහල නිකුත් කරනව. උසාවි භාෂා පනතය කියා තවත් එකක් නීතිගත වෙලා තියෙනව. නමුත් ගම්පහ දිස්ත්‍රික් උසාවියේ ඇපැල් නඩුවකට මුදල් තැන්පත් කර ඒ පිළිබඳ කුවිතාන්සිය සිංහලයෙන් ලියා ඇතුළත් කරන්න බැහැ. තමුන්නාන්සේගේ ආණ්ඩුව යටතේ පවතින නියම තත්ත්වය ඒකයි. 1967 ජනවාරි 31 වැනිදා ගම්පහ දිස්ත්‍රික් උසාවියෙන් නිකුත් කළ ලියවිල්ලක් මම කියවන්නම්. තමුන්නාන්සේලා ජාතික සමගිය උදෙසා සිංහල භාෂාව රජ කරවන්නට දෙමළ භාෂාව පිළිබඳ රෙගුලාසි පනවලා භාෂා ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම විසඳා අවසානයි. නමුත් කොළඹ සිට හැතැප්ම 20ක් පමණ එහායින් තිබෙන ගම්පහ උසාවියේ සිංහල කුවිතාන්සියක් භාරගන්නෙ නැහැ. ඒ උසාවියේ නිලධාරියෙක් කොළඹ දිසාපතිතුමාට ලිපියක් එවනව, මේ විධියට. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

නිලධාරියාගේ නම මම කියවන්නෙ නැහැ, ලිපියේ අනික් කොටස මම කියවන්නම්.

" මගෙ අංකය : ඇජ් 56
දි. උසාවිය,
ගම්පහ.
67. 1. 31.

ඩබ්ලිව්. ඩී. ඒ. මහතන්තිල,
කො. දි. ආ. ඒ.,
කොළඹ.

**උසාවි මගින් නිකුත් කරනු ලබන ගෙවීම් ඇනවුම් ගෙවීම් ආශ්‍ර නිවේදන ආදිය සකස් කිරීම**

මෙම උසාවියේ අංක 977/විශේෂ, 752/බූදල් සහ 609 බූදල් දරණ නඩු සම්බන්ධයෙන් නිකුත් කරන ලද පිළිවෙලින් අංක 031488, 015709 සහ 017710 දරණ ගෙවීම් ආශ්‍ර නිවේදන පත් රාජ්‍ය භාෂාවෙන් ලියා එවන මෙන් ඉල්ලමින් ඒවා ආපසු එවන ලද ඒ. ඩී. සී. / හා 67. 1. 22 දින දරණ ලිපියට අවධානය යොමු කරවමි.

උසාවි මගින් නිකුත් කරනු ලබන ගෙවීම් ඇනවුම්, ගෙවීම් ආශ්‍ර නිවේදන තැන්පත් සටහන් රික්විසිෂන් පත් ආදිය පරිපාලන නියෝගයන් අනුව නිකුත් කරනු ලබන ඒවා වන අතර ඒවා නඩු පොත්වලම කොටස් ලෙස සලකනු ලබයි. නවම උසාවි භාෂාව ඉංග්‍රීසි වන නිසා උසාවි නඩු පොත් නඩු වාර්තා ආදිය ඉංග්‍රීසියෙන්ම පවත්වාගෙන යනු ලබන බැවින් යථෝක්ත ලියකියවිලිත් මින් ඉදිරියට ඉංග්‍රීසියෙන්ම සකස් කිරීමට සිදු වනු ඇත.

එම නිසා මෙම උසාවිය මගින් නිකුත් කරනු ලබන යථෝක්ත ලියකියවිලි අනුව මුදල් ගෙවීම් ආදිය සිදු කිරීමට කටයුතු සලස්වන්නේ නම් කෘතඥ වෙමි. ඉහත සඳහන් ගෙවීම් ආශ්‍ර නිවේදන ආපසු එවමි. "

**එකල්හි වේලාව අ. භා. 7.30 වූයෙන් කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.**

**එතැන් සිට විවාදය 1967 ජූලි 16 වන ඉරිදා පවත් වනු ලැබේ.**

*அப்போது பி. ப. 7.30 மணியாகிவிடவே அலுவல்கள் இடைநிறுத்தப்பட்டு விவாதம் ஒத்திவைக்கப் பெற்றது.*

*1967 ஜூலை 16, ஞாயிற்றுக்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.*

*It being 7.30 P.M., the Debate stood adjourned.*

*Debate to be resumed on Sunday, 16th July 1967.*

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**අ. භා. 7.31 ට කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.**

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අද දින සභාසම්මතය අනුව, 1967 ජූලි 16 වන ඉරිදා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.**

*பி. ப. 7.31 மணிக்கு குழுக்களின் உப அக்கிராசனர் வினா விடுக்காமலேயே சபையை ஒத்திவைத்தார்.*

*அதன்படி, சபை அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க 1967 ஜூலை 16 ஞாயிற்றுக்கிழமை பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.*

*At 7.31* P.M., MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned the House without Question put.*

*Adjourned accordingly until 2* P.M. *on Sunday, 16th July 1967, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6 කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org